# ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස් කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා නිදහසට එයින් ඇතිවන බලපෑම



උතුරු පළාතේ සිදු කරන ලද සහභාගීත්ව පර්යේෂණයකි


TRANSFORM
Building Inclusive Communities and Promoting Women's Leadership
உள்ளடங்கலான சமூகத்தை கட்டியெழுப்புதல் மற்றும் பெண் தலைமைத்துவத்தை மேம்படுத்தல்
ප්‍රජා අතර එකමුතුව සවිබල ගැන්වීම සහ කාන්තා නායකත්වය ප්‍රවර්ධනය කිරීම
Funded by European Union
Implemented by Chrysalis Catalyzing change
Law & Society Trust

# ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා නිදහසට එයින් ඇතිවන බලපෑම

සහභාගීත්ව පර්යේෂණයකි

*"කාන්තාවක් ලෙස යමෙකු උපදින්නේ නැත; නමුත් කාන්තාවක් බවට පත්වේ"*

- Simone de Beauvoir-

ක්‍රිජා ශිවකුමාර්

2021

නීතිය හා සමාජ භාරය සහ ක්‍රිසලීස්
සියළු හිමිකම් ඇවිරිණි.
2021 නොවැම්බර්
පිටු සැලසුම: මුත්තයියා කාන්තරූබන්
සිංහල පරිවර්ථනය: සී ජී කරුණාරත්න
සෝදුපත් බැලීම: දිල්හාරා පතිරණ සහ මොහොමඩ් ඉර්හාම්
කවර නිර්මාණය: චන්ද්‍රන් ගනේෂ්වරන්

මුද්‍රණය ඩිරෙක්ට ප්‍රින්ටර්ස්

ISBN 978-624-5545-12-4

නීතිය හා සමාජ භාරය
3, කිංසි ටෙරස්,
කොළඹ 08,
ශ්‍රී ලංකාව.
දුරකතන: 94 (0) 11 2684845
ෆැක්ස්: 94 (0) 11 2686843
ඊමේල්: info@lstlanka.org
වෙබ්: www.lstlanka.org

මෙම පර්යේෂණ වාර්තාව මගින් ප්‍රකාශනය වන අදහස් සහ අන්තර්ගතයන් නීතිය හා සමාජ භාරයේ හෝ ක්‍රිසලීස් ආයතනයේ දැක්ම හෝ ප්‍රතිපත්ති  අත්‍යාවශයෙන්ම නිරූපණය නොකරන අතර ඒකරාශී කල දත්තයක් මත පදනම් ව එළඹුනු  නිගමනයන් වේ. මෙම ප්‍රකාශණයේ කිසිදු කොටසක් නියමාකාර අවසර ගැනීමකින් තොරව ,  කිසිදු අරමුණක් සදහා හෝ කිසිදු ආකාරයකින් ඉලෙක්ට්‍රොනිකව, යාන්ත්‍රිකව, ඡායාරූප වශයෙන් හෝ හඬ පට වශයෙන් ප්‍රතිනිර්මාණය, සම්ප්‍රේෂණය කිරීම හෝ නැවත ලබා ගන්නා  අරමුණින් තබා ගැනීම නොකල යුතු වේ.

## පෙරවදන - නීතිය හා සමාජභාරය

ස්ත්‍රී පුරුෂ සමාජභාව අසමානතාවය දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාව මුහුණ දෙන ගැටළුවක් වේ. අනෙක් අතට, ශ්‍රී ලාංකික කාන්තාවන් ඉහළ සාක්ෂරතාවයක් සහිත; දශක ගණනාවක් තිස්සේ සර්වජන ඡන්දබලය භුක්ති විඳි අය වන අතර (සියල්ලම නොවුනත්) රටේ බොහෝ නීති ස්ත්‍රී පුරුෂ සමාජභාව මධ්‍යස්ථ ය. කෙසේ නමුත්, ස්ත්‍රී පුරුෂ සමාජභාව අසමානතා පවතින අතර ඒවා සමාජයේ පිළිගැනීමට ලක් වී තිබේ. විසඳලිය යුතු අසාධාරණයක් මෙහිදී සිදුවන්නේ යැයි තදබල හැඟීමක් ඇත්තේ නැත. පවතින මෙම තත්වයෙන් සමස්ථ සමාජයම බලපෑමට ලක්වන බවක් අවබෝධයට විෂයය වී නැත.

සාමාන්‍යයෙන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවී අසමානතා ආමන්ත්‍රණය කෙරෙන්නේ නීති ප්‍රතිසංස්කරණ, එනම්, වෙනස්කොට සැලකීම නිල වශයෙන් තහනම් කරන නීති පැනවීම, අධිකතර අන්දමින් වෙනස්කොට සලකන සුළු නීති සංශෝධනය කිරීම, සහ කාන්තාවන් හා කොන්වූ කණ්ඩායම් ඉහළට ඔසවා තබන විශේෂ විධිවිධාන සඳහා අවසර දීම හරහා ය. නමුත්, මෙවැනි ප්‍රතිසංස්කරණවලින් පවා  බලපෑමක් ඇති කිරීමට සමත්වී නොමැත. කාන්තාවන්ට ඉඩම් කරා ප්‍රවේශය ලබාදීමට යම් ප්‍රතිපත්ති වෙනස්කිරීමත් ඔවුන්ගේ ජීවනෝපාය වැඩි දියුණු කරගැනීම සඳහා කාන්තාවන්ට පුහුණු ලබාදීමත් සිදු වී තිබේ. එනමුත්, මෙම ක්‍රියාකාරකම් හරහා කාන්තාවන් සඳහා අවශ්‍ය කර තිබෙන සුසමාදර්ශී විතැන්වීම නිර්මාණය වී නොමැත.

උතුරු පළාත කෙරෙහි අවධානය කේන්ද්‍ර කර සිදුකරන ලද මෙම අධ්‍යයනය හරහා, ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙනස්කොට සලකන සමාජ සම්මතයන්, ස්ත්‍රී පුරුෂ සමාජභාව අසමානතාවය ඇති කිරීමට බලපාන මූලික හේතුසාධක අතරින් එකක් වන බව හෙළිදරවු කර තිබේ. උතුරු පළාත යනු ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අසමානතාවය ගැඹුරින් මුල් බැස ගත් ගතානුගතිකත්වයේ බලකොටුවකි.

අසමානතාවය තාර්කීකරණය කරවන මෙම සමාජ සම්මතයන්, කාන්තාවන් මෙන්ම පිරිමින් විසින් ගැඹුරින් අල්ලාගෙන සිටින අතර ස්ත්‍රී පුරුෂ අසමානතාවය තුරන් කිරීමට බාධාවක් වී තිබේ. මෙම ප්‍රදේශයේ ඇතිවූ ගැටුම, එම සමාජය කැළතීමකට ලක් කළ අතර සාම්ප්‍රදායික නොවන භූමිකාවන් ඉටු කරමින්, ගෘහමූලිකත්වය ගැනීමට කාන්තාවන්ට සිදු වූ අතර තත්වාකාරයෙන් එය බාධක බිඳ හෙළීමක් වී තිබේ. යුද්ධය අවසන් වී වසර දහයක් ගතවී ඇතත්, යුද්ධයේ ප්‍රතිවිපාක සහ එහි විනාශයන් තවමත් උතුරු පළාතේ කාන්තා වන්ගේ ජීවිත, අයිතිවාසිකම් සහ නිදහස කෙරෙහි බරපතල බලපෑම් ඇති කරයි. කාලය ගෙවී යන අතර, කාන්තා මූලික පවුල් විශාල සංඛ්‍යාවක් සමගින් සහ යුද්ධයෙන් පීඩාවට පත් ආබාධිත කාන්තාවන් සමග, ඉඩම් සඳහා ප්‍රවේශයක් සහ ශක්තිමත් ජීවනෝපායක් නොමැතිව ජීවත්වන්නට සිදුව ඇති නව යථාර්ථයට සමාජය හුරුවෙමින් පවතිද්දී, ස්ත්‍රී පුරුෂ සමාජභාව අසමානතා වඩාත් ඔරොත්තු දෙන සුළු ලක්ෂණ ඇති කර ගනිමින් කාන්තාවන්ව තව දුරටත් පසුපසට අදියි.

කාන්තාවන්ට අන්තර් සම්බන්ධිත බාධක ජාලයක් ඇතිකරවන සමාජ සම්මත පිළිබඳව මෙම අධ්‍යයනයෙන් අද්විතීය අවබෝධයක් ලබා දෙයි. "ගෘහස්ථ ක්ෂේත්‍රයට පහත හෙළනු ලබන බැවින් හා එසේ කළවිට යහපත් සහ නිර්මල වන" "තමා ගැන කිසිදු අපේක්ෂාවක් නොමැතිව තම පවුල වෙනුවෙන් ජීවත් වන" "යහපත් සහ නිර්මල කාන්තාවන්" පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංකල්ප මෙම සීමාවන්ට ඇතුළත් වේ. මෙම සම්මතයන් කාන්තාවන් කායිකව හා මානසිකව ද නිර්වචනය කර සීමා කරයි. ඔවුන් කාන්තාවන්ගේ ක්‍රියාවන් සහ සංචලනය මෙන්ම ඔවුන්ගේ අභිලාෂයන් සහ අපේක්ෂාවන් ද සීමාවකට කොටු කරයි.

පාසල් පෙළපොත්, වෙළඳ දැන්වීම්, පුවත්පත් සහ සාහිත්‍යය වැනි ජාතික ආඛ්‍යාන තුළ "හොඳ කාන්තාව" යනු කෙබඳු අයෙක් දැයි නිර්වචනය කරමින් මෙම සීමාවන් තවත් ශක්තිමත් කරවයි. එසේම, ආගමික ඉගැන්වීම් සහ පිළිවෙත් මගින් තවත් බලගැන්වෙන මෙම සීමාවන්, පවුල තුළ සම්ප්‍රදායේ භාරකරුවන් සහ සම්ප්‍රේෂකයන් වන මාතෘමූලිකයන් විසින් පවුල තුළ සිටින කාන්තාවන්ගේ සහ පිරිමින්ගේ විඥානය සහ උපවිඥානය තුළට කාවද්දයි. මේ අනුව, කාන්තාවන් ඔවුන්ගේම සිපිරිගෙයි රැකවල්කරුවන් බවට පත් වේ.

කාන්තාවන්ගේ ජීවිත පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිපත්ති මෙම අධ්‍යයනයෙන් ගෙනහැර දක්වන අතර වෙනසක් ඇති කිරීමට උතුරු පළාතේ පරිවර්තනය කළයුතු සමාජ සම්මත කවරේද යන්න ද තව දුරටත් මින් හඳුනාගෙන තිබේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත වෙනස්කොට සලකනසුළු ප්‍රධාන සමාජ සම්මත සහ එහි බලපෑම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ අවබෝධ කර ගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන පරමාර්ථය වන අතර, සහභාගීත්ව, ක්‍රියාකාරීපර්යේෂණ ක්‍රමවේදයක් ඇසුරින්,

කාන්තාවන් සමඟ සම්බන්ධ වී ඔවුන්ව නිර්වචනය කරන ආඛ්‍යානය විශ්ලේෂණය කර ප්‍රශ්න කිරීම එතුළින් සිදුවේ. මෙම අධ්‍යයනය සුවිශේෂී සහ පරිවර්තනීය අධ්‍යනයක් කරන්නේ මේ ලක්ෂණ මගිනි. තමන් ඉදිරියට යාම වලක්වන ගැටළු හඳුනා ගැනීමටත් තම භූමිකා නැවත නිර්වචනය කරගැනීමට තමන් විසින්ම තම කාරකත්වය මෙහෙයවිය යුතු බව අවබෝධ කරගැනීමටත් එමගින් කාන්තාවන්ට අවස්ථාව සැලසේ.

නීතිය සහ සමාජ භාරය, ක්‍රිසලීස් සමග හවුල්කාරිත්වයෙන් ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාවය, මානව හිමිකම්, මූලික නිදහස සහ යුක්තිය ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම තුළින් ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මෙම පර්යේෂණය මෙකී අරමුණෙහි කොටසක් වේ. මෙම ප්‍රයත්නයේදී ක්‍රිසලීස් සහ ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ඇති යුරෝපා සංගමයේ හවුල්කාරිත්වය නීතිය සහ සමාජ භාරය විසින් අගය කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය සමඟ සම්බන්ධ ව ඔවුන්ගේ කථා බෙදාගත් කාන්තාවන් දැකීමෙන් සහ වෙනසක් ඇති කිරීමේ නියෝජිතයන් වීමට ඔවුන් තුළ වූ සූදානම දැකීමෙන් අපි නිහතමානීව ජවසම්පන්න වූයෙමු.

ආචාර්ය සකුන්තලා කදිර්ගාමර්
විධායක අධ්‍යක්ෂිකා
නීතිය හා සමාජ භාරය

# පෙරවදන - ක්‍රිසලීස් ආයතනය

අප කරන සෑම දෙයකම මධ්‍යයෙහි සිටින්නේ කාන්තාවන් සහ තාරුණ්‍යයන්ය. ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය, වයස, ජනවර්ගය, ආගම සහ පන්තිය මත පදනම් වෙමින් ඔවුන් ආන්තීකරණය කරන්නා වූ සංකීර්ණ අභියෝග රැසක් කාන්තාවන් සහ තරුණ තරුණියන් වෙත එල්ලවන බව අපට වැටහෙන අතර, අන් කවරදකටත් වඩා, ශ්‍රී ලංකාවේ විභවය සාක්ෂාත් කරගන්නට රටට අවශ්‍යව ඇති නායකයින් ඔවුන් වන බව අපි විශ්වාස කරන්නෙමු. Chrysalis හි අපි, අසමානතාවයන්ට අභියෝග කරන හා සර්වග්‍රාහී වර්ධනයක් ඇති කරන, කාන්තාවන්ට සහ තරුණයින්ට වෙනස්කම් සහ පරිවර්තනයක් ඇති කිරීමට ඉඩ සලසන, නව්‍ය, පරිපූර්ණ විසඳුම් සංවර්ධනය කරන්නෙමු. සියලුම ස්ත්‍රී පුරුෂ සමාජභාවයන්ට අයත් පුද්ගලයින්ට දැනුම, කුසලතා සහ හැකියාව ද, වෙනස්කොට සලකන සහ අභියෝග කරන සබඳතා සාකච්ඡා කිරීමේ හැකියාව ද, අසමානතාවය පවත්වා ගෙන යන සම්මතයන්, සාරධර්ම, හැසිරීම් සහ ආයතනික බාධක පරිවර්තනය කිරීමට ධෛර්යය ද ඇති බව සහතික කිරීම මගින් අපි සර්වග්‍රාහී වර්ධනය ප්‍රවර්ධනය කරමු.

නීතිය හා සමාජ භාරය (LST) සමගින් ඇති හවුල්කාරීත්වය අපගේ මේ වැඩකටයුතු වඩාත් පෝෂණය කරයි. රටේ සමාජ ආර්ථික සහ දේශපාලන පසුබිම සම්බන්ධයෙන් ඔවුන්ට ඇති ගැඹුරු අවබෝධය, විශේෂයෙන්ම කාන්තාවන් සහ අනෙකුත් කණ්ඩායම් ආන්තීකරණයට ලක්වීම සම්බන්ධයෙන් ඔවුන් සතු වැටහීම, වෙනස්කොට සැලකීමේ හේතුමූලයන් පිළිබඳව අපට ඇති අවබෝධය වඩාත් තියුණු කරගැනීමටත්, ප්‍රජාවන්, පළාත් පාලන ආයතන සහ අපගේ සම මට්ටමේ සගයින් සමගින් එක්වී තිරසාර විසඳුම් සංවර්ධනය කිරීමටත් අපට ඉඩ සලසයි.

මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථය වන්නේ උතුරු පළාතේ බලපවත්වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් වෙනස්කොට සැලකීම් හඳුනාගැනීම සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා නිදහස මත ඉන් ඇතිකෙරෙන බලපෑම අවබෝධ කරගැනීමත් ය. එසේම, විශේෂයෙන්ම පශ්චාත් යුධ පසුබිමක් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකා, විශේෂයෙන්ම කාන්තාවන්ගේ භූමිකාව වෙනස් වන තත්වයක් තුළ, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත වෙනස්කොට සලකන සුළු ජාතික ආඛ්‍යාන එවන් සංවාද කෙරෙහි බලපාන අන්දම විමසා බැලීමට ද මෙම පර්යේෂණය හරහා වෑයම් දරා තිබේ. දත්ත විශ්ලේෂණයේදී සමාජ සම්මත විශ්ලේෂණ සැලසුම් සටහන් (SNAP) රාමුව යොදාගැනීම ඇතුළුව අධ්‍යනය සිදුකිරීම සඳහා යොදාගත් සහභාගීත්ව ප්‍රවේශ හිටපු කාන්තා සටන්කාමීන්, ආබාධ සහිත කාන්තාවන්, තනි මවුපිය සහ වැන්දඹු කාන්තාවන් වැනි නිශ්චිත කණ්ඩායම් විසින් මුහුණ දෙන, සියුම් වෙනස්කම් සහිත ගැටළු සම්බන්ධයෙන් වඩාත් ගැඹුරු අවබෝධයක් ලබාගැනීම සඳහා හේතු විය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව වෙනස්කොට සලකන සුළු සමාජ සම්මත උතුරු පළාතේ පවතින බවත්, කාන්තාවන්ට තම අයිතිවාසිකම් සහ නිදහස කරා ප්‍රවේශවීමේ දී මෙම සමාජ සම්මත හරහා බාධක ඇතිකෙරෙන අන්දමත් සම්බන්ධයෙන් නව සාක්ෂි මෙම අධ්‍යයනය හරහ උත්පාදනය වී තිබේ. පෞද්ගලික සහ ප්‍රසිද්ධ අවකාශයන්හිදී කාන්තාවන්ගේ භූමිකාවට බලපාන සහ ඔවුන්ගේ ගරුත්වය, සුරක්ෂිතබව, සහ ආරක්ෂාව බිල්ලට දෙමින් කාන්තාවන්ගේ ප්‍රජනන භූමිකාවම තදින් ස්ථාපිත කරවන සම්මතයන්, ඔවුන්ගේ අයිතිවාසිකම් සහ මූලික නිදහස කෙරෙහි බලපෑම් එල්ල කරන සැලකිය යුතු සාධක වන බව මෙහිදී හඳුනාගෙන තිබේ. මෙම පර්යේෂණයෙන් සොයාගත් කරුණු, පවතින තත්වයට අභියෝග කිරීමටත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව වෙනස්කොට සලකන සුළු සමාජ සම්මතයන් අභියෝගයට ලක් කිරීමටත් හැකියාව ලබාදෙනු ඇතැයි අපට විශ්වාස ය.

පර්යේෂණය සිදුකළ, සහ ශ්‍රී ලංකාවේ වර්ධනය සඳහා කාන්තාවන් සහ තාරුණ්‍යය සම්බන්ධ කරගැනීම පිණිස අපට ඇති පරමාර්ථය මුදුන්පත් කරගැනීමෙහි ලා දිගින් දිගටම අපට වටිනා හවුල්කරුවකු වන නීතිය හා සමාජ භාරයට අපි බෙහෙවින් කෘතඥ වන්නෙමු.

අශිකා ගුණසේන
ප්‍රධාන විධායක නිලධාරිනී
ක්‍රිසලීස් ආයතනය

## ස්තුතිය

මෙම පර්යේෂණය සඳහා දත්ත ලබාදුන් උතුරු පළාතේ ප්‍රජාවල සාමාජිකයින්ට මුලින්ම මාගේ ස්තුතිය පල කරන්නට කැමැත්තෙමි. මෙම පර්යේෂණයේ දත්ත එක් රැස් කිරීම සඳහා ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින් වශයෙන් කටයුතු කළ සියළු දෙනාට මාගේ හෘදයාංගම ස්තුතිය පල කරමි. ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්, මෙම සමීක්ෂණයට සහභාගි වූ අයගෙන් දත්ත එකතු කර දිම සඳහා ගෝලීය කෝවිඩ්-19 වසංගතය අතරතුර පැන නැගුනු අභියෝග හමුවේ පවා වෙහෙස නොබලා දැරූ වෑයම බෙහෙවින්ම ප්‍රශංසනීය ය.

පර්යේෂණ සඳහා අවශ්‍ය සැපයුම් සහය ලබා දීම සම්බන්ධයෙන් ක්‍රිසලීස් හි කාර්ය මණ්ඩලයට මම මගේ කෘතඥ පූර්වක ස්තුතිය පුද කරමි. සොයාගත් කරුණු සම්බන්ධයෙන් වටිනා ප්‍රතිපෝෂණ ලබාදුන් නීතිය හා සමාජ භාරයේ විධායක අධ්‍යක්ෂතුමියට සහ ක්‍රිසලීස් හි ප්‍රධාන විධායක නිලධාරිනී වෙත ද ස්තුති කිරීමට කැමැත්තෙමි. පර්යේෂණ ක්‍රියාවලිය මුළුල්ලේ වෙහෙස මහන්සි වී මගපෙන්වීම සම්බන්ධයෙන් නීතිය හා සමාජ භාරයේ වැඩසටහන් සහ මෙහෙයුම් අධ්‍යක්ෂක සඳුන් තුඩුගල මහතාටද මාගේ අවංක ස්තුතිය පුද කරමි.

එසේම, ජාතික අධ්‍යාපන ආයතනයේ ජ්‍යෙෂ්‍ය කථිකාචාර්ය ආචාර්ය එස්. කරුණාහරන් සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එම්. ජයසීලන් යන මහත්වරුන්ට ද මේ පර්යේෂණය සිදුකිරීමේදි ඔවුන් ලබාදුන් මාහැගි අදහස් හා ප්‍රතිපෝෂණ වෙනුවෙන් මාගේ කෘතඥතාවය පුදකළ යුතුය. තවද, මේ වාර්තාවේ භාෂා සංස්කරණ කටයුතු සිදුකර දුන් ආරුමුගම් සෙල්වේන්ද්‍රන්, නාගරත්නම් ක්‍රිෂ්ණකුමාර්, ෂැලෝම් ඩැනියෙල්, සහ ඉන්ෂිරා ෆලීක් යන මහත්ම මහත්මීන්ට ද මාගේ හදපිරි ස්තුතිය පිළිගන්වමි.

පර්යේෂණ කණ්ඩායමේ සහය නොලැබුණේ නම් මෙම පර්යේෂණය යථාර්ථයක් කරගැනීම කළ නොහැක්කක් වනු ඇත. චතුරිකා සෙව්වන්දි, සුවිර්තන් තේවරාජා, අනුෂා ගයත්‍රි සෙල්වේන්ද්‍රන්, වෙනුජා නවරත්නරාජා, මදිවදනි ගුරුචන්ද්‍රන්, සහ නස්රින් ජාන් මෙම පර්යේෂණ කණ්ඩායමේ සාමාජික සාමාජිකාවන් විය. මෙම පර්යේෂණ කටයුත්ත සාර්ථකව සම්පූර්ණ කිරීම උදෙසා තමන්ගේ නොනිමි සහයෝගය සහ දයකත්වය ලබාදුන් පර්යේෂණ කණ්ඩායම් සාමාජික සාමාජිකාවන්ට මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමමි.

මේ පර්යේෂණය සාර්ථක කරගැනීමට නන් අයුරින් සහය දැක්වූ සියළු දෙනාට ස්තුති කිරීමට මෙය අවස්ථාව කර ගනිමි.

ක්‍රිජා ශිවකුමාර්

# අන්තර්ගතය


## 1 වන පරිච්ඡේදය 1

1. පර්යේෂණය හැඳින්වීම 1
1.1 හැඳින්වීම 1
  1.1.1 කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය 4
  1.1.2 සහභාගීත්වය සඳහා අවස්ථාවන් නොමැතිවීම 6
1.2. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව තහවුරු කිරීම සඳහා වන ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර හා දේශීය නෛතික බැඳීම් 10
1.3. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව 12
1.4. සමාජ ප්‍රතිමාන, නීතී, චාරිත්‍රානුකූල නීති සහ ආගමික විශ්වාස 14
  1.4.1 ඉඩම් අයිතිවාසිකම් 15
  1.4.2 ස්ත්‍රී දූෂණය පිළිබඳ නීතිය 16
1.5. අවසාන වශයෙන් ... 18

## 2 වන පරිච්ඡේදය 19

2. ලිපි ග්‍රන්ථ විමසුම 19
2.1 සමාජ ප්‍රතිමාන සහ ඒවායෙහි ලක්ෂණ 19
  2.1.1 සමාජ ප්‍රතිමාන ස්ත්‍රී පුරුෂ සමාජභාවය සමඟ සම්බන්ධවන ආකාරය 19
  2.1.2 සමාජ ප්‍රතිමාන සහ ආගමික මූලධර්ම 20
  2.1.3 ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව 21
  2.1.4 සමාජ ප්‍රතිමානයන්හි අඛණ්ඩ පැවැත්ම සඳහා වන හේතු 23
2.2 සමාජ ප්‍රතිමාන සහ කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ භූමිකාවන් 24
  2.2.1 ප්‍රජනන කෘත්‍යය ඉටු කරන්නියන් වශයෙන් කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි භූමිකාව 24
  2.2.2 නිවස රැකබලාගන්නියන් (ගෘහණියන්) වශයෙන් කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි භූමිකාව 25
  2.2.3 සංස්කෘතිය ඉදිරියට රැගෙනයන්නන් වශයෙන් කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි භූමිකාව 26
  2.2.4 "පරමාදර්ශී කාන්තාව" යනු කවුද? 26
2.3 ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමාජ ප්‍රතිමාන ආරක්ෂා කිරීම සහ ඒවා ඉදිරියට ගෙනයාම සම්බන්ධ කාන්තාවන්ගේ භූමිකාව 27
2.4 පශ්චාත් යුද සමාජයන්හි දැකිය හැකි සමාජ ප්‍රතිමානයන්ගේ ප්‍රචණ්ඩතාව 28

## 3 වන පරිච්ඡේදය 30

3. පර්යේෂණ ක්‍රමවේදය 30
3.1 හැඳින්වීම 30
3.2 පර්යේෂණයේ පරමාර්ථ 30
3.3 පර්යේෂණ ආචාරධර්ම 31
3.4 දත්ත රැස්කිරීමේ ක්‍රමවේද 32

3.5 පර්යේෂණය සඳහා සහභාගී වන්නන් තෝරාගැනීම 35
3.6 දත්ත එකතු කිරීම 36
3.7 දත්ත විශ්ලේෂණය 41
3.8 දත්ත පිරික්සීම 41
3.9 අවසන් පර්යේෂණ වාර්තාව ලිවීම 42

## 4 වන පරිච්ඡේදය 43

4. පර්යේෂණ නිගමන කොටස 1 43
4.1 හැඳින්වීම 43
4.2 උතුරු පළාතේ ප්‍රධාන වශයෙන් ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන 43
4.2.1 දිස්ත්‍රික් පදනමින් 44
4.2.2 උතුරු පළාත පුරා ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ ප්‍රධාන සමාජ ප්‍රතිමාන 49
4.3 සමාජයේ ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ ප්‍රධාන සමාජ ප්‍රතිමාන සම්බන්ධයෙන් වර්ගීකරණය කරන ලද දත්ත 51
4.3.1 ලිංගික පදනමින් 51
4.3.2 ආගමික පදනමින් 54
4.3.3 වයස් පදනමින් 56
4.3.4 අධ්‍යාපන මට්ටම පදනමින් 58
4.4 හඳුනාගන්නා ලද ප්‍රධාන ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන SNAP ව්‍යුහය ඔස්සේ ඇගයීම 60
4.4.1 සමාජ ප්‍රතිමාන පිළිබඳ සමාජ අපේක්ෂාවන් 60
4.4.2 සමාජ ප්‍රතිචාර සමාජ පිළිගැනීම හා නොසලකා හැරීම 63
4.4.3 සමාජ ප්‍රතිචාරයේ බලපෑම 64
4.4.4 ව්‍යතිරේක 65
4.4.5 බලපෑම් කණ්ඩායම් 65
4.5 හඳුනාගත්, ස්ත්‍රීපුරුෂ සමාජභාවය අනුව වෙනස්කොට සලකනසුළු සමාජ සම්මත පැවතීම සඳහා මූලහේතු 67
4.6 හඳුනාගන්නා ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන කාන්තා අයිතිවාසිකම් හා නිදහස කෙරෙහි බලපෑම් එල්ල කරන ආකාරය තාර්කික විශ්ලේෂණය 74
4.6.1 කාන්තාවන්ගේ කාර්යභාරයන් පවුල් පරිසරයට පමණක් සීමා කරන්නාවූ සමාජ ප්‍රතිමාන 74
4.6.2 "චරිතවත් කාන්තාව" සහ "පතිවෘත කාන්තාව" යන මතයන් පදනම් කරගනිමින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ නිදහස සීමා කරන්නා වූ සමාජ ප්‍රතිමාන 77
4.6.3 කාන්තාවන්ගේ වෘත්තිය අයිතිවාසිකම් සීමා කරන භාවිතාවන්/සමාජ ප්‍රතිමාන 80
4.6.4 කාන්තාවන්ගේ ආගමික නිදහස සීමා කරන භාවිතාවන්/සමාජ ප්‍රතිමාන 82

5 වන පරිච්ඡේදය 86

5. පර්යේෂණ නිගමන කොටස 2 86

5.1 ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ ජාතික කතිකාවන් සහ ඒවා කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා නිදහස කෙරෙහි ඇති කරන බලපෑම 86

5.1.1 හැඳින්වීම 86

5.1.2 'දරුවන් රැක බලාගැනීම කාන්තාවන්ට අදාළ දෙයකි' යන්න අවධාරණය කරන ජාතික කතිකාවන් 87

5.1.3 ඉවුම් පිහුම් සහ ගේදොර වැඩ කටයුතු කාන්තාවන්ට අදාළ බව අවධාරණය කරන ජාතික කතිකාවන් 87

5.1.4 කාන්තාවන් මෘදු බවට අවධාරණය කරන ජාතික කතිකාවන් 90

5.1.5 ආගමික සිරිත් විරිත් ආරක්ෂා කළ යුත්තේ කාන්තාවන්ය යන්න අවධාරණය කරනු ලබන ජාතික කතිකාවන් 91

5.2 යුද්ධයෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමාජ ප්‍රතිමානයන්ට අදාළ ප්‍රවණතාවෙහි ඇතිවී තිබෙන වෙනස්කම් 91

5.2.1 හැඳින්වීම 91

5.2.2 යුද සමයේදී සමාජ ප්‍රතිමායන්හි ඇතිවූ ප්‍රවණතාව 92

5.2.3 පශ්චාත් යුද සමයේ සමාජ ප්‍රතිමානයන්හි ප්‍රවණතාවෙහි ඇතිවී තිබෙන වෙනස 93

6 වන පරිච්ඡේදය 96

6. නිගමනය සහ නිර්දේශ 96

6.1 නිගමනය 96

6.2 නිර්දේශ 97

6.2.1 නීති සංශෝධනය සඳහා වන නිර්දේශ 97

6.2.2 අධිකරණ ක්ෂේත්‍රයෙහි සිදු කළ යුතු සංශෝධන සඳහා වන නිර්දේශ 98

6.2.3 රජයේ ක්‍රියාකාරීන් සඳහා වන නිර්දේශ 98

6.2.4 සිවිල් සමාජ ක්‍රියාධරයන් සඳහා වන නිර්දේශ 99

ඇමුණුම් 101

යොමුව 137

## වගු ලැයිස්තුව


වගුව 1.1 - පුද්ගලයින්ට එරෙහි බරපතල අපරාධයන්ගෙන් පීඩාවට පත් වින්දිත කාන්තාවන් 2015-2019 4

වගුව 1.2 - උතුරු පළාතේ ලිංගික දූෂණය මඟින් පීඩාවට පත් කාන්තාවන් සංඛ්‍යාව වාර්ෂික පදනමින් (2016-2020) 5

වගුව 1.3 - උතුරු පළාතේ පළාත් පාලන ආයතනයන්හි පවතින ස්ත්‍රී පුරුෂ සංයුතිය 2018 6

වගුව 1.4 - පළාත් සභා මන්ත්‍රීවරු හා අමාත්‍යවරු සංඛ්‍යාව සහ ස්ත්‍රී පුරුෂ භාවය වාර්ෂික පදනමින් 2004, 2008/2009, 2012/2013/2014 7

වගුව 1.5 - පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂභාවය අනුව වාර්ෂික පදනමින් 7

වගුව 1.6 - උතුරු පළාත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංඛ්‍යාව වාර්ෂික පදනමින් 8

වගුව 1.7 - විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂ භාවය අනුව 2017 9

වගුව 3.1 - SNAP ව්‍යුහය 34

වගුව 3.2 - දිස්ත්‍රික් සහ ලිංගික පදනමින් පර්යේෂණයට සහභාගීවූවන්ගේ වර්ගීකරණය 35

වගුව 3.3 - පර්යේෂණය සඳහා සහභාගිවූවන්ගේ වයස් අනුව වර්ගීකරණය 35

වගුව 3.4 - පර්යේෂණයසඳහා සහභාගීවූවන්ගේ ආගම් අනුව වර්ගීකරණය 35

වගුව 3.5 - අධ්‍යාපන පදනමින් පර්යේෂණය සඳහා සහභාගීවූවන්ගේ වර්ගීකරණය 36

වගුව 3.6 - දිස්ත්‍රික් සහ ලිංගිකත්ව පදනමින් දත්ත රැස්කරන්නන් වර්ගීකරණය කිරීම 36

වගුව 3.7 - කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා පිළිබඳ විස්තර 40

වගුව 4.1 - යාපනය දිස්ත්‍රික්කය තුළ පැතිර පවතින ප්‍රධාන ස්ත්‍රී පුරුෂ සමාජභාවී හා බැඳී වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන 44

වගුව 4.2 - වව්නියා දිස්ත්‍රික්කය තුළ පැතිර පවතින ප්‍රධාන ස්ත්‍රී පුරුෂ සමාජභාවී හා බැඳී වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන 45

වගුව 4.3 - කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ පැතිර පවතින ප්‍රධාන ස්ත්‍රී පුරුෂ සමාජභාවී හා බැඳී වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන 49

වගුව 4.4 - මුලතිව් දිස්ත්‍රික්කය තුළ පැතිර පවතින ප්‍රධාන ස්ත්‍රී පුරුෂ සමාජභාවී හා බැඳී වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන 47

වගුව 4.5 - මන්නාරම දිස්ත්‍රික්කය තුළ පැතිර පවතින ප්‍රධාන ස්ත්‍රී පුරුෂ සමාජභාවී හා බැඳී වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන 48

වගුව 4.6 - උතුරු පළාතේ ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳී වෙනස්කොට සැලකීමේ ප්‍රධාන සමාජ ප්‍රතිමාන 49

වගුව 4.7 - උතුරු පළාතේ ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳී වෙනස්කොට සැලකීමේ ප්‍රධාන සමාජ ප්‍රතිමාන ලිංගිකත්වය මත වර්ගීකරණය කරන ලද දත්ත 52

වගුව 4.8 - උතුරු පළාතේ ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳී වෙනස්කොට සැලකීමේ ප්‍රධාන සමාජ ප්‍රතිමාන ආගම මත වර්ගීකරණය කරන ලද දත්ත 54

වගුව 4.9 - උතුරු පළාතේ ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳී වෙනස්කොට සැලකීමේ ප්‍රධාන සමාජ ප්‍රතිමාන වයස මත වර්ගීකරණය කරන ලද දත්ත 56

වගුව 4.10 - උතුරු පළාතේ ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳී වෙනස්කොට සැලකීමේ ප්‍රධාන සමාජ ප්‍රතිමාන අධ්‍යාපන මට්ටම මත වර්ගීකරණය කරන ලද දත්ත 58

වගුව 4.11 - අන් අය කුමක් කරනවා කියා ද මම සිතන්නේ? (Empirical Expectations) 60

වගුව 4.12 - අන් අය මා කළයුතු බවට බලාපොරොත්තු වන දේ ලෙස මම සිතන දේ? (Normative Expectations) 61
වගුව 4.13 - සමාජ ප්‍රතිචාර සමාජ පිළිගැනීම හා නොසලකා හැරීම 63
වගුව 4.14 - ව්‍යතිරේක 65
වගුව 4.15 - බලපෑම් කණ්ඩායම් 66
වගුව 4.16 - හඳුනාගත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙනස්කොට සලකනසුළු සමාජ සම්මත පැවතීම සඳහා මූලහේතු 67

## ඇමුණුම් ලැයිස්තුව

1. ආචාරධර්ම මූලලේඛණය 101
2. පර්යේෂණ සැලසුම 106
3. ප්‍රශ්නාවලිය 117
4. ප්‍රජා මූල ක්ෂේත්‍ර පර්යේෂකයින්ගේ නාම ලේඛණය 132
5. දත්ත ඇතුළත් කළ අයගේ නාම ලේඛණය 134
6. මෙම පර්යේෂණයේ අරමුණු සඳහා සම්මුඛ සාකච්ඡා සහ අනෙකුත් සාකච්ඡා පැවැත්වූ විස්තර ලැයිස්තුව 135

## විධායක සාරාංශය

ඕනෑම සමාජයක ප්‍රගමනයට ස්ත්‍රී පුරුෂ සමාජ සමාජභාවයේ සමානතාව අත්‍යවශ්‍ය සාධකයෙකි. ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානතාවය වැදගත් කම සවිඥානික නමුත් ප්‍රායෝගිකව එය සහතික කර ගැනීමට අසමත් වී තිබේ. දශක තුනක් තිස්සේ දිගහැරුණු ජනවාර්ගික යුද්ධය, දිගන ගැටුම, අලුත්ගම බේරුවල ගැටුම සහ පාස්කු ඉරුදින ප්‍රහාරය ඇතුළු විටින් විට සිදුවන ප්‍රචණ්ඩත්වයන් සමාජය තුළ පවතින ස්ත්‍රී පුරුෂ භාවයේ අසමානතාව තවදුරටත් තීව්‍ර කරයි. යුද ගැටුම් මෙන්ම කැරලි ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සියලු ජනයා පීඩාවට පත්කරන නමුත්, විශේෂයෙන්ම කාන්තාවන් කෙරෙහි උග්‍ර සහ ආවේණික වූ බලපෑම් ඇති කරන අතර එය, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාව හේතුවෙන් කාන්තාව මුහුණ දෙන අසමානතාවන් තවදුරටත් උත්සන්න කිරීමට සමත්ව ඇත. 1970 සිට අඛණ්ඩව ප්‍රචණ්ඩත්වයන් සිදුවෙමින් පවතින අපරට තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව අභියෝගයට ලක්ව ඇති බව පෙනේ.

සමාජයේ පැලපදියම් වී තිබෙන, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතා පෙන්නුම් කරන සමාජ සම්මතයන් මෙම අසමානතාව ඇති කරන ප්‍රධාන සාධක වලින් එකකි. වෙනත් විදියකින් පවසන්නේ නම්, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතා අසමානතාවන්ගෙන් සැදුම්ලත් සමාජ සම්මතයන් තුළ පැළ කර තිබේ. සමාජ සම්මතයන් සමාජය තුළ සම්ප්‍රදායන්, සංස්කෘතික ප්‍රතිමාන, පාරම්පරික ඇවතුම් පැවතුම් හෝ හර පද්ධතීන් ආදී වශයෙන් විහිදී තිබෙන අතර, සාමාන්‍යයෙන් මේ සියල්ල ස්ත්‍රී පුරුෂ සමාජභාවීය නිර්මිති බැවින් ඒ තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතාව ගැබ්ව පවතී. අනෙක් අතට මෙම සමාජ සම්මතයන්වල ප්‍රභවය බවට පත්ව ඇත්තේ ආගම හෝ සංස්කෘතිය යි. මෙයින් සිදුවන්නේ පුද්ගල බද්ධ භූමිකා සම්ප්‍රදාය ඇසුරෙන් සැකසීමය. ඒ අනුව, මෙම සමාජ සම්මතයන් සහ ඒ අනුසාරයෙන් සැකසුණු ස්ත්‍රී පුරුෂ සමාජභාවීය භූමිකා හේතුවෙන් වැඩිපුරම අසමානතාවට ලක්වන්නේ කාන්තාවෝය. මෙයට හේතු පාදක වී ඇත්තේ, සංස්කෘතිය ආරක්ෂා කිරීමේ යුතුකම හුදෙක් කාන්තාව සතුයි යන සිතිවිල්ලය. මෙවැනි සම්මතයන් මගින් වර්ගයා බෝ කිරීම, සංස්කෘතිය ආරක්ෂා කිරීම සහ පවුල නඩත්තු කිරීම ආදිය කාන්තාවන්ගේ ප්‍රධාන භූමිකාවන් ලෙස ප්‍රක්ෂේපණය කර ඇත.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) අනු ව්‍යවස්ථාව ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව සහතික කරයි. ඒ වගේම ශ්‍රී ලංකාව විවිධ ජාත්‍යන්තර ප්‍රඥප්ති අපරානුමත කිරීම හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව සහතික කිරීමට බැඳී සිටී. මාරුවෙන් මාරුවට පාලන බලයට පත්වන රජයන් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව සහතික කිරීමට උත්සාහ දැරුවද, කාන්තාවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වයන් වර්ධනය වීම සහ ඔවුන්ගේ සහභාගිත්වයට ප්‍රමාණවත් ඉඩකඩ වෙන් නොකිරීම මගින් රට තුළ මේ වන විටත් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානත්වය සහතික කොට නැති බව පෙන්නුම් කරයි.

මෙවැනි අසමානතාවන් ඇතිකරන සමාජ සම්මතයන් විපරිවර්තනයට ලක් කරනතුරු ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව සහතික කිරීම සිහිනයක් පමණි. එබැවින්, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව සහතික කිරීමට දරන උත්සාහයේ පළමු පියවර විය යුත්තේ අසමානතා ප්‍රදර්ශනය කරන සමාජ සම්මතයන් පරිවර්තනයට ලක් කිරීමය. එසේ කිරීමට නම්, වත්මන් සමාජයේ මුල් බැස තිබෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතා පෙන්නුම් කරන සමාජ සම්මතයන් කවරේද? මෙහි දෘඪ බව සහ ස්ථායි බව කෙබඳුද? ඒවා ප්‍රායෝගිකව ස්ථිතිකව පැවතීමට හේතු කවරේද? සහ එමගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව, කාන්තාවන්ගේ අයිතීන් සහ නිදහසට බලපෑම් ඇති කරන්නේ කෙසේද යන්න දැනගත යුතුය.

ඒ අනුව, මෙම පර්යේෂණයේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ යුද්ධය නිසා වැඩි වශයෙන් බලපෑමට ලක් වූ උතුරු පළාත තුළ මුල් බැස තිබෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතා පෙන්නුම් කරන සමාජ සම්මතයන් හඳුනාගෙන ඒවා තක්සේරු කිරීමයි. TRANSFORM වැඩසටහන යටතේ සිදු කෙරෙන මෙම පර්යේෂණය හරහා හඳුනාගනු ලබනල අසමානතාවන් ප්‍රදර්ශනය කරන සමාජ සම්මතයන් විපරිවර්තනය කිරීමට මැදිහත් වීම සහ එය ප්‍රායෝගික කිරීමට ඉලක්ක කර ඇත. එසේම, මෙය උතුරු පළාතේ අසමානතාවන් පෙන්නුම් කරන සමාජ සම්මතයන් පිළිබඳ නැවුම් අදහස් අපට සමීප කරවන ලේඛනයක් වන නොඅනුමානය.

**පර්යේෂණයේ අරමුණු**

1. ජන සමාජයේ (උතුරු පළාතේ) කිඳා බැස තිබෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතා ප්‍රදර්ශනය කරන සමාජ සම්මතයන් හා එමගින් කාන්තාවන්ට ඇතිවන බලපෑම් සහ කාන්තාවන්ගේ මූලික අයිතීන් මෙන්ම නිදහස භුක්ති විඳීමට ඇති වී තිබෙන බාධාවන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම.
2. යුද සමය තුළ හා පශ්චාත් යුද සමය තුළ සමාජ සම්මතයන් විපරිවර්තනයට ලක්වී ඇති ආකාරය සහ එවැනි සමාජ සම්මත වලින් තමන් ආරක්ෂා කර ගැනීමට කාන්තාවන් භාවිතයට ගත් උපක්‍රමයන් හඳුනා ගැනීම
3. කාන්තාවන් තම මූලික අයිතීන් සහ නිදහස භුක්ති විඳීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතා ප්‍රදර්ශනය කරන ජාතික මට්ටමේ නිර්දේශයන් බලපාන ආකාරය විමසා බැලීම.

සහභාගිත්ව ප්‍රවේශය අනුගමනය කරමින් මෙම පර්යේෂණය සිදු කර ඇත. එහි ඉලක්කගත ප්‍රදේශය වන උතුරු පළාතේ සමාජ කොටස්කරුවන්ගේ සහභාගිත්වය සහ සහයෝගයෙන් පැවැත්වූ මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික මෙන්ම ද්විතීක මූලාශ්‍ර වලින් දත්ත රැස් කෙරුණි. මේ වෙනුවෙන් සහභාගී වූ පුද්ගල ගණන 532 කි. දත්ත රැස්කිරීමට අදාල ප්‍රශ්ණාවලිය සකසන ලද්දේ LST පර්යේෂණ කණ්ඩායම විසිනි. එම කාර්යය වෙනුවෙන් උතුරු පළාත් සමාජ කණ්ඩායම් සමග අඛණ්ඩව සිදු කෙරුණු සාකච්ඡාවක් ඇසුරෙන් ලද තොරතුරු පාදක විය. උතුරු පළාතෙන් තෝරාගත් 51 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් දත්ත රැස් කිරීමට සහභාගී විය. ඊට අමතරව සම්මුඛ සාකච්ඡාවට බඳුන් කළ අය අතරට උතුරු පළාතේ තෝරාගත් ආගමික නායකයින්, වියතුන් සහ මානව හිමිකම් ක්‍රියාදරයින් ද එක් වූහ. තව ද වැන්දඹු කාන්තාවන්, ආබාධ සහිත කාන්තාවන් ලිංගිකත්වය සහ ලිංගිකත්වය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයන් ගෙන් බැට කෑ කාන්තාවන් වැනි විශේෂිත කණ්ඩායම් සමග මධ්‍යගත කණ්ඩායම් සාකච්ඡා සිදුකෙරුණි. මේ අනුව පර්යේෂණය සඳහා දත්ත රැස් කිරීමට ප්‍රශ්ණාවලිය, සම්මුඛ සාකච්ඡා සහ මධ්‍යගත කණ්ඩායම් සාකච්ඡා වැනි ක්‍රමවේද භාවිත කොට තිබුණි.

මෙම පර්යේෂණයේ පළමු පරිච්ඡේදය වෙන්කර ඇත්තේ හැඳින්වීම සඳහාය. එහි ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව, සමාජ සම්මතයන්, ස්ත්‍රී පුරුෂ භාවය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංකල්ප විමසා බැලෙන අතර කාන්තාවන්ට එරෙහිව සිදු කෙරෙන ප්‍රචණ්ඩත්වයන් මෙන්ම පොදු කටයුතු වල සහභාගිවීමට ඔවුන්ට ප්‍රමාණවත් ඉඩකඩ වෙන් නොකිරීම යන කරුණ පදනම් කරගනිමින් ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව සහතික වී නොමැති බව සනාථ කර ඇත. එපමණක් නොව, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහතික කිරීම සඳහා රටක් වශයෙන් අපට තිබෙන ජාතික සහ අන්තර්ජාතික බැඳීම් විග්‍රහ කරයි. අවසාන වශයෙන් මෙවැනි සමාජ සම්මතයන් නීතිය කෙරෙහි ඇති කරන බලපෑම විමසිල්ලට හසු කර ඇත.

දෙවන පරිච්චේදය තුළින් සමාජ සම්මතයන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව පිළිබඳ ජාතික, කලාපීය මෙන්ම අන්තර්ජාතික පර්යේෂණ සහ අධ්‍යනයන් තර්කානුකූලව විශ්ලේෂණය කෙරේ. මෙම සාහිත්‍ය සමාලෝචන කොටසෙහි සමාජ සම්මතයන් හි ස්වභාවයන්, ඒවා සමාජය තුළ පැලපදියම් වීමට හේතු සහ එවැනි සම්මතයන් හා ආගමික සිද්ධාන්ත අතර පවතින සම්බන්ධතා විග්‍රහ කර ඇත. විශේෂයෙන්ම කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය භූමිකා, "පතිවත" සහ යුද්ධය හේතු කොටගෙන සමාජ සම්මතයන් හි ඇති කරනු ලබන වෙනස්කම් පිළිබඳව විශ්ලේෂණයක් ද එහි ඇතුළත්.

තෙවන පරිච්ඡේදයෙන් විමසා බැලෙන්නේ පර්යේෂණ ක්‍රමවේදයයි. එහිදී පර්යේෂණ ගැටලුව, පර්යේෂණය සිදු කිරීමේ අරමුණු, දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය සහ දත්ත රැස් කිරීමේ මෙවලම් ඇතුළු පර්යේෂණ ක්‍රමවේදයේ සියලු කොටස්ය පුළුල් ලෙස විවරණය කර ඇත.

සිව්වන සහ පස්වන පරිච්ඡේදයන් තුළින් පර්යේෂණයේ නිගමන ප්‍රකාශයට පත් කර ඇත. උතුරු පළා තේ සෑම දිස්ත්‍රික්කයකම වැඩි වශයෙන් විද්‍යාමාන වන ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතා පෙන්නුම් කරන සමාජ සම්මතයන් අතුරින් ඉහළින්ම පවතින සම්මතයන් දහයක් ද, උතුරු පළාතේ සමස්තයක් වශ

යෙන් දක්නට ලැබෙන එවැනිම සමාජ සම්මතයන් දහයක් ඇතුළත් ලැයිස්තුවක්ද සිව්වන පරිච්ඡේදය ට ඇතුළත් කර ඇත. තවද, ලැයිස්තුගත කර ඇති මෙම සමාජ සම්මතයන් දහයේ ප්‍රබල බව SNAP ක්‍රමවේදය යොදාගනිමින් අධ්‍යයනය කොට සැකසූ ප්‍රතිකරණ අනුපිළිවෙළ ද, වර්ගීකරණය කළ දත්ත පදනම් කරගනිමින් සිදුකර ඇති විශ්ලේෂණයක් ද එහි දක්නට ලැබේ. මෙම සමාජ සම්මතයන් විවිධ වූ ආගමික, විවිධ වූ අධ්‍යාපන මට්ටම් සහිත සහ විවිධ වයස් කාණ්ඩවල පසුවන අය අතර කොතරම් දුරට ස්ථාවර ව පවතී දැ යි මෙම පරිච්ඡේදයෙන් සොයා බැලීමක් කර ඇත. ස්ථාවර භාවයට හේතු විමසන අතර ඒ සඳහා බලපෑම් එල්ල කරන පුද්ගලයන් හඳුනාගනිමින් අවසානයේදී එවැනි සමාජ සම්මතයන් නිසා කාන්තාවන්ගේ මූලික අයිතීන් මෙන්ම නිදහස බුක්ති විඳීම කෙරෙහි කුමන ආකාරයේ බලපෑමක් එල්ල වන්නේදැයි තර්කානුකූල විශ්ලේෂණයක් ද මෙම පරිච්ඡේදය තුළින් සිදුකර ඇත.

පස් වන පරිච්ඡේදයෙන් අවධාරණය කර ඇත්තේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතා ප්‍රදර්ශනය කරන නිර්දේශයන් කාන්තාවන්ගේ මූලික අයිතීන් සහ නිදහස බුක්ති විඳීම කෙරහි බලපාන ආකාරයයි. තවද, යුද සමය තුළත් පශ්චාත් යුද සමය තුළත් සමාජ සම්මතයන්හි කුමන විදිහේ බලපෑමක් ඇතිවන්නේ දැයි පරීක්ෂා කරයි.

අවසන් පරිච්ඡේදය වෙන්ව ඇත්තේ මෙම පර්යේෂණයේ නිගමන සංක්ෂිප්ත නිර්දේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීමටය. ඒ අතර අධිකරණ පද්ධතිය, නීති ක්ෂේත්‍රය, රාජ්‍ය අංශය සහ සිවිල් සමාජ ක්‍රියාධරයින් යනාදී ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නිර්දේශ ලබාදී තිබේ.

**නිගමන / දළ විශ්ලේෂණය**

උතුරු පළාත මුල් බැස තිබෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතා පෙන්නුම් කරන සමාජ සම්මතයන් 10 මෙහි පහත පෙළගස්වා තිබේ. මෙහි දක්වා ඇති අනුපිළිවෙල මගින් එහි ප්‍රබල බව අවබෝධයට ගත හැකිය. ප්‍රබල බව මැන බැලීම සඳහා SNAP පර්යේෂණ ක්‍රමවේදය භාවිත කොට ඇත.

1. කාන්තාවන්/ ගැහැණු ළමුන් පොදු ස්ථානවල වැඩිපුර කතා කිරීම නොකළ යුතුය.
2. ඕනෑම ආකාරයේ දුකක් වුවද එය විඳ දරා ගනිමින් පවුල් ජීවිතය ආරක්ෂා කර ගැනීමට බිරිඳ කටයුතු කළ යුතුය.
3. කාය ශ්‍රමය වැඩි වශයෙන් අවශ්‍ය රැකියාවන්හි යෙදවිය යුත්තේ පිරිමින් පමණි.
4. දරුවන් රැක බලා ගැනීම කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යයකි.
5. ආහාර පිළියෙල කිරීම සහ ගෙදර දොරේ වැඩ කටයුතු ප්‍රධාන වශයෙන් කළ යුත්තේ කාන්තාවන්ය.
6. කාන්තාවන් / ගැහැණු ළමුන් පොලිස් ස්ථාන වෙත පැමිණිලි කිරීමට නොයා යුතුය.
7. කාන්තාවන් ස්වාමිපුරුෂයා ට එරෙහිව පැමිණිලි නොකළ යුතුය.
8. කාන්තාවන්/ ගැහැණු ළමුන් ලිංගික හිංසනයන්ට එරෙහිව පැමිණිලි කිරීමට පවුලේ අය අනුබල නොදිය යුතුය.
9. ලිංගික හිංසනයන්ට ලක්ව පතිවත අහිමි වූ කාන්තාවන්
10. කාන්තාවන්/ ගැහැණු ළමුන් ලිංගික හිංසනයන්ට එරෙහිව පැමිණිලි නොකල යුතුය.

දරුවන් රැක බලා ගැනීම, ආහාර පිළියෙල කිරීම සහ ගෙදර වැඩ කටයුතු ප්‍රධාන වශයෙන් කාන්තාවන්ගේ කෘතයන් බවට පත්වී ඇති අතර බිරිඳ කෙසේ හෝ පවුල් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතු බවටත් කිසිවිටෙකත් ස්වාමිපුරුෂයාට එරෙහිව පැමිණිලි සිදුනොකළ යුතු බවටත් වන සම්මතයන්ට වැඩි බර තැබීමක් කාන්තාවන් තුළ දක්නට ලැබේ. කාය ශ්‍රමය අධික රැකියාවන්හි පිරිමින් පමණක් නිරත කරවීම, ලිංගික හිංසනයන්ට ලක්ව පතිවත අහිමි වූවන්, කාන්තාවන්/ ගැහැණු ළමුන් පොලිස් ස්ථාන වෙත පැමිණිලි කිරීමට නොයා යුතුය,කාන්තාවන්/ ගැහැණු ළමුන් පොදු ස්ථානවල වැඩිපුර කතා කිරීම නොකළ යුතුය, සහ කාන්තාවන්/ ගැහැණු ළමුන් ලිංගික හිංසනයන්ට එරෙහිව පැමිණියේ නොකල යුතුය වැනි සමාජ සම්මතයන්ට වැඩි බර තැබීමක් පිරිමින් තුළ දක්නට ලැබේ. කාන්තාවන් වැඩි බර තැබීමක් පෙන්නුම් කරන සමාජ සම්මතයන් හරහා ගැහැනිය බොහෝදුරට පවුල් ඒකකයට සීමා කරවන සහ යුගදිවියට විශේෂත්වයක් දක්වන බවක් පෙනේ. එසේම, කාන්තාවන්ගේ පතිවත හා යුක්තිය ලැබීමට ඔවුන්ට ඇති ප්‍රවේශය සීමා කරන සමාජ සම්මතයන්ට පිරිමින් වැඩි බරක් තබා ඇත.

ආහාර පිළියෙල කිරීම, ගෙදර වැඩ කටයුතු, බිරිඳ කෙසේ හෝ පවුල් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතු බව සහ දරුවන් රැක බලා ගැනීම වැනි සමාජ සම්මතයන්ට පොදුවේ සෑම ආගමික සමාජයක් තුළම සැලකිය යුතු ඉඩක් වෙන්ව තිබේ. මෙම ප්‍රවණතාව සියලු වයස් කාණ්ඩවල පසුවන්නන් තුළ ද දක්නට ලැබේ. ඊට හේතුව මෙවැනි සමාජ සම්මතයන් ගේ උපත සිද්ධ වන්නේ පවුල් ඒකකය තුළ ය. ගැහැණු ළමුන් කුඩා කල සිටම ඉයුම් පියුම්, නිවස පිරිසිදුව තබා ගැනීම සහ දරුවන් රැකබලා ගැනීමට පුහුණු කෙරේ. පාසල තුළ ද ගෑනු ළමුන් ඉවුම් පියුම් කලාව දන්න, ගෙදර දොරේ වැඩ කිරීමට හැකි පිරිසක් බවට සිටිය යුතුයැයි විවිධ අන්දමින් බල කෙරේ. මෙලෙස පවුල සහ පාසල වැනි සංස්ථාවන් හරහා සම්ප්‍රේෂණය කෙරෙන මෙම සමාජ සම්මතයන්ට සමාජය තුළ සවිමත්ව හා බහුතරය තුළ පැලපදියම් වීමටත් අවස්ථාව සැලසී ඇත.

සමාජ නොසලකා හැරීම් සහ සමාජ දඬුවම් වැනි සාධක මෙවැනි සමාජ සම්මතයන්ගේ පැවැත්ම තහවුරු කරන මූලික හේතු බවට පත්ව ඇත. මෙම පර්යේෂණයට සහභාගී වූවන්ගෙන් 60% වැඩි පිරිසක් කියා සිටියේ තමන් සමාජ දඬුවම් වලට ඇති බිය නිසා මෙම සම්මතයන් පිළිපදින බවයි. කාන්තාවක් ලිංගික හිංසනයට හෝ අතවරයකට ලක්වන විට තීව්‍ර ලෙස සමාජ නොසලකා හැරීමට ලක් වන බව පර්යේෂණ නිගමන වලින් හෙළි වී තිබේ. එසේම කාන්තාවන්ගේ පවුල් ජීවිතය හා මෙම සමාජ සම්මතයන් අතර අවියෝජනීය බැඳීමක් පවතින්නේය. ඔවුන් මෙම සම්මතයන් කඩ කළහොත් යුගදිවිය හෝ පවුල් ජීවිතයට බලපෑමක් එල්ල වන හෙයින් ඒවා පිළිපැදීමෙන් වියුක්ත වීමට ඇති ඉඩකඩ ඇහිරී තිබේ.

නිරීක්ෂණය වී ඇති කරුණු අනුව මෙම සමාජ සම්මතයන්ගේ පැවැත්ම කෙරෙහි ආගමික නායකයන්ගේ බලපෑම ඉතා අල්පය. කුටුම්බය තුළ එහි පැවැත්ම තහවුරු කිරීම සඳහා පියාට වඩා මව ගෙන් ලැබෙන අනුබලය තරමක් වැඩිය. ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතා ප්‍රදර්ශනය කරන සම්මතයන්ගෙන් වින්දිතයන් බවට පත් වන්නේ කාන්තාවන් වුව ද, එම සම්මතයන් පිළිපැදීමේ දී අනන්‍ය සහ අනාගත පරපුරට ඒය සම්ප්‍රේෂණය කරනු ලබන්නේ ඔවුන් විසින් ම ය. පාරම්පරික ජන සම්මතයන්, සංස්කෘතික මූලධර්ම සහ පාරම්පරික සිරිත් විරිත් මෙවැනි අසමානතා හඟවන සම්මතයන්ගේ පැවැත්ම තහවුරු කරන ප්‍රධාන සාධක බවට පත්වේ. තවද, ආරක්ෂාව සම්බන්ධයෙන් යොමුකරන අවධානය සහ අපරාධ නඩු විධාන සංග්‍රහය වැනි නීති වල පවතින හිඩැස් එහි පැවැත්ම තහවුරු කරයි. නිදසුනක් වශයෙන් ලිංගික හිංසනයන්ට එරෙහිව පැමිණිලි කළත් යුක්තිය නොලැබීම හෝ ප්‍රමාදවී ලැබීම, රහස්‍යභාවය ආරක්ෂා කිරීමට අපොහොසත් වීම සහ වින්දිතයන් තවදුරටත් පීඩාවට පත්වීම වැනි අපරාධ නීතියේ පවතින හිඳැස් නිසා කාන්තාවන් / ගැහැණු ළමුන් ලිංගික හිංසනයන්ට එරෙහිව පැමිණිලි නොකළ යුතුයි යන සමාජ සම්මතය බලගන්වයි.

සාරාංශ කොට ඇති සමාජ සම්මතයන් 10 මඟින් කාන්තාවන්ගේ භූමිකාව පවුල තුළට සංකෝචනය කරන අතර "ගුණවත් කාන්තාව" සහ "පතිනිය" වැනි සංකල්ප ඔවුන්ගේ නිදහස සහ අයිතීන් සීමාකරයි. කාන්තා වන්ගේ භූමිකාව පවුලට පමණක් සීමා කරන බැවින් ඔවුන්ගේ ආර්ථික නිදහසට බලපෑම් ඇතිවීම, ඔහුන්ට එරෙහිව සිදුකෙරෙන ප්‍රචණ්ඩත්වයන් වර්ධනය වීම, ඔවුන්ගේ දැනුම සහ නිපුණතාවන් හීනවීම සහ ඔවුන්ගේ සෞඛ්‍යය ද පිරිහීමට ලක් වේ. "ගුණවත් කාන්තාව" සහ "පතිනිය" වැනි සංකල්ප බලයෙන් ඔවුන් මත පැටවීම හේතුවෙන් ඔවුන්ට යුක්තිය සඳහා ළඟාවීමට ඇති ප්‍රවේශය, වධහිංසාවට ලක් නොවී සිටීමට ඇති නිදහස, සිතීමේ නිදහස සහ හෘද සාක්ෂියේ නිදහස පමණක් නොව ගමනාගමනයට ඇති නිදහස ද උල්ලංඝනය කෙරේ. ගුණවත කාන්තාවන් සහ පතිවත රකින ස්ත්‍රීහු ලිංගික හිංසනයන්ට ගොදුරු නොවෙති යන සමාජ සම්මතයෙන් සිදුකර ඇත්තේ එවැන්නකට ගොදුරු නොවී සිටීමේ වගකීම ඔවුන් වෙත පැවරීම ය. අනෙක් අතට ලිංගික හිංසනයන්ට ගොදුරු වන කාන්තාවන් සමාජ අවඥාවට ලක් කිරීම ද සිදුවෙයි. එම නිසා ලිංගික හිංසනයන්ට ගොදුරු වන කාන්තාවෝ ඊට එරෙහිව පැමිණිලි කිරීමට හෝ අන් අය දැනුවත් කිරීමට මැලිකමක් දක්වති.

සමාජය තුළ දක්නට ලැබෙන වෙනත් ආකාරයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතා ඇති සමාජ සම්මතයන් කාන්තාවන්ගේ කම්කරු අයිතීන් උල්ලංඝනය කරයි. තමන් කැමති වෘත්තියේ යෙදීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කොට ඇතත්, "රාත්‍රී වැඩ මුර බාර ගැනීමෙන් වැළකී සිටිය යුතුය", "වෙනත් පළාතක

නවාතැන් ගෙන රැකියාව කිරීමෙන් වැළකී සිටිය යුතුය", වැනි සමාජ සම්මතයන් ජන සමාජය තුල පැවතීම හේතුවෙන් ඔවුන්ගේ කම්කරු අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා වන ප්‍රවේශය ට බාධා එල්ල වෙයි. කාන්තාවන්ට සහ පිරිමින්ට සමාන වැටුප් නොගෙවීමත් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතා ඇති සමාජ සම්මතයන් වල ප්‍රතිඵලයකි. කෘෂිකර්මාන්තයට මුල් තැන හිමි වී ඇති කිලිනොච්චිය සහ මුලතිව් දිස්ත්‍රික්කවල කුලී කම්කරුවන් ලෙස ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම සේවයේ යොදවා ඇති නමුත්, කාන්තාවන්ට සාපේක්ෂව පිරිමින්ට වැඩි වැටුපක් ගෙවනු ලැබේ. රස්සාවට යෑමේ වගකීම පිරිමියා සතු ය යන සමාජ සම්මතය මෙම විෂමතාවට බලපා ඇත.

ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතා ප්‍රදර්ශනය කරන සමාජ සම්මතයන් කාන්තාවන්ගේ ආගමික නිදහස ප්‍රශ්න කරයි. ඒ තුළින් ආගමික විශ්වාසයන් හෝ ආගමික මූලධර්ම පිළිබිඹු කරන බැවිනි එහි බලපෑම ද අධිකය. ආගමික විශ්වාසයන් හා සමාජ සම්මතයන් බෙදා වෙන් කිරීම අසීරු බැවින්, යම් නිශ්චිත සමාජ පරිචයක්න් පිළිබිඹු වන්නේ ආගමික මූලධර්මය තුළින් ද නැතහොත් සමාජ සම්මතයන් තුළින් ද යන්න ගැටළු සහගතය. කාන්තාවන්ගේ ආගමික නිදහස ප්‍රශ්න කරන සමාජ පරිචයන් ආගමික විශ්වාසය යන ගණයට හෝ සමාජ සම්මතය යන ගණයට අයත් වුවද එමගින් කාන්තාවන්ගේ ආගමික අයිතිය උල්ලංඝනය වන බැවින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව අහිමි කරන බව පැහැදිලිය. රට තුළ පවතින සෑම ආගමික සමාජයක් තුළම කාන්තාව වෙනස් කමට ලක්වේ.

මෙම පර්යේෂණය යුද්ධයක් පසුකල පළාතක් තුළ සිදුකරන බැවින්, යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජ සම්මතයන් තුළ ඇති වී තිබෙන වෙනස්කම් ද විමර්ශනය කර ඇත. ගැටුම් පැවති කාලය තුළ අරගලය වෙනුවෙන් කාන්තාවන් ද බඳවා ගැනීමේ අවශ්‍යතාව උද්ගත වූ බැවින් විමුක්ති කොටි සංවිධානය විසින් තමන්ව සටන් කරුවන් වශයෙන් බඳවා ගන්නා ලද බව හිටපු කාන්තා සටන් කරුවන් පවසයි. එහි දී වෙඩි තැබීමේ පුහුණුව ඇතුළු පිරිමි සටන්කරුවන්ට ලබා දුන් සියලු පුහුණු කාන්තාවන්ටද ලබාදුන් බව සඳහන් වේ. ඒ දක්වා සාම්ප්‍රදායික භූමිකාවන්ට පණ පෙවූ තමන් ඉන් විතැන් වී සටන්කරුවන් යන භූමිකාවට පණ දුන් බව ඔවුහු අවධාරණය කරති. අසාමාන්‍ය වාතාවරණයක් උද්ගත වූ උතුරු පළාත තුළ කාන්තාවන් සම්ප්‍රදායික මානයන්ගෙන් වෙනස්ව ගමන්කිරීම අනුමත වූ අතර ජීවත් වීමේ උපක්‍රමයක් වශයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව පිළිගෙන ඇති බව මෙම අධ්‍යයනයෙන් පෙන්නුම් කෙරේ.

එහෙත්, යුද්ධය අවසන් වීමත් සමග සමාජය ක්‍රමයෙන් ප්‍රකෘති තත්ත්වයට පත්විය. පශ්චාත් යුද සමය තුළ කාන්තාවන් සාම්ප්‍රදායික භූමිකාවෙන් ඈත්වීම විවේචනයට බඳුන් වූ බව සඳහන් වුව ද, යුද්ධය නිසා සමාජ සම්මතයන් තුළ සාධනීය වෙනසක් ඇතිවිය. ස්ත්‍රීන් ගෘහමූලික පවුල් බිහිවීම, සිවිල් සමාජ සංවිධානවල මැදිහත්වීමෙන් කාන්තාවන් සවිබලගැන්වීම සහ වැන්දඹු කාන්තාවන් සුභ කටයුතු වල දී ඈත් කර තැබීමේ ප්‍රවණතාව තුරන් වීම ඒ අතර ප්‍රධාන වේ. යුද්ධයෙන් පසු උතුරු පළාතේ පතුලටම විහිදී තිබූ ස්ත්‍රී පුරුෂ සමාජ භාවයේ අසමානතා ඇති සමාජ සම්මතයන්හි නම්‍යශීලී බවක් උද්ගත වූවා මිස විපරිවර්තනය වීමක් සිදු වූයේ නැත. කාන්තාවන්ගේ මූලික අයිතීන් සහ නිදහස සහතික කිරීමට නම්, සමාජයේ මුල් බැසගත් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතා ඇති සමාජ සම්මතයන් විපරිවර්තනය විය යුතුය. එවැනි වෙනසක් ඇතිවීමට නම් සමාජය තුල පවතින සාම්ප්‍රදායික ජීවන රටාව වෙනසට භාජනය විය යුතුය. ජනතාවගේ චර්යාවන් මෙන්ම ආකල්ප වෙනස් කළ හැක්කේ සාම්ප්‍රදායික සම්මතයන් වෙනස් කිරීමෙන් වන අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානත්වය ඇති කිරීම තීරණය කරනු ලබන්නේ සාම්ප්‍රදායික ජීවන රටාව වෙනස් වීම තුළිනි. තනි පුද්ගලයන් තුළ මෙවැනි වෙනසක් ඇති කිරීම අසීරු බැවින් සැලසුම්ගත දීර්ඝකාලීන මැදිහත්වීමක් හරහා එය ජය ගැනීමට හැකියාව තිබේ.

ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව මූලික අයිතියක් හැටියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇතත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වැනි ව්‍යවස්ථාව බලාත්මක වීමෙන් එය බලරහිත වන්නේය. දීර්ඝ කාලයක් තිස්සේ සංශෝධනයන්ට ලක් නොවුණු සමහර නීති දක්නට ලැබේ. නිදසුනක් වශයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය, සාක්ෂි ආඥා පනත සහ විවාහ හා දික්කසාද නීතිය සඳහන් කළ හැකිය. නීති පනවා ඇත්තේ

පුද්ගලයන් ආරක්ෂා කිරීමට මිස ඔවුන් වෙනස් කමට ලක් කිරීමට නොව. කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ අසමානතා තුරන් කිරීමේ ප්‍රඥප්තිය මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතා පෙන්නුම් කරන නීති සංශෝධනය කළ යුතුයැයි සාමාජික රටවලින් ඉල්ලා ඇත. එම සම්මුතිය අපරානුමත කර ඇති දේශයක් වශයෙන් ශ්‍රී ලංකාවට ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතාවට තුඩුදෙන නීති සංශෝධනයට ලක් කිරීමට බැඳී සිටියි. කාන්තාවන්/ ගැහැණු ළමුන් ලිංගික හිංසනයන්ට එරෙහිව පැමිණිලි සිදු නොකළ යුතු බවට වන සමාජ සම්මතයක් පවතී. එසේ කිරීමෙන් පවුලේ ගෞරවයට කැළලක් ඇතිවන බවත් ව්‍යතිරේකයක් වශයෙන් "රහස්‍යභාවය ආරක්ෂා වන්නේ නම්" පැමිණිලි කළ හැකි බවත් සඳහන් වේ.

ලිංගික හිංසනය සහ ලිංගික අතවරය වැනි සිද්ධියෙන් සමග බැඳී පවතින අවනම්බුව හේතුවෙන් පීඩාවට පත්වන කාන්තාවන් / ගැහැණු ළමුන් සහ ඔවුන්ගේ පවුල් එවැනි සිද්ධි ප්‍රසිද්ධියට පත්කිරීමට ඉදිරිපත් වන්නේ නැත. එම නිසා මේ ආ සම්බන්ධ නඩු විභාග පුද්ගලිකව පැවැත්වීමටත් ඒ සඳහාම වෙන්වූ අධිකරණ ස්ථාපිත කිරීමටත් කටයුතු කළ යුතුය. එසේම එම වින්දිතයන්ගේ නම් සහ තොරතුරු නඩු තීන්දුවට ඇතුළත් කිරීමෙන් වැළකී සිටිය යුතුය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතා ඇති සමාජ සම්මතයන් සිසුන් අතරට සම්ප්‍රේෂණය කිරීමේ මාධ්‍යයක් වන්නේ පාසල් පෙළ පොත් ය. පවුලට අමතරව ළමුන්ගේ අන්තර් ක්‍රියා වැඩි වශයෙන් පෝෂණය වන්නේ පාසල තුළිනි. පාසලෙහි උගන්වන විෂය කරුණු දරුවන් තුළ නොමැකෙන සටහන් බවට පවතින හෙයින් පෙළ පොත්වල ඇතුළත් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතා පෙන්නුම් කරන විෂයන් අනිවාර්යෙන් ඉවත් කළ යුතුය. ඒ වෙනුවට සමානතාව අගයන විෂයන් ඇතුලත් කිරීම වැදගත් වේ. එයින් නොනැවතී විදුහල්පතිවරුන්, ආචාර්ය මණ්ඩලය සහ සෙසු කාර්ය මණ්ඩලයට ද ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානතා පිළිබඳ විශේෂ පුහුණුවක් ලබාදෙමින්, පිරිමි දරුවන් ආහාර පිළියෙල කිරීමේ කලාව ගෙදර දොරේ වැඩ කටයුතු පිළිබඳ ශික්ෂණයට ලබන බව සහතික කොට එවැනි විෂය නිර්දේශ ඇතුළත් ප්‍රායෝගික තාක්ෂණ විෂය 06 ශ්‍රේණියෙන් පසු කුමන හෝ ශ්‍රේණියක් සඳහා අනිවාර්ය කිරීම.

ස්ත්‍රී අනන්‍යතාව සමග ඇතිවන නොහැකියාව සමඟ ස්වාමිපුරුෂයා අහිමිවීම නිසා වැන්දඹු තත්ත්වයට පත් වීම මෙන්ම හිටපු කාන්තා සටන්කරුවන් වැනි අනන්‍යතා සම්බන්ධවීමේදී බරපතළ වෙනස්කමකට සහ තමන්ටම ආවේණික ගැටළු වලට මුහුණ දීමට සිදුවේ. මෙවැනි තත්වයේ පසුවන කාන්තාවන් ග්‍රාම නිලධාරී කාර්යාලය, උපදිසාපති කාර්‍යාලය සහ දිසාපති කාර්යාලයෙන් තමන්ට අවශ්‍ය සේවාවන් ලබා ගන්නා බැවින් එහි සේවය කරන නිලධාරීන් හට ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සංවේදීතාව දැනෙන ආකාරයේ පුහුණුවක් ලබා දිය යුතුය. එම නිලධාරීන් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානතාව ආරක්ෂා වන අයුරින් කටයුතු කරන්නේද යන්න අධීක්ෂණය කිරීමට යාන්ත්‍රණයක් ආයතනික මට්ටමෙන් සැකසිය යුතුය.

අවසාන වශයෙන්, පුද්ගලයන් තුළ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතා ඇති සමාජ සම්මතයන් ඉවත් කිරීමේ අරමුණින් වීදි නාට්‍ය, චිත්‍රපට සහ කතිකාවන් සංවිධානය කිරීම, කාන්තාවන්ගේ මූලික අයිතීන් හා නිදහස සමාජ ප්‍රගමනයට දායක වන්නේ කෙසේද යන්න විමසීමේ දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම මෙන්ම කාන්තාවන් සවිබල ගැන්වීමට සහ රැකියා අවස්ථාවන් ළඟාකර ගැනීමට අවශ්‍ය උපකාර ද ලබා දිය යුතුය. උතුරු පළාතේ ක්‍රියාත්මක වන රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවලට ඊට අදාළ කටයුතු ආරම්භ කිරීමේ හැකියාව පවතී. හඳුනාගෙන තිබෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතා පෙන්නුම් කරන සමාජ සම්මතයන් විපරිවර්තනය කිරීම සඳහා මැදිහත්වීමට මෙම පර්යේෂණයේ නිගමනයන් උපකාරී වේ යැයි බලාපොරොත්තු වෙමු.

# 1 වන පරිච්ඡේදය

## 1 පර්යේෂණය හැඳින්වීම

### 1.1 හැඳින්වීම

දොර අසළ ද වතුවල ද උද්‍යානයන්හි ද
ඔබගේ කාලය මිඩංගු  නොකරන්න
ගේ දොර වැඩ කටයුතු වලදී අලස නොවන්න!

ගෙදර දෙවිවරු ආරක්ෂාකිරීමට අතපසු නොකරන්න
ස්වාමි පුරුෂයාගේ එකඟතාවෙන් තොරව තම කුස උපන් දරුවාට පවා
කිසිවක් නොදෙන්න!

ස්වාමි පුරුෂයාගේ අවධානය වෙනත් දිශාවකට යොමු වුව ද
නිහඬ වන්න! ඔබගේ කඳුළු පමණක්
ඔබගේ දුකෙහි සලකුණ වීමට ඉඩදෙන්න!

ඔබේ සැමියා කෑමට  ආශා දෑ සොයන්න
ඔහු නිරන්තරයෙන් තෘප්තිමත් දැයි බලන්න
ඔහුව  පෝෂණය කර මවක් මෙන් ඔහුගේ යහපැවැත්ම සහතික කරන්න!

සැමට පසුව නිදා සැමට පෙර අවදිවන්න
ස්වාමි පුරුෂයා අවදිවන විට ඔහු අසල සිටින්න
ස්වාමි පුරුෂයා කෝප වුව ද
ඔබ කෝපයෙන් කතා නොකරන්න!

**(සිය දියණිය සරණපාවා දීමේදී පියෙකු විසින් ඇයට ලබාදෙන ලද**
**ඔවදන් ග්‍රන්ථයේ කාව්‍යශේකර ඉංග්‍රීසි පරිවර්තනය ඇසුරෙනි)**

කෘෂිකාර්මික ආර්ථිකයක් මත පදනම් වූ සාම්ප්‍රදායික ශ්‍රී ලංකාවේ කාන්තාවන් ප්‍රජනන කාර්යය සිදුකරන්නියන් වශයෙන්ද දරුවන් රැකබලා ගනු ලබන අය වශයෙන්ද සංස්කෘතිය හා සභ්‍යත්වය ආරක්ෂා කරන්නියන් වශයෙන්ද පමණක් සැලකුණි. ආගමික සහ සංස්කෘතික මූලිකාංග මගින් සීමා කරන ලද කාන්තාවන්ගේ කාර්යභාරය පවුල නම් ඒකකය තුළට පමණක් සීමා වී තිබූ අතර සියලු ආගම් හා ජාතීන්ට අයත් කාන්තාවන් සම්බන්ධයෙන් මෙය පොදු ලක්ෂණයක් ද විය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගම වූ බෞද්ධ ආගමෙහි පොදු අදහස වන්නේ 'පෙර භවයෙහි පව් කරන ලද තැනැත්තන් කාන්තාවන් වශයෙන් උපදින බවත් මතු භවයෙහි හෝ පුරුෂයෙකු වශයෙන් ඉපදීම කාන්තාවන්ගේ උත්තරීතර අරමුණ වන බවත්'ය.[1] හින්දු ආගමික මූලධර්ම හා ග්‍රන්ථයන් ද 'පෙර භවයෙහි පව් කරන ලද්දන්' කාන්තාවන් වශයෙන් උපදින බවට වූ අදහස අවධාරණය කරයි.[2] ඉස්ලාම් ආගමික මූලධර්ම මගින් ද කාන්තාවන් සඳහා ලබාදී ඇත්තේ දෙවන ස්ථානයයි.[3] ක්‍රිස්තියානි ධර්මයද කාන්තාවන් හට  කියා සිටින්නේ තම ස්වාමිපුරුෂයන්ට යටත්ව සහ කීකරු වන සිටින ලෙසයි.[4]  මෙලෙස ආගමික හා සංස්කෘතික මූලධර්මයන්ට අනුව සියලු ආගමික හා වාර්ගික කණ්ඩායම් තුළ කාන්තාවන් සඳහා ලබාදී ඇත්තේ දෙවන ස්ථරයකි.

*1* Kumari Jayawardena, Feminism and nationalism in the Third World in the 19th and early 20th centuries Emancipation and Subordination of Women in Sri Lanka (Verso Books 2016) 109

2 රාමානුජම් ශ්‍රීපාස්සම්.

*3* Supra 1

*4* Ephesians 5:24- "Now as the church submits to Christ, so also wives should sub mit in everything to their husbands"

කෙසේ නමුත්, 1980 ගණන්වල දී ඇති වූ දේශපාලනික, සමාජීය සහ ආර්ථික සාධකයන්හි ප්‍රතිඵලයක් වශයෙන් කාන්තාවන් සම්බන්ධයෙන් වූ මෙම සාම්ප්‍රදායික මතවාදය වෙනස් වීමට පටන් ගැනුණි. 1980 වකවානුවේදී සහ ඊට පූර්ව කාලයේ දී සිදුවූ ආයුධ සන්නද්ධ කලකෝලාහලයන් හි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ තරුණ පිරිස් ඝාතනය කෙරුණු අතර බොහෝ පිරිස් අතුරුදහන් කෙරුණි. ආයුධ සන්නද්ධ කලකෝලාහලයන්හි ප්‍රතිඵල කාන්තාවන් කෙරෙහි විශාල බලපෑම් එල්ල කරන ලදී. ඉන් අනතුරුව කාන්තාවන්ගේ සමාජීය සහ දේශපාලනික මැදිහත්වීම වර්ධනයවීමට පටන් ගැනුණි. කාන්තාවන් තමන්ට සිදු වූ අසාධාරණයන් වෙනුවෙන් යුක්තිය ඉල්ලා සටන් කිරීම සඳහා බොහෝ සංවිධාන පිහිටුවීමට පටන් ගත්හ. එලෙස ප්‍රථමයෙන් පිහිටුවාගත් එවන් වැදගත්කමකින් යුත් කාන්තා පිබිදීම් ව්‍යාපාරය වශයෙන් 1982 වසරේදී පිහිටුවන ලද කාන්තා ක්‍රියාකාරී කමිටුව පෙන්වා දිය හැකිය. ඉන් අනතුරුව ප්‍රාදේශීය හා ජාතික තලයන්හි කාන්තා නායකත්වයන් යටතේ බොහෝ ව්‍යාපාර ආරම්භ විය. එසේම, 1970 වකවානුවේදී ආර්ථික ව්‍යුහය ගොඩනැගීමේ අරමුණින් එක්සත් ජාතික පක්ෂය විසින් හඳුන්වා දෙන ලද නිදහස් වෙළඳ කලාප, ඇඟලුම් කර්මාන්ත ශාලා යනාදියෙහි ප්‍රතිඵලයක් වශයෙන් කාන්තාවන් විසින් ආර්ථිකයට දෙනු ලබන දායකත්වය වර්ධනය විය. 1970 සහ 1980 වකවානුවන්හි දී සිදුවූ මෙවන් ආර්ථික, සමාජීය සහ දේශපාලනික වෙනස්කම් මත කාන්තාවෝ තම සාම්ප්‍රදායික කාර්යභාරයන්ට ඔබ්බෙන් පොදු ජීවිතයට දායකවීමට පටන් ගත්හ. කෙසේ නමුත්, කාන්තාවන් පිළිබඳව පැවති සාම්ප්‍රදායික මතවාදයන් මුළුමනින්ම වෙනස් නොවූ අතර ඒවා මේ වන විට ද ඔවුන්ගේ අයිතිවාසිකම් සහ නිදහස කෙරෙහි සැලකිය යුතු බලපෑමක් එල්ල කරයි. සංස්කෘතිය හා සම්ප්‍රදායන් විසින් ආරක්ෂා කරනු ලබන සහ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රතිමාන කවරේද, ඒවා කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා නිදහස කෙරෙහි බලපෑම් එල්ල කරනු ලබන්නේ කවර අයුරින්ද යන්න සොයා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

ශ්‍රී ලංකාව වනාහි සිංහල, දමිළ, මුස්ලිම් සහ බර්ගර් යන ජනවර්ග හතරින් ද බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි සහ ඉස්ලාම් යන ආගම් වලින් ද සමන්විත ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයකි. දැනට බලාත්මකව පවතින රටේ උත්තරීතර නීතිය වූ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් එය පාලනය වේ. වත්මන් ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් කාන්තාවන් 51.6%ක්ද පුරුෂයින් 48.4%ක්ද සිටින බව ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ නිල දත්ත මඟින් පෙන්නුම් කරනු ලැබේ.[5] සමස්ත ජනගහනයෙන් අඩකටත් වඩා කාන්තාවන් සිටින මෙරටේ, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ කාන්තා අයිතිවාසිකම් හා නිදහස කොතෙක් දුරට තහවුරු වී තිබේද යන්න දශක ගණනාවක් පුරා විවාදයට බඳුන්වන කරුණක් බවට පත්ව තිබේ.

විශේෂයෙන්ම, 1971 කාල වකවානුවේ සිට විවිධ ප්‍රචණ්ඩ ක්‍රියා,[6] වාර්ගික ගැටුම්[7] සහ ආගමික ගැටුම්[8] සිදුවන්නාවූ "ප්‍රචණ්ඩත්වයෙන් සපිරි දේශයක්" ලෙසට අනන්‍යතාවක් ලබා ඇති ශ්‍රී ලංකාවේ, කාන්තා අයිතිවාසිකම් සහ නිදහස කුමන ආකාරයේ ප්‍රවණතාවකට ලක්වී තිබේද යන්න සලකා බැලීම වටී. 1980 දශකයේ දී පමණ ආරම්භ වී 2009 වසරේදී යුධ හමුදා විජයග්‍රහණයත් සමඟ අවසන් වූ ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ගැටුම, රටෙහි, විශේෂයෙන්ම, උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි විවිධ මට්ටමේ විවිධ බලපෑම් ඇතිකර තිබුණි. එකී බලපෑම් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ ඒ ආශ්‍රිත ප්‍රායෝගික අංශ කෙරෙහි සැලකිය යුතු බලපෑමක් එල්ල කළ හැකි තීව්‍රතාවකින් යුක්ත වූ බව සඳහන් කළ හැකි අතර කාන්තා ගෘහමූලික පවුල් සංඛ්‍යාවෙහි ඇතිවූ ක්ෂණික වර්ධනය එම බලපෑම් හි කල් පවත්නා සහ ස්ථිරසාර ප්‍රතිඵලයක් ලෙස පෙන්වා දිය හැකිය. 1981 කාලවකවානුවේදී 17.4%ක් වූ කාන්තා ගෘහමූලික පවුල් සංඛ්‍යාව යුද්ධය අවසන් වන අවස්ථාවේ දී එනම්, 2009 වසරේදී 23.2%ක් ද,[9] 2012 වසරේදී 24.3%ක් ද[10] විය. 2016 වසර සඳහා වන සංඛ්‍යා

---

*5* ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, <http://www.statistics.gov.lk/GenderStatistics/StaticalInformation/Population/Population
SriLankaCensusYearSex> accessed 5 June 2021.

*6* 'Remembering and reflecting on the April 1971 insurrection' (Daily FT, 07 April 2021) <https://www.ft.lk/columns/Remembering-and-reflecting-on-the-April-1971-insurrection/4-715963> accessed 5 June 2021.

*7* 'Remembering Black July' (Tamil Guardian, 23 July 2020) <https://www.tamilguardian.com/content/remembering-black-july-0> accessed on 4 June 2021.

*8* 'Easter blasts in Sri Lankan hotels and churches kill at least 207' (Daily Mirror, 22 April 2019) <https://www.dailymirror.lk/Business-News/Easter-blasts-in-SriLankanhotels-and-churches-kill-at-   least-207/273-165725> accessed 7 June 2021Ñ 'The Sri Lankan Civil War and Its History, Revisited in 2020' (Harvard International Review, 31 August 2020) <https://hir.harvard.edu/sri-lankan-civil-war/> accessed 20 April 2021.

*9* ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, <http://www.statistics.gov.lk/GenderStatistics/StaticalInformation/SpecialConcerns/PercentageOfHouseholdHeadsBySex1981-2016> accessed 5 June 2021.

*10* *Ibid*

ලේඛන දත්ත අනුව මේවන විට ශ්‍රී ලංකාවේ කාන්තා ගෘහමූලික පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතය 25.8%ක් වේ.[11] ගෝලීය වශයෙන් සලකා බැලීමේදී කාන්තා ගෘහමූලික පවුල් බහුල වශයෙන් දක්නට ලැබෙන පළමු රටවල් දහය අතරේ ශ්‍රී ලංකාව නවවන ස්ථානය ලබා තිබීම මෙහිදී සැලකිල්ලට ගත යුතු කරුණක් වේ.[12]

අභ්‍යන්තර යුද්ධයෙන් පීඩාවට පත් ශ්‍රී ලංකාව තවමත් සංක්‍රාන්තික ක්‍රියාවලිය මුළුමනින්ම පසුකර නොමැත. ගැටුම් සහිත රටක සිට පශ්චාත් ගැටුම් සහිත රටකට සංක්‍රාන්ති ක්‍රියාවලිය සුමට හෝ රේඛීය ක්‍රියාවලියක් නොවේ. විශේෂයෙන්ම, යුද්ධයෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ උතුරු පළාත තවමත් එහි ප්‍රතිවිපාකයන්ගෙන් මිදී නොමැතිවීම මීට දියහැකි කදිම නිදසුනකි. මෙම සන්දර්භය තුළ, 2019 වසරේදී එල්ල කෙරුණු මරාගෙන මැරෙන පාස්කු ඉරිදා ප්‍රහාරය[13] දැනට පවතින බොහෝ ගැටළු තවදුරටත් තීව්‍ර කරන ලද අතර තවත් නව ගැටළු රාශියක් ද නිර්මාණය කර තිබේ. මෙවන් ප්‍රචණ්ඩ ක්‍රියා බොහෝ අවස්ථාවලදී ඍජුව හා වක්‍රව ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව කෙරෙහි බලපෑම් එල්ල කරන අතර විශේෂයෙන්ම ඒවා කාන්තාවන් කෙරෙහි විසමානුපාතික ලෙස බලපෑම් එල්ල කරයි. බොහෝ දුරට ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා වන උපාය මාර්ගික මෙවලම් වශයෙන් සමාජ ව්‍යූහයන් හා සමාජ ආයතන තුළ මුල් බැසගත් "සමාජ ප්‍රතිමාන" පවතී.

1960 වසරේදී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය රටේ අග්‍රාමාත්‍යවරිය වශයෙන් තෝරා පත්කර ගැනී. මේ ප්‍රතිඵලයක් වශයෙන් ලොව ප්‍රථම අග්‍රාමාත්‍යවරිය බිහි කළ රට යන අභිමානය ශ්‍රී ලංකාව අත්කර ගත්තේය. එසේම, 1931 වසරේ දී ඩොනමෝර් ප්‍රතිසංස්කරණ ඔස්සේ වයස අවුරුදු විසි එක (21) ඉක්මවූ කාන්තාවන් සඳහා ඡන්ද අයිතිය ලබා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආසියානු හා අප්‍රිකානු මහද්වීපය තුළ කාන්තාවන් සඳහා ඡන්ද අයිතිය මුල් කාලීනවම ලබා ගන්නා ලද රටවල් අතරින් ශ්‍රී ලංකාව ද එක් රටක් වශයෙන් එම අභිමානය ද අත්කර ගත්තේ ය (Jayawardena,2016). මෙලෙස, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ලංකාවේ පිළිගනු ලැබෙන සහ අගයකරනු ලබන සංකල්පයක් බව හුවා දැක්වීම සඳහා අප විසින් යොදා ගනු ලබන ඉහත සඳහන් උදාහරණ ප්‍රශංසනීය වුවද ඒවා ඉතාමත්ම ඉපැරණි ඒවා බව ද අප සිහි තබාගත යුතුය.

2020 වසර සඳහා වන ගෝලීය ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ වාර්තාවට (Global Gender Gap Report) අනුව රටවල් 153කින් ශ්‍රී ලංකාව 102 වන රට වශයෙන් වර්ගීකරණයට ලක් වී තිබේ.[14] විශේෂයෙන්ම, ආර්ථික සහභාගිත්වය සහ අවස්ථාවන් සම්බන්ධයෙන් 128 වන ස්ථානයත්, අධ්‍යාපන සාධනය සම්බන්ධයෙන් 88 වන ස්ථානයත්, දේශපාලන සවිබලගැන්වීම් සම්බන්ධයෙන් 73 වන ස්ථානයත් ලබා ඇත.[15] කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක තලයේ දැකිය හැකි ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ඇගයීම සඳහා විවිධ සාධක සලකා බැලිය යුතුව ඇත. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ඇගයීම සඳහා විවිධ දර්ශක පැවතියද මෙහිදී අප විසින් ප්‍රධාන වශයෙන් කාන්තාවන්ගේ මූලික අයිතිවාසිකම් හා නිදහස සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුන්ට ඇති අවස්ථාවන් පදනම් කරගනිමින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ඇගයීමට උත්සාහ කරනු ලැබේ. ඒ අනුව මෙහිදී කාන්තාවන්ගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස අහිමි වීමට හේතුවන "ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ සිදුවීම්" සහ ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස සීමා කිරීම සඳහා හේතුවන "සහභාගීත්වය සඳහා අවස්ථා නොමැති වීම" යන දර්ශක දෙක පදනම් කරගනිමින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ඇගයීමට ලක් කර තිබේ.

---

***11*** *Ibid*

***12*** World Economic Forum, The Global Gender Gap Report 2020, <http://www3.weforum.org/docs/WEF_GGGR_2020.pdf> accessed 3 March 2021.

***13*** 'Easter blasts in Sri Lankan hotels and churches kill at least 207' (Daily Mirror, 22 April 2019) <https://www.dailymirror.lk/Business-News/Easter-blasts-in-SriLankanhotels-and-churches-kill-at-least-207/273-165725> accessed 7 June 2021.

***14*** Supra 9

***15*** *Ibid*

## 1.1.1 කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩ ක්‍රියා සහ ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් හා නිදහස සාක්ෂාත් කරගැනීමේ හැකියාව හෝ අවස්ථාවන් අතරේ ඉතා සමීප සබඳතාවක් පවතී. මෙය ඉතා සරල උදාහරණයකින් පැහැදිලි කරන්නේ නම්, ලිංගිකව දූෂණයට ලක් වූ කාන්තාවක් එකී සිද්ධියෙන් අනතුරුව බොහෝ අවස්ථාවල දී තම සංචරණය සහ සමාජ සහභාගීත්වය ස්වකැමැත්තෙන් සීමා කරගනී.[16] මෙහිදී එකී කාන්තාවගේ මූලික අයිතිවාසිකම් හා නිදහස අහිමි කිරීම සඳහා වන තීරණය එම කාන්තාව විසින් ස්වකැමැත්තෙන්ම ගන්නේ වුවද, එම තීරණය කරා අදාළ කාන්තාව යොමුවීමට හේතු වන්නේ ඇය විසින් මුහුණ දෙන ලද ප්‍රචණ්ඩ ක්‍රියාව සහ එහි අනිසි ප්‍රතිවිපාක තවදුරටත් බරපතල කිරීමේ හැකියාව ඇති සමාජ ප්‍රතිමාන බව පහසුවෙන් වටහාගත හැකි සත්‍යය වේ. පහත 1 වන වගුවේ දක්වා ඇති පරිදි කාන්තාවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියාවන්හි වර්ධනය මගින් කාන්තාවන්ට තම මූලික අයිතිවාසිකම් සහ නිදහස සාක්ෂාත් කරගැනීම සම්බන්ධයෙන් පවතින අවකාශය සහ අවස්ථාවන් සීමා කර ගෙන ඇති අතර ඒ තුළින් ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව අභියෝගයටද ලක්කර ඇත.

**1.1 වන වගුව**

**පුද්ගලයින්ට එරෙහි බරපතල අපරාධයන්ගෙන් පීඩාවට පත් වින්දිත කාන්තාවන් 2015-2019**

| බරපතල අපරාධ වර්ගය | 2015 | | | 2016 | | | 2017 | | | 2018 | | | 2019 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම | ස්ත්‍රී | ස්ත්‍රී ප්‍රතිශතය | ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම | ස්ත්‍රී | ස්ත්‍රී ප්‍රතිශතය | ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම | ස්ත්‍රී | ස්ත්‍රී ප්‍රතිශතය | ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම | ස්ත්‍රී | ස්ත්‍රී ප්‍රතිශතය | ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම | ස්ත්‍රී | ස්ත්‍රී ප්‍රතිශතය |
| එකතුව | 8,830 | 4,374 | 49.5% | 8,254 | 3,967 | 48.1% | 7,213 | 3,345 | 46.4% | 7,253 | 3,706 | 51.1% | 6,831 | 3,401 | 49.8% |
| පැහැරගෙන යාම | 725 | 661 | 91.2% | 738 | 703 | 95.3% | 647 | 601 | 92.9% | 753 | 691 | 91.8% | 663 | 611 | 92.2% |
| අපහරණය කිරීම | 257 | 128 | 49.8% | 297 | 171 | 57.6% | 251 | 182 | 72.5% | 260 | 186 | 71.5% | 212 | 110 | 51.9% |
| බරපතල තුවාල සිදුකිරීම | 1,388 | 237 | 17.1% | 1,243 | 241 | 19.4% | 1,075 | 223 | 20.7% | 942 | 193 | 20.5% | 894 | 169 | 18.9% |
| ස්වේච්ඡාවෙන් අන්තරාදායක ආයුධ වලින් තුවාල සිදු කිරීම | 2,667 | 474 | 17.8% | 2,358 | 90 | 3.8% | 2,130 | 97 | 4.5% | 1,947 | 84 | 4.3% | 1,857 | 79 | 4.3% |
| මනුෂ්‍ය ඝාතනය/සියදිවි නසා ගැනීමට අනුබල දීම/මිනීමැරීමට තැත් කිරීම | 664 | 139 | 20.9% | 575 | 159 | 23.6% | 616 | 107 | 17.4% | 533 | 129 | 20.4% | 593 | 114 | 19.2% |
| වයස අවුරුදු 16 ට වැඩි කාන්තාවන් දූෂණය කිරීම | 379 | 379 | 100% | 350 | 350 | 100% | 294 | 294 | 100% | 345 | 345 | 100% | 289 | 289 | 100% |
| වින්දිතයාගේ කැමැත්ත ඇතිව ව්‍යවස්ථාපිත දූෂණය (අවුරුදු 16 ට අඩු කාන්තාවන්) | 1,339 | 1339 | 100% | 1,394 | 1,394 | 100% | 1,206 | 126 | 100% | 1,199 | 1,199 | 100% | 1,185 | 1,185 | 100% |
| වින්දිතයාගේ කැමැත්ත නැතිව ව්‍යවස්ථාපිත දූෂණය (අවුරුදු 16 ට අඩු කාන්තාවන්) | 315 | 315 | 100% | 292 | 292 | 100% | 232 | 232 | 100% | 248 | 248 | 100% | 305 | 305 | 100% |
| අස්වාභාවික වැරදි / බරපතල ලිංගික අපයෝජන | 900 | 592 | 65.8% | 716 | 453 | 63.3% | 614 | 315 | 51.1% | 749 | 545 | 72.8% | 710 | 478 | 57.3% |
| ළමයින්ට හිංසා කිරීම | 101 | 58 | 57.4% | 115 | 78 | 67.8% | 88 | 64 | 72.7% | 104 | 62 | 59.6% | 80 | 39 | 48.8% |
| දරුවන්ගේ ලිංගික අපයෝජනය | 76 | 36 | 47.4% | 50 | 19 | 38.0% | 48 | 20 | 46.5% | 50 | 24 | 48.0% | 34 | 20 | 58.8% |
| කුට්ටනය / ජාවාරම | 19 | 16 | 84.2% | 26 | 17 | 65.4% | 15 | 4 | 26.7% | 23 | 0 | 0.0% | 9 | 2 | 22.2% |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව [17]

16 Interview with a girl, victim of sexual abuse (Mannar, 23 March 2021)
17 Department of Census and Statistics, <http://www.statistics.gov.lk/GenderStatistics/StaticalInformation/WomenEmpowerment/Membersofparliamentbyyearandsex> accessed 06 March 2021.

ඉහත වගුවේ දක්වා ඇති පුද්ගලයින්ට එරෙහි බරපතල අපරාධ අතරින් ලිංගික දූෂණය, ව්‍යවස්ථාපිත දූෂණය යන අපරාධ ක්‍රියාවන් මගින් පීඩාවට පත් වූ අය වශයෙන් කාන්තාවන් පමණක් හඳුනාගෙන තිබේ. වාර්තා නොවුවද පුරුෂයින් ද  ලිංගික වශයෙන් අපහරණයට ලක්වූ සිද්ධීන් ශ්‍රී ලංකාවේ සිදුවී තිබේ[18].

කෙසේ නමුත් ලිංගික දූෂණය මගින්  අධික ලෙස පීඩාවට පත්වන පාර්ශවය වන්නේ කාන්තාවන්ය. පසුගිය වසරවල උතුරු පළාතේ වාර්තා වී ඇති ලිංගික දූෂණ අපරාධ සංඛ්‍යාව පහත වගුව මගින් පෙන්නුම් කරනු ලැබේ.

**1.2 වන වගුව**

**උතුරු පළාතේ ලිංගික දූෂණය මඟින් පීඩාවට පත් කාන්තාවන් සංඛ්‍යාව වාර්ෂික පදනමින් (2016-2020)**

| පළාත | දිස්ත්‍රික්කය | අපරාධය | 2016 - 2020 | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
| උතුරු පළාත | වව්නියාව | වයස අවුරුදු 16 ට වැඩි ස්ත්‍රී දූෂණය | 6 | 7 | 3 | 4 | 5 |
| | මන්නාරම | | දත්ත නොමැත | දත්ත නොමැත | 1 | 2 | 1 |
| | කිලිනොච්චිය | | 3 | 1 | 3 | 2 | 4 |
| | යාපනය | | 7 | 5 | 7 | 4 | 15 |
| | මුලතිව් | | 3 | 1 | 2 | 2 | 4 |
| | **එකතුව** | | 19 | 14 | 16 | 14 | 29 |
| | වව්නියාව | ලිංගික දූෂණය (වයස අවුරුදු 16 ට අඩු අය, ඔවුන්ගේ කැමැත්ත සහිතව) | 18 | 12 | 12 | 11 | 15 |
| | මන්නාරම | | | | 4 | 4 | 2 |
| | කිලිනොච්චිය | | 7 | 26 | 9 | 13 | 13 |
| | යාපනය | | 34 | 22 | 9 | 35 | 63 |
| | මුලතිව් | | 0 | 9 | 1 | 6 | 10 |
| | **එකතුව** | | 59 | 69 | 35 | 69 | 103 |
| | වව්නියාව | ලිංගික දූෂණය (වයස අවුරුදු 16 ට අඩු අය, ඔවුන්ගේ කැමැත්ත  නැතිව) | 8 | 7 | 6 | 8 | 12 |
| | මන්නාරම | | | | 2 | 2 | 4 |
| | කිලිනොච්චිය | | 16 | 0 | 6 | 5 | 4 |
| | යාපනය | | 0 | 2 | 2 | 35 | 10 |
| | මුලතිව් | | 10 | 3 | 12 | 5 | 5 |
| | **එකතුව** | | 34 | 12 | 28 | 55 | 35 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා පොලීසිය [19]

*18* Centre for Policy Alternatives, 'Legal Reform to Combat Sexual  and Gender-Based Violence-Part I' (CPA, November 2020) https://www.cpalanka.org/wp-content/uploads/2020/11/Law-Reform-to-combat-SGBV-PART-1-General-Centre-for-Policy-Alternatives.pdf

*19* ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා පොලීසිය <http://www.statistics.gov.lk/GenderStatistics/StaticalInformation/SpecialConcerns/PercentageOfHouseholdHeadsBySex1981-2016> Sri Lanka Police crime statistics <https://www.police.lk/index.php/item/138-crime-statistics>

### 1.1.2 සහභාගිත්වය සඳහා අවස්ථාවන් නොමැතිවීම

මෙම පරිච්ඡේදයේ මෙම කොටස යටතේ දේශපාලන සහ පොදු ජීවිතයේ දී කාන්තා දායකත්වය සහ සහභාගිත්වය සම්බන්ධයෙන් සාකච්ඡා කෙරෙන අතර ඒවා සීමා කරන සමාජ ව්‍යුහයන්ට හා නීතීන්ට පසුබිම් වන සමාජ ප්‍රතිමාන සහ එකී සමාජ ප්‍රතිමාන පිළිබඳ වැඩිදුර පැහැදිලි කිරීම් මෙම පරිච්ඡේදයෙහි අවසන් කොටස මගින් සාකච්ඡා කෙරේ.

කාන්තාවන් දේශපාලනයට සහ පොදු ජීවිතයට සහභාගි වීම සඳහා පවතින අවස්ථාවන්, විධිමත් ලෙස ගොඩනගා ඇති සමාජ ව්‍යුහයන් සහ ඊට අනුබල දෙන සමහර නීති මගින් සීමා කොට ඇත. (Abeykoon, 2020). ශ්‍රී ලංකාවේ පළාත් පාලන, පළාත් සභා සහ ජාතික යන මට්ටම්වල කාන්තාවන්ගේ දේශපාලන නියෝජනය ඉතා අවම මට්ටමක පවතී. පළාත් පාලන මට්ටමින් කාන්තා දේශපාලන නියෝජනය වැඩි කිරීමේ අරමුණ ඇතිව 2017 වසරේදී කාන්තාවන් වෙනුවෙන් 25% ක ආසන වෙන්කිරීමක් සඳහා නීති සංශෝධන ගෙනෙන ලදී.[20] ඉහත නීති සංශෝධනයෙන් පසුව ප්‍රථම පළාත් පාලන මැතිවරණය 2018 වසරේ පෙබරවාරි මස පවත්වන ලදී. එහිදී උතුරු පළාතේ ආසන හිමි කර ගත් කාන්තාවන් සහ පුරුෂයින්ගේ සංඛ්‍යාව පහත වගුව මගින් පෙන්නුම් කරනු ලැබේ.

**1.3 වන වගුව**

**උතුරු පළාතේ පළාත් පාලන ආයතනයන්හි පවතින ස්ත්‍රී පුරුෂ සංයුතිය 2018**

| දිස්ත්‍රික්කය | පළාත් පාලන ආයතන සඳහා තෝරා පත් කර ගනු ලැබූ මන්ත්‍රීවරු සංඛ්‍යාව | ස්ත්‍රී පුරුෂ සංයුතිය | | | |
|---|---|---|---|---|---|
| | | පුරුෂ | % පුරුෂ | ස්ත්‍රී | % ස්ත්‍රී |
| යාපනය | 415 | 318 | 77 | 97 | 23.00 |
| කිලිනොච්චිය | 68 | 54 | 79 | 14 | 21.00 |
| මුලතිව් | 73 | 58 | 79 | 15 | 21.00 |
| මන්නාරම | 94 | 79 | 84 | 15 | 16.00 |
| වව්නියාව | 111 | 93 | 83 | 18 | 16.00 |

මූලාශ්‍රයː ශ්‍රී ලංකා රජයේ ගැසට් නිවේදනය, 2018 මාර්තු 09

එම නීති සංශෝධනයේ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රායෝගිකව පළාත් පාලන ආයතනයන් හි කාන්තා නියෝජනය වැඩි වුවද සමාජය තුළ මුල්බැස ඇති සමාජ ප්‍රතිමාන සහ ඒකාකෘතික ආකල්ප හේතුවෙන් ඔවුන්ගේ සැබෑ දේශපාලන නියෝජනය අපේක්ෂා කරන ලද ප්‍රමාණයට වර්ධනය වී නොමැත. එසේම ඔවුන් නාමික නියෝජිතවරියන් වශයෙන් සිටිය යුතු අවාසනාවන්ත තත්ත්වයකට ද මුහුණ දී ඇත. (Abeykoon, 2020).

පළාත් සභා සහ ජාතික මට්ටමෙහි කාන්තා දේශපාලන නියෝජනය ඉතා අවම මට්ටමක පවතින බව පහත සඳහන් වගුවෙන්ඉතා පැහැදිලිව ගෙනහැර දක්වයි.

---

*20* 2017 අංක 16 දරන පළාත් පාලන මැතිවරණ (සංශෝධන) පනත

## 1.4 වන වගුව

### පළාත් සභා මන්ත්‍රීවරු හා අමාත්‍යවරු සංඛ්‍යාව සහ ස්ත්‍රී පුරුෂ භාවය වාර්ෂික පදනමින් 2004, 2008/2009, 2012/2013/2014

| පළාත් සභාව | | 2004 | | 2008/2009 | | 2012/2013/2014 | |
|---|---|---|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| සියලුම පළාත් සභා | මන්ත්‍රීවරුන් | 361 | 19 | 400 | 17 | 434 | 21 |
| | අමාත්‍යවරුන් | 35 | - | 39 | - | 44 | 1 |
| බස්නාහිර | මන්ත්‍රීවරුන් | 98 | 6 | 98 | 6 | 97 | 7 |
| | අමාත්‍යවරුන් | 5 | - | 5 | - | 5 | - |
| මධ්‍යම | මන්ත්‍රීවරුන් | 53 | 5 | 54 | 4 | 54 | 4 |
| | අමාත්‍යවරුන් | 5 | - | 4 | - | 5 | - |
| දකුණ | මන්ත්‍රීවරුන් | 54 | 1 | 54 | 1 | 54 | 1 |
| | අමාත්‍යවරුන් | 5 | - | 5 | - | 5 | - |
| උතුර | මන්ත්‍රීවරුන් | - | - | 1 | 1 | 36 | 2 |
| | අමාත්‍යවරුන් | - | - | - | - | 5 | - |
| නැගෙනහිර | මන්ත්‍රීවරුන් | - | - | 36 | 1 | 36 | 1 |
| | අමාත්‍යවරුන් | - | - | 5 | - | 4 | 1 |
| වයඹ | මන්ත්‍රීවරුන් | 48 | 4 | 50 | 2 | 50 | 2 |
| | අමාත්‍යවරුන් | 5 | - | 5 | - | 5 | - |
| උතුරු මැද | මන්ත්‍රීවරුන් | 32 | 1 | 32 | 1 | 32 | 1 |
| | අමාත්‍යවරුන් | 5 | - | 5 | - | 5 | - |
| ඌව | මන්ත්‍රීවරුන් | 33 | 1 | 33 | 1 | 33 | 1 |
| | අමාත්‍යවරුන් | 5 | - | 5 | - | 5 | - |
| සබරගමුව | මන්ත්‍රීවරුන් | 43 | 1 | 43 | 1 | 42 | 2 |
| | අමාත්‍යවරුන් | 5 | - | 5 | - | 5 | - |

මූලාශ්‍රයː ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව[21]

## 1.5 වන වගුව

### පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂභාවය අනුව වාර්ෂික පදනමින්

| ව්‍යවස්ථාදායකය | වසර | ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයම | % | මන්ත්‍රීවරුන් සංඛ්‍යාව | % | මන්ත්‍රීවරියන් සංඛ්‍යාව | % |
|---|---|---|---|---|---|---|---|
| 2වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 1989 | 225 | 100 | 212 | 94.2 | 13 | 5.8 |
| 3වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 1994 | 225 | 100 | 213 | 94.7 | 12 | 5.3 |
| 4වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 2000 | 225 | 100 | 216 | 96.0 | 9 | 4.0 |
| 5වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 2001 | 225 | 100 | 215 | 95.6 | 10 | 4.4 |
| 6වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 2004 | 225 | 100 | 212 | 94.2 | 13 | 5.8 |
| 7වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 2010 | 225 | 100 | 212 | 94.2 | 13 | 5.8 |
| 8වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 2015 | 225 | 100 | 212 | 94.2 | 13 | 5.8 |
| 9වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 2020 | 225 | 100 | 213 | 94.7 | 12 | 5.3 |

මූලාශ්‍රයː ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව[22]

21 ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව <http://www.statistics.gov.lk/GenderStatistics/StaticalInformation/WomenEmpowerment/Membersofparliamentbyyearandsex> accessed 06 March 2021.

22 ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, <http://www.statistics.gov.lk/GenderStatistics/StaticalInformation/WomenEmpowerment/Membersofparliamentbyyearandsex> accessed 06 March 2021.

## 1.6 වන වගුව

### උතුරු පළාත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංඛ්‍යාව වාර්ෂික පදනමින්

| ව්‍යවස්ථාදායකය | වසර | කාන්තා මන්ත්‍රීවරියන්ගේ සංඛ්‍යාව | උතුරු පළාත | කොට්ඨාසය | නම |
|---|---|---|---|---|---|
| 2වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 1989 | 13 | 1 | වන්නි | ආර්.එම්.පුලේන්ද්‍රන් එ. ජා. ප. |
| 3වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 1994 | 12 | 1 | වන්නි | ආර්.එම්.පුලේන්ද්‍රන් එ. ජා. ප. |
| 4වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 2000 | 9 | 0 | | |
| 5වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 2001 | 10 | 0 | | |
| 6වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 2004 | 13 | 1 | යාපනය | පද්මිණි සිදම්බරනාදන් මිය අයි. ටී. ඒ. කේ. |
| 7වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 2010 | 13 | 1 | යාපනය | විජයකලා මහේෂ්වරන් එ. ජා. ප. |
| 8වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | | | | වන්නි | ශාන්ති ශ්‍රීස්කන්දරාසා අයි. ටී. ඒ. කේ. |
| | | | | යාපනය | විජයකලා මහේෂ්වරන් එ. ජා. ප. |
| 9වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 2020 | 12 | 0 | | |

මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව[23]

ජාතික මට්ටමේ කාන්තාවන්ගේ දේශපාලන නියෝජනය අවම මට්ටමක පවතින අතර යුද්ධයේ දිග්ගැස්සුනු හා තිරසාර ප්‍රතිවිපාක මගින් විවිධ පෞද්ගලික ගැටළුවලට මුහුණ දෙන කාන්තාවන් බහුලව සිටින උතුරු පළාත ජාතික මට්ටමින් නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංඛ්‍යාව ඉතා අවම මට්ටමක පවතින බව ඉහත වගුව පෙන්නුම් කරයි. එසේම, වත්මන් රජයේ[24] 26දෙනෙකුගෙන් සමන්විත කැබිනට් මණ්ඩලයේ එක් කැබිනට් අමාත්‍යවරියක්[25] පමණක් සිටීම විධායකය තුළ කාන්තා නියෝජනය ඉතා අවම මට්ටමක පවතින බවට සාක්ෂි සපයයි. රජයේ තවත් ප්‍රධාන මූලිකාංගයක් වූ අධිකරණ ක්ෂේත්‍රයේ කාන්තා නියෝජනය සෑහීමට පත්විය හැකි තත්ත්වයක නොමැති බව ද සඳහන් කළ යුතුය. උදාහරණ වශයෙන් 2017 වසරේ රටේ සිටි විනිසුරුවරියන්ගේ ප්‍රතිශතය 28.9%ක් ලෙස පැවතුණි. මෙම තත්ත්වය පහත වගුව මගින් නිරීක්ෂණය කළ හැකිය.

---

*23* Department of Census and Statistics, <http://www.statistics.gov.lk/GenderStatistics/StaticalInformation/WomenEmpowerment/Membersofparliamentbyyearandsex> accessed 06 March 2021.

*24* 2020 වසරේ පවත්වන ලද මැතිවරණයෙන් පසුව පිහිටවූ රජය.

*25* ගරු පවිත්‍රා දේවි වන්නිආරච්චි මැතිනිය, වර්තමානයේ ප්‍රවාහන අමාත්‍යවරිය වශයෙන් කටයුතු කරමින් සිටී.

## 1.7 වන වගුව

### විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂ භාවය අනුව 2017

| අධිකරණ වර්ගය | සමස්ත විනිසුරු සංඛ්‍යාව | % | විනිසුරුවරුන් සංඛ්‍යාව | % | විනිසුරුවරියන් සංඛ්‍යාව | % |
|---|---|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 11 | 100 | 9 | 81.8 | 2 | 18.2 |
| අභියාචනාධිකරණය | 12 | 100 | 10 | 83.3 | 2 | 16.7 |
| සිවිල් අභියාචනා මහාධිකරණ/ මහාධිකරණ/ පළාත්බද මහාධිකරණ | 81 | 100 | 70 | 86.4 | 11 | 13.6 |
| දිසා අධිකරණ/ මහේස්ත්‍රාත් අධිකරණ | 224 | 100 | 150 | 67.0 | 74 | 33.0 |
| ළමා මහේස්ත්‍රාත් අධිකරණ | 2 | 100 | 0 | 0 | 2 | 100 |
| කම්කරු විනිශ්චය සභා | 33 | 100 | 19 | 57.6 | 14 | 42.4 |
| සියලු වර්ගයේ අධිකරණ | 363 | 100 | 258 | 71.1 | 105 | 28.9 |

මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව[26]

මෙලෙස කාන්තා දායකත්වය හා සහභාගිත්වය දේශපාලන හා පොදු ජීවිතයේ අවම වශයෙන් දක්නට ලැබීම ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් හා නිදහස සීමාකර තිබීම පෙන්නුම් කරයි. ඒ අනුව කාන්තාවන්ට එරෙහිව වර්ධනය වෙමින් පවතින ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් හා නිදහස අහිමි වන අතර දේශපාලන සහ පොදු ජීවිතයේදී ඔවුන්ගේ සහභාගිත්වය ප්‍රමාණවත් ලෙස සහතික නොකිරීමෙන් ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස සීමා කෙරේ. කාන්තාවන්ගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස ප්‍රායෝගික ලෙස සහතික නොකරන ලද සමාජයක ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව යන්න කිසිදා සාක්ෂාත් කර ගත නොහැකි දෙයකි. ඒ අනුව, ශ්‍රී ලාංකික කාන්තාවන් තම මූලික අයිතිවාසිකම් සහ නිදහස සාක්ෂාත් කරගැනීමේදී සීමා පැනවෙන සාධක පිළිබඳව අවබෝධ කරගැනීම කාලීන අවශ්‍යතාවක් බව සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර යුද්ධයෙන් විශාල වශයෙන් පීඩාවට පත්ව සංක්‍රාන්තික ක්‍රියාවලියට යටත් ව සිටින උතුරු පළාතේ කාන්තාවන්ගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස සම්බන්ධයෙන් පවතින තත්ත්වය සහ ඒවා සාක්ෂාත් කර ගැනීමේදී බාධාවන් ලෙස පවතින සමාජ ප්‍රතිමාන සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වී ඇත.

26 ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, <http://www.statistics.gov.lk/GenderStatistics/StaticalInformation/WomenEmpowerment/Membersofparliamentbyyearandsex> accessed 06 March 2021.

## 1.2 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව තහවුරු කිරීම සඳහා වන ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර හා දේශීය නෛතික බැඳීම්

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීම වළක්වාලමින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව තහවුරු කරන්නේය.[27] එසේම මෙම ව්‍යවස්ථාවේ 3 වන සහ 4 වන අනු ව්‍යවස්ථා මගින් කාන්තාවන්ගේ ප්‍රගතිය සඳහා විශේෂ නීති හා රෙගුලාසි පැනවීම අනුමත කරනු ලැබේ.[28] කෙසේ වෙතත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වන ව්‍යවස්ථාව[29] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනයට පූර්වයෙන් පැවති ලිඛිත හා අලිඛිත නීතීන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් සමග ගැටුණද ඒවායෙහි අධිකරණමය සමාලෝචනය තහනම් කරන බැවින් මෙය පැහැදිලිව ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පදනම් කොටගත් වෙනස්කොට සැලකීමේ චාරිත්‍රානුකූල නීතීන්හි පැවැත්ම අනුමත කරන තත්ත්වයක් පෙන්නුම් කරයි. මෙය කාන්තාවන්ට වෙනස්කොට සලකන උඩරට නීතිය, තේසවලාමෙයි නීතිය සහ මුස්ලිම් නීතිය වැනි විශේෂ නීති, දණ්ඩ නීති සංග්‍රහයේ ඇතම් විධිවිධාන, ඉඩම් හිමිකම පිළිබඳ සාමාන්‍ය නීතියේ විධිවිධාන සහ වෙනත් සාමාන්‍ය නීති විධිවිධානයන්හි අවිච්ඡින්න පැවැත්මට මගපාදා ඇත.

ශ්‍රී ලංකා රජය විසින් කිසිඳු වෙන් කිරීමකින් තොරව ස්ත්‍රීන්ට එරෙහි සියලු ආකාර වෙනස්කම් පිටුදැකීමේ ජාත්‍යන්තර සම්මුතිය පිළිගෙන අපරානුමත කිරීමෙන් අනතුරුව එම සම්මුතිය සවිබලගැන්වීම සඳහා 1993 වසරේ දී කාන්තා ප්‍රඥප්තියක් සම්පාදනය කරන ලදී. එම ප්‍රඥප්තියේ ප්‍රධාන කරුණු හතක් අවධාරණය කෙරුණි. ඒවා නම්, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්, අධ්‍යාපනය සහ පුහුණුවීම් සඳහා වන අයිතිවාසිකම්, ආර්ථික කටයුතු හා ප්‍රතිලාභ ලැබීමේ අයිතිවාසිකම්, සෞඛ්‍ය රැකවරණය සහ පෝෂණය සඳහා වන අයිතිවාසිකම්, පවුල් අයිතිවාසිකම්, සමාජ වෙනස්කොට සැලකීම් වලින් ආරක්ෂාව ලැබීමේ අයිතිවාසිකම් යනාදිය වේ. කෙසේ වෙතත්, එම ලේඛනය සඳහා කිසිඳු නෛතික පිළිගැනීමක් ලබා නොදී එය හුදු ලේඛනයකට පමණක් සීමාකර තිබීම අවාසනාවන්ත තත්ත්වයකි.[30]

කෙසේ වෙතත්, පසුගිය කාල වකවානුවේදී ක්‍රියාත්මක කරන ලද විවිධ දේශීය වැඩසටහන්හි ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහතික කිරීම සඳහා වන ශ්‍රී ලංකා රජයේ බැඳීම අන්තර්ගත කර තිබුණි. මේ සඳහා උදාහරණ ලෙස, ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා ආමන්ත්‍රණය කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලසුම 2016 – 2020 සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලසුම 2017 – 2021 වැනි ක්‍රියාකාරී සැලසුම් පෙන්වා දිය හැකිය.

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව තහවුරු කිරීම සඳහා වන ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර නෛතික බැඳීම් ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති පහත සඳහන් ජාත්‍යන්තර සම්මුතීන්හි විධිවිධාන මගින් උද්ගත වී තිබේ.

**27** 12(2) ව්‍යවස්ථාව මෙලෙස දක්වයි: "කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේය."
එසේ වුවද, රජයේ සේවයේ, අධිකරණ සේවයේ, පළාත් පාලන සේවයේ නැතහොත් යම් රාජ්‍ය සංස්ථාවක සේවයේ යම් සේවා නියුක්තියක හෝ ධූරයක කාර්ය ඉටු කිරීම සඳහා යම් තැනැත්තකු යම් භාෂාවක් පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් ඇතිව සිටීම සාධාරණව අවශ්‍ය වන අවස්ථාවක ඒ සේවා නියුක්තිය හෝ ධූරය සඳහා සුදුසුකමක් වශයෙන් ඒ භාෂාව පිළිබඳ එසේ ප්‍රමාණවත් දැනීමක් සාධාරණ කාලයක් තුළදී ලබා ගත යුතු යයි එවැනි තැනැත්තකුට නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.
එසේම, තවදුරටත්, එවැනි යම් සේවා නියුක්තියක හෝ ධූරයක හෝ කිසිදු කර්තව්‍යයක් යම් භාෂාවක් පිළිබඳ දැනීම ඇත්තේ නම් මිස ඉටු කළ නොහැකි වන අවස්ථාවලදී, ඒ සේවා නියුක්තියට හෝ ධූරයට හෝ ඇතුළත් කරගැනීමේ සුදුසුකමක් වශයෙන් යම් තැනැත්තකුට ඒ භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් තිබිය යුතු යැයි නියම කිරීම නිත්‍යානුකූල වන්නේය.

**28** 12(4) ව්‍යවස්ථාව මෙලෙස දක්වයි: "වර්ගය, ආගම, භාෂාව, කුලය හෝ ස්ත්‍රී පුරුෂ භේදය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙළෙඳසල්වලට, පොදු භෝජනාගාර වලට, ආපන ශාලාවලට, පොදු විනෝද ස්ථානවලට හෝ තම තමාගේ ආගමට අයත් පොදු පූජනීය ස්ථාන වලට ඇතුළු වීම සම්බන්ධයෙන් යම් අශක්නුතාවකට, බැඳීමකට, සීමා කිරීමකට නැතහොත් කොන්දේසියකට කිසිම තැනැත්තෙක් යටත් නොවන්නේ ය. කාන්තාවන්ගේ, ළමයින්ගේ හෝ අබල තැනැත්තන්ගේ ප්‍රගතිය සඳහා නීතියෙන් හෝ අනු නීති වලින් හෝ විධායක ක්‍රියාමාර්ගයෙන් හෝ විශේෂ විධිවිධාන සැලැස්වීම මෙම ව්‍යවස්ථාවෙන් කිසිසේත් අවහිර නොවන්නේය.

**29** 16 වන ව්‍යවස්ථාව මෙලෙස දක්වයි: "16(1) පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති අතුරෙන් යම්කිසි ලිඛිත නීතියක් හෝ ලිඛිත නොවූ නීතියක් මේ පරිච්ඡේදයේ මෙයට ඉහතින් ඇති විධිවිධාන වලට අනුකූල නොවුවද, එකී සියලු පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති බලාත්මක ව ක්‍රියාත්මක වන්නේ ය."
16(2) කවර වූ හෝ පවත්නා නීතියකින් දඬුවමක් ලෙස පිළිගනු ලැබූ කවර වූ හෝ ආකාරයක දඬුවමකට කවර වූ හෝ තැනැත්තකු නිසි අධිකරණයක ආඥාව පිට යටත් කිරීම මේ පරිච්ඡේදයේ විධිවිධාන කඩ කිරීමක් නොවන්නේ ය.

**30** Sri Lanka Shadow Report to the Committee on the Elimination of All Forms of Discrimination against Women (CEDAW), Submitted for the 66th Session of the CEDAW Committee Geneva, Switzerland 13 February – 03 March 2017, <https://tbinternet.ohchr.org/Treaties/CEDAW/Shared%20Documents/LKA/INT_CEDAW_NGO_LKA_26306_E.pdf> accessed 7 June 2021.

රූප සටහන 1.1

**මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය, 1948**

**2 වන වගන්තිය**

ජාති, වංශ, වර්ණ, ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව, ආගම්, දේශපාලන ආදී කවර භේදයක් හෝ සමාජ, ජාතික, දේපළ, උපත ආදී කවර තත්ත්වයක විශේෂයක් හෝ නොමැතිව මේ ප්‍රකාශනයේ සඳහන් සියලු හිමිකම්වලට හා ස්වාධීනත්වයන්ට සෑම පුද්ගලයකුම උරුම වන්නේය.

**ස්ත්‍රීන්ට එරෙහි සියලු ආකාර වෙනස්කම් පිටුදැකීමේ සම්මුතිය, 1981**

**3 වන වගන්තිය**

පාර්ශ්වකාර රාජ්‍යයන් සියලු ක්ෂේත්‍රවල විශේෂයෙන් දේශපාලනික, සමාජීය, ආර්ථික සහ සංස්කෘතික කේෂ්ත්‍රවල, පුරුෂයන්ට හා සමානාත්මතාව මත පදනම්ව අයිතිවාසිකම් සහ මූලික නිදහස පරිහරණය හා භුක්ති විඳීම තහවුරු කරනු වස් ස්ත්‍රීන්ගේ පූර්ණ සංවර්ධනය සහ ප්‍රගමනය සහතික කරනු පිණිස ව්‍යවස්ථා සම්පාදනය ඇතුළුව සියලු පියවර ගනු ඇත.

**සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, 1976**

**3 වන වගන්තිය**

මෙම සම්මුතියට ඇතුළත් රාජ්‍ය පාර්ශ්වකරුවෝ මෙම සම්මුතියෙහි දැක්වෙන පරිදි සියලුම සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමෙහිලා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම එක සමානව අයිතිවාසිකම් ලබන බවට වගබලා ගැනීමට පොරොන්දු වෙති.

**ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, 1976**

**3 වන වගන්තිය**

මෙම සම්මුතියෙහි දැක්වෙන සියලු ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් භුක්ති විඳීමට පුරුෂයින්ට හා ස්ත්‍රීන්ට ඇති සමාන අයිතිවාසිකම් සහතික කිරීමට මෙම සම්මුතියට ඇතුළත් සියලුම රාජ්‍ය පාර්ශවකරුවෝ පොරොන්දු වෙති.

## 1.3 ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව

"ලිංගිකත්වය"(Sex) සහ "ස්ත්‍රී පුරුෂ සමාජභාවය" (Gender) යන යෙදුම් බොහෝ අවස්ථාවලදී සුළු ව්‍යාකූලත්වයක් ඇති කරයි. එබැවින්, ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන යෙදුම්වලින් සත්‍ය වශයෙන්ම අදහස් කරන්නේ කුමක්ද යන්න පැහැදිලි කිරීම අවශ්‍ය වේ. "ලිංගිකත්වය" පුරුෂයන්, ස්ත්‍රීන් සහ අනෙකුත් ලිංගිකයන්[31] අතර පවතින ජීව විද්‍යාත්මක වෙනස (හෝමෝන සහ වර්ණදේහ ප්‍රමාණය) පෙන්නුම් කරන්නකි (WHO, 2014). "ස්ත්‍රී පුරුෂ සමාජභාවය" යනු "ලිංගිකත්වය" මෙන් ජීව විද්‍යාත්මක තත්ත්වයක් නොවන අතර එය සමාජය ආශ්‍රිතව ගොඩනැගී ඇති අනන්‍යතාවන් සහ කාර්යභාරයන් නැවත නැවතත් අවධාරණය කිරීම මගින් හෝ පෝෂණය කිරීම මගින් සමාජය විසින් කෘත්‍රිමව ගොඩනගා ඇති තත්ත්වයකි. හිලරි චාල්ස්වර්ත් විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන්න නිර්වචනය කර ඇත්තේ "ස්ත්‍රීන් හා පුරුෂයන් සහ ස්ත්‍රීභාවය හා පුරුෂභාවය යන සංකල්ප අතර වෙනස්කම් සමාජය විසින් ගොඩ නගා ඇති ආකාරය" යනුවෙනි (Charlesworth, 1999). එසේම, ඇය තවදුරටත් අවධාරණය කරමින් දක්වා සිටින්නේ "මෙම වෙනස්කම් ජීව විද්‍යාත්මක වශයෙන් වෙනස් කොට දක්වන ලිංගිකත්වය සමග බද්ධ වී ඇති අත්‍යන්ත සංස්කෘතික මූලධර්ම මගින් ගොඩනගා ඇති බවයි" (Charlesworth, 1999). වෙනත් වචනවලින් පවසන්නේ නම්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු විවිධ ප්‍රජාවන් විසින් තම අනන්‍යතා, සංස්කෘතික මූලධර්ම, සභ්‍යත්වයන්, සම්ප්‍රදායයන් සහ සාරධර්ම යන පදනමින් ගොඩනගා ඇති කෘත්‍රිම සංකල්පයකි. මෙම සංකල්පය සෑම ප්‍රජාවකම එකම ස්වභාවයකින් දක්නට නොලැබෙන අතර කාලීනව එහි ස්වරූපය වෙනස් වේ. කෙසේ වෙතත්, සෑම ප්‍රජාවකම ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන සංකල්පය ගොඩනැගී ඇති අතර එනම්, ස්ත්‍රීන් සහ පුරුෂයන් තම ලිංගිකත්වය අනුව හැසිරිය යුතු ආකාරය පිළිබඳව රීතීන් ගොඩනැගී ඇති අතර සියලු පුද්ගලයින් ඒවා අනුගමනය කළ යුතු බවට ද අපේක්ෂා කෙරේ. එවැනි රීති අනුගමනය කිරීමේදී ඔවුන් ඒ ඒ ලිංගිකත්වයට අයත් පුද්ගලයන් ලෙසට සලකනු ලැබේ.

පිරිමි දරුවකු/ පිරිමියකු අඬන විට, "ගැහැණු ළමයකු මෙන් අඬනවා" යනුවෙන් ද "පිරිමින් අඬන්න හොඳ නැති" බව ද සාමාන්‍ය ව්‍යවහාරයේදී පැවසේ. මෙහිදී ඇඬීම යන ලක්ෂණය කාන්තාවට පමණක් අදාළ දෙයක් බවට ආරෝපණය කර තිබේ. සමාජය විසින් ගොඩනගා ඇති "ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ භූමිකාව" ලෙස හැඳින්වෙන්නේ මෙය යි. ඇඬීම කාන්තාවන්ට පමණක් උරුම වූ දෙයක් යන්නට ජීව විද්‍යාත්මක සාක්ෂි කිසිවක් නොමැත. එසේ වුවද, සමාජය විසින් ගොඩනගා ඇති සමාජ ප්‍රතිමානයන්ට අනුව ඇඬීම කාන්තාවන්ට ආවේණික දෙයක් ලෙසට එනම්, කාන්තාවන්ගේ ලිංගිකත්ව ස්වභාවයක් ලෙසට සැලකේ. එසේම, "ඇය පිරිමියෙක් වගේ රණ්ඩු කරනවා" යනුවෙන් කාන්තාවන් හුවා දක්වමින් පැවසෙන බොහෝ අවස්ථා ද දක්නට ඇත. රණ්ඩු කිරීම පුරුෂ ලිංගිකයන්ට අයත් ලක්ෂණයක් යන්න සමාජය විසින් ගොඩනගා ඇති දෙයක් මිස එය ජීව විද්‍යාත්මක හෝ ස්වාභාවික දෙයක් නොවේය යන්න මේ සඳහා දැක්විය හැකි තවත් උදාහරණයකි.


මේ අනුව සමාජ සම්මතයන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස් කිරීම සක්‍රීය කරන ප්‍රධාන උපායමාර්ගික මෙවලම වේ. මීළඟට "සමාජ ප්‍රතිමාන" යනු මොනවාද යන්න සම්බන්ධයෙන් මදක් සලකා බලමු. යම් සමාජයක ජීවත්වන පුද්ගලයන්ගේ භූමිකාවන් ඔවුන්ගේ ලිංගිකත්වය, ආගම, සංස්කෘතිය යනාදිය පදනම් කරගෙන අර්ථ නිරූපණය කරන සහ සමාජයේ බල සම්බන්ධතා නැතහොත් බල ගතිකයන් කුමන ආකාරයට පැවතිය යුතු ද යන්න නිර්වචනය කරන "රීතීන්" හෝ "ආචාරධර්ම" හෝ "හැසිරීම් රටා" හෝ "සම්ප්‍රදායන්" සමාජ ප්‍රතිමාන ලෙස හැඳින්වේ (UNDP, 2020). මෙම සමාජ ප්‍රතිමාන බොහෝ දුරට ආගමික විශ්වාස, සංස්කෘතික මූලධර්ම සහ සාම්ප්‍රදායික භාවිතයන් පදනම් කරගනිමින් ගොඩනැගී ඇත. මේවා කෙටියෙන් සංස්කෘතික ජීවිතය ආරක්ෂා කරන අංග වශයෙන් ද හැඳින්විය හැකිය. නිදසුනක් වශයෙන්, හින්දු සංස්කෘතිය අනුගමනය කරන කාන්තාවක් සිය ස්වාමි පුරුෂයාගේ මරණින් පසු ඇගේ නළලේ තිලක/ සින්දූර් නොතැබිය යුතුය යන්න සමාජ ප්‍රතිමානයකි. මෙම සමාජ ප්‍රතිමානය හින්දු ආගමික මූලධර්ම සහ සංස්කෘතික භාවිතයන් මත පදනම් වී ඇති අතර එය ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සම්බන්ධ ප්‍රතිමානයක් ද වේ.

31 ස්ත්‍රීන් හා පුරුෂයන් යන දෙපාර්ශ්වයට අමතරව සංක්‍රාන්ති ලිංගිකයන් සහ ලිංගිකත්වය පැහැදිලිව හඳුනාගත නොහැකි අය යනාදී වශයෙන් විවිධ ලිංගිකයන් සිටිති.

මෙලෙස ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආවරණ කොට සමාජ ප්‍රතිමාන බිහිකිරීමේදී ඒවා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත වෙනස්කොට සැලකීමෙන් යුක්ත වනු ඇත. එවන් ප්‍රතිමාන ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන ලෙස හඳුන්වනු ලැබේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස්කොට සැලකීමෙන් යුක්ත මෙම සමාජ ප්‍රතිමාන සමාජය තුළ බිහිවන ඒකාකෘතික ආකල්ප (stereotypes) සඳහා පසුබිම් වෙයි. ඒ අනුව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස්කොට සැලකීම සමාජය තුළට ව්‍යුහාත්මක වශයෙන් ප්‍රවේශ වන ප්‍රමුඛතම මෙවලමක් වශයෙන් සමාජ ප්‍රතිමාන ක්‍රියාත්මක වන අතර එකී ප්‍රතිමාන දීර්ඝ කාලයක් අනුගමනය කෙරෙන සමාජයක මුල් බැසගන්නා ඒකාකෘතික ආකල්ප ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස්කොට සැලකීමේ තත්වයන්ගෙන් සමන්විත වූ ඒවා බවට පත්වේ. මෙලෙස ගැඹුරින් මුල් බැසගත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සහ ඒකාකෘතික ආකල්ප මගින් ස්ත්‍රීන් සහ පුරුෂයන්ගේ "හැසිරීම් රටාව" නැතහොත් "හැසිරිය යුතු ආකාරය" තීරණය කරනු ලැබේ. නිදසුනක් වශයෙන්, භාවිතයේ ඇති සමාජ ප්‍රතිමාන අනුව විශේෂයෙන්ම, ඉස්ලාම් සංස්කෘතිය, කාන්තාවන් නායකත්ව තනතුරු නොදැරිය යුතු බවට අපේක්ෂා කරයි (Haniffa, 2008). මෙම සමාජ ප්‍රතිමාන පොදු ජීවිතයේ නිරත වීම සඳහා වන කාන්තාවන්ගේ මූලික නිදහස අභියෝගයට ලක් කරයි. මෙලෙස ක්‍රියාත්මක තලයේ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන කාන්තාවන්ගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස සාක්ෂාත් කර ගැනීමෙහිලා බාධා ඇති කරන අතර අනෙක් අතට ඒවා අතර ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ ශ්‍රී ලංකාව අත්සන් කර ඇති ජාත්‍යන්තර සම්මුතීන් හරහා සහතික කර ඇති ස්ත්‍රී පුරුෂ සමානාත්වතාව අභියෝගයට ලක් කරයි.

රූප සටහන 1.2

**සමාජ ප්‍රතිමාන හා ස්ත්‍රී පුරුෂ අසමානතාව අතර පවතින සම්බන්ධතාව**




සමාජ ප්‍රතිමානයන්හි කැපී පෙනෙන විශේෂ ලක්ෂණයක් වන්නේ ඒවා 'යම් නිශ්චිත ප්‍රජාවකට හෝ කණ්ඩායමකට අදාළ භාවිතයන්' යන අනන්‍යතාවක් ලබාගෙන තිබීම යි (UNDP, 2020). අනන්‍යතාව නැමැති මෙම සංරචකය සමාජ ප්‍රතිමාන සමග බැඳී පැවතීම, සමාජ ප්‍රතිමානයන්හි ප්‍රබලත්වයට සහ ඒවා සමාජය තුළ ගැඹුරින් මුල් බැස ගැනීමට මූලික හේතුව වන්නේය. අදාළ සමාජ ප්‍රතිමානයන්ට පටහැනිව කටයුතු කිරීම හෝ එකී ප්‍රතිමානයන්ගෙන් අපගමනයවීම තම ප්‍රජාවේ අනන්‍යතාව අතහැර දමන හෝ තම ප්‍රජාවේ අනන්‍යතාව කෙලෙසා දමන ක්‍රියාවක් ලෙස නිරූපණය කරන බැවින් සමාජ ප්‍රතිමාන පරම්පරාවෙන් පරම්පරාවට එහි අවිච්ඡින්නතාව සහ පැවැත්ම ඉතා පහසුවෙන් ආරක්ෂා කර ගනී.

## 1.4 සමාජ ප්‍රතිමාන, නීති, චාරිත්‍රානුකූල නීති සහ ආගමික විශ්වාස

කිසියම් සමාජයක ස්ථාපිත සමාජ ප්‍රතිමාන සහ එම සමාජයේ බලාත්මකව පවතින නීතීන්, චාරිත්‍රානුකූල නීතින් සහ එම සමාජයේ ආගමික විශ්වාසයන් අතර සමීප සබඳතාවයක් පවතින අතර සමහර අවස්ථාවන්හිදී එකී සම්බන්ධතා ජාලයන් සංකීර්ණතාවකින් යුක්ත වේ. විශේෂයෙන්ම, ආසියාවේ සමාජ ප්‍රතිමාන සහ ආගමික විශ්වාස යනාදිය නීති පැනවීමේදීත් නීති සංශෝධනය කිරීමේදීත් බලපෑම් එල්ල කරන අතර නීති සම්පාදකයන් කෙරෙහිද බලපෑම් එල්ල කරන බව පැහැදිලිව දැකිය හැකිය. මේ සඳහා උදාහරණ රාශියක් පෙන්වා දිය හැකිය. ඉතා පහසුවෙන් අවබෝධ කරගත හැකි මෑතකාලීන නිදසුනක් වශයෙන්, ශ්‍රී ලංකාවේ ගබ්සා කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ නීති සංශෝධනය ආගමික සහ සංස්කෘතික සාධක හේතු වශයෙන් ඉදිරිපත් කොට අත්හැර දැමීම සඳහන් කළ හැකිය.[32] ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය අනුව මවගේ ජීවිතයට අනතුරක් ඇතිවිය හැකි අවස්ථාවේදී පමණක් ගබ්සා කිරීම සඳහා අවසර ලබාදී තිබේ.[33] ගබ්සා කිරීම් සම්බන්ධයෙන් වන මෙකී දැඩි විධිවිධාන සෞඛ්‍ය සඳහා වන නිදහස ඇතුළු කාන්තාවන්ගේ විවිධ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමේ පදනමින් ස්ත්‍රී දූෂණය, ව්‍යභිචාරය සහ දරු කළලයට බරපතල රෝගී තත්ත්වයක් ඇතිවී තිබීම වැනි ව්‍යතිරේකී විශේෂිත අවස්ථාවන්හිදී ගබ්සා සිදුකිරීමට අවසර ලැබෙන පරිදි නීතිය සංශෝධනය කළ යුතු බවට දශක ගණනාවක් පුරා මානව හිමිකම් පිළිබඳ ක්‍රියාකාරීන් විසින් උද්දේශනය කරමින් සිටිනු ලැබේ.[34] මෙම නීති සංශෝධනය සඳහා අවස්ථා ගණනාවකදී උත්සාහ කරනු ලැබුවද ආගමික නායකයන්ගේ මැදිහත්වීම හේතුවෙන් ඒවා කිසිවක් සාර්ථක වූයේ නැත. (Kumarage, 2019). 1995 වසරේදී යම් ව්‍යතිරේක විශේෂිත අවස්ථාවන්හිදී ගබ්සාව අනුමත කිරීම සඳහා නීති සංශෝධන පාර්ලිමේන්තුවේ විවාදය සඳහා ඉදිරිපත් කළ අවස්ථාවේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ආගමික හා සංස්කෘතික මූලධර්ම පදනම් කරගනිමින් එයට දැඩි ලෙස විරෝධතාව දැක්වූහ.

**‘ගබ්සා කිරීම නීතිගත කිරීම මගින් නැතහොත් ගබ්සා කිරීම පිළිබඳව දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන ලිහිල් කිරීම මගින් සමාජයේ සෑම කොටසකම විරෝධතාව මතු වෙනවා. එසේ කිරීම තුළින් තමුන්නාන්සේලා මේ රටේ ජනතාවගේ සමාජ හා සංස්කෘතික ජීවිතයේ මූලිකාංගවලට බලපෑම් කිරීමට උත්සහ කරනවා” ජේ.ඒ.ඊ. අමරතුංග, පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තාව, 1995 සැප්තැම්බර් 19 (පිටුව 102)**

**‘අද අප සමාජයේ, අපගේ ආගම හා සංස්කෘතිය අනුව, කාන්තාවක් ගැබ් ගැනීම තුළින් කාන්තා වර්ගයේ උත්තරීතර පදවිය වූ මව් පදවිය ඇය ලබාගන්නවා. නමුත් මෙම නීතිය මාතෘත්වය නැමැති පූජනීයත්වයට කැළලක් ඇතිකර තිබෙනවා. මෙය තමුන්නාන්සේලා හොඳින් වටහා ගත යුතුයි. වසර 2500ක ප්‍රෞඩ ඉතිහාසයකට හිමිකම් කියන අප රටේ සංස්කෘතික සභ්‍යත්වයන් නියමිත පරිදි ආරක්ෂා වී පැවතෙනවා.” පුලේන්තිරන් මිය, පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තාව, 1995 සැප්තැම්බර් 19 (පිටුව 118)**

මෙම විවාදය අවසානයේ දී, රජය විවිධ ආගමික හා සංස්කෘතික සම්ප්‍රදායන් සැලකිල්ලට ගන්නා බැවින් එකී පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගන්නා බව එවකට සිටි අධිකරණ අමාත්‍යවරයා ප්‍රකාශ කළේය.[35] එසේම 2017 වසරේදී අධිකරණ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ ආචාර්ය විජේදාස රාජපක්ෂ මැතිතුමා මේ සම්බන්ධයෙන් පනත් කෙටුම්පතක් ගෙන ආ අවස්ථාවේදී එවකට ජනාධිපතිවරයා වශයෙන් කටයුතු කළ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පනත් කෙටුම්පතට "දැඩිවිරෝධතාව දක්වා සිටි ආගමික නායකයන් සමග සාකච්ඡා කිරීමට කැමති වූයෙන්" එම පනත් කෙටුම්පත, කෙටුම්පත් කිරීමේ කාර්යය නවතා දැමුණි.[36]

---

32 Saira Meyler, ‘Abortion- Where is Sri Lanka on the Spectrum?’ (Groundviews, 02 September 2018) <https://groundviews.org/2018/09/02/abortion-where-is-sri-lanka-on-the-spectrum/amp/> accessed 7 July 2021.

33 Penal Code of Sri Lanka, section 303- 307

34 Dinesha Samararatne, ‘The abortion debate: mismatched and misplaced’, (Groundviews, 13 September 2017) <https://groundviews.org/2017/09/13/the-abortion-debate-mismatched-and-misplaced/> accessed 2 February 2021; Law Commission of Sri Lanka, ‘Medical Termination of Pregnancy – Proposals of the Law Commission of Sri Lanka’, (February 2013), page 2 <http://lawcom.gov.lk/web/images/stories/reports/medical_termination_of_pregnancy_proposals_of_the_law_commi ssion_of_sri_lanka.pdf> accessed 2 February 2021.


35 Hansard of Parliament of Sri Lanka, 20th September 1995. 5.

36 Supra 21.

මෙහිදී කාන්තාවන්ගේ මූලික අයිතිවාසිකම් තහවුරු කරන නීති සංශෝධනයක් ආගමික හා සංස්කෘතික කරුණු කාරණා හේතු වශයෙන් ගෙන හැර දක්වමින් අවස්ථා ගණනාවක දී වළක්වා තිබීම පැහැදිලිව දැකගත හැකිය. මෙලෙස ආගමික විශ්වාස සහ භාවිතයන් සහ ඒවා පාදක කර ගනිමින් ගොඩනගා ඇති සමාජ ප්‍රතිමාන චාරිත්‍රානුකූල නීති කෙරෙහි පමණක් නොව රටේ සාමාන්‍ය නීතීන් කෙරෙහිද බලපෑම එල්ල කරනු දැකිය හැකිය.

සමාජ ප්‍රතිමාන සහ ආගමික විශ්වාස නීතින් කෙරෙහි බලපෑම් එල්ල කරමින් ඒ හරහා පුද්ගල අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කරන ආකාරය කෝට්නි හෝලන්ඩ් අදියර තුනක් යටතේ විස්තර කරයි. (Howland, 1999).

රූප සටහන 1.3




ලංකාවේ දැනට බලාත්මකව පවතින උඩරට නීතිය, තේසවලමෙයි නීතිය සහ මුස්ලිම් නීතිය වැනි විශේෂ පුද්ගල නීතින් හි මෙවැනි ආගමික හා සංස්කෘතික මූලධර්මයන්ගේ බලපෑම බහුල වශයෙන් දැකිය හැකිය. එයින් කිහිපයක් පිළිබඳව කෙටියෙන් අවධානය යොමුකරමු.

## 1.4.1 ඉඩම් අයිතිවාසිකම්

ශ්‍රී ලංකාවේ කාන්තාවන් සඳහා ඉඩම් අයිතිවාසිකම් දීර්ඝ කාලීනව ප්‍රතික්ෂේප කොට ඇත. බලාත්මකව පවතින විවිධ නීතීන් ඉඩම් අයිතිවාසිකම් සම්බන්ධයෙන් කාන්තාවන්ට ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත වෙනස්කොට සැලකීමට මගපාදා ඇත (Pinto-Jayawardena & Jayantha, 2010). විශේෂයෙන්ම, චාරිත්‍රානුකූල නීතීන් පිළිබඳව සලකා බැලීමේදී, තේසවලමෙයි නීතිය තුළට[37] ඇතුළත්වන 1911 අංක 1 දරන යාපනයේ වෛවාහක අයිතිවාසිකම් හා උරුම ආඥා පනතේ 6 වන වගන්තිය (1947 අංක 58 දරන සංශෝධනය අනුව) විවාහක කාන්තාවන්ගේ පෞද්ගලික නිශ්චල දේපල අන්සතු කිරීම සඳහා හෝ ඒ පිළිබඳ කටයුතු කිරීම සඳහා ස්වාමිපුරුෂයාගේ ලිඛිත අවසරය අවශ්‍ය බව සඳහන් කරයි.[38] මෙම චාරිත්‍රානුකූල නීති විධිවිධානය සංස්කෘතික සම්ප්‍රදායන් සමග සම්බන්ධ වන ආකාරය පෙන්වීම සඳහා මනුගේ නීතිය සහ කාව්‍යශේඛරය වැනි සාහිත්‍යයන් උපුටා දැක්විය හැකිය.

---

**37** තේසවලමෙයි නීතිය උතුරු පළාතේ පදිංචි ද්‍රවිඩ ජනතාව පාලනය කිරීම සඳහා වන පුද්ගල නීතියකි. මෙය මුල්කාලීනව අසංවිධිත, අලිඛිත චාරිත්‍රානුකූල නීතියක් වශයෙන් පැවතිණි. ලන්දේසී පාලන සමයේදී සයිමන්ස් ආණ්ඩුකාරවරයාගේ නියමය පරිදි 1806 අංක 18 දරණ තේසවලමෙයි රෙගුලාසි යන නමින් සංග්‍රහගත කරන ලදී. ඉන් අනතුරුව යාපනයේ වාසයකරන ද්‍රවිඩ ජනතාවට අදාලවන පුද්ගලික නීතියක් බවට පිළිගත් අතර එහි හිඩැස් පිරවීමේ නීතිය වශයෙන් රෝම ලන්දේසි නීතිය පැවතිණි. ඉංග්‍රීසි පාලන සමයේදී 1911 අංක 1 දරන යාපනයේ වෛවාහක අයිතිවාසිකම් හා උරුම ආඥා පනත පනවන ලදී.

**38** 6 වන වගන්තිය මෙලෙස දක්වයිඃ මෙම ආඥා පනත බලාත්මක වීම ආරම්භ වීමෙන් පසු විවාහ වූ කාන්තාවකට ඇය විවාහ වන අවස්ථාවේ දී හිමිවන සියලුම චංචල හා නිශ්චල දේපල ඇගේ වෙනම දේපල වශයෙන් ඇයට හිමිවිය යුත්තේය. ත්‍යාග හෝ උරුමයෙන් විවාහය පවතින අවස්ථාවේදී එම කාන්තාව විසින් අත්කර ගන්නා හෝ හිමිකාරීත්වයෙන් ලැබී ඇති සියලු චංචල හා නිශ්චල දේපල ද ඇගේ වෙනම දේපල වශයෙන් ඇයට හිමිවිය යුත්තේය. ඉහත කී කාන්තාවගේ දේපල දෙයාකාරයකට වර්ගීකරණය කර තිබේ. ඒ විවාහය සිදුකර ගන්නා අවස්ථාවේදී ඇය සතුව පවතින දේපල සහ විවාහය පවතින අවස්ථාවේදී අත්කරගන්නා ලද දේපල වශයෙනි. මේවා ස්වාමිපුරුෂයාගේ ණය හෝ වෙනත් බැරකම් සඳහා වගකීමට යටත් නොවේ. එවැනි කාන්තාවකට චංචල දේපල සම්බන්ධයෙන් ස්වාමිපුරුෂයාගේ අවසරය නොමැතිව නීත්‍යානුකූල වශයෙන් එවැනි දේපලක් අන්සතු කිරීමට හෝ හැසිරවීමට පූර්ණ බලය ඇත. එනමුත් නිශ්චල දේපලක් බැහැර කිරීම සඳහා හෝ වෙනත් ආකාරයකට හැසිරවීම සඳහා ස්වාමිපුරුෂයාගේ ලිඛිත අවසරය ලබා ගත යුතු වේ. නිශ්චල දේපලක් අන්තිම කැමති පත්‍රයක් මගින් බැහැර කිරීම සඳහා ස්වාමිපුරුෂයාගේ අවසරය අවශ්‍ය නොවේ. එනම් අවිවාහක කාන්තාවක මෙන් අන්තිම කැමති පත්‍රයක් මගින් දේපල අන්සතු කළ හැකිය.

පළමුව මනුධර්ම නීතිය නම් වූ ග්‍රන්ථය පිළිබඳව විමසා බලන්නේ නම්, එය ස්වායම්භුව (මනු) යනුවෙන් හඳුන්වනු ලබන වෛදික ඍෂිවරයා විසින් ක්‍රි.පූ.1500 දී ලියන ලද ග්‍රන්ථයක් බව පෙනී යයි. මෙම ග්‍රන්ථය හින්දු ලබ්ධිකයන් උපතේ සිට මරණය දක්වා තම ජීවිත කාලය තුළ අනුගමනය කළ යුතු වත්පිළිවෙත්, සම්ප්‍රදායන් හා ධාර්මික විනය රීතීන් පිළිබඳව විස්තර කරයි. මෙම මනුධර්ම නීතියේ බලපෑම ඉන්දියාවේ බහුල වශයෙන්, එනම්, රටෙහි නීතියට ඇතුලත් කර ගන්නා තත්ත්වයට පත්ව තිබුණි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ, විශේෂයෙන්ම, උතුරු පළාතේ ප්‍රායෝගිකව අනුගමනය කෙරෙන බොහෝ සිරිත් ඉන්දියාවේ සිට පැමිණි ඒවා යන පදනමින් මෙම මනුධර්ම රීතීන්ගේ බලපෑම උතුරු පළාතේ ද දැකිය හැකිය. එහි 5.147 රීතිය පහත පරිදි සඳහන් කරයි.

**"කුඩා දැරියකව සිටියදීත්, තරුණියකව සිටියදීත්, වයෝවෘද්ධ කාන්තාවකව සිටියදීත් කිසිවක් ස්වාධීනව සිදු නොකළ යුතුය. තම නිවසේ දී පවා එසේ නොකළ යුතුය."**

කාන්තාවන් ස්වාධීන තීරණ ගැනීමට නුසුදුස්සන් වේ යන මනුධර්ම රීතිය අනුගමනය කිරීම කාන්තාවට හිමි නිශ්චල දේපලක් විකිණීම සඳහා ස්වාමිපුරුෂයාගේ ලිඛිත අවසරය අවශ්‍ය වීමට හේතු වී ඇති බවට සැලකිය හැකිය.

මීළඟට, පහළොස්වන සියවසේ නිර්මාණය වූ ඉතා ප්‍රසිද්ධ කාව්‍යශේඛරය නම් සිංහල සාහිත්‍යය ග්‍රන්ථය, "කාන්තාවක් තම ස්වාමි පුරුෂයාගේ අවසරයකින් තොරව තම දරුවන්ට පවා කිසිවක් ලබා නොදිය යුතුය" යන නියමය අලංකාර වැකි මගින් ඉතාමත් අවධාරණයෙන් යුතුව දක්වා ඇත (Jayawardena, 2016). මෙලෙස ශ්‍රී ලංකාවේ බලපෑම් ඇති කළ හැකි තත්ත්වයට පත්ව සිටි සිංහල හා දමිළ ප්‍රජාවන් විසින් අනුගමනය කරන ලද සමාජ සිරිතක් නැතහොත් සමාජ ප්‍රතිමානයක් වශයෙන් මෙය 1911 පනවන ලද චාරිත්‍රානුකූල නීතියෙහි විධිවිධානයක් ලෙස ඊට ඇතුලත් වී ඇති බවට සඳහන් කළ හැකිය.

## 1.4.2 ස්ත්‍රී දූෂණය පිළිබඳ නීතිය

ශ්‍රී ලංකාවේ ස්ත්‍රී දූෂණය පිළිබඳ නීතිය ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන මගින් පාලනය වේ.[39] කෙසේ වෙතත්, ශ්‍රී ලංකා සාක්ෂි ආඥා පනතේ[40] ඇතැම් විධිවිධාන මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත වෙනස්කොට සැලකීමක් දක්වයි. එනම්, සාක්ෂි ආඥාපනතේ 155 වන වගන්තිය, සාක්ෂිකරුගේ විශ්වාසදායකත්වයට දොස් තැබීම පිළිබඳව සඳහන් කරයි. මෙම වගන්තියේ (ඈ) උපවගන්තිය මගින් දැක්වෙන්නේ, "ස්ත්‍රී දූෂණය කිරීමක් ගැන හෝ දූෂණය කිරීමට තැත් කිරීමක් ගැන මිනිසකුට විරුද්ධව නඩු පවරනු ලැබූ විට, චෝදක තැනැත්තී සාමාන්‍යයෙන් අයහපත් චරිතයකින් යුක්ත යැයි පෙන්විය හැකිය" යනුවෙනි. මෙම නෛතික විධිවිධානය, "ස්ත්‍රී දූෂණයට ලක්වන කාන්තාව අයහපත් චරිතයකින්ම යුක්ත විය යුතුය" නැතහොත් "ඉදිකටුව ඉඩ නොදෙන්නේ නම් නූලට ඇතුල්විය නොහැක" නැතහොත් "කාන්තාවක් යහපත් චරිතයකින් යුක්ත වේ නම් පුරුෂයෙකු වැරදි කිරීමට පෙළඹෙන්නේ නැත" වැනි සමාජයේ පවතින මත නැතහොත් ප්‍රතිමාන පිළිබිඹු කරන තත්ත්වයක් පෙන්නුම් කරයි. 2013 දී කෙයාර් ඉන්ටර්නැෂනල් ආයතනය විසින් සිදුකරන ලද සහභාගිත්ව පර්යේෂණයේදී පර්යේෂණය සඳහා දත්ත ලබාදුන් කාන්තාවන් 653 දෙනාගෙන් තුනෙන් දෙකකට වැඩි පිරිසක් "ස්ත්‍රී දූෂණයක් වාර්තා වන අවස්ථාවකදී, ප්‍රථමයෙන් එම කාන්තාව යහපත් චරිතයකින් යුක්ත වූ තැනැත්තියක් ද යන්න සොයා බැලිය යුතුය" යන අදහස ඉදිරිපත් කර තිබුණි. (Mel, Peiris, & Gomez, 2013).

***39*** ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය, 363 සහ 364 වගන්ත

***40*** 1895 අංක 14 දරන, සාක්ෂි පිළිබඳ නීතිය සම්පාදනය කිරීමටත් එය අර්ථ නිරූපණය කිරීමටත් සංශෝධනය කිරීමටත් සඳහා වන ආඥා පනත

මීළඟට වෛවාහක ස්ත්‍රී දූෂණය පිළිබඳව සලකා බැලීමේදී ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ අධිකරණ පාත්‍රතාවට ඇතුළත් නොවන, ස්වාමි පුරුෂයා සහ භාර්යාව අතර සිදුවන බලහත්කාර සංසර්ගය (ස්ත්‍රී දූෂණය) අපරාධ වරදක් බවට නීතිගත කොට නොමැත. "විවාහ වන අවස්ථාවේදී කාන්තාවක් සංසර්ගය සඳහා වන ඇයගේ පූර්ණ කැමැත්ත තම ස්වාමිපුරුෂයාට ලබා දෙන්නීය." නැතහොත් "විවාහ වන මොහොතේ සිට භාර්යාව ස්වාමිපුරුෂයාගේ දේපළක් බවට පත්වන්නීය" යනාදී සමාජමය හෝ සංස්කෘතිකමය සම්ප්‍රදායන් නැතහොත් ප්‍රතිමාන පදනම් කරගනිමින් වෛවාහක ස්ත්‍රී දූෂණය අපරාධයක් බවට පත්කිරීම සඳහා වන නීති සංශෝධන සඳහා බාධක ඇති කෙරේ.[41] භාර්යාව, ස්වාමිපුරුෂයාගේ දේපළක් බවට දකින ප්‍රවණතාව දමිළ සහ මුස්ලිම්ප්‍රජාවන් අතර සුලභ වශයෙන් දැකිය හැකිය. හින්දු ආගමේ එන ඉපැරණි මහාභාරත[42] වීර කාව්‍යයේ, පංච පාණ්ඩවයින්, දුර්යෝදන සමග සූදු ක්‍රීඩාවෙහි යෙදී පැරදුණු අවස්ථාවේදී අවසාන වශයෙන් තම භාර්යාව දුර්යෝදනට උකස් තබා සූදු ක්‍රීඩාවේ නිරත වූ බවට සඳහන් වේ. මෙම ඉපැරණි වීරකාව්‍ය පැරණි පාසල් විෂය නිර්දේශයට ද ඇතුළත් වී තිබුණි. මෙහිදී පාණ්ඩවයින්ගේ ක්‍රියාව විවේචනයට ලක් කිරීමේදී ඔවුන් සූදු ක්‍රීඩාවේ නිරත වීම විවේචනය වූ තරමට ඔවුන්ගේ භාර්යාව වූ දෞපදී උකස් කරනු ලැබීමේ සිද්ධිය විවේචනයට ලක්නොවූ අතර දෞපදී දෙවියගේ පුද්ගල අයිතිවාසිකම් පිළිබඳව ද සාකච්ඡා කොට නොමැත. මෙම සාහිත්‍යය පෙළපොත් තුළට ඇතුළත් කිරීමේ අරමුණ සූදු ක්‍රීඩාව ධර්මයට එරෙහි වරදක් බව පෙන්වීමටත් අනෙකුත් සාහිත්‍යමය කරුණු ඉගැන්වීමටත් වේ. කෙසේ නමුත්, ධර්මය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් සුප්‍රසිද්ධ පාණ්ඩවයන්ම හදිසි තත්ත්වයකදී තම බිරිඳ උකස් කරනු ලැබීමේ සිද්ධිය ද එම සිද්ධිය කාන්තා අයිතිවාසිකම් මත පදනම්ව විවේචනය නොවීමටද කතාබහට ලක් නොවීමටද හේතුව වන්නේ දෞපදී දෙවිය පාණ්ඩවයින්ගේ දේපලක් බවට වන ඒකාකෘතික ආකල්පය මිස අන් කිසිවක් නොවන බව පැහැදිලි වේ. එබැවින්, මෙවැනි වීරකාව්‍යයන්ගේ මග පැමිණ, වත්මන් සමාජයේ ද ස්ථාපිත වී ඇති "භාර්යාව, ස්වාමිපුරුෂයාගේ දේපලක්ය" යන සමාජ ප්‍රතිමානය නැතහොත් ඒකාකෘතික ආකල්පය විසින් වෛවාහික ස්ත්‍රී දූෂණය අපගේ සංස්කෘතියට වෙනස් දෙයක් ලෙස සැලකීමට හෝ එය බටහිර සංකල්පයක් ලෙස සැලකීමට මූල බීජ වපුරා ඇති බවට සඳහන් කළ හැකිය.

මේ අනුව නීතීන්, සමාජ ප්‍රතිමාන සහ ආගමික මූලධර්ම අතර සමීප සබඳතාවක් පවතින බව පෙනීයයි. කෙසේ වෙතත්, සමාජ ප්‍රතිමාන මගින් ඇති කෙරෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීමෙන් කාන්තාවන් ආරක්ෂා කිරීම සඳහා නීති පනවා ඇති අවස්ථාවන්හිදී පවා සමාජ ප්‍රතිමානයන්ගේ ස්ථාවරභාවය හේතුවෙන් ඒවා නීතීන් අභිබවා ක්‍රියාත්මක වන අවස්ථාවන්ද දැකිය හැකිය. උදාහරණ වශයෙන්, ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් කාන්තාවන් ආරක්ෂා කිරීමේ පනත[43] 2005 වසරේදී සම්මත කරනු ලැබුවද ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳව පැමිණිලි කිරීම සඳහා පොලිස් ස්ථාන කරා යන කාන්තාවන්ට එහි සිටින පොලිස් නිලධාරීන් සමාජ ප්‍රතිමානයන් "කාන්තාවන් අනුගමනය කළ යුතු විනය රීති ලෙස" ගෙනහැර දක්වමින් ඔවදන් ලබාදී පිටත් කර යවන ප්‍රවණතාවයක් ද දැකිය හැකිය.[44] මේ සඳහා තවත් නිදර්ශනයක් වශයෙන්, දකුණු අප්‍රිකාවේ ගබ්සා කිරීම නීතිගත කිරීමෙන් පසුවද[45] එහි සිදුවන නීති විරෝධී ගබ්සා කිරීම් සංඛ්‍යාව වැඩිවී තිබීම පෙන්වා දිය හැකිය.[46] ඊට ප්‍රධාන හේතුවක් වශයෙන් ගබ්සා කිරීම සම්බන්ධයෙන් සමාජයේ පවතින සමාජ ප්‍රතිමාන සහ සමාජීය වශයෙන් ඇතිවන කැළල පවතින බව පර්යේෂණ මගින් හෙළි වී තිබේ.[47] එබැවින්, සමාජ ප්‍රතිමාන මගින් ඇති කෙරෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස්කොට සැලකීම් වලට විරුද්ධ වීම සඳහා ප්‍රගතිගාමී නීතීන් ක්‍රියාත්මක කරනු ලැබුවද අදාල සමාජ ප්‍රතිමාන එම සමාජයෙන් තුරන් කරන තාක් එකී නීතීන්හි පූර්ණ ඵලය භුක්ති විඳීම ප්‍රායෝගික නොවනු ඇත.

---

*41* ශ්‍රී ලඞබෘ එෘර්ලිඎණ්තු ගැණ්ෂෘජ් තර්තෘජ, 1995 ෂැප්තැඳෲහර් 19 ෂග 20

*42* මහා භාරතය යනු ධාර්මික රීතීන් අනුගමනය කරන පංච පාණ්ඩවයින් සහ අධාර්මික ලෙස ක්‍රියාත්මක වන දුර්යෝදන ඇතුළු කුරුවරු අතර සිදුවන යුද්ධය පිළිබඳ කතා පුවත ඇතුළත් වීර කාව්‍යය කි. දෞපදී දේවියපාණ්ඩවයින් පස්දෙනාගේ බිරිඳ වූවාය.

*43* 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව ක්‍රියා වැළැක්වීමේ පනත.

*44* කාන්තාවක් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට ගිය අවස්ථාවේදී, විවාහ උත්සවයකදී ඇය නර්තනයක නිරත වීම නිසා පහර දුන් බව ස්වාමිපුරුෂයා ප්‍රකාශ කිරීම මත පොලිස් නිලධාරීන් ද එය අනුමත කරමින් එලෙස නර්තනයක නිරත වීම යහපත් නොවන බව එකී කාන්තාවට ඔවදන් දී පිටත්කර යැවූහ. : Women Action Network, 'Women's Access to Justice in the North and East in Sri Lanka' CEDAW Shadow Report, (August 2016) <https://tbinternet.ohchr.org/Treaties/CEDAW/Shared%20Documents/LKA/INT_CEDAW_NGO_LKA_25964_E.pdf> accessed 21 November 2020.

*45* The choice on Termination of Pregnancy Act, No. 92 of 1996

*46* 'Preventing unsafe abortions' (WHO, 25 September 2020) <https://www.who.int/news-room/fact-sheets/detail/preventing-unsafe-abortion> accessed 07 July 2021.

*47* *Ibid*

## 1.5 අවසාන වශයෙන්...

1920 කාල වකවානුවේ ජීවත් වූ සෙල්ලම්මාල් සහ පියදාස සිරිසේන වැනි කවීන්ගේ පටන් වර්තමාන මානව හිමිකම් පිළිබඳ ක්‍රියාකාරීන් දක්වා විවිධ කාලවකවානුවන්හි විවිධ පාර්ශව විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනමින් කාන්තාවන්ට එරෙහිව සිදුවන වෙනස්කොට සැලකීම පිළිබඳ සමාජ ප්‍රතිමානයන් විවේචනයට ලක් කෙරී ඇත. සමාජයේ ඉතා ගැඹුරින් මුල් බැස පවතින මෙම සමාජ ප්‍රතිමාන තුරන් කිරීම දැඩි ප්‍රයත්නයන් අවශ්‍ය කරන කාර්යයකි. කෙසේ වෙතත්, රටක ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව යනු එම රටෙහි සාමය පිළිබිඹු කරන ප්‍රධාන දර්ශකයක් ලෙස සැලකෙන අතර ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබිඹු කරන රටවල ප්‍රචණ්ඩත්වය ඉතා අවම මට්ටමක පවතින බව පර්යේෂණ මගින් ද සනාථ කර තිබේ (Jacevic & al, 2021). එබැවින් මෙපමණ වැදගත්කමකින් යුත් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීම සඳහා දැඩි උත්සාහයක නිරත විය යුතු අවශ්‍යතාව සහ යුතුකම අප සියලු දෙනාටම ඇත. ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ මුල්බැස ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමානයන් පිළිබඳව සහ ඒවා කාන්තාවන්ගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස කෙරෙහි බලපාන ආකාරය පිළිබඳව සාකච්ඡා කෙරෙන මෙම පර්යේෂණ වාර්තාව එම ප්‍රයත්නයේ පළමු පියවර බවට පත්වේ.

# 2 වන පරිච්ඡේදය

## 2 ලිපි ග්‍රන්ථ විමසුම

### 2.1 සමාජ ප්‍රතිමාන සහ ඒවායෙහි ලක්ෂණ

'සමාජ ප්‍රතිමානී' (social norms) යන යෙදුම සඳහා තනි නිර්වචනයක් ලබාදීම අපහසු කාර්යයකි. සමාජ ප්‍රතිමාන, විවිධ සමාජයන්හි පවතින වෙනස් වූ වාතාවරණයන්ට අනුව විවිධ වූ ස්වරූපයන්ගෙන් ස්ථාපිතව පවතී. 2019 වසරේ දී UNDP ආයතනය විසින් සිදුකරන ලද පර්යේෂණය මගින්, සමාජ ප්‍රතිමාන 'සංස්කෘතික මූලිකාංග, 'සංස්කෘතික මූලධර්ම', 'ආගමික විශ්වාසයන්' නැතහොත් 'පාරම්පරික පුරුදු පුහුණු නැතහොත් සම්ප්‍රදායන් ලෙස' ස්ථාපිතව පැවතිය හැකි බවත් විශේෂයෙන්ම, ඒවා අනන්‍යතාවන් හා බද්ධව පවතින බවත් පෙන්නුම් කරයි (UNDP, 2019). මෙම සමාජ ප්‍රතිමානයන්හි ස්වභාවය ඍජුව නිරීක්ෂණය කිරීම අපහසු බැවින් ඒවාහි බලපෑම වටහා ගැනීම සංකීර්ණ වේ. කෙසේ වෙතත්, මේවා සමාජයේ පුරුෂයන් හා ස්ත්‍රීන් අතර බල ගතිකතාවයන් අර්ථ නිරූපණය කිරීම මගින් සමාජයෙහි බල ව්‍යුහයන් ආරක්ෂා කරන බව මෙම පර්යේෂණය මගින් පැහැදිලිව පෙන්නුම් කරයි (UNDP, 2019).

'සමාජ ප්‍රතිමාන සමාජයේ උපරිම ව්‍යුහයන් තුළ බහුල වශයෙන් ස්ථාපිතව පවතී' යන්න මෙම පර්යේෂණය මගින් හඳුනාගෙන ඇති සමාජ ප්‍රතිමාන පිළිබඳ තවත් ලක්ෂණයක් වේ (UNDP, 2019). 'ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීම වයස් ව්‍යුහය සමග එක්වී මෙම තත්ත්වය වර්ධනය කරන්නේය යනුවෙන් අයේශා බානු සඳහන් කරයි. මේ සඳහා නිදසුනක් වශයෙන්, ප්‍රාථමික අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය ලැබීම සම්බන්ධයෙන් කාන්තාවන් කෙරෙහි දක්වනු ලබන වෙනස්කොට සැලකීමේ මට්ටම ඇය පෙන්වා දෙයි. එනම්, ගැහැනු දරුවන් ප්‍රාථමික අධ්‍යාපනය ලැබීම සම්බන්ධයෙන් එතරම් බාධා එල්ල නොවූවද ඔවුන් උසස් අධ්‍යාපනය ලැබීම සම්බන්ධයෙන් සමාජ පාලනයන් මගින් බාධා පැනවෙන බවත් නිදසුන් වශයෙන් ඇය පෙන්වා දෙයි (Banu, 2016). මෙම පර්යේෂණයන් දෙක මගින්ම සමාජ ප්‍රතිමාන සහ ඒවා මගින් සමාජයෙහි ඇති කෙරෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳිවෙනස්කොට සැලකීමේ බලපෑම් පිළිබඳ අධ්‍යනයන් හා පර්යේෂණයන් සිදු කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙයි. UNDP ආයතනය විසින් සිදුකරන ලද පර්යේෂණය ගෝලීය වශයෙන් ද, අයේශා බානු විසින් සිදුකරන ලද පර්යේෂණය ශ්‍රී ලංකාව, ඉන්දියාව, පාකිස්තානය බංග්ලාදේශය වැනි රටවල් ආවරණය වන පරිදි ද සිදුකර තිබේ. කෙසේ නමුත්, මෙකී පර්යේෂණයන් දෙක මගින්ම ශ්‍රී ලාංකික පසුබිමෙන් විශේෂයෙන්ම, පශ්චාත් යුද සමාජ පසුබිමෙන් සමාජ ප්‍රතිමාන හා ඒවායේ ක්‍රියාකාරීත්වය ගැඹුරින් සලකා නොබැලුවද, සමාජ ප්‍රතිමාන, ඒවායෙහි ක්‍රියාකාරීත්වය සහ ප්‍රතිවිපාක පිළිබඳ පොදුවේ අවබෝධයක් ලබාගත හැකි තොරතුරු ඉදිරිපත් කර තිබේ.

#### 2.1.1 සමාජ ප්‍රතිමාන ස්ත්‍රී පුරුෂ සමාජභාවය සමග සම්බන්ධවන ආකාරය

සමාජ ප්‍රතිමාන බොහෝ දුරට ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සම්බන්ධ වේ. ශ්‍රී ලංකාවේ 'විවාහය' යන සමාජ සංස්ථාව තුළ 'පීතෘ මූලික සමාජ න්‍යාය' ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් 2015 වසරේදී විතානගේ විසින් සිදුකරන ලද ලිපිග්‍රන්ථ විමසුමෙහි, 'පීතෘමූලික සමාජ න්‍යාය' (patriarchy) යනු "සමාජයෙහි කාන්තාවන් කෙරෙහි විධිමත්ව යොදා ගැනෙන පුරුෂාධිපත්‍යය" බවට දක්වා ඇත (Vithanage, 2015). පීතෘමූලික සමාජයන්හි එනම් පුරුෂාධිපත්‍යය සහිත සමාජයන්හි ගොඩනගා තිබෙන විවාහය නම් සමාජ සංස්ථාව ඇතුළු සෙසු සියලු සමාජ සංස්ථාවන්හි පුරුෂයින් සඳහා අධික බලයක් ලබාදී ඇති බව මෙහි කර්තෘ විතානගේ තර්ක කරයි. පුරුෂාධිපත්‍ය සහිත සමාජ ව්‍යුහයන් තුළ ගොඩනැගී ඇති සමාජ ප්‍රතිමාන ලිංගිකත්වය පදනම් කරගනිමින් කාන්තාවන් පහළ ස්ථරයේ පසුවන නැතහොත් යටහත් අය වශයෙන් විග්‍රහ කරන අතර බොහෝ ආගම් පුරුෂාධිපත්‍යයට පක්ෂපාතී වූ මූලධර්ම වලින් සමන්විත බැවින් ඒවා ද මෙකී සමාජ ප්‍රතිමානයන් පෝෂණය කරයි (Vithanage, 2015) යනුවෙන් ඔහු පැහැදිලි කරයි. එබැවින්, මෙම සමාජ ප්‍රතිමානයන් ගොඩනැගී ඇති ව්‍යුහය පුරුෂාධිපත්‍යයෙන් සමන්විත බැවින් එකී සමාජ ප්‍රතිමාන ස්ත්‍රී පුරුෂ සමා

ජභාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීමෙන් සමන්විත වන බවටත් එකී පුරුෂාධිපත්‍ය ව්‍යුහය ආගමික මූලධර්ම මඟින් පෝෂණය කර තිබෙන බවටත් (Vithanage, 2015) ඔහු ඔප්පු කර දක්වයි. පුරුෂාධිපත්‍යයෙහි බිහිවීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ දී, "පුරුෂාධිපත්‍යය යන්න ස්වයංව පුරුෂයින් තුළ නිර්මාණය වූ දෙයක් නොවන අතර කාලාන්තරයක් තිස්සේ ආගම විසින් නිර්මාණය කරන ලද්දක්" (Elackia, 2016, p. 14) බව ඉලක්කියා සඳහන් කරයි. කෙසේ වෙතත්, ලෝක සෞඛ්‍ය සංවිධානය සහ ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සිදුකරන ලද පර්යේෂණයක් මගින් "පුරුෂාධිපත්‍ය යනු ජීව විද්‍යාත්මක දෙයක් නොවන අතර එය මිනිසා විසින් ගොඩනගන ලද දෙයක්" වශයෙන් පෙන්වයි (WHO & Nutrition, 2008).

මෙලෙස, සමාජ ප්‍රතිමාන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව ගොඩනැගී ඇති බැවින් ඒවා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීමෙන් යුක්ත වේ. එබැවින්, සමාජ ප්‍රතිමාන ස්ථාපිත වී ඇති ප්‍රමාණය සහ ස්ත්‍රී පුරුෂ අසමානතාව අතර සමීප සබඳතාවක් පවතී. එනම්, සමාජ ප්‍රතිමාන බහුල වශයෙන් ස්ථාපිත වී ඇති සමාජයන්හි ස්ත්‍රී පුරුෂ අසමානත්වයේ ප්‍රමාණයද වර්ධනය වී පවතින බව පර්යේෂණ මගින් සොයාගෙන තිබේ (UNDP, 2019). මේ පිළිබඳව සඳහන් කිරීමේදී, "ස්ත්‍රී පුරුෂ අසමානතා සමාජය ප්‍රතිමාන මත රැඳී ඇත" (Banu, 2016) යනුවෙන් අයේශා බානු සිය වාර්තාවෙහි සඳහන් කර ඇත.

## 2.1.2 සමාජ ප්‍රතිමාන සහ ආගමික මූලධර්ම

විතානගේ විසින් පෙන්වා දී ඇති පරිදිල ආගම ඍජුව සහ/හෝ වක්‍රව සමාජ ප්‍රතිමාන බිහිවීමේ මූලික ප්‍රභවය වේ (Vithanage, 2015). කෙසේ වෙතත්, මහාචාර්ය ගුණසේකර සංස්කෘතික ක්‍රියාකාරකම් සහ ආගමික මූලධර්ම අතර වෙනසක් දැක්වීමට උත්සාහ දරයි. ඇතැම් සාම්ප්‍රදායික චාරිත්‍රයන් පවා ආගමික මූලධර්ම නැතහොත් විශ්වාස යන මුවාවෙන් ක්‍රියාත්මක කෙරෙමින් පවතින බව පවසන ඔහු ඊට උදාහරණයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් අතරේ දැකිය හැකි දෑවැදි ක්‍රමය ගෙනහැර දක්වයි. ඉස්ලාම් ආගමට අනුව දෑවැද්ද අනුමත නොකර තිබියදීත්, ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජාතිකයන් පාරම්පරික චාරිත්‍රයක් වශයෙන් මෙය සිදුකරන අතර බොහෝ අවස්ථාවලදී එම ක්‍රියා පිළිවෙත සඳහා 'ආගමික සිරිත' යන අනන්‍යතාව ලබාදෙයි (Prof.Goonesekere, 2012). සමාජ ප්‍රතිමාන ආගමික මූලධර්ම නැමැති පලිහ භාවිතා කිරීමේදී ඒවායෙහි බලපෑම තවදුරටත් වර්ධනය වන බැවින් ආගමික මූලධර්ම සහ ආගමික විශ්වාසයන්හි පදනමින් සම්භවය ලැබී ඇතැයි සඳහන් කෙරෙන සිරිත් විරිත් හා සම්ප්‍රදායන් අතරේ වෙනස සොයාගැනීම ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ආගම්[48] සහ සමාජ ප්‍රතිමාන අතර පවතින සම්බන්ධතාව සලකා බැලීමේදී 'ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන ආගම් හින්දු ආගම හා බද්ධ වී ඇති සමාජ පාලනයන් යම් සැලකිය යුතු ප්‍රමාණයක් අන්තර්ග්‍රහණය කරගෙන ඇති බව' විතානගේ සඳහන් කරයි. ඉංග්‍රීසි පාලනයට පෙරද යටත් විජිත පාලනයට පසු ද ශ්‍රී ලංකාවේ ආගම් කෙරෙහි දකුණු ඉන්දීය ආගමක් වූ හින්දු ආගමේ බලපෑම අධික ලෙස එල්ල වීම මීට හේතු වී ඇති බව ඔහු සඳහන් කරයි (Vithanage, 2015). මේ පිළිබඳව තවදුරටත් පැහැදිලි කරන ඔහු, විශේෂයෙන්ම බෞද්ධාගම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව අගයන ආගමක් බවත්, කෙසේ නමුත්, අන්‍ය ආගම් මිශ්‍රවී මෙන් බෞද්ධාගම ද කාන්තාවන් පහත හෙලන බවත් ප්‍රකාශ කරයි. බුද්ධාගම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව අගයන ආගමක් බවට වූ මතය මහාචාර්ය ගුණසේකරගේ පර්යේෂණයේදී ද අවධාරණය කර තිබේ. "බුද්ධාගමේ පවතින ලිබරල්වාදී පුරුෂාර්ථ කාන්තාවන්ට එරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීම මුළුමනින්ම තුරන් නොකළද ඒවා අවම කිරීමට හේතු වී ඇත." යනුවෙන් ඔහු පෙන්වා දෙයි (Prof.Goonesekere, 2012).

හින්දු ආගමික බලපෑම හේතුවෙන් ඒ හා බද්ධව පැවති සමාජ පාලනයන් බෞද්ධ ආගම අන්තර්ග්‍රහණය කරගැනීම ඔප්පු කිරීම සඳහා වන උදාහරණ ද විතානගේ ලබාදෙයි. නිදසුනක් ලෙස, "කාන්තාවක් සිය ජීවිත කාලය තුළ පියා, සහෝදරයා, පුත්‍රයා වශයෙන් පුරුෂයින්ගේ රැකවරණය යටතේ සිටිය යුතුය" සහ "ස්වාමිපුරුෂයා මියගිය කාන්තාවක් සුභ කටයුතුවල නිරත නොවිය යුතුය" යනාදී හින්දු ආගමික මනුධර්ම රීතීන් බෞද්ධාගමට ද අවශෝෂණය වී ඇති බව ඔහු සඳහන් කරයි (Vithanage, 2015). ඉහත සඳහන්

48 හින්දු ආගම උතුරු පළාතේ බහුලව 'ශෛව ආගම' ලෙස හැඳින්වේ.

කළ හින්දු ආගම හා සම්බන්ධ මනුධර්ම රීතීන් බිහිවීමට අදාළ හේතු පිළිබඳව පැහැදිලි කරන ඉලක්කියා, ආචාර්ය අම්බෙක්කාර්ගේ මතවාද පදනම් කරගනිමින් "සමාජයේ පවතින කුල ක්‍රමය ආරක්ෂා කර ගැනීම සඳහා මෙවැනි මනුධර්ම රීතීන් බිහිවී ඇති බවට"(K.V.Elackia, 2016) අවධාරණය කරන බව මෙහිදී සඳහන් කළ යුතුය.

ආගමික මූලධර්ම මත පදනම් වූ සමාජ ප්‍රතිමානයන්හි ස්ථායිතාව විවිධ මට්ටම් වලින් දැකිය හැකිවීමත්, ඒ තුළ සැඟව ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීමත් මහාචාර්ය ගුණසේකර නිදසුනක් මගින් පැහැදිලි කර ඇත. එනම්, ඉස්ලාම් ආගම 'දරුකමට හදා ගැනීම' සහ'අන්තිම කැමති පත්‍ර' යනාදිය අනුමත නොකරයි. නමුත්, ශ්‍රී ලාංකික මුස්ලිම් ජාතිකයන් මේවා චාරිත්‍ර වශයෙන් අනුගමනය කරන අතර ඒ සම්බන්ධයෙන් ඔවුහු සාමාන්‍ය නීතිය අනුගමනය කරති.[49] ඉස්ලාම් ආගම විසින් අනුමත නොකර ඇති මෙකී භාවිතයන් මුස්ලිම් ජාතිකයන් අනුගමනය කිරීම සම්බන්ධයෙන් කිසිදු විරෝධතාවක් මතුවී නොමැති අතර ඒවා පිළිගැනීමට ලක්වී ඇත. නමුත්, ශ්‍රී ලංකාවේ අවම විවාහ වීමේ වයස සියලු පුද්ගලයන්ට අවුරුදු 18 වන පරිදි නීති සම්මත කර ගැනීම සඳහා, මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ දැක්වෙන අවම විවාහ වීමේ වයස පිළිබඳ විධිවිධාන[50] සංශෝධනය කිරීම සඳහා උත්සහ කිරීමේදී 'ආගමික සිද්ධාන්ත' ඉදිරිපත් කරමින් එම උත්සාහයන්ට බාධා ඇති කෙරේ (Prof.Goonesekere, 2012). මෙහිදී ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත වෙනස්කොට සැලකීමේ ආගම් මත පදනම් වූ මෙකී සිරිත් සංශෝධනය කිරීම වැළැක්වීම සඳහා ආරක්ෂිත මෙවලමක් වශයෙන් ආගමික මූලධර්ම හා සිද්ධාන්ත යොදා ගන්නා අතරේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත වෙනස්කොට නොසලකන, සැමට පොදු වූ සිරිත් ආගමික සිද්ධාන්තයන් ට පටහැනිව පැවතිය ද ඒවා පිළිගනු ලැබීම පැහැදිලිව දැකගත හැකිය. මේ සම්බන්ධයෙන් සලකා බැලීමේදී විතානගේ විසින් පෙන්වා දී ඇති පරිදි නුහුමාන් නැමැති මාධ්‍යවේදියාගේ අදහස ඉදිරිපත් කිරීම වඩාත් ගැලපේ. 2011 වසරේදී රචනා කරන ලද සිය ලිපියක් මගින් ඉස්ලාම් ආගමික මූලධර්ම සහ කාන්තාවන් පිළිබඳව සාකච්ඡා කළ ඔහු, "ආගමික හැඟීමෙන් යුත් කිසිදු මුස්ලිම් පුරුෂයෙකු කාන්තාවන් සඳහා සමානාත්මතාව යන මූලධර්මය කිසිවිටෙක පිළිනොගනී. මන්ද, ඔවුන්ට අනුව එය ඉස්ලාම් ආගමට පටහැනි දෙයකි." යනුවෙන් පෙන්වා දී ඇත (Vithanage, 2015). ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීම සහ අසමානතාව සාධාරණීකරණය කරන සාම්ප්‍රදායික සිද්ධාන්ත අභියෝගයට ලක්කිරීම සඳහා උද්දේශන යාන්ත්‍රණයක් ලංකාවට අවශ්‍ය බව ද විතානගේ ඉස්මතු කොට දක්වයි.

ආගමික මූලධර්ම පදනමෙන් අනුගමනය කෙරෙන සමාජ ප්‍රතිමාන කාලයත් සමඟ සමාජයෙන් අතුගා දැමිය හැකි බව පෙරියාර් විසින් ඉදිරිපත් කර ඇති නිදසුන් ද සනාථ කරයි (ඊ.වී රාමසාමි දකුණු ඉන්දියාවේ කීර්තිමත් සමාජ ක්‍රියාකාරිකයෙක් සහ දේශපාලනඥයෙක්). "සති පූජාව[51] තුරන්කිරීම සඳහා සටන් කළ එකලද, හින්දු ආගමික ආචාර විධි විනාශ වන බවටත් සමස්ත ආගමටම අනතුරුදායක තත්ත්වයක් උදාවී ඇති බවටත් විශාල කැරැල්ලක් මතුවිය. නමුත්, කාලානුරූපීව එම කතිකාවන්ද යටපත්වී, සති පූජාඝාතන චාරිත්‍රය ඉන්දියාවෙන් මුළුමනින්ම තුරන් විය"(Periyar, 1942). යනුවෙන් පෙරියාර් ඉදිරිපත් කර ඇති ප්‍රකාශ මෙහිදී පෙන්වා දීම වඩාත් උචිත වේ.

## 2.1.3 ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව

ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව පිළිබඳ විවිධ හා පුළුල් නිර්වචන පිළිගැනීමට ලක්ව තිබේ. කෙසේ නමුත්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කාන්තාවන් පිළිබඳ අංශය විසින් 'ස්ත්‍රී පුරුෂ සමාජ භාවයේ සමානාත්මතාව' පිළිබඳව ඉදිරිපත් කර ඇති නිර්වචනය පොදුවේ සියලු දෙනා විසින් පිළිගෙන තිබේ. එම නිර්වචනය මගින් "ස්ත්‍රී පුරුෂ සමාජ භාවයේ සමානාත්මතාව යනු කාන්තාවන් සහ පුරුෂයන්, ගැහැණු දරුවන් සහ පිරිමි දරුවන් අතරේ සමාන අයිතිවාසිකම්, වගකීම් සහ අවස්ථාවන් පැවතීම" බවට දක්වා ඇත.[52] කාන්තාවන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීම පමණක් සැබෑ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව

---

49 මුස්ලිම් ජාතිකයන්, 1941 අංක 24 දරන දරුකමට හදාගැනීමේ ආඥා පනත යටතේ (සාමාන්‍ය නීතිය) කුලවද්දා ගැනීම සිදුකරයි.

50 මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ 23 වන වගන්තිය යටතේ වයස අවුරුදු 12ට අඩු ගැහැනු දරුවන් කාතිවරයාගේ කැමැත්ත මත විවාහ කර දිය හැකිය යනුවෙන් සඳහන් කර ඇත.

51 ස්වාමිපුරුෂයා මියගිය පසු ඔහුගේ චිතකයට පැන භාර්යාව සියදිවි හානිකර ගැනීමේ චාරිත්‍රය 'සති පූජාව' ලෙස හැඳින්වේ.

52 එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කාන්තා අංශයෙහි අදහස් සහ නිර්වචන, <https://www.un.org/womenwatch/osagi/conceptsandefinitions.htm#:~:text=Equality%20between%20women%20and%20men,men%20and%20girls%20and%20boys.&text=Gender%20equality%20is%20not%20a,men%20as%20well%20as%20women> accessed on 18 May 2020.

නොවන බව UNDP ආයතනය විසින් සිදුකරන ලද පර්යේෂණය පෙන්නුම් කරයි (UNDP, 2019). කොළඹ, මඩකලපුව, නුවරඑළිය සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක 4 හි ස්ථාපිතව පවතින හැසිරීම් රටා, භාවිතයන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් 2013 වසරේදී Care International ආයතනය විසින් සිදුකරන ලද පර්යේෂණයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව තවදුරටත් පුළුල් ලෙස විග්‍රහ කර තිබේ. එනම්, ප්‍රචණ්ඩත්වය සඳහා ප්‍රතිචාර දැක්වීම ප්‍රවර්ධනය කිරීම, ඒ පිළිබඳ සේවාවන් ප්‍රවර්ධනය කිරීම, නීති සහ අපරාධ නීති පද්ධතිය ශක්තිමත් කිරීම සහ සෞඛ්‍යය, අධ්‍යාපනය වැනි මූලික අවශ්‍යතා සඳහා ප්‍රවේශය තහවුරු කිරීම යනාදිය පමණක් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව සාක්ෂාත් කරගැනීම සඳහා ප්‍රමාණවත් නොවන අතර ඒ සදහා ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතාව නිර්මාණය කරන්නා වූ මූලික සාධක හැසිරවීම සැබෑ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතායට මග පාදන බව අවධාරණය කර තිබේ (De Mel, Peiris, & Gomez, 2013). "පොලිස් නිලධාරීන් සමාජ ප්‍රතිමාන අනුගමනය කරන පිරිසක් වන්නේ නම්, පොලිස් ස්ථානයන්හි කාන්තා කටයුතු පිළිබද කාර්යාංශයක් පිහිටුවීමෙන් කිසිදු ඵලක් නොමැත." යන ප්‍රායෝගික උදාහරණය ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතාව නිර්මාණය කරන්නා වූ මූලික සාධක හැසිරවීමෙහි පවතින වැදගත්කම පැහැදිලිව ඒත්තු ගන්වයි (Birgitte, 1998). "කාන්තාවන්ට අධ්‍යාපනය සඳහා ප්‍රවේශය පැවතීම සැබෑ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව ලෙස සැලකිය නොහැක. ඒ වෙනුවට අධ්‍යාපනය ලැබීම සඳහා වන අවස්ථාව ඔවුන්ට ලබාදීමට පාදක වූ සැබෑ අරමුණ පිළිබඳව සලකා බැලිය යුතුය. මුල්කාලීනව, හොඳ සහකාරියක් ලබාගැනීමේ අරමුණ සඳහාත්, පවුල් වලට ඉහළ සමාජ තත්ත්වයක් අත්කර ගැනීම සඳහාත් කාන්තාවන්ට අධ්‍යාපනය ලැබීමට අවසර ලබා දෙන ලදී. එසේ නොමැතිව ඔවුන්ගේ ස්වයං බලගැන්වීම සඳහා නොවේ" (Vithanage, 2015) යනුවෙන් ඓතිහාසික නිදසුන් ගෙනහැර දක්වමින් සැබෑ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව පැහැදිලි කිරීම සඳහා විතානගේ උත්සාහ කරයි.

සමාජයේ මුල් බැස ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන ප්‍රචණ්ඩත්වය සඳහා මූල බීජ වැපිරීම තුළින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව නැති කරන බව නැතහොත් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතාව නිර්මාණය කරන බව Care International ආයතනය විසින් සිදුකරන ලද පර්යේෂණය පැහැදිලිව පෙන්වා දී තිබේ. මෙම පර්යේෂණය සමාජයේ සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියාවන් සහ සමාජ ප්‍රතිමාන අතර පවතින සම්බන්ධතාව සහභාගිත්ව පර්යේෂණ ක්‍රමවේදය මගින් තහවුරු කර තිබේ (De Mel, Peiris, & Gomez, 2013). ප්‍රචණ්ඩත්වය යන්න පුද්ගල ක්‍රියාවන් හා අසම්භාව්‍ය ක්‍රියාවන් මත රඳාපැවතීමට පරිබාහිරව ඒවා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීමේ සමාජ සංස්ථාවන් විසින් නිර්මාණය කෙරෙන බව ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සහ ප්‍රචණ්ඩත්වය අතර සම්බන්ධතාව දක්වමින් අයේශා බානු පෙන්වා දෙයි (Banu, 2016). "ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කාන්තාවන් අතරේ ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රතිමාන වෙනස් කිරීම සඳහා වන ප්‍රජා පාදක සෞඛ්‍ය ප්‍රවර්ධන මැදිහත්වීමේ ඵලය" යන මාතෘකාව යටතේ ශ්‍රී ලංකාවේ අනුරාධපුර ප්‍රදේශයේ ගම්මාන දෙකක් පදනම් කරගනිමින් සිදුකරන ලද සහභාගිත්ව පර්යේෂණයේදී, කාන්තාවන් විසින් පිළිගෙන අනුමත කරනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීමේ ප්‍රතිමාන සහ කාන්තාවන්ට එරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩ ක්‍රියා අතර වන සම්බන්ධතාව 'සම්බන්ධතා පාලම' යන මෙවලම ඔස්සේ තහවුරු කර තිබේ. මෙකී සම්බන්ධතා පාලම ස්ථර තුනකින් සමන්විත වේ. එහි පවතින ඉහළම ස්ථරය ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ සිදුවීම් ද, අතරමැදි ස්ථරය එකී ප්‍රචණ්ඩ ක්‍රියාවන් සදහා පාදක වූ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හේතූන් ද, සම්බන්ධතා පාලමෙහි පාදම වශයෙන් පවතින පහළම ස්ථරය කාන්තාවන් විසින් පිළිගෙන අනුමත කොට ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන ද පිළිබිඹු කරයි.

රූපය 2.1

සම්බන්ධතා පාලම




මූලාශ්‍රය ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාවන්හි කාන්තාවන් අතරේ ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීමේ ප්‍රතිමාන වෙනස් කිරීම සඳහා වන ප්‍රජාපාදක සෞඛ්‍ය ප්‍රවර්ධන මැදිහත් වීමේ ඵලය පිළිබඳ වාර්තාව[53]

2019 වසරේදී OXFAM ආයතනය විසින් නිකුත් කරන ලද 'ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන සේවයේදී සිදුවන ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වයට මූල බීජ වපුරන සමාජ ප්‍රතිමාන වෙනස් කිරීම' පිළිබඳ සහභාගිත්ව පර්යේෂණ වාර්තාවෙහි, "බල ව්‍යුහය හා පුරුෂාධිපත්‍ය ව්‍යුහයෙහි මුල්බැස ඇති සමාජ ප්‍රතිමාන, ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩ ක්‍රියාවන් සාධාරණීකරණය කරන නැතහොත් පිළිගන්නා අතර ඒවා සිදු කරන පුද්ගලයින් දඬුවම්වලින් මිදීමේ සංස්කෘතියක් බිහිවීමට මූලික හේතු බවට පත්වන්නේ ය" යන කරුණ ඉතා දැඩිව අවධාරණය කොට සමාජ ප්‍රතිමාන සහ ප්‍රචණ්ඩත්වය අතර පවතින සම්බන්ධතාව තහවුරුකර තිබේ (Butt & Sharanya, 2019). මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියාවන් සාධාරණීකරණය කරන සමාජ ප්‍රතිමාන වශයෙන්, "ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා කාන්තාවන් විනීත ලෙස ඇඳුම් පැළඳිය යුතුය, රාත්‍රී කාලයේදී තනිව ගමන් නොකළ යුතුය සහ පොදු ස්ථාන වලදී සිනාවෙමින් කතා නොකළ යුතු ය' යනාදිය හඳුනාගත හැකි බවත් පර්යේෂණයේ නිගමන අනුව මේවා ඉතා දැඩි ලෙස ස්ථාපිත වී ඇති සමාජ ප්‍රතිමාන වශයෙන් හඳුනාගෙන ඇති බවත් පෙන්වා දී තිබේ (Butt & Sharanya, 2019).

## 2.1.4 සමාජ ප්‍රතිමානයන් හි අඛණ්ඩ පැවැත්ම සඳහා වන හේතු

සමාජ ප්‍රතිමානයන්හි අඛණ්ඩ පැවැත්ම සඳහා ඒ හා බද්ධවී ඇති 'සමාජ පිළිගැනීම' සහ 'සමාජ නොසලකා හැරීම' ප්‍රධාන වී ඇති බව UNDP පර්යේෂණ වාර්තාව පෙන්වා දෙයි. එනම්, සමාජ ප්‍රතිමාන අනුගමනය කිරීමේදී සමාජ පිළිගැනීමත්, ඒවායින් අපගමනය වීමේදී සමාජය නොසලකා හැරීමත් සිදුවන බැවින් සමාජමය පිළිගැනීම සඳහා එකී සමාජ ප්‍රතිමාන නොකඩවා අනුගමනය කෙරේ. එසේම, මෙම වාර්තාව මගින් තවදුරටත් පෙන්වා දෙනු ලබන්නේ, තනි පුද්ගලයින්ට නිවැරදි තොරතුරු වෙත ප්‍රවේශවීමේ දී පවතින බාධා සහ වෙනස් ආකාරයට සිතීමට ඇති නොහැකියාව යන සාධකයන්ද සමාජ ප්‍රතිමානයන්හි පැවැත්මට දායකවන බවයි (UNDP, 2019). මෙකී සමාජ නොසලකා හැරීම කාන්තාවන් සම්බන්ධයෙන් පමණක් බහුල වශයෙන් දක්නට ලැබෙන බව විතානගේ සඳහන් කරයි. ඔහු සිය ලිපි ග්‍රන්ථ විමසුමෙහි, "සමාජ ප්‍රතිමාන විසින් නිර්වචනය කර ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ භූමිකාවන්ගෙන් කාන්තාවන් අපගමනය වීම වැළැක්වීම සඳහා සමාජය විසින් බොහෝ බාධාවන් පනවා ඇත" (Vithanage, 2015) යනුවෙන් පෙන්වා දෙයි. "සමාජ ප්‍රතිමාන සමාජය විසින් ලබා දෙන දඬුවම් සහ ඒවායෙහි පැවැත්ම අවධාරණය කරන කණ්ඩායම් (reference group) හේතුවෙන් ස්ථායිව පවතී" (Butt & Sharanya, 2019) යන අදහස ද අවධාරණය කර තිබේ.

53 T. Herath; D.Guruge; M.Fernando; S.Jayarathna & L.Senarathna, 'The effect of a community-based health promotion intervention to change gender norms among women in a rural community in Sri Lanka' (BMC Public Health, 2018) < https://bmcpublichealth.biomedcentral.com/articles/10.1186/s12889-018-5914-7#citeas> accessed 10 February 2021.

සමාජ ප්‍රතිමානයන්හි අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සාකච්ඡා කිරීමේදී පවුල් මට්ටමින් අනුගමනය කෙරෙන සමාජ ප්‍රතිමාන ශක්තිමත්, ස්ථායිව පැවතීමේ හැකියාවෙන් අධික ලෙස යුක්ත සහ වෙනස් කිරීමට අපහසු ආකාරයෙන් පවතින බව UNDP පර්යේෂණය පෙන්වා දෙයි (UNDP, 2019).

කෙසේ වෙතත් අධ්‍යාපනය මගින් සමාජ ප්‍රතිමානයන්හි පැවැත්ම අභියෝගයට ලක්කළ හැකි බවට මහාචාර්ය ගුණසේකර (Prof.Goonesekere, 2012) සහ විතානගේ (Vithanage, 2015) අදහස් දක්වති. මහාචාර්ය ගුණසේකර, ශ්‍රී ලංකාවේ හඳුන්වා දී ඇති සෞඛ්‍ය හා අධ්‍යාපනය පිළිබඳ සමාජ ප්‍රතිපත්ති සමාජ ප්‍රතිමාන මගින්, විශේෂයෙන්ම, පිරිමි දරුවන්ට ප්‍රමුඛතාව ලබාදීම වැනි සමාජ ප්‍රතිමාන මගින් ගැහැනු දරුවන්ට ඇතිවිය හැකි වෙනස්කොට සැලකීම වළකා ඇති බව පෙන්වා දී තිබේ (Prof.Goonesekere, 2012). එසේම, ප්‍රජාපාදක මැදිහත්වීම් සමාජ ප්‍රතිමාන සමාජය තුළින් ඉවත් කර දැමීමේ හැකියාව සහිත ක්‍රමයක් බව සහභාගිත්ව පර්යේෂණ මගින් සොයාගෙන ඇත (T.Herath & all, 2018).

## 2.2 සමාජ ප්‍රතිමාන සහ කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ භූමිකාවන්

සමාජ ප්‍රතිමාන සාමාන්‍යයෙන් ලිංගිකත්ව පදනමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ භූමිකාවන් අර්ථ නිරූපණය කළද සමාජ ප්‍රතිමාන විසින් අර්ථ නිරූපණය කෙරෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ භූමිකාවන් වලට අනුගතව ක්‍රියාකළ යුතු බවට පුරුෂයින්ට බලපෑම් නොකෙරෙන නමුත් කාන්තාවන් සම්බන්ධයෙන් ගත්කල ඔවුන් එවැනි සමාජභාවය මත පදනම් වූ භූමිකාවන්ට අනුගත වීම සමාජයෙහි නොසලකා හැරීමට ලක්කළ නොහැකි අනිවාර්ය රීතියක් බවට පත්කොට ඇත (Butt & Sharanya, 2019). කාන්තාවන් සමාජ ප්‍රතිමානයන්ගෙන් අපගමනය වීම වැළැක්වීම සඳහා සමාජය තුළ කාන්තාවන් සඳහා විවිධ පාලනයන් පනවා තිබේ. කෙසේ නමුත්, එවැනි පාලනයන් පුරුෂයන් සම්බන්ධයෙන් දක්නට නොමැත (Vithanage, 2015) කාන්තාවන්ගේ සමාජභාවය මත පදනම් වූ භූමිකාවන් නම්‍යශීලී නොවන සංකීර්ණ ව්‍යුහයක් තුළ ගොඩනගා ඇති අතර කාන්තාවන් එයින් අපගමනය වීමට තැත්කිරීමේ දී හෝ එම ව්‍යුහයෙන් ඉවත්වීමේ දී, එහි ප්‍රතිවිපාක වශයෙන් නැතහොත් දඬුවම් වශයෙන් ප්‍රචණ්ඩත්වයට මුහුණ දීමට සිදුවේ (T.Herath & all, 2018). පවුල් සංස්ථාව තුළ කාන්තාවන්ට ලබාදී ඇති පහළ තත්ත්වය සමාජ ප්‍රතිමානයන්හි ඍජු ප්‍රතිඵලයක් බව දක්වන අයේශා බානු එමගින් ඇතිවන බලපෑම් සම්බන්ධයෙන් ද පුළුල්ව සාකච්ඡා කර තිබේ (Banu, 2016). කාන්තාවන්ට ලබා දෙන මෙකී පහළ තත්ත්වයේ භූමිකාව ඔවුන්ගේ පොදු සහ වාණිජ ජීවිතයේ සියලුම අංශ කෙරෙහි බලපෑම් ඇති කරන බව විතානගේ සඳහන් කරයි (Vithanage, 2015). කාන්තාවන්ගේ විශේෂ බැඳියාවන් සහ ඔවුන්ගේ අවශ්‍යතාවන් යනාදිය සමාජ ප්‍රතිමාන විසින් නිර්වචනය කෙරෙන කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ භූමිකාවන්ගේ පදනමින් නිර්මාණය කෙරේ (Birgitte, 1998).

### 2.2.1 ප්‍රජනන කෘත්‍යය ඉටු කරන්නියන් වශයෙන් කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි භූමිකාව

මෙම ලිපි ග්‍රන්ථ විමසුම සඳහා තෝරාගන්නා ලද සියලුම පර්යේෂණ, වාර්තා හා ග්‍රන්ථයන්හි කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි ප්‍රධාන භූමිකාව 'ප්‍රජනනය' බව ගැඹුරින් අවධාරණය කර තිබේ. කාන්තාවන්, ඔවුන්ගේ ඵලදායිතාව මත ඇගයීමට ලක්වනවාට වඩා ඔවුන්ගේ ප්‍රජනන හැකියාව පදනම් කරගනිමින් ඇගයීමට ලක්වෙන බව අයේශා බානු ගැඹුරින් අවධාරණය කරයි (Banu, 2016). කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සෙසු භූමිකාවන් මෙන් නොව "මව" යන භූමිකාව සඳහා දැඩි අවධාරණයක් ලබා දෙන බව විතානගේ පෙන්වා දී ඇත. විශේෂයෙන්ම, "බිරිඳ යන භූමිකාවට වඩා මව යන භූමිකාවට වැඩි අවධාරණයක් ලබාදී ඇත" යනුවෙන් ඔහු සඳහන් කරයි. ශ්‍රී ලංකාවේ කුමන ජාතියකට අයත් පුද්ගලයින් වුවද, සමාජයෙහි කුමන ආකාරයේ දේශපාලන, සමාජීය සහ සංස්කෘතික වෙනස්කම් ඇති වුවද, 'ප්‍රජනනය' සම්බන්ධයෙන් කාන්තාවන්ට ඇති මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි භූමිකාව සම්බන්ධයෙන් ද ඒ වටා ගොඩනැගී ඇති අංග සම්බන්ධයෙන් ද කිසිදු වෙනසක් ඇති නොකෙරෙන බවත් ඔහු අවධාරණය කරයි (Vithanage, 2015). මේ පිළිබඳව මහාචාර්ය සාවිත්‍රී ගුණසේකර සිංහල හා දමිළ සමාජයන්හි කාන්තාවන් මල්වර වීමේදී සිදු කරනු ලබන චාරිත්‍ර ක්‍රම ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සලකනු ලබන හෝ නිශ්චිත අයිතිවාසිකම් උල්ලංඝනය කරනු ලබන ඒවා නොවුවද, ඒවා කාන්තාවන්ට තිබිය යුතු ප්‍රජනන හැකියාවේ

වැදගත්කම අවධාරණය කරන බව (Prof.Goonesekere, 2012) පෙන්වා දෙයි. පුරුෂාධිපත්‍ය සමාජ ව්‍යුහයක් පවතින ශ්‍රී ලංකාවේ තවමත් 'මාතෘත්වය' සහ 'විවාහය' යන කරුණු සමාජ ප්‍රතිමාන මගින් ආවරණය වී ඇත යන අදහස ද අවධාරණය කර තිබේ. එසේම මෙම සමාජ ප්‍රතිමානයන්ගෙන් මද වශයෙන් හෝ අපගමනය වීම පුරුෂයන්ගේ ප්‍රචණ්ඩකාරී හැසිරීම ප්‍රතිඵල වශයෙන් ඇති කළ හැකි තරමට මෙම සමාජ ප්‍රතිමාන බලගතු වී ඇති බව සහභාගිත්ව පර්යේෂණ මඟින් සනාථ කර තිබේ (T.Herath & all, 2018).

## 2.2.2 නිවස රැක බලාගන්නියන් (ගෘහණියන්) වශයෙන් කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි භූමිකාව

පුරුෂාධිපත්‍ය ව්‍යුහයකින් සමන්විත සියලු සමාජයන්හි කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි භූමිකාව 'හොඳ බිරිඳක්' සහ 'හොඳ මවක්' වශයෙන් පවුල නම් වූ ඒකකයට සීමා කර ඇති බව පර්යේෂණ මගින් පෙන්නුම් කෙරේ (Militzer, 2008). දකුණු ආසියාතික රටවල්හි කුඩා කල සිට ගැහැනු දරුවන්ට හොඳ බිරිඳක් සහ හොඳ මවක් වන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් උගන්වනු ලබන බව අයේෂා බානු සඳහන් කරයි (Banu, 2016). මෙලෙස කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි භූමිකාවන් නිවස රැක බලාගන්නියන් (ගෘහණියන්) වශයෙන් "පවුල" නැමැති ඒකකයට පමණක් සීමා කෙරෙන බැවින් 'නායිකාවන්' හෝ 'දේශපාලන නියෝජිතවරියන්' වශයෙන් ඔවුන්ගේ භූමිකාවන් ප්‍රශ්නාර්ථයක් බවට පත්වන බව විතානගේ පෙන්වා දෙයි (Vithanage, 2015). Care International ආයතනය විසින් සිදුකරන ලද සහභාගිත්ව පර්යේෂණය සඳහා සහභාගී වූ පුද්ගලයින්ගෙන් අඩකට වඩා වැඩි පිරිසක් (කාන්තාවන් හා පුරුෂයන්), "කාන්තාවන්ගේ ප්‍රධාන භූමිකාව පවුල රැක බලාගැනීම සහ පවුල වෙනුවෙන් ආහාර පිසීම" බවට පිළිගෙන තිබූ බව පර්යේෂණ නිගමන පෙන්වා දෙයි (De Mel, Peiris, & Gomez, 2013). "පවුලේ ආහාර අවශ්‍යතාව පිළිබඳව සැලකිලිමත් වීම කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යය වේ" යන සමාජ ප්‍රතිමානය කාන්තාවන් අතරේ අධික ලෙස ස්ථාපිත වී ඇති බව තවත් සහභාගිත්ව පර්යේෂණයක් මගින් තහවුරු කරයි (T.Herath & all, 2018).

පොදු ප්‍රවාහන සේවයේදී සිදුවන ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි ප්‍රචණ්ඩත්වය දිරිගැන්වීම සඳහා මූල බීජ වපුරන සමාජ ප්‍රතිමාන සම්බන්ධයෙන් සිදුකරන ලද සහභාගිත්ව පර්යේෂණයකදී, කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි භූමිකාවන් පවුල නැමැති ඒකකයට පමණක් සීමා කර තිබීමෙන් ඇතිවන්නා වූ ප්‍රතිවිපාක පුළුල්ව සාකච්ඡා කර තිබේ (Butt & Sharanya, 2019). එනම්, කාන්තාවන් පවුල නැමැති සීමාව තුළ පමණක් කටයුතු කිරීමට අයිතිවාසිකම් ලත් අය වශයෙන් සලකනු ලබන බැවින් ඔවුන් එසේ සීමාවී සිටින පවුල නැමැති ඒකකයෙන් මිදී පොදු ක්ෂේත්‍රය තුළට පිවිසීමට උත්සහ කිරීමේදී ඔවුන් ලිංගික හිංසනයට ලක්කිරීම සදාචාරාත්මක ක්‍රියාවක් ලෙස හෝ පිළිගත හැකි ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ. වෙනත් ආකාරයට සඳහන් කරන්නේ නම්, කාන්තාවන් තමන්ව කොටුකරන ලද ස්ථානයෙන් ඉවත් වී පුරුෂයන් සඳහා වෙන්වූ පොදු ක්ෂේත්‍රයට පිවිසීම පිළිගත නොහැකි ක්‍රියාවක් ලෙසත්, එසේ කිරීමේදී කාන්තාවන් හිංසනයට ලක් කිරීම පිළිගත හැකි ක්‍රියාවක් ලෙසත් සලකනු ලැබේ. මෙම පර්යේෂණය මඟින් පෙන්වාදී ඇති OXFAM ආයතනය විසින් බංග්ලාදේශයේ දී සිදුකරන ලද තවත් පර්යේෂණයක නිගමන අනුව, අලෙවිකරණ කටයුතුවල සහ ක්ෂේත්‍ර කටයුතුවල නිරතවන කාන්තාවන් ලිංගික හිංසනයට ලක්කිරීම සදාචාරාත්මක දෙයක් බවට සැලකේ. ඊට හේතුව වන්නේ අලෙවිකරණ සහ ක්ෂේත්‍ර කටයුතු පුරුෂයන් විසින් සිදු කළ යුතු කටයුතු වශයෙන් සලකනු ලැබීමත් කාන්තාවන් ඒවා සිදුකිරීම පිළිනොගැනීමත් වේ (Butt & Sharanya, 2019).

මෙම පර්යේෂණයේ නිගමන අනුව කිලිනොච්චිය සහ මඩකලපුව යන දිස්ත්‍රික්කයන් හි ජීවත්වන කාන්තාවන් පොදු ප්‍රවාහන සේවා භාවිත කිරීමට හේතු ලෙස 'වෙළෙඳපලට යෑම' සහ 'දරුවන් රැක බලා ගැනීමේ කටයුතු සඳහා පිටතට යෑම'පමණක් දක්වා ඇත (Butt & Sharanya, 2019). මෙය, කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි භූමිකාව පවුල් පරිසරයට පමණක් සීමාකර තිබීම ප්‍රායෝගික වශයෙන් ගෙන හැර දක්වන කදිම නිදසුනකි. කාන්තාවන් ලිංගික හිංසනයට ලක්වීමට හේතු වන්නේ ඔවුන් ඔවුන්ට වෙන්කර ඇති සීමාවෙන් ඔබ්බට යාම බවට පවතින සමාජ ප්‍රතිමානය ලිංගික හිංසනයට ලක්නොවී සිටීමේ යුතුකම සහ වගකීම කාන්තාවන් මත පැටවීමට හේතු වී ඇති බව මෙම පර්යේෂණයේ නිගමන පෙන්වා දී ඇත (Butt & Sharanya, 2019). මෙම සමාජ ප්‍රතිමානය හේතුවෙන් ලිංගික හිංසනයට ලක්වන කාන්තාවන්

'චරිතවත් කාන්තාවන්' නොවන බවට වූ ප්‍රතිමානය ද බලගැන්වී ඇත. මෙම ප්‍රතිමානය සහ ඉන් අනතුරුව පැමිණෙන සමාජ කැළල හේතුවෙන් කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට හා හිංසනයට ලක්වන අවස්ථාවන් පිළිබඳව වාර්තා කිරීමේ සහ පැමිණිලි කිරීමේ ප්‍රමාණයද ඉතා අවම වශයෙන් දක්නට ලැබේ (Butt & Sharanya, 2019 ; De Mel, Peiris, & Gomez, 2013). කෙසේ නමුත්, කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි භූමිකාවන් 'පවුල් පරිසරයට' පමණක් සීමාකිරීම සම්බන්ධයෙන් ඇතැම් ව්‍යතිරේක පවතින බව OXFAM හි පර්යේෂණය පෙන්වා දෙයි. එනම්, ශාරීරික දුබලතාවකින් යුත් කාන්තාවන්, ධනවත් කාන්තාවන්, ගෘහමූලික කාන්තාවන් සහ දේශපාලනයේ නිරත කාන්තාවන් ඔවුන්ගේ භූමිකාවන් පවුල් පරිසරයට' සීමා කරගත යුතු බවට අපේක්ෂා නොකෙරේ (Butt & Sharanya, 2019).

### 2.2.3 සංස්කෘතිය ඉදිරියට රැගෙනයන්නන් වශයෙන් කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳිභූමිකාව

සමාජයේ පවතින සංස්කෘතික සම්ප්‍රදායන් මතු පරම්පරාව කරා රැගෙනයන කාරකයින් වශයෙන් කාන්තාවන් සිටිය යුතු බවට අපේක්ෂා කෙරෙන බව අයේශා බානු පෙන්වා දෙයි (Banu, 2016). කෙසේ වෙතත්, සමාජයට අයත් සම්ප්‍රදායන් සහ සංස්කෘතීන් ආරක්ෂා කිරීමේ වගකීම සහ බලපෑම බොහෝ දුරට කාන්තාවන් කෙරෙහි පමණක් එල්ල වන බව විතානගේ තම පර්යේෂණයේදී අවධාරණය කර තිබේ (Vithanage, 2015). ශ්‍රී ලංකාවේ ප්‍රායෝගික වශයෙන් ස්ථාපිතව පවතින සම්ප්‍රදායන් සහ සමාජ ප්‍රතිමාන කෙරෙහි දකුණු ඉන්දියාවේ හින්දු ආගම මගින් සැලකිය යුතු බලපෑමක් එල්ලකර තිබෙන බව මීට ඉහත දී පෙන්වා දෙන ලදී (Vithanage, 2015). ඒ අනුව, ඉන්දියාවේ ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සම්බන්ධයෙන් සාකච්ඡා කර ඇති ඇතැම් ග්‍රන්ථ පිළිබඳව සලකා බැලීම වඩාත් සුදුසු වේ. ඉන්දියාවේ කේ. වී. ඉලක්කියා යන අය විසින් රචිත "කාන්තා නිදහස අදයි" යන ග්‍රන්ථයෙහි කාන්තා වාස්තවීකරණය (female objetification) යන අදහස විග්‍රහ කොට තිබේ. එනම්, කාන්තා වාස්තවීකරණය යනු "කාන්තාවන් භාණ්ඩ වශයෙන් හෝ මාංශ වශයෙන් හෝ තම අරමුණ ඉටුකරගැනීම සඳහා ප්‍රයෝජනවත් වන මෙවලමක් වශයෙන් හෝ පෞද්ගලික පෞරුෂත්වය ප්‍රතික්ෂේප කොට නිදහස අහිමි අයෙකු වශයෙන් හෝ දැකීම" ලෙස අර්ථ නිරූපණය කොට තිබේ. ඉලක්කියා, මෙහිදී කාන්තා වාස්තවීකරණය සංස්කෘතික වාස්තවීකරණය, ස්වයං වාස්තවීකරණය සහ ලිංගික වාස්තවීකරණය වශයෙන් කොටස් තුනකට වර්ගීකරණයකොට දක්වා ඇත. මෙහිදී සංස්කෘතික වාස්තවීකරණය යනුවෙන් අදහස් කරන්නේ සංස්කෘතිය හෝ සංස්කෘතිය යන නාමයෙන් කුල ව්‍යුහයන් ආරක්ෂා කිරීම සඳහා වන මෙවලම් වශයෙන් කාන්තාවන් යොදා ගැනීම වේ. ඒ අනුව සංස්කෘතිය ආරක්ෂා කළ යුතු මෙවලමක් වශයෙන් කාන්තාව සැලකෙන බවට ඉලක්කියා ඉතා ගැඹුරින් අදහස් ඉදිරිපත් කර තිබේ (Elackia, 2016).

### 2.2.4 "පරමාදර්ශී කාන්තාව" යනු කවුද?

ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳී වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි භූමිකාවන් ගොඩනැගීමට අමතරව 'පරමාදර්ශී කාන්තාවක්' සතු ලක්ෂණද පෙන්වා දී ඇත. පරමාදර්ශී කාන්තාවක් සතුව 'පවිත්‍රත්වය, ප්‍රජනන හැකියාව සහ පතිව්‍රතාව නොහොත් පතිවත යනාදී ලක්ෂණ තිබිය යුතු බවට අපේක්ෂා කෙරෙන බව අයේශා බානු පෙන්වා දෙයි (Banu, 2016). විතානගේ මේ සම්බන්ධයෙන් අදහස් දැක්වීමේදී, බොහෝ දුරට ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන සියලු ආගමික ප්‍රජාවන් තුළ පරමාදර්ශී කාන්තාවක් 'කීකරු, නිහතමානී සහ මහන්සියෙන් වැඩ කරන' තැනැත්තියක් විය යුතු බවට අපේක්ෂා කෙරෙන බව පෙන්වාදෙයි (Vithanage, 2015). "සාමාන්‍යයෙන් දකුණු ආසියාතික ගැහැනු දරුවන් නිහතමානී කාන්තාවක, පවුල රැකබලාගන්නා කාන්තාවක සහ කීකරු කාන්තාවක ලෙස කටයුතු කිරීමට පුරුදු පුහුණු කෙරේ" යනුවෙන් Care International ආයතනයේ පර්යේෂණ වාර්තාව පෙන්වා දෙයි (De Mel, Peiris, & Gomez, 2013). කාන්තාවන් පුරුෂාධිපත්‍යය පිළිගෙන ඒවාට අවනත වන, නිර්මල නාමයක් සහිත පතිදම් සුරකින කාන්තාවන් වශයෙන් සිටියයුතු බවට අපේක්ෂා කෙරෙන බවත් එම අපේක්ෂාව ප්‍රහලව පවතින බවත් OXFAM ආයතනය විසින් සිදුකරන ලද පර්යේෂණය මගින් පෙන්වා දෙයි (Butt & Sharanya, 2019).

### කාන්තාව සහ පතිව්‍රතාව

පතිව්‍රතාව යන පදය නිර්වචනය කරමින් ඒ සමග බද්ධ වී ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීම කාන්තා විමුක්තිය වෙනුවෙන් සටන් කළ පෙරියාර් ඉතා ගැඹුරින් පැහැදිලි කර තිබේ. එනම්, පතිව්‍රතාව යන්නට යොදා ගැනෙන නිවැරදි ඉංග්‍රීසි වචනය Chastity බවත් එහි නියම තේරුම Virginity යන්න බවත් Virginity යන්නෙහි අර්ථය 'පුරුෂයාට හෝ කාන්තාවට හෝ යනුවෙන් සීමා නොකරන ලද, සාමාන්‍යයෙන් ස්ත්‍රී පුරුෂ සංසර්ග සම්බන්ධතාවක් සුළු වශයෙන් හෝ නොපවතින පාරිශුද්ධභාවය වේ' යනුවෙන් ඔහු තර්ක කරයි (Periyar, 1942). එසේම, 'පුරුෂයන් කුමර බඹසර සහිත වූවන් බව හැඳින්වීම සඳහා අපගේ භාෂාවන්හි (දමිළ භාෂාවේ) තනි යෙදුම් දැකගත නොහැකි වීමට හේතුව වී ඇත්තේ පුරුෂාධිපත්‍යය හැර අන් කිසිවක් නොවේ" (Periyar, 1942) ලෙස චෝදනා කිරීම මගින් පතිව්‍රතාව යන අදහස සමග බද්ධවී ඇති කාන්තා වන්ට එරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීම දැඩි ලෙස අවධාරණය කර ඇත. ඉලක්කියා, පතිව්‍රතාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේදී කුල ක්‍රමය ආරක්ෂාකර ගැනීම සඳහා පතිව්‍රතාව හා සම්බන්ධ නිර්මලත්වය සහ චරිතවත් බව කාන්තාවන්ට හිමිවන දෙයක් බවට වූ මතය ඉන්දීය සමාජයේ අනුගමනය කෙරුණු බව අවධාරණය කරයි. පතිව්‍රතාව පදනමින් කාන්තාවකගේ සමාජ පැවැත්ම තීරණය කෙරෙන ක්‍රමයක් දියුණුවෙමින් පවතින සමාජය තුළට බලෙන් කාවැද්දීම පිළිබඳව ද ඇය අවධාරණය කර ඇත (Elackia, 2016).

දකුණු ආසියාතික රටවල්හි කාන්තාවන් සහ ඔවුන්ගේ ශරීරය ගරුත්වයේ සලකුණු වශයෙන් සලකනු ලබන බවත් යම් පවුලක හෝ සමාජයක තත්ත්වය හෝ කීර්තිය ආරක්ෂාකර ගැනීම සඳහා කාන්තා වන්ගේ නිර්මලත්වය සහ චරිතවත් බව ආරක්ෂාකර ගැනීම ඉතා අත්‍යවශ්‍ය වන බවට සැලකෙන බවත් අයේෂා බානු පෙන්වා දෙයි (Banu, 2016).

## 2.3 ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමාජ ප්‍රතිමාන ආරක්ෂා කිරීම සහ ඒවා ඉදිරියට ගෙන යාම සම්බන්ධ කාන්තාවන්ගේ භූමිකාව

ක්‍රියාත්මක තත්ත්වයේ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන නැතහොත් බල සම්බන්ධතා කාන්තාවන්ට හානි කළහැකි තත්ත්වයක පැවතිය ද ඒවාට අනුගතවීම අවශ්‍ය බවට ඔවුන් විශ්වාස කරන බව අයේෂා බානු පෙන්වා දෙයි (Banu, 2016). මේ සඳහා ප්‍රායෝගික සාක්ෂි Care International ආයතනය විසින් සිදුකරන ලද සහභාගිත්ව පර්යේෂණයේ දී ඉදිරිපත් කර තිබේ (De Mel, Peiris, & Gomez, 2013). මෙම පර්යේෂණයේ වැදගත් නිගමන කිහිපයක් පහත පරිදි ලැයිස්තුගත කළ හැකිය.

- ස්ත්‍රී දූෂණ සිද්ධියකදී විපතට පත්වූ තැනැත්තිය චරිතවත් තැනැත්තියක් ද යන්න ප්‍රථමයෙන් සලකා බැලිය යුතු බවට වූ අදහස සමග කාන්තාවන් 67%ක් (පර්යේෂණයට සහභාගීවූ) එකඟ විය. නමුත් මෙම අදහස සමග එකඟ වූ පුරුෂයන්ගේ සංඛ්‍යාව 55%ක් පමණි.

- ඇතැම් කාන්තාවන්ගේ හැසිරීම් විලාශය හේතුවෙන් ඔවුන් ස්ත්‍රී දූෂණයට ලක්වන බවට වූ අදහස 75%ක කාන්තාවන් පිරිසක් අනුමත කර තිබුණි.

- තුනෙන් දෙකකට අධික කාන්තාවන් පිරිසක් 'කාන්තාවක් කිනම් වාතාවරණයකදී වුවද ස්වාමි පුරුෂයා සමග සංසර්ගයෙහි යෙදීම ප්‍රතික්ෂේප නොකළ යුතුය' යන අදහස අනුමත කර තිබුණි.

- කාන්තාවන් 83%ක් දරුවන්ට ආහාර සැපයීම සහ ඔවුන් රැකබලා ගැනීම වැනි කටයුතු මවකගේ වගකීම් වන බවට වූ අදහස පිළිගෙන තිබුණි. කෙසේ නමුත්, පුරුෂයින් 64%ක පිරිසක් පමණක් එම අදහස පිළිගෙන තිබුණි.

- අඩකට වඩා වැඩි කාන්තාවන් පිරිසක් පවුල් රැකවරණය සහ ආහාර පිසීම වැනි දේ කාන්තාවන්ගේ ප්‍රධාන භූමිකාව බවට වන අදහස පිළිගෙන තිබුණි (De Mel, Peiris, & Gomez, 2013)

කාන්තාවන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන ආරක්ෂා කිරීමට නැතහොත් මතු පරම්පරාව වෙත ගෙනයාමට අදාළ මූලික හේතු අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිදුකරන ලද සමාජ ප්‍රතිමාන පිළිබඳ සහභාගිත්ව පර්යේෂණය මගින් පෙන්වා දී ඇත. එනම්, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට පදනම වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන මතු පරම්පරාව වෙත ගෙනයනු ලබන ප්‍රධාන පුද්ගලයන් වශයෙන් කාන්තාවන් සිටින බව අවධාරණය කරන මෙම පර්යේෂණය ඒ සඳහා හේතු වශයෙන් දකුණු ආසියාතික සමාජයන්හි ජීවත් වන කාන්තාවන් පුරුෂයන් නොමැති විට තමන් දුබලයන් වන බවට සලකන අතර පිරිමින් තම පවුල්වල ආධිපත්‍ය හෙබවිය යුතු බවට ද අපේක්ෂා කරන බව පෙන්වා දී ඇත. එසේම, මේ සඳහා වන තවත් හේතුවක් වශයෙන්, 'මෙවැනි සමාජ ප්‍රතිමාන අනුගමනය කිරීම තමන් ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා වීමටත් තම පවුල් වල කීර්තිනාමය ආරක්ෂා වීමටත් හේතුවන බවට ඔවුන් විශ්වාස කිරීම' පවතින බව මෙම පර්යේෂණය ඉස්මතු කොට දක්වා ඇත (T.Herath & all, 2018).

මේ සම්බන්ධයෙන් අදහස් දක්වන පෙරියාර් වසර ගණනාවක පුරුදු පුහුණු හේතුවෙන් පහත් කුල යැයි සම්මත කුලයන්ට අයත් පුද්ගලයින් තමන් පහත් පන්තියේ අය බව පිළිගනිමින් තමන්ම අවනත වී හැකිළී සිටීමට කටයුතු කරන ආකාරයෙන්ම කාන්තාවන්ද තමන් පිරිමින්ගේ දේපල බවටත් ඔවුන්ගේ කෝපයට හසුනොවී සිටිය යුතු පිරිසක් බවටත් සිතමින් තම නිදහස කෙරෙහි සැලකිල්ලක් නොදක්වා කටයුතු කරන බව සඳහන් කරයි (Periyar, 1942). ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාවක් නොමැති මෙම සමාජයේ ජීවත්වන කාන්තාවන් පීඩාවට පත් වූ අය වශයෙන් හෝ පීඩාවට පත්වන අය වශයෙන් සිටින අතර මෙම සමාජ ව්‍යුහයෙහි ආරක්ෂකයන් වශයෙන් සිටින්නේ ද ඔවුන්මය යනුවෙන් ඉලක්කියා අවධාරණය කරයි (Elackia, 2016).

## 2.4 පශ්චාත් යුද සමාජයන්හි දැකිය හැකි සමාජ ප්‍රතිමානයන්ගේ ප්‍රවණතාව

පශ්චාත් යුද සමාජ ව්‍යුහයන්හි ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි භූමිකාවන් යලි ගොඩනැගෙන්නේ කෙසේද යන්න පිළිබඳව සාකච්ඡා කරන Sorenson Birgette විසින් රචනාකර ඇති වාර්තාවේ පශ්චාත් යුද සමාජයන්හි සමාජ ප්‍රතිමාන කුමන ආකාරයේ වෙනස්කම්වලට නැතහොත් නම්‍යතාවන්ට ලක් වන්නේ ද යන්න පිළිබඳව පුළුල් ලෙස සාකච්ඡා කර ඇත. දේශපාලන ප්‍රතිසංස්කරණය, ආර්ථික ප්‍රතිසංස්කරණය සහ සමාජ ප්‍රතිසංස්කරණය යන කොටස් තුන යටතේ මෙය සාකච්ඡා කර ඇත. යුද්ධයේ ප්‍රතිවිපාක හේතුවෙන්, පශ්චාත් යුධ සමයෙහි කාන්තාවන් හට නව භූමිකාවන් භාරගැනීමට සිදුව ඇත. උදාහරණ වශයෙන්, යුද්ධය හේතුවෙන් ස්වාමිපුරුෂයා අහිමිවූ කාන්තාවන් පවුලේ නායකත්වය භාරගත යුතු තත්ත්වයක් උදාවී තිබීම පෙන්වා දිය හැකිය. මෙවැනි නව භූමිකාවන් සමාජයේ පවතින සාරධර්ම සහ ප්‍රතිමාන වෙනස්කරනු ඇති බව Birgitte පෙන්වා දෙයි. යුද්ධයට පෙර කාන්තාවන්ගේ ඇතැම් ක්‍රියාකාරකම් අනුමත නොකළ සමාජය, යුද වාතාවරණයකදී කාන්තාවන්ට ඒවා කිරීමට නියම වී තිබීම පැකිළීමකින් වුවද පිළිගැනීමට උත්සාහ කරන බව වැඩිදුරටත් ඔහු පැහැදිලි කර දක්වයි (Birgitte, 1998). මෙය Patti Petesch යන අය විසින් 'සමාජ ප්‍රතිමානයන්හි වෙනස්වීම සහ සමාජ ප්‍රතිමානයන්හි ලිහිල් වීම' වශයෙන් මතවාදයන් දෙකක් ඉදිරිපත් කරමින් පැහැදිලි කරයි. එනම් සමාජ ප්‍රතිමාන ලිහිල් වීමේදී ප්‍රජාවේ සාමාජිකයන් සමාජ ප්‍රතිමානයන්ගෙන් අපගමනය වුවද එය පොදු රීතියක් වශයෙන් සමාජය විසින් පිළිනොගන්නා අතර එය ව්‍යතිරේකයක් වශයෙන් ගනු ලබයි. නමුත් ප්‍රතිමාන වෙනස් වීමේදී නව රීතීන් ව්‍යතිරේකයන් වශයෙන් නොව පොදු රීතීන් වශයෙන් පිළිගනු ලබන බව ඔහු පැහැදිලි කරයි. එසේම යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජ ප්‍රතිමාන වෙනස්නොවන බවත් හුදෙක් ඒවා ලිහිල් වන බවත් ඔහු තහවුරු කරයි (Patesch, 2017). මෙම මතවාදය සමග සම්බන්ධ වන ශ්‍රී ලංකාව පිළිබඳව විශ්ලේෂණය පස්වන පරිච්ඡේදයේ දී දැකිය හැකිය.

එසේම, යුද්ධයකට මුහුණ දී ඇති රටක මානව සම්පත් සංවර්ධන අවශ්‍යතාව බහුලව පවතින විට කාන්තාවන් ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි භූමිකාවන්ට පටහැනි වන කටයුතු සිදුකිරීමට පවා දිරිගැන්වෙන බව පෙන්වාදෙමින් පශ්චාත් යුද සමාජයන්හි සමාජ ප්‍රතිමානයන් නම්‍යශීලී වන ආකාරය Birgitte පැහැදිලි කරයි. යුද සමයේදී සහ පශ්චාත් යුද සමයේදී ශ්‍රම වෙළඳපොළෙහි කාන්තාවන්ගේ දායකත්වය වර්ධනය වන බව සිද්ධි අධ්‍යයන මගින් පෙන්වා දෙයි. යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් කාන්තාවන්ගේ වෘත්තීය සහභාගිත් වය වර්ධනය වුව ද සම වැටුප් ලබාගැනීමේ නොහැකියාව සහ ඒ වන විටත් පැවති පවුල් වගකීම් තවදුරටත්

පැවතීම, ශ්‍රම සූරාකෑම වැනි හේතූන් මත කාන්තාවන් පීඩාවට පත්වන බව මෙම සිද්ධි අධ්‍යනයන් පෙන්වා දෙයි (Justino, 2012). කෙසේ නමුත්, යුද්ධයෙන් පසු සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි භූමිකාවන් යළි හඳුන්වාදෙනු ලැබ, ඒවාට පටහැනි වන අයුරින් පොදු ක්ෂේත්‍රයන් කෙරෙහි උනන්දුවක් දක්වන කාන්තාවන් කොන් කරනු ලබන අවස්ථාවන් ද ඇති බව පෙන්වීමට ද Birgitte අසමත් නොවීය. කාන්තාවන් තමන් දැරූ සාම්ප්‍රදායික භූමිකාවන්ගෙන් ඉවත් වී ගෘහමූලික කාන්තාවන්, ආදායම් උපයන්නියන් දේශපාලන නියෝජිතවරියන් වශයෙන් නව භූමිකාවන් දැරීමේදී ඔවුහු බොහෝ විරෝධතාවන්ට හා කොන් කිරීම්වලට ලක්වෙති. කාන්තාවන් මෙම භූමිකාවන් දැරීමට පටන් ගැනීම තුළින් එකී භූමිකාවන්ගේ පරම හිමිකරුවන් වන තම පැවැත්ම අභියෝගයට ලක් විය හැකි බවට පුරුෂයන් අතරේ ඇති වන බිය උක්ත විරෝධතා සඳහා ප්‍රධාන හේතුව බව පෙන්වා දී තිබේ (Patesch, 2017)

යුද්ධය හේතුවෙන් ඇතිවූ දේශපාලන, සමාජීය සහ ආර්ථික වෙනස්වීම් හේතුවෙන් කාන්තාවන්ගේ සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි භූමිකාවන් අභියෝගයට ලක් වී ඇති බවත් තවදුරටත් අභියෝගයට ලක් වෙමින් පවතින බවත් සඳහන් කරන Birgitte සමාජයන් නව වාතාවරණයන්ට අනුව ස්ත්‍රී පුරුෂ සමාජ භාවය හා බැඳිඅනන්‍යතාවන් අලුතින් ගොඩනගාගැනීම සඳහා සටන් කරමින් සිටින බවත්, කෙසේ නමුත්, අනන්‍යතාවන් ගොඩනඟා ගැනීම සඳහා වන මෙම සටන සම්පත් සහ බලය ලබාගැනීම සඳහා වන සටන සමග සම්බන්ධ වන බැවින් "ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි භූමිකාවන්" යළි ගොඩනැගීම ඉතා සංකීර්ණ කරුණක්ව පවතින බවත් පැහැදිලි කරයි (Birgitte, 1998).

මෙම වාර්තාව, කාන්තා සටන්කාමීන්, කාන්තාවන් විසින් නායකත්වය ලබා දෙන ලද විපතට පත්වූවන්ගේ මුලපිරීම්, කාන්තාවන් විසින් දියත් කරන ලද සාමය සඳහා වන ප්‍රයත්නයන් වැනි ශ්‍රී ලංකාවේ යුද්ධය සමඟ සම්බන්ධ වන ඇතැම් අංශ සම්බන්ධයෙන් සාකච්ඡා කර තිබුණද මෙය 1998 වසරේ ලියන ලද වාර්තාවක් වන බැවින් පශ්චාත් යුද සමයේදී යුද්ධය සිදු වූ ප්‍රජාවන් තුළ සමාජ ප්‍රතිමානයන්හි ප්‍රවණතාව කෙසේ පැවතිය ද යන්න පිළිබඳව සාකච්ඡා කර නැත. ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ සමාජයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා නිදහස කෙරෙහි එල්ල කරන ලද බලපෑම සාකච්ඡා කිරීමට ප්‍රමාණවත් පර්යේෂණ සිදු වී නොමැත.

කෙසේ වෙතත්, OXFAM ආයතනය විසින් සිදුකරන ලද පර්යේෂණය, ශ්‍රී ලංකාවේ පැවති අභ්‍යන්තර යුද්ධය, ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි ප්‍රචණ්ඩත්වයට පදනම් වී ඇති සමාජ ප්‍රතිමාන වෙනස්කරන සාධකයක් බවට හඳුන්වා දී තිබේ. විශේෂයෙන්ම, මෙම පර්යේෂණය සඳහා මඩකලපුව දිස්ත්‍රික්කය නියෝජනය කරමින් සහභාගී වූ පිරිස ගෘහමූලික කාන්තාවන් සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන නම්‍යශීලී වී ඇති ආකාරය පෙන්වා දී තිබුණි. යුද්ධය පැවති කාලසීමාවේ දී නිකුත් වූ දමිළ මාසික සඟරාවන්හි පළවී තිබූ කාන්තාවන් සහ යුද්ධය පිළිබඳ ලිපි මගින් එම කාලසීමාවේ දී විශේෂයෙන්ම දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානයේ පාලනය යටතේ පැවති උතුරු පළාතේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි අසමානතා බහුල වශයෙන් පැවති බව පෙන්වා දී තිබේ. කාන්තා වහල්භාවය තුරන් කරන බවට දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය ප්‍රකාශයට පත් කර තිබුණ ද එම සංවිධානයේ ක්‍රියාකාරකම් හා ස්ථාවරයන් මුළුමනින්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව අනුමත නොකරන ලද බව එකී ලිපි මගින් විවේචනය කර තිබුණි. විශේෂයෙන්ම කාන්තාවන්ගේ පතිව්‍රතාව සම්බන්ධයෙන් මෙම සංවිධානය පවිත්‍රතා නැඹුරුවක් දැක්වූ බවත්, දූෂණයට ලක්වූ කාන්තාවන් අයාලේ ගිය අය වශයෙන් විවේචනය කර ඇති බවත් සඳහන් කර තිබේ (පාංචාලි, පතිව්‍රතතාව යනුවෙන් කියන්නේ කුමක්ද, 1991). එසේම එම කාලසීමාවේ දී ස්වාමිපුරුෂයා අහිමි වූ කාන්තාවන් යළි විවාහ වීම දැඩි ලෙස විවේචනය කරන ලද බවත් සඳහන් කර තිබේ (පාංචාලි, යුද්ධය සහ කාන්තාවල 1990). මෙලෙස යුද්ධය හේතුවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමානයන්හි ඇති වූ වෙනස්කම් සම්බන්ධයෙන් විවිධ වූ අදහස් පවතී. කෙසේ වෙතත්, මෙය ගැඹුරින් හා ක්‍රමවත්ව සොයාබැලීමේ අවශ්‍යතාවක් පවතින බව පැහැදිලිය.

# 3 වන පරිච්ඡේදය

## 3 පර්යේෂණ ක්‍රමවේදය

### 3.1 හැඳින්වීම

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සහ ක්ෂේත්‍ර මට්ටමින් ඒවායෙහි භාවිතාවන් පිළිබඳව දැනගැනීම වේ. එබැවින් මෙම පර්යේෂණය සඳහා වන ක්‍රමවේදය වශයෙන් සහභාගීත්ව ප්‍රවේශය පිළිගන්නා ලදී. පර්යේෂණයේ සෑම පියවරකදීම ප්‍රජා සාමාජිකයන් අන්තර්ග්‍රහණය කොට ඔවුන්ගේ දායකත්වය සහ සහභාගීත්වය සහතික කරන ලදී. එසේම, මෙම පර්යේෂණය "ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව" යන මූලික සිද්ධාන්තය මත ගොඩ නගන ලදී. මෙකී පර්යේෂණයේ විෂය කරුණ හා සම්බන්ධ "සංවේදී බව" හේතුවෙන් මෙම පර්යේෂණයේ අරමුණ සඳහා ආචාර ධර්ම පද්ධතියක්[54] විශේෂයෙන් සම්පාදනය කර තිබෙන අතර එහි රීතීන්ට යටත්ව පර්යේෂණය දියත් කර තිබේ. එම ආචාර ධර්ම පද්ධතිය නීතිය හා සමාජ භාරය (LST) ආයතනයේ පර්යේෂණ කණ්ඩායම විසින් සම්පාදනය කරන ලදුව Chrysalis හි අනුමැතිය මත පිළිගන්නා ලදී. පර්යේෂණය සඳහා වන පුළුල් සැලැස්ම නීතිය හා සමාජ භාරය ආයතනයේ පර්යේෂණ කණ්ඩායම විසින් සැලසුම්[55] කර තිබූ අතර එය නිවැරදි කිරීම සඳහා වන ප්‍රතිපෝෂණය සහ අවසරය Chrysalis විසින් ලබාදී තිබුණි.

මෙම පර්යේෂණය, ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ කාන්තාවන්ගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමානයන් වෙනස් කිරීම සඳහා උත්සාහ දරන TRANSFORM වැඩසටහන යටතේ දියත් කරනු ලබන කටයුත්තකි. එම වැඩසටහනේ අවසන් ඉලක්කය වනුයේ, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව, මානව අයිතිවාසිකම්, මූලික නිදහස සහ සාධාරණත්වය ප්‍රවර්ධනය කොට ආරක්ෂා කිරීම මගින් ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම වේ. මෙම වැඩසටහන සඳහා යුරෝපා සංගමය විසින් මූල්‍ය අනුග්‍රහය දක්වන අතර මෙම පර්යේෂණය Chrysalis විසින් දෙනු ලබන සංවිධානාත්මක සහයෝගය මත නීතිය හා සමාජ භාරය විසින් සිදු කරනු ලැබේ.

### 3.2 පර්යේෂණයේ පරමාර්ථ

ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සහ එහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි බලපෑම් සහ එකී බලපෑම් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව හා කාන්තාවන්ගේ මූලික අයිතිවාසිකම් හා නිදහස කෙරෙහි බලපෑම් ඇතිකරන ආකාරය පිළිබඳව සොයාබැලීම මෙම සහභාගීත්ව පර්යේෂණයෙහි අරමුණ වී තිබේ. මෙම පර්යේෂණයේ විශේෂ පරමාර්ථ වශයෙන් පහත පරමාර්ථ හඳුනාගෙන තිබේ.

1. සමාජයේ (උතුරු පළාතෙහි) ස්ථාපිතව පවතින සමාජ ප්‍රතිමාන, ඒවා කාන්තාවන් කෙරෙහි ඇතිකරන ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි බලපෑම් සහ ඒවා කාන්තාවන් සිය මූලික අයිතිවාසිකම් හා නිදහස සාක්ෂාත් කරගැනීම වළකාලන ආකාරය පිළිබඳව අවබෝධ කර ගැනීම.
2. යුධ සමයේදී සහ පශ්චාත් යුද සමයේදී සමාජ ප්‍රතිමාන කෙබඳු ආකාරයේ වෙනස්වීම් වලට ලක්වූයේ ද යන්න පිළිබඳව සහ ඒවා මගින් ඇති කරන බලපෑම්වලින් මිදීම සඳහා කාන්තාවන් විසින් අනුගමනය කර ඇති උපාය මාර්ගික යාන්ත්‍රණ පිළිබඳව අවබෝධ කර ගැනීම.
3. ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ ජාතික කතිකාවන් කාන්තාවන් සිය මූලික අයිතිවාසිකම් හා නිදහස සාක්ෂාත් කර ගැනීමේදී බලපෑම් එල්ල කරන ආකාරය පිළිබඳව සලකා බැලීම.

---

*54* ඇමුණුම 1
*55* ඇමුණුම 2

## 3.3 පර්යේෂණ ආචාරධර්ම

මෙම පර්යේෂණයේ විෂය කරුණෙහි පවතින සංවේදී බව සැලකිල්ලට ගනිමින් පර්යේෂණයේ දත්ත රැස්කිරීමේ ක්‍රියාවලිය නියාමනය කිරීමේ විශේෂ අරමුණ සඳහා ආචාර ධර්ම පද්ධතියක් සකස් කරන ලදී. පර්යේෂණ ආචාරධර්ම පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන් සැලකිල්ලට ගෙන මෙම ආචාර ධර්ම පද්ධතිය සකස් කර තිබේ. මෙම ආචාර ධර්ම පද්ධතිය මූලික මාර්ගෝපදේශන මූලධර්ම අටකින් (8) සමන්විත විය. ඒවා නම්,

### 1. පර්යේෂණය සඳහා සහභාගීවන්නන්ගේ ගරුත්වය සහ ආරක්ෂාව තහවුරු කිරීම

පර්යේෂණයට සහභාගීවන්නන් ඇතුළු පර්යේෂණය සඳහා තොරතුරු සපයන්නාවූ සියලු පාර්ශ්වයන්ගෙන් ඔවුන් සපයන තොරතුරු පර්යේෂණයේ අරමුණු සඳහා භාවිතා කිරීමට ඔවුන්ගේ පූර්ව එකඟතාව ලිඛිතව ලබාගැනීමෙන් පසුව තොරතුරු රැස් කළයුතුය. පර්යේෂණය පිළිබඳ තොරතුරු ඔවුන්ට මනාව පැහැදිලි කර දීමෙන් අනතුරුව ඔවුන්ගේ එකඟතාව ලබා ගතයුතුය.

### 2. දැනුවත් එකඟතාව

පර්යේෂණයට සහභාගීවන්නන් ඇතුළු පර්යේෂණය සඳහා තොරතුරු සපයන්නාවූ සියලු පාර්ශ්වයන්ගෙන් ඔවුන් සපයන තොරතුරු පර්යේෂණයේ අරමුණු සඳහා භාවිතා කිරීමට ඔවුන්ගේ පූර්ව එකඟතාව ලිඛිතව ලබාගැනීමෙන් පසුව තොරතුරු රැස් කළයුතුය. පර්යේෂණය පිළිබඳ තොරතුරු ඔවුන්ට මනාව පැහැදිලි කර දීමෙන් අනතුරුව ඔවුන්ගේ එකඟතාව ලබා ගතයුතුය.

### 3. සහතික කිරීම

දත්ත රැස්කරන්නන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා වන නිල ලේඛන ඔවුන් වෙත ලබාදී තිබූ අතර පර්යේෂණයට සහභාගීවන්නන් ඉල්ලා සිටින විටෙක ඒවා ඔවුන්ට පෙන්විය යුතු බවටද දත්ත රැස් කරන්නන් හට උපදෙස් ලබා දෙන ලදී.

### 4. නිර්නාමිකභාවය සහ රහස්‍යභාවය

පර්යේෂණ ක්‍රියාදාමයේ සෑම අදියරකදී ම පර්යේෂණයට සහභාගීවන්නන්ගේ රහස්‍යභාවය සඳහා වන අයිතිය තහවුරු කළ යුතුය. එකතුකරනු ලබන දත්ත ඉතා රහසිගතව පවත්වාගෙන යා යුතුය. පර්යේෂණයට සහභාගීවන්නන්හට සිය අනන්‍යතාව හෙළිදරව් නොකර සිටීමේ නිදහස ලබා දිය යුතුය.

### 5. අතරමගදී පර්යේෂණ ක්‍රියාදාමයෙන් ඉවත්වීම සඳහා සහභාගීවන්නන් සතු අයිතිය

කිසියම් හේතුවක් මත හෝ කිසිදු හේතුවක් නොමැතිව මෙම පර්යේෂණ ක්‍රියාදාමයෙන් ඉවත් වීම සඳහා වන අයිතිය පර්යේෂණය සඳහා සහභාගීවන්නන්ට ඇත.

### 6. ළමුන්ගෙන් දත්ත රැස් කිරීම

වයස අවුරුදු 18ට අඩු පුද්ගලයින්ගෙන් දත්ත එකතුකිරීමේදී ඔවුන්ගේ දෙමාපියන්ගේ හෝ භාරකරුවන්ගේ ලිඛිත එකඟතාව ලබා ගත යුතුය.

### 7. පර්යේෂණයට සහභාගීවන්නන් සඳහා වන ප්‍රතිලාභ


දත්ත රැස්කිරීමේදී දත්ත රැස්කරන්නන් විසින් මෙම පර්යේෂණය මගින් ලබාගත හැකි ප්‍රතිලාභ පිළිබඳ පැහැදිලි කිරීමක් ඊට සහභාගීවන්නන්හට සිදු කළ යුතුය.

### 8. කොවිඩ්-19 සඳහා වන ආරක්ෂිත මගපෙන්වීම්

**මුහුණු ආවරණ පැළඳීම, විෂබීජ නාශක දියර භාවිත කිරීම ඇතුළු කොවිඩ්-19 වසංගතයෙන් දත්ත රැස්කරන්නන්, පර්යේෂණයට සහභාගීවන්නන් සහ සෙසු සියලු පුද්ගලයින් ආරක්ෂා කර ගැනීම සඳහා ආරක්ෂිත ක්‍රමවේද දත්ත රැස්කිරීමේදී අනුගමනය කළ යුතුය. පර්යේෂණ කණ්ඩායම විසින් දත්ත රැස්කරන්නන් හට අවශ්‍ය සෞඛ්‍යය මෙවලම් ලබාදිය යුතුය.**

## 3.4 දත්ත රැස්කිරීමේ ක්‍රමවේද

රූප සටහන 3.1
දත්ත රැස්කිරීමේ ක්‍රමවේද



මෙම පර්යේෂණය වෙනුවෙන් දත්ත රැස්කිරීම සඳහා දත්ත රැස්කිරීමේ මෙවලමක් (ප්‍රශ්නාවලිය) නීතිය හා සමාජ භාරය (LST) ආයතනයේ පර්යේෂණ කණ්ඩායම විසින් සකස් කරන ලදී. කෙසේ වෙතත් මෙම ප්‍රශ්නාවලිය සැකසීම සඳහා ප්‍රජා සාමාජිකයන්ගේ දායකත්වය විවිධ උපායමාර්ග ඔස්සේ තහවුරු කරන ලදී. ප්‍රශ්නාවලිය සකස් කිරීමේ ප්‍රථම පියවර වශයෙන් උතුරු පළාතේ ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන පිළිබඳ ලිපි ග්‍රන්ථ විමසුමක් සිදු කරන ලදී. එම ලිපි ග්‍රන්ථ විමසුමෙහි පදනමෙන් සැලකිය යුතු සමාජ ප්‍රතිමාන සංඛ්‍යාවක් පර්යේෂණ කණ්ඩායම විසින් ලැයිස්තුගත කරන ලදී. කෙසේ වෙතත්, එවන් සමාජ ප්‍රතිමාන වර්තමානයේ කොතෙක් දුරට සමාජයෙහි ස්ථාපිතව පවතී ද යන්න අවබෝධ කරගැනීමේ ප්‍රයත්නයෙහි පළමු පියවර වශයෙන් උතුරු පළාතේ තරුණ පිරිස් සමග මාර්ගස්ත සංවිධානය කරන ලදී.[56] මෙම සාකච්ඡාව මඟින් උතුරු පළාතේ ස්ථාපිතව පවතින සමාජ ප්‍රතිමාන සම්බන්ධයෙන් මූලික දැනුමක් ලබාගත හැකි විය.

එම මූලික දැනුම පදනම් කරගනිමින් දත්ත රැස්කරන්නන් සඳහා දිශාභිමුඛ වැඩසටහන් මාර්ගස්ත ක්‍රමයට සංවිධානය කරන ලදී.[57] මෙකී දිශාභිමුඛ වැඩසටහන්වලදී එක් එක් දිස්ත්‍රික්කයට අයත් දත්ත රැස්කරන්නන් තම තමන්ගේ දිස්ත්‍රික්කයන්හි ස්ථාපිතව පවතින සමාජ ප්‍රතිමාන හඳුන්වා දෙන ලදී. බොහෝ සමාජ ප්‍රතිමාන උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක පහේම ස්ථාපිතව පැවතියද ඒවා ස්ථාපිත වී ඇති ප්‍රමාණය විවිධ මට්ටම්වලින් පැවතීම නිරීක්ෂණය කළ හැකිවිය. ලිපි ග්‍රන්ථ විමසුම තරුණ පිරිස් සමග වූ සාකච්ඡාව සහ දත්ත රැස්කරන්නන් සඳහා වූ දිශාභිමුඛ වැඩසටහන් මගින් හඳුනාගන්නා ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන පදනම් කරගනිමින් ප්‍රශ්නාවලිය සකස් කරන ලදී. ප්‍රශ්නාවලිය මෙයට අමුණා ඇත.[58]

**ඡායාරූපය 3.1**

**උතුරු පළාතේ ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන පිළිබඳව තරුණ පිරිස් සමග සිදුකරන ලද මාර්ගගත සාකච්ඡාව**



**ඡායාරූපය 3.1 සහ ඡායාරූපය 3.1**

දත්ත රැස්කරන්නන් සඳහා වන දිශාභිමුඛ වැඩසටහනේදී






56 2021 පෙබරවාරි මස 4 වන දින Zoom තාක්ෂණය ඔස්සේ සංවිධානය කර තිබුණි.

57 මෙම දිශාභිමුඛ වැඩසටහන් පෙබරවාරි මස 08 වන දින යාපනය දිස්ත්‍රික්කයේ දත්ත රැස් කරන්නන් සඳහාද, 09 වන දින කිලිනොච්චිය සහ මුලතිව් දිස්ත්‍රික්කයන්හි දත්ත රැස්කරන්නන් සඳහා ද,17 වන දින මන්නාරම සහ වව්නියා දිස්ත්‍රික්කයන්හි දත්ත රැස්කරන්නන් සඳහා ද පවත් වන ලදී.

58 ඇමුණුම 3

**CARE හි SNAP ව්‍යුහය (සමාජ ප්‍රතිමාන විශ්ලේෂණය කිරීමේ ව්‍යුහය)**

සමාජ ප්‍රතිමාන විශ්ලේෂණය කිරීමේ ව්‍යුහාත්මක මෙවලම (SNAP ව්‍යුහාත්මක මෙවලම) යොදාග නිමින් මෙම පර්යේෂණයේදී ගවේෂණය කිරීමට නියමිත ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන විශ්ලේෂණය කර තිබේ. එය සැලකිල්ලට ගනිමින් දත්ත රැස්කිරීමේ මෙවලම SNAP ව්‍යුහාත්මක මෙවලම මගින් විශ්ලේෂණය කළ හැකි පරිදි සකස් කර ඇත. SNAP ව්‍යුහය සමාජ ප්‍රතිමානයන්හි මූලිකාංග පහක් විශ්ලේෂණය කළ හැකි පරිදි නිර්මාණය කර තිබේ.


## 3.1 වන වගුව

### SNAP ව්‍යුහය[59]

| සමාජ ප්‍රතිමාන මූලිකාංග | පැහැදිලි කිරීම |
|---|---|
| ආනුභවික අපේක්ෂාවන් | අන් අය කුමක් කරනවා කියා ද මම සිතන්නේ |
| ප්‍රතිමානක අපේක්ෂාවන් | අන් අය මා කළ යුතු බවට බලාපොරොත්තු වන දේ ලෙස මම සිතන දේ |
| සමාජ ප්‍රතිචාර (අනුමැතිය/දඬුවම) | මගේ හැසිරීම පිළිබඳ අන් අයගේ ප්‍රතිචාරය |
| අනුමැතිය/දඬුවමට ප්‍රතිචාර දැක්වීමේ ප්‍රමාණය | සමාජයේ ප්‍රතිචාරය අනුව හැසිරීම් වල වෙනස්වීමේ ප්‍රමාණය |
| ව්‍යතිරේක | කිසියම් සමාජ ප්‍රතිමානයකින් අපගමනය වීමට අවසර දී ඇති අවස්ථා තිබේද? |

සමාජ ප්‍රතිමාන ඇගයීම සඳහා වන මෙම SNAP ව්‍යුහය සමාජ අපේක්ෂාවන් (ආනුභවික අපේක්ෂාවන් සහ ප්‍රතිමානක අපේක්ෂාවන්) විශ්ලේෂණය කිරීමෙන් ස්ථාපිතව පවත්නා සමාජ ප්‍රතිමානයක ප්‍රබලත්වය අවබෝධ කරගැනීම සඳහා සංවර්ධනය කර ඇත. සමාජ අපේක්ෂාවන් දෙවර්ගයකි.

රූපය 3.2




එසේම, මෙම ව්‍යුහය කිසියම් සමාජ ප්‍රතිමානයක් අනුගමනය නොකිරීමෙන් ඇතිවන ප්‍රතිවිපාක පිළිබඳවත් කිසියම් නිශ්චිත සමාජ ප්‍රතිමානයක් අනුගමනය කිරීම සඳහා ඒවා මගින් ඇති කෙරෙන බලපෑම පිළිබඳවත් අවබෝධ කරගැනීමට උපකාරී වේ. එසේම, මෙම ව්‍යුහය, කිසියම් සමාජ ප්‍රතිමානයක් ස්ථාපිතව පැවතීම කෙරෙහි බලපෑම් කරන පුද්ගලයින් සහ අදාළ සමාජ ප්‍රතිමානයෙන් අපගමනය වීමට අවසර දී ඇති ව්‍යතිරේකී අවස්ථාවන් යනාදිය හඳුනා ගැනීම මගින් එකී සමාජ ප්‍රතිමාන සම්බන්ධයෙන් කළ හැකි මැදිහත්වීම වර්ධනය කර ගැනීම සඳහාත් උපකාරී වේ.

එසේම, මෙම ව්‍යුහය, කිසියම් සමාජ ප්‍රතිමානයක ප්‍රබලත්වය විවිධ කාල වකවානුවලදී වෙනස් වී තිබේද යන්න පිළිබඳව සංසන්දනාත්මකව ගවේෂණය කිරීමට උපකාරී වේ. මෙම පර්යේෂණයෙන් අනතුරුව සිදුකරනු ලබන මැදිහත්වීම් වල ප්‍රතිඵලයක් වශයෙන් සමාජ ප්‍රතිමානයන්හි ප්‍රබලත්වය කොතෙක් දුරට වෙනස් වී තිබේද යන්න තක්සේරු කිරීම සඳහා මෙම ව්‍යුහය අපට යොදාගත හැකිය.

59 Ben Cislaghi and Lori Heise. 2016. Measuring Gender-related Social Norms: Report of a Meeting, Baltimore Maryland, June 14-15, 2016. Learning Group on Social Norms and Gender-based Violence of the London School of Hygiene and Tropical Medicine

## 3.5 පර්යේෂණය සඳහා සහභාගීවන්නන් තෝරාගැනීම

මෙම පර්යේෂණය සඳහා සහභාගීවන්නන් මෙම පරීක්ෂණයේ ඉතා වැදගත් කොටස්කරුවන් වේ. උතුරු පළාතේ පිහිටා තිබෙන දිස්ත්‍රික්ක පහට අයත් ප්‍රජා සාමාජිකයින් මෙම පර්යේෂණය සඳහා සහභාගීවන්නන් ලෙස තෝරා ගන්නා ලදී. Chrysalis ආයතනය විසින් TRANSFORM වැඩසටහන සඳහා ඒවනවිටත් ප්‍රතිලාභීන් 500 දෙනෙකු පමණ තෝරාගෙන තිබුණි. ඔවුන්ගෙන් 400 දෙනෙකු පමණ මෙම පර්යේෂණයේ සහභාගීවන්නන් ලෙස තෝරාගෙන තිබුණි. කෙසේ වෙතත්, තෝරාගන්නා ලද මෙම 400 දෙනාගේ පසුබිම් පිළිබඳව සොයා බැලීමේදී ඔවුන්ගෙන් බහුතරයක් සිවිල් සමාජ කටයුතු සහ මානව හිමිකම් පිළිබඳ කටයුතුවල නිරත වන පුද්ගලයන් වශයෙන් ද දේශපාලන නියෝජිතයන් වශයෙන් ද සිටියහ. මෙවැනි පසුබිමකින් යුතුව පර්යේෂණයට සහභාගීවන්නන්ගෙන් ලබාගත හැකි ප්‍රතිචාර ඔවුන්ගේ පොදු දේශපාලන ජීවිතය තුළ පවතින තත්ත්වයන් අනුව ඇතැම්විට ඒකාකෘතික ස්වභාවයෙන් යුක්ත විය හැකි බැවින් මෙම පර්යේෂණය සඳහා පොදු ජීවිතයට සහභාගී නොවී පවුල් ජීවිතයට පමණක් තමන්ව සීමාකරගත් කාන්තාවන්ගේ අදහස් ඇතුළත් කරගැනීම වැදගත් බවට හැඟී ගිය බැවින් පර්යේෂණ කණ්ඩායම තවත් ප්‍රජා සාමාජිකයන් කිහිපදෙනෙකු මෙම පර්යේෂණය සඳහා සහභාගී වන්නන් ලෙස සම්බන්ධ කර ගැනීමට කැමති විය. ඒ අනුව Chrysalis ආයතනයේ ප්‍රතිලාභී ලැයිස්තුවෙන් තෝරාගන්නා ලද පුද්ගලයින් 300 දෙනෙකු සහ වෙනත් ප්‍රජා සාමාජිකයන් 250 දෙනෙකු ඇතුළුව පර්යේෂණය සඳහා සහභාගීවන්නන් 550 දෙනෙකු තෝරාගන්නා ලදී. කෙසේ වෙතත්, නොවැළැක්විය හැකි හේතූන් කීපයක් මත[60] ඔවුන් අතරින් පුද්ගලයින් 532 කගෙන් පමණක් පර්යේෂණය වෙනුවෙන් තොරතුරු රැස්කර ගැනීමට අප හට හැකි විය.

**3.2 වන වගුව**

දිස්ත්‍රික් සහ ලිංගික පදනමින් පර්යේෂණයට සහභාගී වූවන්ගේ වර්ගීකරණය

| දිස්ත්‍රික්කය | කාන්තාවන් | පුරුෂයින් | සංක්‍රාන්ති ලිංගික පුරුෂයින් | සංක්‍රාන්ති ලිංගික කාන්තාවන් | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| යාපනය | 86 | 24 | - | 01 | 01 | 112 |
| කිලිනොච්චිය | 52 | 36 | - | - | 03 | 91 |
| මුලතිව් | 41 | 19 | - | - | 03 | 63 |
| වව්නියාව | 107 | 59 | - | - | 06 | 172 |
| මන්නාරම | 82 | 12 | - | - | - | 94 |
| **එකතුව** | | | | | | 532 |

**3.3 වන වගුව**

පර්යේෂණය සඳහා සහභාගීවූවන්ගෙ වයස් අනුව වර්ගීකරණය

| වයස | ස්ත්‍රී | % | පුරුෂ | % | වෙනත් | % |
|---|---|---|---|---|---|---|
| 18 වඩා අඩු | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 19-30 | 70 | 13.3 | 38 | 7.2 | 7 | 1.3 |
| 31-40 | 125 | 23.8 | 39 | 7.4 | 1 | 0.2 |
| 41-50 | 101 | 19.2 | 41 | 7.8 | 2 | 0.4 |
| 51-60 | 45 | 8.6 | 17 | 3.2 | 2 | 0.4 |
| 61 ට වැඩි | 23 | 4.4 | 14 | 2.7 | 1 | 0.2 |

**3.4 වන වගුව**

පර්යේෂණය සඳහා සහභාගීවූවන්ගෙ ආගම් අනුව වර්ගීකරණය

| ආගම | ස්ත්‍රී | % | පුරුෂ | % | වෙනත් | % |
|---|---|---|---|---|---|---|
| හින්දු | 194 | 36.5 | 84 | 15.8 | 9 | 1.7 |
| ක්‍රිස්තියානි | 56 | 10.5 | 11 | 2.1 | 3 | 0.6 |
| රෝමානු කතෝලික | 42 | 7.9 | 12 | 2.3 | 0 | 0 |
| ඉස්ලාම් | 26 | 4.9 | 13 | 2.5 | 1 | 0.2 |
| බෞද්ධ | 48 | 9.0 | 30 | 5.7 | 0 | 0 |
| වෙනත් | 2 | 0.4 | 0 | 0 | 1 | 0.2 |

60 සමහරෙක් නිරෝධායනය වූ අතර තවත් සමහරෙක් සම්බන්ධ කරගැනීමට නොහැකි විය

**3.5 වන වගුව**

අධ්‍යාපන පදනමින් පර්යේෂණය සඳහා සහභාගීවූවන්ගේ වර්ගීකරණය

| අධ්‍යාපන මට්ටම | ස්ත්‍රී | % | පුරුෂ | % | වෙනත් | % |
|---|---|---|---|---|---|---|
| ලිවීමට හා කියවීමට හැකි නමුත් විධිමත් අධ්‍යාපනයක් ලබා නැත | 6 | 1.1 | 4 | 0.8 | 0 | 0 |
| ලිවීමට හෝ කියවීමට නොහැක | 4 | 0.8 | 1 | 0.2 | 0 | 0 |
| 5 වන ශ්‍රේණිය දක්වා | 2 | 0.4 | 3 | 0.6 | 1 | 0.2 |
| 6 - 9 ශ්‍රේණි අතරේ | 30 | 5.6 | 9 | 1.7 | 1 | 0.2 |
| 9 අ.පො.ස සාමාන්‍ය පෙළ දක්වා | 173 | 32.5 | 46 | 8.6 | 8 | 1.5 |
| අ.පො.ස උසස් පෙළ දක්වා | 115 | 21.6 | 54 | 10.2 | 2 | 0.4 |
| අධ්‍යාපන විද්‍යාපීඨ | 6 | 1.12 | 3 | 0.6 | 0 | 0 |
| ඩිප්ලෝමා | 19 | 3.6 | 9 | 1.7 | 1 | 0.2 |
| උපාධිය | 11 | 2.1 | 20 | 3.8 | 1 | 0.2 |
| ශාස්ත්‍රපති | 0 | 0 | 1 | 0.2 | 0 | 0 |
| වෙනත් | 2 | 0.4 | 0 | 0 | 0 | 0 |

## 3.6 දත්ත එකතු කිරීම

ඉහත පෙන්වා දී ඇති පරිදි මෙම පර්යේෂණය වෙනුවෙන් දත්ත එකතු කිරීමේ කාර්යය සඳහා ප්‍රජා සාමාජිකයන් යොදවා තිබුණි. උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක පහේ පදිංචි පුද්ගලයින් 51 දෙනෙකු මෙම පර්යේෂණයෙහි දත්ත රැස්කරන්නන් වශයෙන් අප සමග එක්වූහ. පර්යේෂණයේදී ප්‍රජා සාමාජිකයන්ගේ සහභාගීත්වය සහතික කිරීමේ අරමුණින් සහ පර්යේෂණයට අදාළ විෂය කරුණ සමග බද්ධ වී පවතින සංස්කෘතික හා සාම්ප්‍රදායික අංග සැලකිල්ලට ගනිමින් කාර්යක්ෂම සහ සුමට දත්ත ඒකරාශීකරණය තහවුරු කිරීම සඳහා ප්‍රජා සාමාජිකයන් දත්ත රැස්කරන්නන් වශයෙන් යොදවන ලදී. ඔවුන්ගේ කාර්යභාරයෙහි වැදගත්කම සැලකිල්ලට ගෙන ඔවුන් මෙම පර්යේෂණයට අයත් "ප්‍රජා මට්ටමේ ක්ෂේත්‍ර පර්යේෂකයන්" යන තනතුරු නාමය යටතේ මෙම පර්යේෂණ කටයුත්තට අන්තර් ග්‍රහණය කර තිබුණි. ප්‍රජා මට්ටමේ ක්ෂේත්‍ර පර්යේෂකයන්ගේ නම් ලැයිස්තුව මෙහි ඇමුණුමෙහි දක්වා ඇත.[61]

මෙම සාමාජිකයින් 51දෙනා Chrysalis ප්‍රතිලාභී ලැයිස්තුවෙන් තෝරාගනු ලැබූ පුද්ගලයින් වේ. 500 දෙනෙකුගෙන් සමන්විත ප්‍රතිලාභී ලැයිස්තුවෙන් පුද්ගලයින් 51දෙනෙකු තෝරාගැනීම සඳහා පර්යේෂණ කණ්ඩායම තේරීම් මෙවලමක් සකස්කර තිබුණි. පදිංචි දිස්ත්‍රික්කය, ජන වර්ගය, ආගම, වයස සහ පොදු ජීවිතයට සම්බන්ධවීම යන සාධක ප්‍රජා මට්ටමේ ක්ෂේත්‍ර පර්යේෂකයන් තෝරාගැනීමේදී සලකා බලන ලදී.

**ප්‍රජා මට්ටමේ ක්ෂේත්‍ර පර්යේෂකයන් සඳහා වන වැඩමුළු**

මෙම පර්යේෂණයේ විෂය කරුණු හා බද්ධ වී පවතින සංවේදී බව සැලකිල්ලට ගනිමින් ප්‍රජා මට්ටමේ ක්ෂේත්‍ර පර්යේෂකවරුන් පර්යේෂණය සඳහා සහභාගීවන්නන් වෙත ප්‍රවේශ වී දත්ත එකතු කිරීමට හැකිවන පරිදි ඔවුන්ව සූදානම් කිරීමේ අවශ්‍යතාව හඳුනාගත් පර්යේෂණ කණ්ඩායම ඔවුන් වෙනුවෙන් දින දෙකක පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී.[62]

**3.6 වන වගුව**

දිස්ත්‍රික් සහ ලිංගිකත්ව පදනමින් දත්ත රැස්කරන්නන් වර්ගීකරණය කිරීම

| දිස්ත්‍රික්කය | ස්ත්‍රී | % | පුරුෂ | % |
|---|---|---|---|---|
| යාපනය | 10 | 19.6 | 1 | 1.9 |
| කිලිනොච්චිය | 7 | 13.7 | 3 | 5.9 |
| මුලතිව් | 4 | 7.8 | 2 | 3.9 |
| වව්නියාව | 8 | 15.7 | 7 | 13.7 |
| මන්නාරම | 6 | 11.8 | 3 | 5.9 |
| **එකතුව** | | | | 51 |

61 ඇමුණුම 4

62 2021 මාර්තු 16,17,18 සහ 19 යන දිනයන්හි යාපනය සර්වෝදය ශාලාවේදී මෙම පුහුණු වැඩමුළු පවත්වන ලදී.

ඡායාරූපය 3.4 සහ ඡායාරූපය 3.5

දත්ත රැස්කරන්නන් සඳහා වන දිශානිමුඛ වැඩසටහනේදී





වැඩමුළුවේ පරමාර්ථ


1. ප්‍රජා මට්ටමේ ක්ෂේත්‍ර පර්යේෂකයන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන හඳුනා ගැනීමට උපකාර කිරීම.
2. මූලික අයිතිවාසිකම් සහ නිදහස හඳුනාගැනීමට උපකාර කිරීම
3. ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳිවෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන පිළිබඳ ප්‍රජා මට්ටමේ ක්ෂේත්‍ර පර්යේෂකයන්ගේ ස්වයං මතයන් වෙනස් කිරීමට උපකාර කිරීම
4. ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳිවෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන කාන්තාවන්ගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස කෙරෙහි බලපාන ආකාරය පිළිබඳව අවබෝධ කරගැනීමට උපකාර කිරීම.
5. දත්ත එකතුකිරීම පිළිබඳ උපාය මාර්ග සහ ආචාර ධර්ම පිළිබඳව පුහුණුව ලබාදීම

වැඩමුළුවේ පරමාර්ථ කොතෙක් දුරට සාක්ෂාත් කරගෙන තිබේද යන්න පිළිබඳව දැනගැනීම සඳහා වැඩමුළුවට පෙර සහ පසු ඇගයීම් පත්‍රිකා පුරවන ලෙස පර්යේෂණයට සහභාගීවන්නන්ගෙන් ඉල්ලා සිටින ලදී. එකී ඇගයීම් පත්‍රිකා සසඳා බැලීමේදී වැඩමුළුවේ පරමාර්ථ අපේක්ෂිත අයුරින් සැලකිය යුතු ප්‍රමාණයකට සාක්ෂාත් කරගෙන ඇති බව අවබෝධ කරගත හැකි විය. කෙසේ නමුත් ඇතැම් සමාජ ප්‍රතිමාන සමාජයෙන් තුරන් කිරීම සඳහා දැඩි වෙහෙසක් දැරීමට අවශ්‍ය බව එම නිගමන මගින් පෙන්වා දෙන ලදී.

ඇගයීම් නිගමන

**ප්‍රස්තාරය 3.1**

සමාජ ප්‍රතිමාන පිළිබඳ සහභාගී වන්නන්ගේ අවබෝධය




A-1: සමාජ ප්‍රතිමාන අප සමාජයේ සංස්කෘතිය ආරක්ෂා කිරීමේ අරමුණින් අපගේ පූර්වජයන් විසින් ස්ථාපිත කොට ඇති සම්මතයන් වේ.

A-2: සැබෑ වශයෙන්ම අපගේ සංස්කෘතිය ආරක්ෂාකිරීම සඳහා සමාජ ප්‍රතිමාන සමාජයෙහි පවත්වගෙන යා යුතුය.

A-3: සමාජ ප්‍රතිමාන ලිංගිකත්වය පදනමින් පුද්ගලයින්ගේ කාර්යභාරයන් අර්ථ නිරූපණය කරයි.

A-4: සමාජ ප්‍රතිමාන සමාජයට වාසිදායක බලපෑම්වලින් පමණක් යුක්ත වේ.

A-5: සමාජ ප්‍රතිමාන සමාජයට ධනාත්මක සහ සෘණාත්මක බලපෑම්වලින් ද සමන්විත වේ.


A-6: සමාජ ප්‍රතිමාන විශේෂයෙන්ම කාන්තාවන් කෙරෙහි නිශේධාත්මක බලපෑම් එල්ල කරයි.

A-7: ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව තහවුරු කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන වෙනස් කළ යුතුය.

වැඩමුළුවට පෙර "සංස්කෘතිය ආරක්ෂා කිරීම සඳහා සමාජ ප්‍රතිමාන අඛණ්ඩව පවත්වාගෙන යා යුතු බවට" වන අදහස 61.7%ක පිරිසක් සතුව පැවති අතර වැඩමුළුවෙන් පසුව එම අදහස පැවතියේ 38.2%ක පිරිසක් සතුව පමණි. "සමාජ ප්‍රතිමාන විශේෂයෙන්ම කාන්තාවන් කෙරෙහි නිෂේධාත්මක බලපෑමක් එල්ල කරයි" යන අදහස වැඩමුළුවට පෙර 38.5%ක පිරිසක් සතුව පැවති අතර වැඩමුළුව අවසානයේදී 61.5%ක පිරිසක් එම අදහස හා එකඟ වී තිබුණි. විශේෂයෙන්ම "ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව තහවුරුකිරීම සඳහා සමාජ ප්‍රතිමාන වෙනස් කළ යුතුය" යන අදහස වැඩමුළුවට පෙර 41.5%ක පිරිසක් පමණක් පිළිගෙන තිබූ අතර වැඩමුළුවෙන් පසුව 58.5%ක පිරිසක් එම අදහස පිළිගෙන තිබුණි.

**ප්‍රස්තාරය 3.2**

ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව පිළිබඳ සහභාගීවන්නන්ගේ අවබෝධය




A-1: ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව යනු අපගේ සංස්කෘතියට පටහැනි සංකල්පයකි.

A-2: ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව යනු අපගේ ආගමට පටහැනි සංකල්පයකි.

A-3: ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව යනු කාන්තාවන් වැරදි ලෙස මෙහෙයවනු ලබන සංකල්පයකි.

A-4: ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව යනු පුරුෂයන් හා ස්ත්‍රීන්ට සියලුම අවස්ථාවන්හිදී සමානව සැලකීමයි.

A-5: ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව යනු කිසිදු පුද්ගලයෙකුට ලිංගිකත්වය පදනමින් වෙනස්කොට නොසැලකීමයි.

A-6: ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර තිබේ.

A-7: ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර නෙ ාමැත.

A-8: සමාජ ප්‍රගමනය සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව අත්‍යවශ්‍ය වේ.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව යනු සංස්කෘතිය සහ ආගමට පටහැනි සංකල්පයක් වන බවට වූ අදහස වැඩමුළුවට පෙර පැවති තත්ත්වයට වඩා වැඩමුළුවෙන් පසු වර්ධනය වී ඇති බව ඇගයීම් මගින් පෙන්නුම් කෙරේ. මෙය කෝණ දෙකකින් විශ්ලේෂණය කළ හැකිය. 'කාන්තාවන් තම ස්වාමි පුරුෂයන්ට අවනත විය යුතුය' සහ 'පුරුෂයන් සහ කාන්තාවන් එක හා සමානය වැනි ආකාරයෙන් සමාජ ප්‍රතිමාන සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව පිළිබඳ වැඩමුළුවේදී ඉදිරිපත් වූ ඇතැම් සංකල්පල සංස්කෘතික හා ආගමික මූලධර්මයන් සමඟ සංසන්දනය කරමින් සාධනීය ආකල්ප මත සහභාගීවන්නන් මෙවැනි නිගමනයකට එළැඹ තිබිය හැකිය. ඊට ප්‍රතිපක්ෂව වැඩමුළුවේදී සම සහභාගීවන්නන් අතරේ මතුව 'ඔසප් වීම දෙවියන් නැමදීමට සත්‍ය වශයෙන්ම බාධාවක් වන්නේද? 'ඉස්ලාම් ආගම කාන්තාවන්ට වෙනස් කොට සලකයි' වැනි ආගමික සංවේදීභාවයෙන් යුත් විවාදයන්හි ප්‍රතිඵලයක් වශයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව ආගමට හා සංස්කෘතියට තර්ජනයක් වශයෙන් නිරීක්ෂණය කරන මානසික තත්ත්වයක් මත සහභාගීවන්නන් එවන් නිගමනයකට පැමිණ තිබිය හැකිය.

කෙසේ නමුත්, සමාජ ප්‍රගමනය සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව අත්‍යවශ්‍ය වේ යන අදහස වැඩමුළුවට පෙර 21 දෙනෙකු විසින් ද වැඩමුළුවට පසුව 28 දෙනෙකු විසින් ද අනුමත කර තිබීම වෙනසක් සඳහා වූ හැකියාව තහවුරු කරයි.

ප්‍රජා මට්ටමේ ක්ෂේත්‍ර පර්යේෂකයන් සඳහා වන දෙදින වැඩමුළුවෙන් අනතුරුව ඔවුන් දත්ත රැස්කිරිමේ කාර්යය සඳහා යොමු කරන ලදී. වැඩමුළුවේදී, දත්ත රැස්කිරීමට ලක් කළයුතු පර්යේෂණයට සහභාගීවන්නන්ගේ නාමලේඛනයක්, සහභාගීවන්නන්ගේ කැමැත්ත ලබාගැනීම සඳහා වන එකඟතා ආකෘතිපත්‍ර, පර්යේෂණ සැලසුම, ආචාරධර්ම සංග්‍රහය යනාදී ලේඛන ඇතුළත් ලිපිගොනුවක් සියලුම ප්‍රජා මට්ටමේ ක්ෂේත්‍ර පර්යේෂකයන් වෙත වෙන් වෙන් වශයෙන් ලබා දෙන ලදී.

**කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා**

ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි අනන්‍යතාවන් වන ආබාධිතභාවය, වැන්දඹුභාවය, ස්වාමිපුරුෂයාගෙන් වෙන්ව ජීවත්වීම වැනි පහසුවෙන් අවදානමට ලක්විය හැකි අනන්‍යතාවන් සමග සම්බන්ධ වීමේදී කාන්තාවන්ට සුවිශේෂී හානිකර තත්ත්වයන්ට සහ වෙනස්කොට සැලකීම්වලට ලක්වීමේ අවස්ථාවන් නිර්මාණය වේ. ඒ අනුව, මෙවැනි පහසුවෙන් අවදානම් සහගත තත්ත්වයන්ට ලක්විය හැකි තත්ත්වයන් තුළ ජීවත්වන කාන්තාවන් කෙරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන කෙබඳු බලපෑමක් ඇති කරන්නේ ද යන්න අවබෝධ කරගැනීම සඳහා කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා ඔස්සේ තොරතුරු රැස්කරන ලදී.

**3.7 වන වගුව**

කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා පිළිබඳ විස්තර

| දිස්ත්‍රික්කය | කණ්ඩායම | සහභාගීවන්නන්ගේ සංඛ්‍යාව |
|---|---|---|
| යාපනය | කාන්තා ගෘහ මූලික පවුල් | 3 |
| | හිටපු කාන්තා සටන්කාමීන් | 3 |
| කිලිනොච්චිය | කාන්තා ගෘහ මූලික පවුල් | 3 |
| | හිටපු කාන්තා සටන්කාමීන් | 3 |
| | ආබාධිතභාවයෙන් යුත් කාන්තාවන් | 3 |
| මුලතිව් | කාන්තා ගෘහමූලික පවුල් | 3 |
| | හිටපු කාන්තා සටන්කාමීන් | 3 |
| | ආබාධිතභාවයෙන් යුත් කාන්තාවන් | 3 |
| වව්නියාව | කාන්තා ගෘහ මූලික පවුල් | 3 |
| | හිටපු කාන්තා සටන්කාමීන් | 3 |
| මන්නාරම | බාල වයස්කාර විවාහ මගින් පීඩාවට පත් කාන්තාවන් | 3 |
| | ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ලිංගික ප්‍රචණ්ඩත්වය හේතුවෙන් පීඩාවට පත් කාන්තාවන් | 1 |
| | කාන්තා ගෘහ මූලික පවුල් | 2 |
| | ආබාධිත භාවයෙන් යුත් කාන්තාවන් | 1 |

**සම්මුඛ සාකච්ඡා**

මෙම පර්යේෂණයේ අරමුණු සඳහා ආගමික නායකයින්, අධ්‍යාපනඥයින් සහ සමාජ ක්‍රියාධරයින් සම්මුඛ සාකච්ඡාවන්ට ලක්කරන ලදී. රටේ පවතින කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇතැම් සම්මුඛ සාකච්ඡා මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදුකරන ලදී.

**ඡායාරූපය 3.4 සහ ඡායාරූපය 3.5**

යාපනය, කිලිනොච්චිය සහ මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි පවත්වන ලද කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා සහ සම්මුඛ සාකච්ඡා අවස්ථාවන්







## 3.7 දත්ත විශ්ලේෂණය

එකතු කරන ලද දත්ත හය දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක්[63] විසින් පර්යේෂණ කණ්ඩායමේ අධීක්ෂණය යටතේ වාර්තාගත කරන ලදී. වාර්තා කරගන්නා ලද දත්ත 'Statistical Package for the Social Sciences (SPSS)' මගින් අර්ථ නිරූපණය කරගන්නා ලදී. ඉන් අනතුරුවල මෙම දත්ත පර්යේෂණ කණ්ඩායම විසින් පර්යේෂණයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා විශ්ලේෂණය කරන ලදී. දිස්ත්‍රික්කය, වයස, අධ්‍යාපන මට්ටම සහ ආගම වැනි සාධකවල පදනමින් දත්ත වෙන් වෙන් වශයෙන් ලේඛනගත කොට වගු සහ ප්‍රස්තාරගත කරන ලදී.


## 3.8 දත්ත පිරික්සීම


වාර්තා ගත කරන ලද දත්ත ඉතා සරල ස්වරූපයෙන් ප්‍රජා මට්ටමේ ක්ෂේත්‍ර පර්යේෂකයන් වෙත ලබාදී ඔවුන් සමග පවත්වන ලද සාකච්ඡාවන් හිදී ඒ පිළිබඳව ඔවුන්ගේ අදහස්, මත සහ විවේචන විමසන ලදී.[64] එලෙස විමසීම මගින් ප්‍රජා මට්ටමේ ක්ෂේත්‍ර පර්යේෂකයන්ගේ අදහස් ඔස්සේ එකතු කරන ලද දත්ත තවදුරටත් තහවුරු කරගන්නා ලද අතර ඇතැම් අවස්ථාවලදී තොරතුරුවලට පසුබිම් වී ඇති කරුණු ද හෙළිදරව් කරගන්නා ලදී.

පර්යේෂණයේ නිගමන දත්ත රැස් කරන්නන්ගෙන් බහුතරයක් විසින් පිළිගන්නා ලදී. හඳුනාගන්නා ලද ඇතැම් සමාජ ප්‍රතිමාන තම සමාජයන්හි දක්නට නොලැබෙන බව ඇතමුන් ප්‍රකාශ කරන ලදී. කෙසේ නමුත්, බහුතර පුද්ගලයින්ගේ අදහස් සැලකිල්ලට ගෙන එකී පදනම මත පර්යේෂණයේ නිගමන තහවුරු කරන ලදී.

**ඡායාරූපය 3.9 සහ ඡායාරූපය 3.10**

දත්ත පිරික්සීමේ මාර්ගගත සාකච්ඡා රැස්වීම්





63 ඇමුණුම 5

64 සාකච්ඡා රැස්වීම් 2021 අගෝස්තු මස 4 සහ 5 යන දිනයන්හි පවත්වන ලදී.

## 3.9 අවසන් පර්යේෂණ වාර්තාව ලිවීම

ප්‍රාථමික මූලාශ්‍ර සහ ද්විතීයික මූලාශ්‍ර ඔස්සේ එකතු කරන ලද දත්ත පදනම් කරගනිමින් අවසන් පර්යේෂණ වාර්තාව ලියන ලදී. මෙම පර්යේෂණයේ අරමුණ සඳහා පවත්වන ලද මාර්ගගත සාකච්ඡා, කේන්ද්‍රිය කණ්ඩායම් සාකච්ඡා, සම්මුඛ සාකච්ඡා වැනි ක්‍රමවේද ඔස්සේ එකතු කරන ලද දත්ත ද මෙම පර්යේෂණය සඳහා යොදා ගන්නා ලදී. පවත්වන ලද සාකච්ඡා සහ සම්මුඛ සාකච්ඡාවල ලැයිස්තුව මෙයට අමුණා ඇත.[65] පර්යේෂණය සඳහා සහභාගීවූවන්ගෙන් බහුතරය දමිළ භාෂාව කතාකරන්නන් වූ බැවින් සහ පර්යේෂණයට ලක් කෙරුණු ප්‍රදේශයේ ජීවත්වන බහුතරය දමිළ භාෂාව කතාකරන්නන් වූ බැවින් අවසන් පර්යේෂණ වාර්තාව දමිළ භාෂාවෙන් ලියාල එය සිංහල සහ ඉංග්‍රීසි භාෂාවන්ට පරිවර්තනය කරන ලදී.

65 ඇමුණුම 6

# 4 වන පරිච්ඡේදය

## 4 පර්යේෂණ නිගමන   කොටස 1

### 4.1 හැඳින්වීම

මෙම පර්යේෂණයේ නිගමන ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ ජීවත් වන සහ මෙම පර්යේෂණයට සහභාගී වූ පුද්ගලයින් 532කට ආසන්න පිරිසක් විසින් ලබාදෙන ලද දත්ත මත පදනම් වී තිබේ. එසේම, පර්යේෂණ කණ්ඩායම විසින් අධ්‍යාපනඥයින් සහ ආගමික නායකයන් වැනි ප්‍රධාන පෙළේ පුද්ගලයන් සමග පවත්වන ලද සම්මුඛ සාකච්ඡා හා පහසුවෙන් පීඩාවට පත්විය හැකි කාන්තා කණ්ඩායම් සමග  පවත්වන ලද කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා ඔස්සේ ලබා ගන්නා ලද දත්ත ද මෙම පර්යේෂණයේ නිගමන වලට එළැඹීම සඳහා උපකාරී විය.

එසේම, පර්යේෂණයට සහභාගී වූ පුද්ගලයන් විසින් ලබා දෙන ලද දත්ත පදනම් කරගනිමින් උතුරු පළාතේ ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳී වෙනස්කොට සැලකීමේ ප්‍රධාන සමාජ ප්‍රතිමාන හඳුනාගැනීමටත් ඒවා ඇගයීමටත් SNAP ව්‍යුහය යොදා ගන්නා ලදී. එකී ව්‍යුහය සම්බන්ධයෙන් මීට පෙර පරිච්ඡේදයේදී පැහැදිලි කර තිබේ.

### 4.2 උතුරු පළාතේ ප්‍රධාන වශයෙන් ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳී වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන

පර්යේෂණය වෙනුවෙන් පිළියෙල කරන ලද ප්‍රශ්ණාවලියෙ හි ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳී වෙනස්කොට සැලකීමෙ සමාජ ප්‍රතිමාන 49ක් ඇතුළත් කර තිබුණි. මෙම පර්යේෂණයේ ප්‍රධාන පරමාර්ථ වලින් එකක් වූයේ, ඉහත සඳහන් කළ සමාජ ප්‍රතිමාන අතුරින් මේ වන විට සමාජයේ ඉතා ගැඹුරින් ස්ථාපිතව පවතින සමාජ ප්‍රතිමාන මොනවාද යන්න හඳුනාගැනීමත්, ඒවා කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා නිදහස සාක්ෂාත් කර ගැනීමේදී කෙබඳු බලපෑමක් ඇති කරන්නේ ද යන්න හඳුනාගැනීමත් වේ. ඒ අනුව, මෙම සමාජ ප්‍රතිමාන පිළිබඳ තොරතුරු දිස්ත්‍රික් පදනමින් එකතු කරන ලදී. උතුරු පළාතේ පවතින දිස්ත්‍රික්ක පහෙහි බොහෝ දුරට ඒකාකාර සමාජ ප්‍රතිමාන ස්ථාපිතව පැවතියද යම් යම් වෙනස්කම් ද ඒවායෙහි පවතින බව පර්යේෂණ නිගමන පිළිබිඹු කරයි. එබැවින්, එක් එක් දිස්ත්‍රික්කයෙහි ස්ථාපිතව පවතින සමාජ ප්‍රතිමාන ඒවා ස්ථාපිතව පවතින ප්‍රමාණය අනුව ශ්‍රේණිගත කොට පළමු සමාජ ප්‍රතිමාන දහය වගුවක ආකාරයෙන් ලබා දී ඇත.

## 4.2.1 දිස්ත්‍රික් පදනමින්

### යාපනය දිස්ත්‍රික්කය

**4.1 වන වගුව**

| අංකය | සමාජ ප්‍රතිමාන | පවතී: ඉතා සුලබව පවතී | පවතී: යම්තාක්දුරකට පවතී | පවතී (%) | නොපවතී: අඩුම වශයෙන් පවතී | නොපවතී: නොපවතී | නොපවතී (%) | නොදනී |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ඉවුම් පිහුම් සහ ගේදොර කටයුතු කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරයන් වේ | 61 | 28 | 79.46% | 10 | 8 | 16.07% | 0 |
| | | 89 | | | 18 | | | |
| 2 | ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ කටයුතු සඳහා පුරුෂයන් පමණක් යෙදවිය යුතුය | 48 | 36 | 75.00% | 14 | 8 | 19.64% | 1 |
| | | 84 | | | 22 | | | |
| 3 | දරුවන් රැකබලා ගැනීම කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරය වේ | 54 | 29 | 74.11% | 15 | 8 | 20.54% | 1 |
| | | 83 | | | 23 | | | |
| 4 | පවුලේ සාමාජිකයන් ලිංගික හිංසනයට එරෙහිව කාන්තාවන් පැමිණිලි කිරීමෙන් වළක්වයි | 37 | 46 | 74.11% | 10 | 13 | 20.54% | 1 |
| | | 83 | | | 23 | | | |
| 5 | භාර්යාවන් සෑම විටම තම වෛවාහක/පවුල් ජීවිතය රැකගත යුතුය | 40 | 40 | 71.43% | 21 | 7 | 25.00% | 0 |
| | | 80 | | | 28 | | | |
| 6 | කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීමට පැකිළෙති | 36 | 40 | 67.86% | 25 | 6 | 27.68% | 2 |
| | | 76 | | | 31 | | | |
| 7 | කාන්තාවන්/ ගැහැනු දරුවන් පොදු ස්ථාන වලදී වැඩියෙන් කතා නොකළ යුතුය | 21 | 52 | 65.18% | 30 | 8 | 33.93% | 0 |
| | | 73 | | | 38 | | | |
| 8 | කාන්තාවන් රාත්‍රී රාජකාරී සිදු නොකළ යුතුය | 30 | 42 | 64.29% | 24 | 11 | 31.25% | 0 |
| | | 72 | | | 35 | | | |
| 9 | කාන්තා ගෘහ මූලික පවුල් හැර සෙසු පවුල්වල ප්‍රධාන ආදායම් උපයන්නන් පුරුෂයන් විය යුතුය | 30 | 42 | 64.29% | 17 | 14 | 27.68% | 1 |
| | | 72 | | | 31 | | | |
| 10 | තම සැමියාට එරෙහිව පොලිස් ස්ථානවල පැමිණිලි කරන කාන්තාවන් විවේචනයට ලක් වේ | 30 | 41 | 63.39% | 31 | 3 | 30.36% | 3 |
| | | 71 | | | 34 | | | |

## වව්නියාව දිස්ත්‍රික්කය

**4.2 වන වගුව**

<table>
<tr><th rowspan="2">අංකය</th><th rowspan="2">සමාජ ප්‍රතිමාන</th><th colspan="2">පවතී</th><th rowspan="2">පවතී (%)</th><th colspan="2">නොපවතී</th><th rowspan="2">නොපවතී (%)</th><th rowspan="2">නොදනී</th></tr>
<tr><th>ඉතා සුලබව පවතී</th><th>යම්තාක්දුරකට පවතී</th><th>අඩුම වශයෙන් පවතී</th><th>නොපවතී</th></tr>
<tr><td rowspan="2">1</td><td rowspan="2">භාර්යාවන් සෑම විටම තම වෛවාහක/පවුල් ජීවිතය රැකගත යුතුය</td><td>94</td><td>52</td><td rowspan="2">82.95%</td><td>18</td><td>9</td><td rowspan="2">15.34%</td><td rowspan="2">2</td></tr>
<tr><td colspan="2">146</td><td colspan="2">27</td></tr>
<tr><td rowspan="2">2</td><td rowspan="2">දරුවන් රැකබලා ගැනීම කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරය වේ</td><td>102</td><td>40</td><td rowspan="2">80.68%</td><td>10</td><td>13</td><td rowspan="2">13.07%</td><td rowspan="2">3</td></tr>
<tr><td colspan="2">142</td><td colspan="2">23</td></tr>
<tr><td rowspan="2">3</td><td rowspan="2">කාන්තාවන්/ ගැහැනු දරුවන් පොදු ස්ථාන වලදී වැඩියෙන් කතා නොකළ යුතුය</td><td>56</td><td>77</td><td rowspan="2">75.57%</td><td>31</td><td>7</td><td rowspan="2">21.59%</td><td rowspan="2">0</td></tr>
<tr><td colspan="2">133</td><td colspan="2">38</td></tr>
<tr><td rowspan="2">4</td><td rowspan="2">ඉවුම් පිහුම් සහ ගේදොර කටයුතු කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරයන් වේ</td><td>84</td><td>44</td><td rowspan="2">72.73%</td><td>20</td><td>18</td><td rowspan="2">21.59%</td><td rowspan="2">3</td></tr>
<tr><td colspan="2">128</td><td colspan="2">38</td></tr>
<tr><td rowspan="2">5</td><td rowspan="2">ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ කටයුතු සඳහා පුරුෂයන් පමණක් යෙදවිය යුතුය</td><td>73</td><td>52</td><td rowspan="2">71.02%</td><td>26</td><td>12</td><td rowspan="2">21.59%</td><td rowspan="2">3</td></tr>
<tr><td colspan="2">125</td><td colspan="2">38</td></tr>
<tr><td rowspan="2">6</td><td rowspan="2">ලිංගික ප්‍රචණ්ඩත්වය/ දූෂණයට ලක්වූ කාන්තාවන් පතිවත අහිමි වූවන් ලෙස සැලකේ</td><td>87</td><td>33</td><td rowspan="2">68.18%</td><td>18</td><td>15</td><td rowspan="2">18.75%</td><td rowspan="2">6</td></tr>
<tr><td colspan="2">120</td><td colspan="2">33</td></tr>
<tr><td rowspan="2">7</td><td rowspan="2">කාන්තාවන්/ ගැහැණු දරුවන් පුරුෂයන් කරන කටයුත්තම සිදු කළ ද සම වැටුප් ලැබීමට හිමිකම් නොලබයි</td><td>66</td><td>50</td><td rowspan="2">65.91%</td><td>13</td><td>29</td><td rowspan="2">23.86%</td><td rowspan="2">3</td></tr>
<tr><td colspan="2">116</td><td colspan="2">42</td></tr>
<tr><td rowspan="2">8</td><td rowspan="2">කාන්තාවන් රාත්‍රී කාලයේදී තනිවම ගමන් නොකළ යුතුය</td><td>70</td><td>44</td><td rowspan="2">64.77%</td><td>30</td><td>15</td><td rowspan="2">25.57%</td><td rowspan="2">4</td></tr>
<tr><td colspan="2">114</td><td colspan="2">45</td></tr>
<tr><td rowspan="2">9</td><td rowspan="2">කාන්තා ගෘහ මූලික පවුල් හැර සෙසු පවුල් වල ප්‍රධාන ආදායම් උපයන්නන් පුරුෂයන් විය යුතුය</td><td>64</td><td>49</td><td rowspan="2">64.20%</td><td>22</td><td>22</td><td rowspan="2">25.00%</td><td rowspan="2">1</td></tr>
<tr><td colspan="2">113</td><td colspan="2">44</td></tr>
<tr><td rowspan="2">10</td><td rowspan="2">කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීමට පැකිළෙති</td><td>55</td><td>58</td><td rowspan="2">64.20%</td><td>37</td><td>10</td><td rowspan="2">26.70%</td><td rowspan="2">3</td></tr>
<tr><td colspan="2">113</td><td colspan="2">47</td></tr>
</table>

## කිලිනොච්චිය දිස්ත්‍රික්කය

**4.3 වන වගුව**

<table>
<tr><th rowspan="2">අංකය</th><th rowspan="2">සමාජ ප්‍රතිමාන</th><th colspan="2">පවතී</th><th rowspan="2">පවතී (%)</th><th colspan="2">නොපවතී</th><th rowspan="2">නොපවතී (%)</th><th rowspan="2">නොදනී</th></tr>
<tr><th>ඉතා සුලබව පවතී</th><th>යම්තාක්දුරකට පවතී</th><th>අවම වශයෙන් පවතී</th><th>නොපවතී</th></tr>
<tr><td rowspan="2">1</td><td rowspan="2">ඉවුම් පිහුම් සහ ගේදොර කටයුතු කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරයන් වේ</td><td>51</td><td>27</td><td rowspan="2">85.71%</td><td>10</td><td>3</td><td rowspan="2">14.29%</td><td rowspan="2">0</td></tr>
<tr><td colspan="2">78</td><td colspan="2">13</td></tr>
<tr><td rowspan="2">2</td><td rowspan="2">දරුවන් රැකබලා ගැනීම කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරය වේ</td><td>48</td><td>30</td><td rowspan="2">85.71%</td><td>9</td><td>0</td><td rowspan="2">9.89%</td><td rowspan="2">0</td></tr>
<tr><td colspan="2">78</td><td colspan="2">9</td></tr>
<tr><td rowspan="2">3</td><td rowspan="2">ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ කටයුතු සඳහා පුරුෂයන් පමණක් යෙදවිය යුතුය</td><td>53</td><td>22</td><td rowspan="2">82.42%</td><td>10</td><td>2</td><td rowspan="2">13.19%</td><td rowspan="2">0</td></tr>
<tr><td colspan="2">75</td><td colspan="2">12</td></tr>
<tr><td rowspan="2">4</td><td rowspan="2">භාර්යාවන් සෑම විටම තම වෛවාහක/පවුල් ජීවිතය රැකගත යුතුය</td><td>48</td><td>21</td><td rowspan="2">75.82%</td><td>19</td><td>0</td><td rowspan="2">20.88%</td><td rowspan="2">2</td></tr>
<tr><td colspan="2">69</td><td colspan="2">19</td></tr>
<tr><td rowspan="2">5</td><td rowspan="2">පොලිස් ස්ථානයන්ට යන කාන්තාවන් විවේචනයට ලක් වේ</td><td>39</td><td>28</td><td rowspan="2">73.63%</td><td>12</td><td>9</td><td rowspan="2">23.08%</td><td rowspan="2">0</td></tr>
<tr><td colspan="2">67</td><td colspan="2">21</td></tr>
<tr><td rowspan="2">6</td><td rowspan="2">ස්වාමිපුරුෂයාට එරෙහිව පැමිණිලි කරන කාන්තාවන් විවේචනයට ලක් වේ</td><td>34</td><td>33</td><td rowspan="2">73.63%</td><td>19</td><td>3</td><td rowspan="2">24.18%</td><td rowspan="2">0</td></tr>
<tr><td colspan="2">67</td><td colspan="2">22</td></tr>
<tr><td rowspan="2">7</td><td rowspan="2">ලිංගික ප්‍රචණ්ඩත්වය/ දූෂණයට ලක්වූ කාන්තාවන් පතිවත අහිමි වූවන් ලෙස සැලකේ</td><td>42</td><td>22</td><td rowspan="2">70.33%</td><td>11</td><td>12</td><td rowspan="2">25.27%</td><td rowspan="2">0</td></tr>
<tr><td colspan="2">64</td><td colspan="2">23</td></tr>
<tr><td rowspan="2">8</td><td rowspan="2">කාන්තාවන් රාත්‍රී කාලයේදී තනිවම ගමන් නොකළ යුතුය</td><td>34</td><td>30</td><td rowspan="2">70.33%</td><td>17</td><td>6</td><td rowspan="2">25.27%</td><td rowspan="2">0</td></tr>
<tr><td colspan="2">64</td><td colspan="2">23</td></tr>
<tr><td rowspan="2">9</td><td rowspan="2">කාන්තාවන්/ ගැහැනු දරුවන් පොදු ස්ථාන වලදී වැඩියෙන් කතා නොකළ යුතුය</td><td>21</td><td>43</td><td rowspan="2">70.33%</td><td>20</td><td>5</td><td rowspan="2">27.47%</td><td rowspan="2">1</td></tr>
<tr><td colspan="2">64</td><td colspan="2">25</td></tr>
<tr><td rowspan="2">10</td><td rowspan="2">කාන්තාවන්/ ගැහැණු දරුවන් පුරුෂයන් කරන කටයුත්තම සිදු කළ ද සම වැටුප් ලැබීමට හිමිකම් නොලබයි</td><td>37</td><td>26</td><td rowspan="2">69.23%</td><td>15</td><td>12</td><td rowspan="2">29.67%</td><td rowspan="2">0</td></tr>
<tr><td colspan="2">63</td><td colspan="2">27</td></tr>
</table>

## මුලතිව් දිස්ත්‍රික්කය

**4.4 වන වගුව**

| අංකය | සමාජ ප්‍රතිමාන | පවතී | | | පවතී (%) | නොපවතී | | | නොපවතී (%) | නොදනී |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඉතා සුලබව පවතී | යම්තාක්දුරකට පවතී | | | අවම වශයෙන් පවතී | නොපවතී | | | |
| 1 | දරුවන් රැකබලා ගැනීම කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරය වේ | 30 | 21 | 51 | 80.95% | 7 | 4 | 11 | 17.46% | 0 |
| 2 | ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ කටයුතු සඳහා පුරුෂයන් පමණක් යෙදවිය යුතුය | 39 | 11 | 50 | 79.37% | 6 | 3 | 9 | 14.29% | 1 |
| 3 | ඉවුම් පිහුම් සහ ගේදොර කටයුතු කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරයන් වේ | 38 | 12 | 50 | 79.37% | 7 | 4 | 11 | 17.46% | 0 |
| 4 | භාර්යාවන් සෑම විටම තම වෛවාහක/පවුල් ජීවිතය රැකගත යුතුය | 31 | 18 | 49 | 77.78% | 11 | 2 | 13 | 20.63% | 0 |
| 5 | ලිංගික ප්‍රචණ්ඩත්වය/ දූෂණයට ලක්වූ කාන්තාවන් පතිවත අහිමි වූවන් ලෙස සැලකේ | 36 | 12 | 48 | 76.19% | 5 | 6 | 11 | 17.46% | 2 |
| 6 | පොලිස් ස්ථානයන්ට යන කාන්තාවන් විවේචනයට ලක් වේ | 28 | 20 | 48 | 76.19% | 8 | 3 | 11 | 17.46% | 1 |
| 7 | කාන්තාවන්/ ගැහැනු දරුවන් පොදු ස්ථාන වලදී වැඩියෙන් කතා නොකළ යුතුය | 16 | 31 | 47 | 74.60% | 13 | 2 | 15 | 23.81% | 0 |
| 8 | වැන්දඹු කාන්තාවන් අසුභ ලකුණක් සේ සැලකේ. | 31 | 15 | 46 | 73.02% | 7 | 6 | 13 | 20.63% | 1 |
| 9 | කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් විසින් වළකාලනු ලැබේ | 29 | 17 | 46 | 73.02% | 6 | 8 | 14 | 22.22% | 0 |
| 10 | කාන්තාවන්/ ගැහැනු දරුවන් ඔසප් කාලවලදී දේවාලයට නොයති | 43 | 2 | 45 | 71.43% | 1 | 4 | 5 | 7.94% | 2 |

## මන්නාරම දිස්ත්‍රික්කය

**4.5 වන වගුව**

| අංකය | සමාජ ප්‍රතිමාන | පවතී | | | පවතී (%) | නොපවතී | | | නොපවතී (%) | නොදනී |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඉතා සුලබව පවතී | යම්තාක්දුරකට පවතී | | | අවම වශයෙන් පවතී | නොපවතී | | | |
| 1 | දරුවන් රැකබලා ගැනීම කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරය වේ | 47 | 30 | 77 | 81.91% | 9 | 3 | 12 | 12.77% | 0 |
| 2 | ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ කටයුතු සඳහා පුරුෂයන් පමණක් යෙදවිය යුතුය | 52 | 23 | 75 | 79.79% | 8 | 7 | 15 | 15.96% | 2 |
| 3 | ස්වාමිපුරුෂයාට එරෙහිව පැමිණිලි කරන කාන්තාවන් විවේචනයට ලක් වේ | 41 | 31 | 72 | 76.60% | 14 | 5 | 19 | 20.21% | 0 |
| 4 | භාර්යාවන් සෑම විටම තම වෛවාහක/පවුල් ජීවිතය රැකගත යුතුය | 47 | 24 | 71 | 75.53% | 8 | 8 | 16 | 17.02% | 1 |
| 5 | කාන්තාවන්/ ගැහැනු දරුවන් පොදු ස්ථාන වලදී වැඩියෙන් කතා නොකළ යුතුය | 33 | 36 | 69 | 73.40% | 14 | 11 | 25 | 26.60% | 0 |
| 6 | ඉවුම් පිහුම් සහ ගේදොර කටයුතු කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරයන් වේ | 48 | 20 | 68 | 72.34% | 14 | 7 | 21 | 22.34% | 0 |
| 7 | කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් විසින් වළකාලනු ලැබේ | 46 | 21 | 67 | 71.28% | 12 | 9 | 21 | 22.34% | 2 |
| 8 | කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීමට පැකිළෙති. | 43 | 24 | 67 | 71.28% | 8 | 14 | 22 | 23.40% | 2 |
| 9 | කාන්තාවන් රාත්‍රී කාලයේදී තනිවම ගමන් නොකළ යුතුය | 47 | 18 | 65 | 69.15% | 19 | 5 | 24 | 25.53% | 1 |
| 10 | පොලිස් ස්ථානයන්ට යන කාන්තාවන් විවේචනයට ලක් වේ | 36 | 28 | 64 | 68.09% | 22 | 4 | 26 | 27.66% | 1 |

## 4.2.2 උතුරු පළාත පුරා ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳී වෙනස්කොට සැලකීමේ ප්‍රධාන සමාජ ප්‍රතිමාන

දිස්ත්‍රික්ක පදනමෙන් ලබා ගන්නා ලද දත්ත පදනම් කරගනිමින් උතුරු පළාත පුරා ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳී වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන 20ක් ඒවා ස්ථාපිතව පවතින ප්‍රමාණය අනුව පහත සඳහන් පරිදි ශ්‍රේණිගත කොට තිබේ. එකී සමාජ ප්‍රතිමාන අතුරින් පළමු ස්ථාන පහ අත්පත් කරගෙන ඇති සමාජ ප්‍රතිමාන "ඉතා වැදගත් සමාජ ප්‍රතිමාන" වශයෙන් හඳුනාගෙන තිබේ. කෙසේ නමුත් මෙම පර්යේෂණයේදී පළමු ස්ථාන දහය අත්පත් කරගෙන ඇති සමාජ ප්‍රතිමාන සම්බන්ධයෙන් විශ්ලේෂණය කෙරෙනු ඇත.

**4.6 වන වගුව**

| අංකය | සමාජ ප්‍රතිමාන | පවතී | | | පවතී (%) | නොපවතී | | | නොපවතී (%) | නොදනී |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඉතා සුලබව පවතී | යම්තාක්දුරකට පවතී | | | අඩුම වශයෙන් පවතී | නොපවතී | | | |
| 1 | දරුවන් රැකබලා ගැනීම කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරය වේ | 281 | 150 | 431 | 81.02% | 50 | 28 | 78 | 14.66% | 4 |
| 2 | භාර්යාවන් සෑම විටම තම වෛවාහක/පවුල් ජීවිතය රැකගත යුතුය | 260 | 155 | 415 | 78.01% | 77 | 26 | 103 | 19.36% | 5 |
| 3 | ඉවුම් පිහුම් සහ ගේදොර කටයුතු කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරයන් වේ | 282 | 131 | 413 | 77.63% | 61 | 40 | 101 | 18.98% | 3 |
| 4 | ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ කටයුතු සඳහා පුරුෂයන් පමණක් යෙදවිය යුතුය | 265 | 144 | 409 | 76.88% | 64 | 32 | 96 | 18.05% | 7 |
| 5 | කාන්තාවන්/ ගැහැනු දරුවන් පොදු ස්ථාන වලදී වැඩියෙන් කතා නොකළ යුතුය | 147 | 239 | 386 | 72.56% | 108 | 33 | 141 | 26.50% | 1 |
| 6 | ලිංගික ප්‍රචණ්ඩත්වය/ දූෂණයට ලක්වූ කාන්තාවන් පතිවත අහිමි වූවන් ලෙස සැලකේ | 255 | 109 | 364 | 68.42% | 70 | 57 | 127 | 23.87% | 15 |
| 7 | කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීමට පැකිළෙති. | 205 | 157 | 364 | 68.05% | 96 | 41 | 137 | 25.75% | 9 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 8 | කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් විසින් වළකාලනු ලැබේ | 197 | 164 | 361 | 67.86% | 85 | 54 | 139 | 26.13% | 10 |
| 9 | පොලිස් ස්ථානයන්ට යන කාන්තාවන් විවේචනයට ලක් වේ | 196 | 159 | 355 | 66.73% | 101 | 41 | 142 | 26.69% | 9 |
| 10 | ස්වාමිපුරුෂයාට එරෙහිව පැමිණිලි කරන කාන්තාවන් විවේචනයට ලක් වේ | 195 | 159 | 354 | 66.54% | 111 | 39 | 150 | 28.20% | 8 |
| 11 | කාන්තාවන් රාත්‍රී කාලයේදී තනිවම ගමන් නොකළ යුතුය | 203 | 144 | 347 | 65.23% | 109 | 44 | 153 | 28.76% | 7 |
| 12 | කාන්තාවන්/ ගැහැනු දරුවන් පොදු ස්ථාන වලදී කොක් හඬලා සිනා නොසිය යුතුය | 154 | 191 | 345 | 64.85% | 117 | 54 | 171 | 32.14% | 5 |
| 13 | කාන්තාවන්/ ගැහැනු දරුවන් රැකියාවේදී රාත්‍රී කාල රාජකාරි භාර නොගත යුතුය | 169 | 169 | 338 | 63.53% | 119 | 52 | 171 | 32.14% | 6 |
| 14 | කාන්තා ගෘහ මූලික පවුල් හැර සෙසු පවුල් වල ප්‍රධාන ආදායම් උපයන්නන් පුරුෂයන් විය යුතුය | 183 | 151 | 334 | 62.78% | 86 | 72 | 158 | 29.70% | 6 |
| 15 | කාන්තාවන්/ ගැහැනු දරුවන් බාහිර ස්ථා නවල රෑදී සිට වැඩ නොකළ යුතුය | 143 | 186 | 329 | 61.84% | 125 | 52 | 177 | 33.27% | 8 |
| 16 | කාන්තාවන්/ ගැහැණු දරුවන් පුරුෂයන් කරන කටයුත්තම සිදු කළ ද සම වැටුප් ලැබීමට හිමිකම් නොලබයි | 194 | 133 | 327 | 61.47% | 95 | 80 | 175 | 32.89% | 7 |
| 17 | භාර්යාවන් තම ස්වාමි පුරුෂයන් සමග (එකටෙක කතා නොකළ යුතුය) වාද නොකළ යුතුය | 126 | 196 | 322 | 60.53% | 133 | 39 | 172 | 32.33% | 0 |
| 18 | දරුවන් නොමැති කාන්තාවන් අසුබ ලකුණක් සේ සැලකෙති | 186 | 127 | 313 | 58.83% | 91 | 82 | 173 | 32.52% | 15 |
| 19 | ස්වාමි පුරුෂයන්ගෙන් ගුටි කෑවද භාර්යාවන් ඒ සම්බන්ධව පැමිණිලි නොකළ යුතුය | 144 | 161 | 305 | 57.33% | 148 | 56 | 204 | 38.35% | 3 |
| 20 | වැන්දඹු කාන්තාවන් අසුභ ලකුණක් සේ සැලකේ. | 190 | 113 | 303 | 56.95% | 102 | 79 | 181 | 34.02% | 13 |

## ප්‍රධාන නිගමන

- දරුවන් රැක බලාගැනීම කාන්තාවන්ගේ/ගැහැණු දරුවන්ගේ ප්‍රධාන කාර්ය භාරයක් වේ, භාර්යාවන් සෑම විටම තම වෛවාහක/පවුල් ජීවිතය රැකගත යුතුය, ඉවුම් පිහුම් සහ ගේ දොර කටයුතු කාන්තාවන්ගේ/ ගැහැණු දරුවන්ගේ ප්‍රධාන කාර්යභාරයන් වේ සහ ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ කටයුතු සඳහා පුරුෂයන් යෙදවිය යුතුය යන සමාජ ප්‍රතිමාන හතර දිස්ත්‍රික්ක පහේම ඉතා ගැඹුරෙන් ස්ථාපිත වී ඇත. එක් එක් දිස්ත්‍රික්කයට අදාළව පර්යේෂණයට සහභාගීවූවන්ගෙන් 70%කට අධික පිරිසක් මෙම සමාජ ප්‍රතිමාන තම සමාජයන්හි ගැඹුරින් ස්ථාපිත වී ඇති බව ප්‍රකාශ කළහ.

- කාන්තාවන්/ ගැහැනු දරුවන් පොදු ස්ථානවලදී වැඩියෙන් කතා නොකළ යුතුය යන සමාජ ප්‍රතිමානයද උතුරු පළාතේ ස්ථාපිතව පවතින බව පර්යේෂණයට සහභාගී වූවන් ලබා දෙන ලද දත්ත මගින් තහවුරු විය. මෙම සමාජ ප්‍රතිමානය ස්ථාපිතව පවතින බව දිස්ත්‍රික්ක පහෙන්ම පර්යේෂණයට සහභාගිවූ 72.56% පිරිසක් ද, මෙම සමාජ ප්‍රතිමානය ස්ථාපිත වී නොමැති බව 26.5% පිරිසක්ද ප්‍රකාශ කර තිබේ. යාපනය දිස්ත්‍රික්කය හැර සෙසු සෑම දිස්ත්‍රික්කයකටම අයත් 70%කට අධික පිරිසක් සහ යාපනය දිස්ත්‍රික්කයෙන් පර්යේෂණයට සහභාගීවූ පුද්ගලයින්ගෙන් 65%කට වඩා වැඩි පිරිසක් මෙම සමාජ ප්‍රතිමානය ස්ථාපිතව පවතින බව ප්‍රකාශ කර තිබේ.

- ස්වාමිපුරුෂයාට එරෙහිව පැමිණිලි කරන කාන්තාවන් විවේචනයට ලක් වන බව සහ පොලිස් ස්ථානයන්ට යන කාන්තාවන්/ ගැහැනු දරුවන් විවේචනයට ලක්වන බවට වන සමාජ ප්‍රතිමාන ඉහත දිස්ත්‍රික්ක පහේම ගැඹුරින් ස්ථාපිත වී තිබේ. එක් එක් දිස්ත්‍රික්කයෙන් පර්යේෂණයට සහභාගී වූ පුද්ගලයින්ගෙන් ආසන්න වශයෙන් 60%ක් හෝ ඊට වැඩි පිරිසක් මෙම සමාජ ප්‍රතිමානය සමාජයන්හි ගැඹුරින් ස්ථාපිත වී ඇති බව ප්‍රකාශ කර තිබේ. කෙසේ නමුත්, යාපනය දිස්ත්‍රික්කයෙන් සහභාගිවූ පුද්ගලයින්ගෙන් 58.04%ක පිරිසක් පමණක් කාන්තාවන්/ ගැහැනු දරුවන් පොලිස් ස්ථානයන්ට නොයායුතු බවට වූ සමාජ ප්‍රතිමානය තම දිස්ත්‍රික්කයෙහි ස්ථාපිතව ඇති බව ප්‍රකාශ කළහ.

- ලිංගික ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් කාන්තාවන්/ ගැහැනු දරුවන් පතිවත අහිමි වූවන් ලෙස සැලකේ, කාන්තාවන්/ ගැහැනු දරුවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීමට පැකිලීම සහ කාන්තාවන්/ගැහැනු දරුවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් විසින් වළකාලනු ලැබේ යනාදී සමාජ ප්‍රතිමාන තම සමාජයන්හි ස්ථාපිතව පවතින බව එක් එක් දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පර්යේෂණයට සහභාගී වූ පුද්ගලයින්ගෙන් 60%ක් හෝ ඊට වැඩි පිරිසක් ප්‍රකාශ කර තිබේ. කෙසේ නමුත්, සැලකිය යුතු ආකාරයකින්, කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් විසින් වලකාලනු ලබයි යන සමාජ ප්‍රතිමානය වවුනියාව දිස්ත්‍රික්කයේ ඉතා අඩු ප්‍රමාණයකින් පවතින බව පර්යේෂණයට සහභාගීවූවන්ගේ අදහස් මගින් හෙළිදරව් වේ. පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 33%කට වඩා අඩු ප්‍රමාණයක් මෙම සමාජ ප්‍රතිමාන තම දිස්ත්‍රික්කයෙහි ස්ථාපිතව පවතින බවට ප්‍රකාශ කර තිබේ.

## 4.3 සමාජයේ ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳී වෙනස්කොට සැලකීමේ උතුරු පළාතේ ප්‍රධාන සමාජ ප්‍රතිමාන සම්බන්ධයෙන් වර්ගීකරණය කරන ලද දත්ත

### 4.3.1 ලිංගික පදනමින්

උතුරු පළාතෙහි ඉතා ගැඹුරෙන් ස්ථාපිත වී ඇති බවට හඳුනාගන්නා ලද ප්‍රධාන සමාජ ප්‍රතිමාන ස්ත්‍රීන් හා පුරුෂයන් අතරේ[66] ස්ථාපිත වී ඇති රටාව අවබෝධ කරගැනීම සඳහා ලිංගික පදනමෙන් මෙම දත්ත වර්ගීකරණය කර තිබේ. පර්යේෂණයෙන් පසුව, සමාජ ප්‍රතිමාන වෙනස් කිරීම සඳහා වන මැදිහත්වීම සැලසුම් කර ගැනීම පිණිස එම දත්ත දිස්ත්‍රික්ක පදනමෙන් ද විශ්ලේෂණය කර තිබේ.

*66* වෙනත් ලිංගිකයන්ගෙන් දත්ත රැස්කිරීම සඳහා උත්සාහ කළ ද ඔවුන් තම ලිංගික අනන්‍යතාව සහ පෞද්ගලික තොරතුරු එළිදරව් කිරීමට කැමැත්තක් නොදැක්වූහ.

## 4.7 වන වගුව

| අංකය | සමාජ ප්‍රතිමාන | පිළිගනු ලබන්නන්ගේ සංඛ්‍යාව සහ ප්‍රතිශතය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ස්ත්‍රීන් | | | | | | පුරුෂයින් | | | | | |
| | | යාපනය | කිලිනොච්චිය | මුලතිව් | මන්නාරම | වවුනියාව | සමස්ත උතුරු පළාත තුළම | යාපනය | කිලිනොච්චිය | මුලතිව් | මන්නාරම | වවුනියාව | සමස්ත උතුරු පළාත තුළම |
| 1 | දරුවන් රැකබලා ගැනීම කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරය වේ | 28 (32.5%) | 12 (23%) | 10 (27.0%) | 23 (28.7%) | 45 (44.1%) | 118 (33%) | 7 (29.1%) | 10 (31.2%) | 5 (27.7%) | 2 (15.8%) | 17 (29.3%) | 41 (28.6%) |
| 2 | භාර්යාවන් කුමන ආකාරයේ දුකක් හෝ විඳ තම පවුල් ජීවිතය ආරක්ෂා කරගත යුතුය | 38 (58.7%) | 20 (38.4%) | 13 (35.1%) | 37 (46.8%) | 35 (35.3%) | 143 (42.1%) | 9 (52.9%) | 7 (22.5%) | 7 (38.8%) | 3 (27.2%) | 24 (42.1%) | 50 (37.3%) |
| 3 | ඉවුම් පිහුම් සහ ගේදොර කටයුතු කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරයන් වේ | 26 (30.2%) | 16 (30.7%) | 6 (15.7%) | 23 (29.1%) | 37 (36.2%) | 108 (30.2%) | 7 (30.4%) | 6 (18.7%) | 4 (22.2%) | 3 (27.2%) | 22 (37.9%) | 42 (29.5%) |
| 4 | ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ කටයුතු සඳහා පුරුෂයන් පමණක් යෙදවිය යුතුය | 43 (51.1%) | 23 (44.2%) | 9 (25%) | 45 (56.9%) | 41 (44.5%) | 161 (46.9%) | 14 (58.3%) | 14 (42.4%) | 10 (55.5%) | 3 (27.2%) | 31 (56.3%) | 72 (51%) |
| 5 | කාන්තාවන් පොදු ස්ථාන වලදී වැඩියෙන් කතා නොකළ යුතුය | 23 (27%) | 6 (11.5%) | 13 (31.7%) | 31 (38.2%) | 39 (36.7%) | 112 (30.6%) | 8 (33.3%) | 10 (29.4%) | 5 (27.7%) | 3 (25%) | 27 (48.2%) | 53 (36.8%) |
| 6 | ලිංගික ප්‍රචණ්ඩත්වය මගින් පීඩාවට පත් කාන්තාවන් පතිවත අහිමි වූවන්ය | 9 (10.8%) | 7 (14%) | 9 (25%) | 23 (29.4%) | 19 (21.1%) | 67 (19.8%) | 1 (4.3%) | 4 (12.9%) | 5 (27.7%) | 2 (18.1%) | 16 (30.1%) | 28 (20.5%) |
| 7 | කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි නොකළ යුතුය | 7 (8.6%) | 3 (5.7%) | 5 (13.5%) | 9 (11.3%) | 13 (13.5%) | 37 (10.2%) | 3 (13.6%) | 2 (6.2%) | 3 (16.6%) | 1 (9%) | 9 (16.1%) | 18 (13%) |
| 8 | කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් අනුමත නොකළ යුතුය | 10 (12.3%) | 8 (15.6%) | 8 (22.2%) | 11 (14.4%) | 8 (8.3%) | 45 (13.2%) | 3 (13%) | 2 (6.2%) | 2 (11.1%) | 1 (9%) | 11 (20%) | 19 (13.6%) |
| 9 | කාන්තාවන් පොලිස් ස්ථානයන්ට නොයා යුතුය | 9 (10.8%) | 7 (13.4%) | 5 (13.5%) | 16 (20.7%) | 13 (13.5%) | 50 (14.4%) | 3 (12.5%) | 5 (15.6%) | 4 (22.2%) | 2 (18.1%) | 10 (17.5%) | 24 (16.9%) |
| 10 | කාන්තාවන් ස්වාමිපුරුෂයන්ට එරෙහිව පැමිණිලි නොකළයුතුය | 10 (12.0%) | 7 (13.4%) | 6 (14.2%) | 13 (17.1%) | 11 (11.8%) | 47 (13.7%) | 3 (12.5%) | 2 (6.2%) | 4 (22.2%) | 0 | 8 (11.2%) | 17 (12%) |

67 එක් එක් සමාජ ප්‍රතිමානය සම්බන්ධයෙන් තම පෞද්ගලික අදහස ඉදිරිපත් කළ අයගේ සංඛ්‍යාව වෙනස් වන අතර එලෙස පිළිතුරු සැපයූ සමස්ත පුරුෂයින් සහ සමස්ත කාන්තාවන් සංඛ්‍යාවෙන් ඉහත ප්‍රතිශත අගය ලබාගෙන තිබේ.

## ප්‍රධාන නිගමන

- දරුවන් රැක බලාගැනීම ප්‍රධාන වශයෙන් කාන්තාවන්ගේ කාර්යභාරය වේ, ඉවුම් පිහුම් සහ ගේදොර වැඩකටයුතු යනාදිය ප්‍රධාන වශයෙන් කාන්තාවන්ගේ වැඩ කටයුතු වේ, කාන්තාවන් පොදු ස්ථානවලදී වැඩියෙන් කතා නොකළ යුතුය සහ කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි නොකළ යුතුය යන සමාජ ප්‍රතිමාන වව්නියාව දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පර්යේෂණයට සහභාගී වූ කාන්තාවන් අතරේ බහුලව දැකිය හැකි විය.
- භාර්යාවන් සෑම අවස්ථාවකදීම පවුල් ජීවිතය රැක ගැනීමට කටයුතු කළ යුතුය සහ කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් විසින් අනුමත නොකළ යුතුය යන සමාජ ප්‍රතිමාන යාපනය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පර්යේෂණයට සහභාගී වූ කාන්තාවන් අතරේ බහුලව දැකිය හැකි විය.
- ශාරීරික ශ්‍රමය බහුලව යෙදවිය යුතු වැඩ කටයුතු සඳහා පුරුෂයන් පමණක් යෙදවිය යුතුය, ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ කාන්තාවන් පතිවත අහිමි වූවන්ය, කාන්තාවන් පොලිස් ස්ථාන වලට නොයා යුතුය සහ ස්වාමිපුරුෂයාට එරෙහිව පැමිණි නොකළ යුතුය යන සමාජ ප්‍රතිමාන මන්නාරම දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පර්යේෂණයට සහභාගී වූ කාන්තාවන් අතරේ බහුලව දැකගත හැකි විය.
- ඉවුම් පිහුම් සහ ගේදොර වැඩකටයුතු යනාදිය ප්‍රධාන වශයෙන් කාන්තාවන්ගේ වැඩකටයුතු වේ, ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ කාන්තාවන් පතිවත අහිමි වූවන් ය, කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත් වයට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් විසින් අනුමත නොකළ යුතුය සහ කාන්තාවන් පොදු ස්ථානවල වැඩියෙන් කතා නොකළ යුතුය යන සමාජ ප්‍රතිමාන වව්නියාව දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පර්යේෂණයට සහභාගී වූ පුරුෂයින් අතරේ බහුලව දැකගත හැකි විය.
- කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි නොකළ යුතුය, කාන්තාවන් පොලිස් ස්ථානයන්ට නොයා යුතුය සහ ස්වාමිපුරුෂයාට එරෙහිව පැමිණිලි නොකළ යුතුය යන සමාජ ප්‍රතිමාන මුලතිව් දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පර්යේෂණයට සහභාගී වූ පුරුෂයන් අතරේ බහුල වශයෙන් දැකගත හැකි විය.
- භාර්යාවන් ඕනෑම දුකක් විඳ පවුල් ජීවිතය ආරක්ෂා කරගත යුතුය සහ ශාරීරික ශ්‍රමය බහුලව යෙද විය යුතු වැඩ කටයුතු සඳහා පුරුෂයන් පමණක් යෙදවිය යුතුය යන සමාජ ප්‍රතිමාන යාපනය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පර්යේෂණයට සහභාගී වූ පුරුෂයන් අතරේ බහුලව දැකගත හැකි විය.
- දරුවන් රැකබලාගැනීම ප්‍රධාන වශයෙන් කාන්තාවන්ගේ කාර්යභාරය වේ යන සමාජ ප්‍රතිමානය කිලිනොච්චිය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පර්යේෂණයට සහභාගී වූ පුරුෂයින් අතර බහුලව දැකගත හැකි විය.
- සමස්ත උතුරු පළාතින්ම ප්‍රතිචාර දක්වා තිබූ කාන්තාවන් සහ පුරුෂයන්ගේ ප්‍රතිචාර ප්‍රතිශත පදනමින් විශ්ලේෂණය කිරීමේ දී:
    - දරුවන් රැකබලාගැනීම ප්‍රධාන වශයෙන් කාන්තාවන්ගේ කාර්යභාරය වේ, ඉවුම් පිහුම් සහ ගේදොර වැඩකටයුතු යනාදිය ප්‍රධාන වශයෙන් කාන්තාවන්ගේ වැඩ කටයුතු වේ, භාර්යාවන් ඕනෑම අවස්ථාවක තම පවුල් ජීවිතය රැකගත යුතුය සහ කාන්තාවන් ස්වාමි පුරුෂයන්ට එරෙහිව පැමිණිලි නොකළ යුතුය යන සමාජ ප්‍රතිමාන පුරුෂයන්ට වඩා කාන්තාවන් තුළ බහුල වශයෙන් ස්ථාපිතව පවතී.
    - ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩකටයුතුවලට පුරුෂයන් පමණක් යෙදවිය යුතුය, ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ කාන්තාවන් පතිවත අහිමි වූවන් ය, කාන්තාවන් පොලිස් ස්ථානවලට නොයා යුතුය, කාන්තාවන් පොදු ස්ථානවල වැඩියෙන් කතා නොකළ යුතුය සහ කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි නොකළ යුතුය යන සමාජ ප්‍රතිමාන කාන්තාවන්ට වඩා පුරුෂයන් තුළ බහුල වශයෙන් ස්ථාපිත වී ඇත.
- එබැවින්, සමාජ ප්‍රතිමාන වෙනස් කිරීම සඳහා වන කුමන හෝ මැදිහත්වීමක් ඉහත පර්යේෂණ නිගමන සැලකිල්ලටගෙන කාන්තාවන් සහ පුරුෂයන් යන දෙපාර්ශවයම සුදුසු පරිදි කේන්ද්‍රකොට සිදුකළ යුතුය.

## 4.3.2 ආගමික පදනමින් [68]

**4.8 වන වගුව**

| අංකය | සමාජ ප්‍රතිමාන | පිළිගනිමි | | | | | පිළිනොගනිමි | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | හින්දු | ක්‍රිස්තියානි | කතෝලික | ඉස්ලාම් | බෞද්ධ | හින්දු | ක්‍රිස්තියානි | කතෝලික | ඉස්ලාම් | බෞද්ධ |
| 1 | දරුවන් රැකබලා ගැනීම කාන්තාවන්ගේ ප්‍රධාන කාර්ය භාරය වේ | 85 (31.25%) | 19 (27.14%) | 15 (28.84%) | 10 (25.00%) | 31 (40.79%) | 187 (68.75%) | 51 (72.86%) | 37 (71.16%) | 30 (75.00%) | 45 (59.21%) |
| | | 160 (31.37%) | | | | | 350 (68.63%) | | | | |
| 2 | භාර්යාව ඕනෑම අවස්ථාවක කුමන හෝ දුකක් දරාගනිමින් තම වෛවාහක/ පවුල් ජීවිතය රැක ගැනීමට උත්සාහ කළ යුතුය. | 105 (41.67%) | 32 (45.71%) | 20 (40.00%) | 19 (47.50%) | 22 (30.56%) | 147 (58.33%) | 38 (54.29%) | 30 (60.00%) | 21 (52.50%) | 50 (69.44%) |
| | | 198 (40.91%) | | | | | 286 (59.09%) | | | | |
| 3 | ඉවුම් පිහුම් සහ ගේදොර කටයුතු කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරයන් වේ | 73 (26.74%) | 20 (28.17%) | 13 (25.00%) | 19 (50.00%) | 30 (39.47%) | 200 (73.26%) | 51 (71.83%) | 39 (75.00%) | 19 (50.00%) | 46 (60.53%) |
| | | 155 (30.39%) | | | | | 256 (51.72%) | | | | |
| 4 | ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ කටයුතු සඳහා පුරුෂයන් පමණක් යෙදවිය යුතුය | 129 (47.96%) | 29 (43.94%) | 24 (48.00%) | 22 (55.00%) | 35 (50.00%) | 140 (52.04%) | 37 (56.06%) | 26 (52.00%) | 18 (45.00%) | 35 (50.00%) |
| | | 239 (48.28%) | | | | | 256 (51.72%) | | | | |
| 5 | කාන්තාවන්/ ගැහැනු දරුවන් පොදු ස්ථාන වලදී වැඩියෙන් කතා නොකළ යුතුය | 63 (22.42%) | 25 (36.23%) | 14 (26.92%) | 20 (50.00%) | 44 (57.14%) | 218 (77.58%) | 44 (63.77%) | 38 (73.08%) | 20 (50.00%) | 33 (42.86%) |
| | | 166 (31.98%) | | | | | 353 (68.02%) | | | | |
| 6 | ලිංගික ප්‍රචණ්ඩත්වය/ දූෂණයට ලක්වූ කාන්තාවන් පතිවත අහිමි වූවන්ය | 48 (18.18%) | 17 (25.37%) | 11 (22.00%) | 11 (30.56%) | 11 (16.67%) | 216 (81.82%) | 50 (74.63%) | 39 (78.00%) | 25 (69.44%) | 55 (83.33%) |
| | | 98 (20.29%) | | | | | 385 (79.71%) | | | | |
| 7 | කාන්තාවන් තමන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට එරෙහිව පැමිණිලි නොකළ යුතුය | 27 (10.23%) | 11 (16.18%) | 5 (9.62%) | 4 (10.53%) | 9 (12.68%) | 237 (89.77%) | 57 (83.82%) | 47 (90.38%) | 34 (89.47%) | 62 (87.32%) |
| | | 56 (11.36%) | | | | | 437 (88.64%) | | | | |
| 8 | කාන්තාවන් තමන්ට එරෙහිව සිදු වන ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් විසින් අනුමත නොකළ යුතුය | 33 (12.60%) | 13 (19.40%) | 8 (15.69%) | 6 (15.79%) | 7 (9.86%) | 229 (87.40%) | 54 (80.60%) | 43 (84.31%) | 32 (84.21%) | 64 (90.14%) |
| | | 67 (13.70%) | | | | | 422 (86.30%) | | | | |
| 9 | කාන්තාවන් පොලිස් ස්ථානවලට නොයා යුතුය | 36 (13.38%) | 10 (14.71%) | 7 (13.46%) | 12 (31.58%) | 10 (14.29%) | 233 (86.62%) | 58 (85.29%) | 45 (86.54%) | 26 (68.42%) | 60 (85.71%) |
| | | 75 (15.09%) | | | | | 422 (84.91%) | | | | |
| 10 | කාන්තාවන් තම ස්වාමි පුරුෂයන්ට එරෙහිව පැමිණිලි නොකළ යුතුය | 38 (14.29%) | 9 (13.43%) | 9 (18.00%) | 7 (17.95%) | 4 (5.71%) | 228 (85.74%) | 58 (86.57%) | 41 (82.00%) | 32 (82.05%) | 66 (94.29%) |
| | | 67 (13.62%) | | | | | 425 (86.38%) | | | | |

68 පර්යේෂණයට සහභාගි වූ ඇතැම් පුද්ගලයින් තමන්ගේ ලිංගිකත්වය හෝ ආගම හෝ වයස හෝ අධ්‍යාපන මට්ටම හෝ ප්‍රසිද්ධ නොකළ බැවින් එකම සමාජ ප්‍රතිමානය සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වා ඇති පර්යේෂණයට සහභාගීවූවන්ගේ සංඛ්‍යාව සහ ලිංගිකත්වය, ආගම, වයස සහ අධ්‍යාපන මට්ටම වශයෙන් වෙන් වෙන් සංරචක යටතේ විශ්ලේෂණය කිරීමේදී සුළු වශයෙන් වෙනස්කම් දක්නට ලැබේ.

## ප්‍රධාන නිගමන

- ලැබී ඇති තොරතුරු පදනමෙන් සලකා බැලීමේදී ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍යවන වැඩ කටයුතු වල පුරුෂයින් පමණක් නිරත විය යුතුය, ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ කාන්තාවන් පතිවත අහිමි වූවන් ය, කාන්තාවන් පොලිස් ස්ථානවලට නොයා යුතුය, ඉවුම්, පිහුම් සහ ගේ දොර වැඩ කටයුතු කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරයන් වේ සහ භාර්යාවන් කුමන හෝ දුකක් විඳ පවුල් ජීවිතය ආරක්ෂා කරගත යුතුය යන සමාජ ප්‍රතිමාන අනෙකුත් ආගමික ප්‍රජාවන්ට වඩා මුස්ලිම් ප්‍රජාව තුළ බහුලව පවතී.

- කාන්තාවන් පොදු ස්ථානවල වැඩියෙන් කතා නොකළ යුතුය සහ දරුවන් රැක බලාගැනීම කාන්තාවන්ගේ කාර්යභාරය වේ යන සමාජ ප්‍රතිමාන අනෙකුත් සියලූ ආගමික ප්‍රජාවන්ට වඩා බෞද්ධාගමික ප්‍රජාව තුළ බහුලව පවතී.

- කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි නොකළ යුතුය සහ කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් විසින් අනුමත නොකළ යුතුය යන සමාජ ප්‍රතිමාන අනෙකුත් සියලු ආගමික ප්‍රජාවන්ට වඩා ක්‍රිස්තියානි ආගමික ප්‍රජාව තුළ බහුලව පවතී.

- කාන්තාවන් ස්වාමිපුරුෂයාට එරෙහිව පැමිණිලි නොකළ යුතුය යන සමාජ ප්‍රතිමානය අනෙකුත් සියලු ආගමික ප්‍රජාවන්ට වඩා කතෝලික ආගමික ප්‍රජාව තුළ බහුලව පවතී.

- ශාරීරික ශ්‍රමය අධික ලෙස අවශ්‍ය වන වැඩ කටයුතු සඳහා පුරුෂයින් පමණක් යෙදවිය යුතුය, දරුවන් රැක බලාගැනීම ප්‍රධාන වශයෙන් කාන්තාවන්ගේ කාර්යභාරය වේ සහ භාර්යාවන් කුමන හෝ දුකක් විඳ පවුල් ජීවිතය ආරක්ෂා කර ගත යුතුය යන සමාජ ප්‍රතිමාන හින්දු ආගමික ප්‍රජාව තුළ සැලකිය යුතු අයුරින් ස්ථාපිතව පවතින බව දැකගත හැකිය.

## 4.3.3 වයස් පදනමින්

**4.9 වන වගුව**

| අංකය | සමාජ ප්‍රතිමාන | පිළිගනිමි | | | | | පිළිනොගනිමි | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 21-30 | 31-40 | 41-50 | 51-60 | 61 හෝ ඊට වැඩි | 21-30 | 31-40 | 41-50 | 51-60 | 61 හෝ ඊට වැඩි |
| 1 | දරුවන් රැකබලා ගැනීම කාන්තාවන්ගේ ප්‍රධාන කාර්ය භාරය වේ | 38 (33.63%) | 49 (30.81%) | 37 (27.40%) | 23 (36.50%) | 15 (39.47%) | 75 (66.37%) | 110 (69.19%) | 98 (72.60%) | 40 (63.5%) | 23 (60.53%) |
| | | 162 (31.89%) | | | | | 346 (68.11%) | | | | |
| 2 | භාර්යාව ඕනෑම අවස්ථාවක කුමන හෝ දුකක් දරාගනිමින් තම වෛවාහක/පවුල් ජීවිතය රැක ගැනීමට උත්සාහ කළ යුතුය. | 37 (34.91%) | 66 (43.14%) | 42 (32.81%) | 26 (43.33%) | 27 (77.14%) | 69 (65.09%) | 87 (56.86%) | 86 (67.19%) | 34 (56.67%) | 8 (22.86%) |
| | | 198 (41.08%) | | | | | 284 (58.92%) | | | | |
| 3 | ඉවුම් පිහුම් සහ ගේදොර කටයුතු කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරයන් වේ | 44 (39.64%) | 47 (29.38%) | 33 (24.44%) | 15 (23.44%) | 15 (39.47%) | 67 (60.36%) | 113 (70.62%) | 102 (75.56%) | 49 (76.56%) | 23 (60.53%) |
| | | 154 (30.31%) | | | | | 354 (69.69%) | | | | |
| 4 | ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ කටයුතු සඳහා පුරුෂයන් පමණක් යොමු කළ යුතුය | 57 (51.82%) | 70 (44.87%) | 62 (48.06%) | 28 (45.16%) | 20 (57.14%) | 53 (48.18%) | 86 (55.13%) | 67 (51.94%) | 34 (54.84%) | 15 (42.86%) |
| | | 237 (48.17%) | | | | | 353 (68.28%) | | | | |
| 5 | කාන්තාවන්/ ගැහැනු දරුවන් පොදු ස්ථාන වලදී වැඩියෙන් කතා නොකළ යුතුය | 47 (40.87%) | 49 (30.25%) | 43 (30.50%) | 14 (22.95%) | 11 (28.95%) | 68 (59.13%) | 113 (69.75%) | 98 (69.50%) | 47 (77.05%) | 47 (71.05%) |
| | | 164 (31.72%) | | | | | 353 (68.02%) | | | | |
| 6 | ලිංගික ප්‍රචණ්ඩත්වය/ දූෂණයට ලක්වූ කාන්තාවන් පතිවත අහිමි වූවන්ය | 22 (20.75%) | 31 (20.67%) | 26 (20.31%) | 11 (17.74%) | 8 (22.22%) | 84 (79.25%) | 119 (79.33%) | 102 (79.69%) | 51 (82.26%) | 28 (77.78%) |
| | | 98 (20.33%) | | | | | 384 (79.67%) | | | | |
| 7 | කාන්තාවන් තමන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට එරෙහිව පැමිණිලි නොකළ යුතුය | 11 (10.00%) | 25 (16.34%) | 7 (5.30%) | 7 (11.67%) | 6 (16.67%) | 99 (90.00%) | 128 (83.66%) | 125 (94.70%) | 53 (88.33%) | 30 (83.33%) |
| | | 56 (11.41%) | | | | | 435 (88.59%) | | | | |
| 8 | කාන්තාවන් තමන්ට එරෙහිව සිදු වන ලිංගික ප්‍රචණ්ඩත් වයට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් විසින් අනුමත නොකළ යුතුය | 14 (12.61%) | 24 (16.11%) | 16 (12.21%) | 8 (12.90%) | 5 (14.29%) | 97 (87.39%) | 125 (82.24%) | 115 (87.79%) | 54 (87.10%) | 30 (85.71%) |
| | | 67 (13.73%) | | | | | 421 (86.27%) | | | | |
| 9 | කාන්තාවන් පොලිස් ස්ථානවලට නොයා යුතුය | 14 (12.61%) | 27 (17.76%) | 19 (14.39%) | 8 (12.70%) | 6 (16.22%) | 97 (87.39%) | 125 (82.24%) | 113 (85.61%) | 55 (87.30%) | 31 (83.78%) |
| | | 74 (14.95%) | | | | | 421 (85.05%) | | | | |
| 10 | කාන්තාවන් තම ස්වාමි පුරුෂයන්ට එරෙහිව පැමිණිලි නොකළ යුතුය | 12 (11.11%) | 27 (17.76%) | 16 (12.03%) | 7 (11.48%) | 6 (16.22%) | 96 (88.89%) | 125 (82.24%) | 117 (87.97%) | 54 (88.52%) | 31 (83.78%) |
| | | 68 (13.85%) | | | | | 423 (86.15%) | | | | |

### ප්‍රධාන නිගමන

- දරුවන් රැක බලාගැනීම ප්‍රධාන වශයෙන් කාන්තාවන්ගේ කාර්යභාරය වේ, ඉවුම් පිහුම් සහ ගේදොර වැඩ කටයුතු ප්‍රධාන වශයෙන් කාන්තාවන්ගේ කාර්යභාරයන් වේ, කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි නොකළ යුතුය, භාර්යාවන් කුමන හෝ දුකක් විඳ තම පවුල් ජීවිතය ආරක්ෂා කර ගත යුතුය, ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ කාන්තාවන් පතිවත අහිමිවූවන්ය සහ ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ කටයුතු වල පුරුෂයින් පමණක් යෙදවිය යුතුය යන සමාජ ප්‍රතිමානය වයස අවුරුදු 61 ඉක්මවූ පර්යේෂණයට සහභාගිවූවන් අතරේ බහුලව දක්නට ලැබුණි.

- කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් විසින් අනුමත නොකළ යුතුය, කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි නොකළ යුතුය, කාන්තාවන් පොලිස් ස්ථානවලට නොයා යුතුය සහ ස්වාමිපුරුෂයාට එරෙහිව පැමිණිලි නොකළ යුතුය යන සමාජ ප්‍රතිමාන අවුරුදු 31 – 40 දක්වා වයස් කාණ්ඩයට අයත් පුද්ගලයින් අතර බහුලව දැකගත හැකි විය. පැමිණිලි කිරීම පිළිබඳ මෙකී සමාජ ප්‍රතිමාන මෙම වයස් කාණ්ඩයට අයත් පුද්ගලයන් අතරේ බහුලව පෙනෙන්නට තිබෙන බව මෙම පර්යේෂණයේ නිගමන මගින් පෙන්වා දෙන අතර ශ්‍රී ලංකාවේ 2020 වසරේ කාන්තාවන්ගේ යහපත සම්බන්ධයෙන් සිදුකරන ලද පර්යේෂණයක්[69] මගින් සොයාගෙන ඇත්තේ අවුරුදු 35 – 54 අතර වයස් කාණ්ඩයේ පසුවන පුද්ගලයින් අතරේ අධික ලෙස ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය (ශාරීරික හා ලිංගිකමය ප්‍රචණ්ඩ ක්‍රියා) සිදු වන බවය.

- ඉවුම් පිහුම් සහ ගේදොර වැඩ කටයුතු ප්‍රධාන වශයෙන් කාන්තාවන්ගේ කාර්යභාරයන් වේ සහ කාන්තාවන් පොදු ස්ථාන වලදී වැඩියෙන් කතා නොකළ යුතුය යන සමාජ ප්‍රතිමාන අවුරුදු 21 – 30 දක්වා වූ වයස් කාණ්ඩයට අයත් පුද්ගලයින් අතරේ බහුලව දක්නට ලැබුණි.

*69* Women's Wellbeing Survey – 2019, Findings from Sri Lanka's first dedicated National Survey on Violence against Women and Girls Final Report, (Department of Census and Statistics, Sri Lanka, October 2020) available at: http://www.statistics.gov.lk/Resource/refference/WWS_2019_Final_Report accessed 12 August 2021

## 4.3.4 අධ්‍යාපන මට්ටම පදනමින්

**4.10 වන වගුව**

| අංකය | සමාජ ප්‍රතිමාන | පිළිගනිමි | | | | | | | | | | පිළිනොගනිමි | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ලිවීමට හා කියවීමට හැකි නමුත් විධිමත් අධ්‍යාපනයක් ලබා නොමැත | ලිවීමට හෝ කියවීමට නොහැක | 5 ශ්‍රේණිය දක්වා | 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා | 9 ශ්‍රේණියේ සිට අ.පො.ස. සාමාන්‍ය පෙළ දක්වා | අ.පො.ස. උසස් පෙළ දක්වා | අධ්‍යාපන විද්‍යාපීඨ | ඩිප්ලෝමා | උපාධිය | පශ්චාත්උපාධිය | ලිවීමට හා කියවීමට හැකි නමුත් විධිමත් අධ්‍යාපනයක් ලබා නොමැත | ලිවීමට හෝ කියවීමට නොහැක | 5 ශ්‍රේණිය දක්වා | 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා | 9 ශ්‍රේණියේ සිට අ.පො.ස. සාමාන්‍ය පෙළ දක්වා | අ.පො.ස. උසස් පෙළ දක්වා | අධ්‍යාපන විද්‍යාපීඨ | ඩිප්ලෝමා | උපාධිය | පශ්චාත්උපාධිය |
| 1 | දරුවන් රැකබලා ගැනීම කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරය වේ | 3 (30.00%) | 2 (40.00%) | 3 (50.00%) | 12 (30.00%) | 70 (33.33%) | 50 (29.41%) | 1 (11.11%) | 9 (32.14%) | 10 (31.25%) | 1 (100.00%) | 7 (70.00%) | 3 (60.00%) | 3 (50.00%) | 28 (70.00%) | 140 (66.67%) | 120 (70.59%) | 8 (88.89%) | 19 (67.86%) | 22 (68.75%) | 0 (0.00%) |
| | | 161 (31.51%) | | | | | | | | | | 350 (68.49%) | | | | | | | | | |
| 2 | භාර්යාව ඕනෑම අවස්ථාවක කුමන හෝ දුකක් දරාගනිමින් තම වෛවාහක/පවුල් ජීවිතය රැක ගැනීමට උත්සාහ කළ යුතුය. | 3 (33.33%) | 1 (33.33%) | 2 (40.00%) | 15 (39.47%) | 88 (43.35%) | 71 (44.38%) | 3 (33.33%) | 9 (33.33%) | 6 (20.00%) | 1 (100.00%) | 6 (66.67%) | 2 (66.67%) | 3 (60.00%) | 23 (60.53%) | 115 (56.65%) | 89 (55.62%) | 6 (66.67%) | 18 (66.67%) | 24 (80.00%) | 0 (0.00%) |
| | | 199 (41.03%) | | | | | | | | | | 286 (58.97%) | | | | | | | | | |
| 3 | ඉවුම් පිහුම් සහ ගේදොර කටයුතු කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරයන් වේ | 4 (40.00%) | 1 (20.00%) | 2 (33.33%) | 12 (30.00%) | 73 (34.43%) | 47 (27.81%) | 1 (11.11%) | 7 (25.00%) | 8 (25.81%) | 1 (100.00%) | 6 (60.00%) | 4 (80.00%) | 4 (66.67%) | 28 (70.00%) | 139 (65.57%) | 122 (72.19%) | 8 (88.89%) | 21 (75.00%) | 23 (74.19%) | 0 (0.00%) |
| | | 156 (30.53%) | | | | | | | | | | 355 (69.47%) | | | | | | | | | |
| 4 | ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ කටයුතු සඳහා පුරුෂයන් පමණක් යෙදවිය යුතුය | 3 (30.00%) | 3 (75.00%) | 3 (60.00%) | 21 (56.76%) | 98 (47.80%) | 80 (48.78%) | 2 (22.22%) | 13 (46.43%) | 13 (40.63%) | 1 (100.00%) | 7 (70.00%) | 1 (25.00%) | 2 (40.00%) | 16 (43.24%) | 107 (52.20%) | 84 (51.22%) | 7 (77.78%) | 15 (53.57%) | 19 (59.37%) | 0 (0.00%) |
| | | 237 (47.88%) | | | | | | | | | | 258 (52.12%) | | | | | | | | | |
| 5 | කාන්තාවන්/ ගැහැනු දරුවන් පොදු ස්ථාන වලදී වැඩියෙන් කතා නොකළ යුතුය | 3 (30.00%) | 1 (20.00%) | 1 (16.67%) | 15 (38.46%) | 76 (34.55%) | 48 (28.24%) | 1 (11.11%) | 6 (21.43%) | 13 (40.63%) | 1 (100.00%) | 7 (70.00%) | 4 (80.00%) | 5 (83.33%) | 24 (61.54%) | 144 (65.45%) | 122 (71.76%) | 8 (88.89%) | 22 (78.57%) | 19 (59.37%) | 0 (0.00%) |
| | | | | | | | | | | | | 387 (79.79%) | | | | | | | | | |

| | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6 | ලිංගික ප්‍රචණ්ඩත්වය/ දූෂණයට ලක්වූ කාන්තාවන් පතිවත අහිමි වූවන්ය | 3 (30.00%) | 0 (0.00%) | 0 (0.00%) | 12 (30.00%) | 44 (22.34%) | 28 (17.07%) | 4 (44.44%) | 4 (16.00%) | 3 (9.68%) | 0 (0.00%) | 7 (70.00%) | 3 (100.00%) | 5 (100.00%) | 28 (70.00%) | 153 (77.66%) | 136 (82.93%) | 4 (44.44%) | 4 (16.00%) | 3 (9.68%) | 0 (0.00%) |
| | | 98 (20.21%) | | | | | | | | | | 387 (79.79%) | | | | | | | | | |
| 7 | කාන්තාවන් තමන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට එරෙහිව පැමිණිලි නොකළ යුතුය | 2 (20.00%) | 1 (25.00%) | 1 (25.00%) | 6 (14.63%) | 23 (11.27%) | 19 (11.59%) | 0 (0.00%) | 3 (10.71%) | 1 (3.33%) | 0 (0.00%) | 8 (80.00%) | 3 (75.00%) | 3 (75.00%) | 35 (85.37%) | 181 (88.73%) | 145 (88.41%) | 9 (100.00%) | 25 (89.29%) | 29 (96.67%) | 1 (100.00%) |
| | | 56 (11.31%) | | | | | | | | | | 439 (88.69%) | | | | | | | | | |
| 8 | කාන්තාවන් තමන්ට එරෙහිව සිදු වන ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් විසින් අනුමත නොකළ යුතුය | 3 (30.00%) | 0 (0.00%) | 0 (0.00%) | 8 (20.51%) | 26 (12.87%) | 25 (15.34%) | 0 (0.00%) | 3 (10.71%) | 1 (3.23%) | 0 (0.00%) | 7 (70.00%) | 3 (100.00%) | 5 (100.00%) | 31 (79.49%) | 176 (87.13%) | 138 (84.66%) | 9 (100.00%) | 25 (89.29%) | 30 (96.77%) | 30 (100%) |
| | | 66 (13.44%) | | | | | | | | | | 425 (86.56%) | | | | | | | | | |
| 9 | කාන්තාවන් පොලිස් ස්ථානවලට නොයා යුතුය | 2 (20.00%) | 0 (0.00%) | 1 (20.00%) | 8 (20.51%) | 38 (18.45%) | 18 (10.84%) | 0 (0.00%) | 7 (25.00%) | 0 (0.00%) | 1 (100.00%) | 8 (80.00%) | 4 (100.00%) | 4 (100.00%) | 31 (79.49%) | 168 (81.55%) | 148 (89.16%) | 9 (100.00%) | 21 (75.00%) | 31 (100.00%) | 0 (0.00%) |
| | | 75 (15.03%) | | | | | | | | | | 424 (84.97%) | | | | | | | | | |
| 10 | කාන්තාවන් තම ස්වාමි පුරුෂයන්ට එරෙහිව පැමිණිලි නොකළ යුතුය | 1 (11.11%) | 0 (0.00%) | 0 (0.00%) | 5 (12.82%) | 34 (16.43%) | 22 (13.50%) | 0 (0.00%) | 4 (14.29%) | 2 (6.67%) | 0 (0.00%) | 8 (88.89%) | 3 (100.00%) | 5 (100.00%) | 34 (87.18%) | 173 (83.57%) | 141 (86.50%) | 9 (100.00%) | 24 (85.71%) | 28 (93.33%) | 1 (100.00%) |
| | | | | | | | | | | | | 426 (86.23%) | | | | | | | | | |

**ප්‍රධාන නිගමන**

- පොදුවේ සලකා බැලීමේදී මෙම සමාජ ප්‍රතිමාන අධ්‍යාපන විද්‍යාපීඨ, ඩිප්ලෝමා නැතහොත් උපාධි අධ්‍යාපනය ලැබූ අය අතරේ අවම වශයෙන් දක්නට ලැබේ.
- කෙසේ නමුත්, කාන්තාවන් තම ස්වාමිපුරුෂයාට එරෙහිව පැමිණිලි නොකළ යුතුය සහ පොලිස් ස්ථානයන්ට නොයා යුතුය යන සමාජ ප්‍රතිමාන ඩිප්ලෝමා අධ්‍යාපනය සම්පූර්ණ කරන ලද පුද්ගලයින් අතරේ සැලකිය යුතු ලෙස අධිකව දක්නට ලැබෙයි.
- උපාධි අධ්‍යාපනය ලැබූ පුද්ගලයින් සමඟ සසඳා බැලීමේදී අ.පො.ස. සාමාන්‍ය පෙළ නැතහොත් ඊට අඩු මට්ටමේ අධ්‍යාපනයක් සහිත පුද්ගලයින් අතරේ සාමාන්‍යයෙන් සියළුම සමාජ ප්‍රතිමානයන් සැලකිය යුතු අන්දමින් බහුලව දක්නට ලැබේ.

## 4.4 හඳුනා ගන්නා ලද ප්‍රධාන ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන SNAP ව්‍යුහය ඔස්සේ ඇගයීම[70]

### 4.4.1 සමාජ ප්‍රතිමාන පිළිබඳ සමාජ අපේක්ෂාවන්

අන් අය කුමක් කරනවා කියා ද මම සිතන්නේ? (Empirical Expectations)


**4.11 වන වගුව**

| අංකය | ප්‍රකාශය | පර්යේෂණයට සහභාගී වූ ගණන | |
|---|---|---|---|
| | | පිළිගනිමි | පිළිනොගනිමි |
| 1 | ඔබගේ ප්‍රජාව තුළ ප්‍රධාන වශයෙන් දරුවන් රැක බලාගැනීමේ කාර්යයෙහි නිරතවන්නේ කාන්තාවන්ය | 370 | 95 |
| 2 | ඔබගේ ප්‍රජාව තුළ සිටින භාර්යාවන් ඕනෑම අවස්ථාවක තම වෛවාහක/ පවුල් ජීවිතය රැක ගැනීමට උත්සාහ කරති | 367 | 100 |
| 3 | ඔබගේ ප්‍රජාව තුළ ප්‍රධාන වශයෙන් ඉවුම් පිහුම් සහ ගේ දොර කටයුතු සිදු කරනු ලබන්නේ කාන්තාවන්ය | 352 | 119 |
| 4 | ප්‍රජාව තුළ ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ කටයුතුවල යොදවනු ලබන්නේ පුරුෂයන් පමණි | 355 | 102 |
| 5 | ඔබගේ ප්‍රජාව තුළ කාන්තාවන්/ ගැහැනු දරුවන් පොදු ස්ථානයන්හි වැඩියෙන් කතා නොකරති | 340 | 134 |
| 6 | ඔබගේ ප්‍රජාව තුළ ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ කාන්තාවන් පතිවත අහිමි වූ අය ලෙස සැලකේ | 277 | 161 |
| 7 | ඔබගේ ප්‍රජාව තුළ බොහෝ දුරට කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීමට පැකිලෙති | 329 | 113 |
| 8 | ඔබගේ ප්‍රජාව තුළ කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් විසින් වළක්වාලනු ලබයි. | 330 | 100 |
| 9 | ඔබගේ ප්‍රජාව තුළ බොහෝ දුරට කාන්තාවන් පොලිස් ස්ථානයන්ට නොයති | 321 | 125 |
| 10 | ඔබගේ ප්‍රජාව තුළ කාන්තාවන් තම ස්වාමිපුරුෂයාට එරෙහිව පැමිණිලි නොකරති | 313 | 138 |

70 SNAP ව්‍යුහය පිළිබඳවදැනගැනීම සඳහා 3 වන පරිච්ඡේදය බලන්න

## ප්‍රස්තාරය 4.1

### ආනුභවික අපේක්ෂාවන් (Empirical Expectations)





### අන් අය මා කළයුතු බවට බලාපොරොත්තු වන දේ ලෙස මම සිතන දේ? **(Normative Expectations)**

**4.12 වන වගුව**

| අංකය | ප්‍රකාශය | පර්යේෂණයට සහභාගී වූ ගණන | |
|---|---|---|---|
| | | ඔව් | නැත |
| 1 | ඔබගේ ප්‍රජාව තුළ කාන්තාවන් ප්‍රධාන වශයෙන් දරුවන් රැක බලා ගැනීමේ කාර්යයෙහි නිරතවිය යුතු බවට සෙසු අය අපේක්ෂා කරති. | 325 | 100 |
| 2 | ඔබගේ ප්‍රජාව තුළ භාර්යාවන් ඕනෑම අවස්ථාවක තම වෛවාහක/ පවුල් ජීවිතය ආරක්ෂා කරගත යුතු බවට සෙසු අය අපේක්ෂා කරති. | 346 | 78 |
| 3 | ඔබගේ ප්‍රජාව තුළ කාන්තාවන් ප්‍රධාන වශයෙන් ඉවුම් පිහුම් සහ ගේ දොර වැඩ කටයුතු සිදුකළ යුතු බවට සෙසු අය අපේක්ෂා කරති. | 303 | 106 |
| 4 | ඔබගේ ප්‍රජාව තුළ ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ කටයුතු වල පුරුෂයින් පමණක් යෙදවිය යුතු බවට සෙසු අය අපේක්ෂා කරති. | 346 | 80 |
| 5 | ඔබගේ ප්‍රජාව තුළ කාන්තාවන්/ගැහැනු දරුවන් පොදු ස්ථානයන් වල වැඩියෙන් කතා නොකළ යුතු බවට සෙසු අය අපේක්ෂා කරති. | 395 | 44 |
| 6 | ඔබගේ ප්‍රජාව තුළ ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ කාන්තාවන් පතිවත අහිමි වූවන් ලෙස සෙසු අය සලකති | 308 | 106 |
| 7 | ඔබගේ ප්‍රජාව තුළ කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි නොකළ යුතු බවට සෙසු අය අපේක්ෂා කරති. | 249 | 153 |
| 8 | ඔබගේ ප්‍රජාව තුළ කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් විසින් අනුමත නොකළ යුතු බවට සෙසු අය අපේක්ෂා කරති. | 279 | 133 |
| 9 | ඔබගේ ප්‍රජාව තුළ කාන්තාවන් පොලිස් ස්ථානයන්ට නොයායුතු බවට සෙසු අය අපේක්ෂා කරති. | 296 | 112 |
| 10 | ඔබගේ ප්‍රජාව තුළ කාන්තාවන් ස්වාමිපුරුෂයාට එරෙහිව පැමිණිලි නොකළ යුතු බවට සෙසු අය අපේක්ෂා කරති. | 297 | 112 |

**ප්‍රස්තාරය 4.2**

අන් අය මා කළයුතු බවට බලාපොරොත්තු වන දේ ලෙස මම සිතන දේ? **(Normative Expectations)**




**ප්‍රධාන නිගමන**

- හඳුනාගන්නා ලද සමාජ ප්‍රතිමානයන්හි බලවත්භාවය ආනුභවික අපේක්ෂාවන් සහ ප්‍රතිමානක අපේක්ෂාවන් යන සමාජ ප්‍රතිමානයන්හි සංරචක දෙක විශ්ලේෂණය කිරීම මගින් ඇගයීමට ලක් කර තිබේ. සමාජ අපේක්ෂාවන් අධික ලෙස ස්ථාපිතව පවතින සමාජ ප්‍රතිමාන බලවත් සමාජ ප්‍රතිමාන වශයෙන් හඳුනාගෙන ලැබ තිබේ. ඒ අනුව බලවත්භාවයේ පදනමෙන් ශ්‍රේණිගත කර තිබෙන සමාජ ප්‍රතිමානයන්හි ලැයිස්තුවක් පහත ලබා දී ඇත.

01. කාන්තාවන් පොදු ස්ථානයන් වල වැඩියෙන් කතා නොකළ යුතුය.

02. භාර්යාවන් කුමන හෝ දුකක් විඳ තම පවුල් ජීවිතය ආරක්ෂා කරගත යුතුය.

03. ශාරීරික ශ්‍රමය අධික ලෙස අවශ්‍ය වන වැඩ කටයුතුවල පුරුෂයින් පමණක් යෙදවිය යුතුය.

04. දරුවන් රැක බලාගැනීම කාන්තාවන්ගේ මූලික කාර්යභාරයකි

05. ඉවුම් පිහුම් ගේ දොර වැඩ කටයුතු ප්‍රධාන වශයෙන් කාන්තාවන්ගේ කාර්යභාරයන් වේ.

06. කාන්තාවන් පොලිස් ස්ථානයන්ට නොයා යුතුය.

07. කාන්තාවන් ස්වාමි පුරුෂයන්ට එරෙහිව පැමිණිලි නොකළ යුතුය.

08. කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් විසින් අනුමත නොකරයි.

09. ලිංගික ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් වූ කාන්තාවන් පතිවත අහිමිවූන්ය.

10. කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි නොකරති.

- ස්ථාපිත වී ඇති ප්‍රමාණයට සමාජ ප්‍රතිමාන ශ්‍රේණිගත කිරීමේදීත් බලවත් භාවය අනුව ඒවා ශ්‍රේණිගත කිරීමේදීත් ප්‍රථම ස්ථාන පහම එකම සමාජ ප්‍රතිමානයන් විසින් අත්පත් කරගනී. එබැවින්, ඒවා මෙම පර්යේෂණයේදී හඳුනාගනු ලබන "ඉතා වැදගත් සමාජ ප්‍රතිමාන" බවට පත්වේ.

## 4.4.2 සමාජ ප්‍රතිචාර - සමාජ පිළිගැනීම හා නොසලකා හැරීම

**4.13 වන වගුව**

<table>
<tr><th rowspan="3">අංකය</th><th rowspan="3">ක්‍රියාව (සමාජ ප්‍රතිමානයක් උල්ලංඝනය වීමේදී)</th><th colspan="5">සමාජ ප්‍රතිචාරය</th></tr>
<tr><th>සමාජ පිළිගැනීම</th><th colspan="2">සමාජ නොසලකා හැරීම</th><th rowspan="2">ප්‍රතිචාරයක් නොමැත</th><th rowspan="2">නොදනී</th></tr>
<tr><th>ධනාත්මක</th><th>සෘණාත්මක</th><th>වෙනස් කිරීම සඳහා සෘණාත්මක ලෙස මැදිහත් වේ</th></tr>
<tr><td rowspan="2">1</td><td rowspan="2">පුරුෂයෙකු විසින් තම දරුවන් බලා ගන්නා විටෙක</td><td rowspan="2">164<br>(39.0%)</td><td>159<br>(37.8%)</td><td>31<br>(7.3%)</td><td rowspan="2">57<br>(13.5%)</td><td rowspan="2">9<br>(2.1%)</td></tr>
<tr><td colspan="2">190<br>(45.2%)</td></tr>
<tr><td rowspan="2">2</td><td rowspan="2">කාන්තාවක් තම වෛවාහක/පවුල් ජීවිතය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ඕනෑම දුකක් විඳීමට උත්සාහ නොකරන විටෙක</td><td rowspan="2">80<br>(17.6%)</td><td>238<br>(52.5%)</td><td>84<br>(18.5%)</td><td rowspan="2">36<br>(7.9%)</td><td rowspan="2">15<br>(3.3%)</td></tr>
<tr><td colspan="2">322<br>(71%)</td></tr>
<tr><td rowspan="2">3</td><td rowspan="2">කාන්තාවන් ගේදොර වැඩ කටයුතු සහ ඉවුම් පිහුම් නොකරන විටෙක</td><td rowspan="2">61<br>(13.6%)</td><td>268<br>(59.9%)</td><td>73<br>(16.3%)</td><td rowspan="2">37<br>(8.2%)</td><td rowspan="2">8<br>(1.7%)</td></tr>
<tr><td colspan="2">341<br>(76.2%)</td></tr>
<tr><td rowspan="2">4</td><td rowspan="2">කාන්තාවක් ශාරීරික ශ්‍රමය අධික ලෙස අවශ්‍ය වන වැඩකටයුතු වල නිරත වූ විටෙක</td><td rowspan="2">50<br>(11.8%)</td><td>265<br>(62.9%)</td><td>56<br>(13.3%)</td><td rowspan="2">40<br>(9.5%)</td><td rowspan="2">10<br>(2.3%)</td></tr>
<tr><td colspan="2">321<br>(76.2%)</td></tr>
<tr><td rowspan="2">5</td><td rowspan="2">කාන්තාවක්/ ගැහැණු දරුවෙක් පොදු ස්ථාන වල වැඩියෙන් කතා කළ විටෙක</td><td rowspan="2">84<br>(18%)</td><td>272<br>(58.4%)</td><td>62<br>(13.3%)</td><td rowspan="2">41<br>(8.8%)</td><td rowspan="2">6<br>(1.2%)</td></tr>
<tr><td colspan="2">334<br>(71.8%)</td></tr>
<tr><td rowspan="2">6</td><td rowspan="2">ලිංගික ප්‍රචණ්ඩත්වයට පත් වූ කාන්තාවක්/ ගැහැනු දරුවන් පිළිබඳ සමාජ දෘෂ්ටිය</td><td rowspan="2">56<br>(12.3%)</td><td>284<br>(62.8%)</td><td>71<br>(15.7%)</td><td rowspan="2">34<br>(7.5%)</td><td rowspan="2">7<br>(1.5%)</td></tr>
<tr><td colspan="2">355<br>(78.5%)</td></tr>
<tr><td rowspan="2">7</td><td rowspan="2">කාන්තාවක්/ ගැහැණු දරුවෙක් ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පැමිණිලි කළ විටෙක</td><td rowspan="2">114<br>(25.2%)</td><td>207<br>(45.7%)</td><td>84<br>(18.5%)</td><td rowspan="2">35<br>(7.7%)</td><td rowspan="2">12<br>(2.6%)</td></tr>
<tr><td colspan="2">291<br>(64.3%)</td></tr>
<tr><td rowspan="2">8</td><td rowspan="2">කාන්තාවක්/ ගැහැණු දරුවෙක් ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට ඇයගේ පවුල සහයෝගය දක්වන විටෙක</td><td rowspan="2">65<br>(14.6%)</td><td>267<br>(60.2%)</td><td>68<br>(15.3%)</td><td rowspan="2">34<br>(7.6%)</td><td rowspan="2">9<br>(2.0%)</td></tr>
<tr><td colspan="2">335<br>(75.6%)</td></tr>
<tr><td rowspan="2">9</td><td rowspan="2">කාන්තාවක්/ ගැහැණු දරුවෙක් පොලිස් ස්ථානයක් වෙත ගිය විටෙක</td><td rowspan="2">69<br>(15.4%)</td><td>262<br>(58.7%)</td><td>72<br>(16.1%)</td><td rowspan="2">35<br>(7.8%)</td><td rowspan="2">8<br>(1.7%)</td></tr>
<tr><td colspan="2">334<br>(74.8%)</td></tr>
<tr><td rowspan="2">10</td><td rowspan="2">කාන්තාවක් සිය ස්වාමිපුරුෂයාට එරෙහිව පොලීසියට පැමිණිලි කළ විටෙක</td><td rowspan="2">79<br>(17.2%)</td><td>261<br>(57.1%)</td><td>72<br>(15.7%)</td><td rowspan="2">35<br>(7.6%)</td><td rowspan="2">10<br>(2.1%)</td></tr>
<tr><td colspan="2">333<br>(72.8%)</td></tr>
</table>

**ප්‍රධාන නිගමන**

- ලිංගික ප්‍රචණ්ඩත්වය මගින් පීඩාවට පත් කාන්තාවන් සම්බන්ධයෙන් ප්‍රජාව සෘණාත්මක ප්‍රතිචාර දක්වන බවට පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 78.5%ක් පිළිතුරු ලබාදී තිබුණි. ඒ අනුව උතුරු පළාතේ මෙම සමාජ ප්‍රතිමානය සම්බන්ධයෙන් වැඩිම නොසලකා හැරීමක් දක්නට ලැබේ.

- ඉවුම් පිහුම්, ගේදොර වැඩකටයුතු මූලික වශයෙන් කාන්තාවන්ගේ කාර්යභාරයන් වේ, ලිංගික ප්‍රචණ්ඩත් වයෙන් පීඩාවට පත් කාන්තාවන් ඒ පිළිබඳව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් අනුමත නොකළ යුතුය සහ ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ කටයුතු වල පුරුෂයන් පමණක් යෙදවිය යුතුය යන සමාජ ප්‍රතිමාන උල්ලංඝණය කරමින් කටයුතු කිරීමේදී සමාජය සෘණාත්මක ප්‍රතිචාර දක්වන බව පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 75%කට වඩා අධික පිරිසක් ප්‍රකාශ කළහ.

- කාන්තාවන් පොලිස් ස්ථානවලට නොයා යුතුය, කාන්තාවන් තම ස්වාමිපුරුෂයාට එරෙහිව පැමිණිලි නොකළ යුතුය, කාන්තාවන් පොදු ස්ථාන වලදී වැඩියෙන් කතා නොකළ යුතුය සහ කාන්තාවන් කුමන හෝ දුකක් විඳ ගනිමින් තම පවුල් ජීවිතය ආරක්ෂා කර ගත යුතුය යන සමාජ ප්‍රතිමාන උල්ලංඝනය වීමේ දී සමාජය සෘණාත්මක ප්‍රතිචාර දක්වන බව පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 70%කට අධික පිරිසක් ප්‍රකාශ කළහ.

- කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීමේදී සමාජය සෘණාත්මක ප්‍රතිචාර දක්වන බව පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 64.3%ක් ප්‍රකාශ කළහ.

- කෙසේ නමුත්, පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 45.2% පිරිසක් පුරුෂයන් දරුවන් රැක බලාගන්නා විටෙක සමාජය සෘණාත්මක ප්‍රතිචාර දක්වන බව ප්‍රකාශ කළහ. මෙම කරුණ සම්බන්ධයෙන් දත්ත පිරික්සීම සඳහා පවත්වන ලද හමුවේදී දත්ත එකතුකරන්නන් සමග සාකච්ඡා කරනලදී. වර්තමානයේදී, ස්වාමි පුරුෂයා සහ භාර්යාව යන දෙපාර්ශ්වයම රැකියා සඳහා යන බැවින් පුරුෂයන් ද දරුවන් රැක බලාගැනීමේ කාර්යයෙහි නිරත වන බවත්, එය මේ වන විට සමාජයේ පිළිගැනීමට ලක්වෙමින් පවතින බවත් ප්‍රකාශ විය. කෙසේ නමුත් දරුවන් රැක බලාගැනීම කාන්තාවන්ගේ කාර්යභාරයක් වන බවට වූ සමාජ ප්‍රතිමානය සමාජයේ ස්ථාපිතව පවතින බව පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 81.2%ක පිරිසක් ප්‍රකාශ කරන ලද බව මෙහිදී පෙන්වා දිය යුතුය.

### 4.4.3 සමාජ ප්‍රතිචාරයේ බලපෑම

පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 60%කට අධික පිරිසක්ල හඳුන්වා දී ඇති මෙම සමාජ ප්‍රතිමාන අනුගමනය නොකෙරෙන අවස්ථාවලදී තමන්ට මුහුණදීමට සිදුවන සමාජ නොසලකා හැරීම, සමාජ කො න්කිරීම සහ සමාජ විවේචන යනාදියට බියෙන් බොහෝ පිරිසක් මෙම සමාජ ප්‍රතිමාන අනුගමනය කරන බවට ප්‍රකාශ කළහ.

**ප්‍රධාන නිගමන**

- පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 60%කට අධික ප්‍රමාණයක් සමාජ දඬුවම් කෙරෙහි පවතින බිය හේතුවෙන් සමාජ ප්‍රතිමාන අනුගමනය කෙරන බවට ප්‍රකාශ කර තිබුණි.

## 4.4.4 ව්‍යතිරේක

**4.14 වන වගුව**

| සමාජ ප්‍රතිමානය | ව්‍යතිරේක (නිශ්චිත සමාජ ප්‍රතිමානයකින් අපගමනය විය හැකි අවස්ථා) |
|---|---|
| දරුවන් රැක බලාගැනීම මූලිකවම කාන්තාවන්ගේ කාර්යභාරයක් වේ. | ❖ භාර්යාව අසනීප වී සිටින අවස්ථාවන්හි ස්වාමි පුරුෂයා විසින් සිදු කළ හැකිය<br>❖ භාර්යාවද රැකියාව සඳහා යන අවස්ථාවලදී ස්වාමිපුරුෂයා විසින් සිදුකළ හැකිය |
| භාර්යාවන් කුමන හෝ දුකක් විඳ තම පවුල් ජීවිතය ආරක්ෂා කරගත යුතුය | ❖ ස්වාමිපුරුෂයා අඛණ්ඩව ශාරීරික වශයෙන් වදහිංසා පමුණු වන අවස්ථාවේදී වෙන් විය හැකිය<br>❖ ස්වාමි පුරුෂයා ද්‍රෝහී වන අවස්ථාවකදී වෙන් විය හැකිය |
| ඉවුම් පිහුම්, ගේදොර වැඩ කටයුතු මූලිකව කාන්තාවන්ගේ කාර්යභාරයන් වේ. | ❖ භාර්යාව අසනීප වී සිටින අවස්ථාවන්හිදී ස්වාමි පුරුෂයා විසින් සිදු කළ හැකිය<br>❖ භාර්යාවද රැකියාව සඳහා යන අවස්ථාවන්හිදී ස්වාමි පුරුෂයා විසින් සිදු කළ හැකිය |
| ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ කටයුතු වල පුරුෂයන් පමණක් යෙදවිය යුතුය | ❖ වැන්දඹු කාන්තාවන් ආදායම් උපයාගැනීම සඳහා මෙවැනි වැඩ කටයුතුවල නිරත විය හැකිය<br>❖ කාන්තාවන් සතුව ශාරීරික හැකියාව සහ ඒ සඳහා වන අවශ්‍යතාව පවතින විටක කළ හැකිය |
| කාන්තාවන් පොදු ස්ථානවලදී වැඩියෙන් කතා නොකළ යුතුය | ❖ අයිතිවාසිකම් වෙනුවෙන් කතා කළ හැකිය |
| ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා මගින් විපතට පත්වූ කාන්තාවන් පතිවත අහිමි වූවන් ය | ❖ නිකැළැල් චරිතයකින් යුක්තව සිටින අවස්ථාවකදී බලහත්කාරයෙන් ලිංගික දූෂණයට ලක්කර ඇති විටෙක මෙසේ නොසැලකිය යුතුය |
| කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට එරෙහිව පැමිණිලි නොකරති | ❖ රහසිගතව පැමිණිලි කළ හැකි නම් එසේ පැමිණිලි කළ හැකිය |
| කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් විසින් අනුමත නොකරයි | ❖ උදව්වට කිසිවෙකු නොමැති අවස්ථාවලදී කළ හැකිය |
| කාන්තාවන් පොලිස් ස්ථානයන්ට නොයා යුතුය | ❖ ආරක්ෂිතව යන්නේ නම් යාමට පුළුවන |
| කාන්තාවන් තම ස්වාමිපුරුෂයාට එරෙහිව පැමිණිලි නොකළ යුතුය | ❖ ස්වාමිපුරුෂයා අඛණ්ඩව ශාරීරික වශයෙන් වධහිංසා කිරීමේදී |

## 4.4.5 බලපෑම් කණ්ඩායම්

කිසියම් සමාජ ප්‍රතිමානයක් සමාජයේ ස්ථාපිතව පැවතීම කෙරෙහි බලපෑම් කළ හැකි පුද්ගලයන් හඳුනාගැනීම එම සමාජ ප්‍රතිමාන වෙනස් කිරීම සඳහා සිදුකරන ලබන මැදිහත්වීම් සැලසුම් කරගැනීම සඳහා වැදගත් වේ. ඒ අනුව හඳුනාගෙන ඇති සමාජ ප්‍රතිමාන 10 කෙරෙහි බලපෑම් ඇතිකරන පුද්ගලයන් පිළිබඳ ඇගයීමක් පහත සඳහන් වගුව ආශ්‍රයෙන් සිදුකළ හැකිය.

**4.15 වන වගුව**

| සමාජ ප්‍රතිමානය | මව | පියා | පවුලේ කාන්තා සාමාජිකාවන් | පවුලේ පිරිමි සාමාජිකයන් | ආගමික නායකයින් | අසල්වැසියන් | සමස්ත සමාජය |
|---|---|---|---|---|---|---|---|
| දරුවන් රැකබලා ගැනීම මූලිකවම කාන්තාවන්ගේ කාර්යභාරයක් වේ. | 13.05% | 11.45% | 12.05% | 12.25% | 2.61% | 14.66% | 33.94% |
| භාර්යාවන් කුමන හෝ දුකක් විඳ තම පවුල් ජීවිතය ආරක්ෂා කරගත යුතුය | 17.32% | 13.24% | 12.58% | 11.93% | 5.39% | 11.93% | 27.61% |
| ඉවුම් පිහුම්, ගේ දොර වැඩ කටයුතු මූලිකව කාන්තාවන්ගේ කාර්යභාරයන් වේ. | 10.72% | 10.26% | 12.59% | 13.05% | 2.56% | 13.29% | 37.53% |
| ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ කටයුතු වල පුරුෂයන් පමණක් යෙදවිය යුතුය | 6.78% | 6.07% | 10.28% | 9.58% | 2.34% | 13.79% | 51.17% |
| කාන්තාවන් පොදු ස්ථානවලදී වැඩියෙන් කතා නොකළ යුතුය | 17.89% | 14.09% | 13.01% | 12.47% | 5.01% | 12.33% | 25.20% |
| ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා මගින් විපතට පත්වූ කාන්තාවන් පතිවත අහිමි වූවන් ය | 4.28% | 5.08% | 7.22% | 6.95% | 3.21% | 20.32% | 52.94% |
| කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට එරෙහිව පැමිණිලි නොකරති | 11.34% | 10.05% | 15.46% | 15.21% | 2.06% | 14.43% | 31.44% |
| කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් විසින් අනුමත නොකරයි | 11.81% | 11.56% | 11.56% | 12.06% | 3.52% | 18.09% | 31.41% |
| කාන්තාවන් පොලිස් ස්ථානයන්ට නොයා යුතුය | 11.73% | 10.62% | 10.84% | 11.50% | 3.98% | 15.71% | 35.62% |
| කාන්තාවන් තම ස්වාමිපුරුෂයාට එරෙහිව පැමිණිලි නොකළ යුතුය | 13.79% | 11.73% | 13.58% | 13.79% | 3.50% | 14.61% | 29.01% |

## ප්‍රධාන නිගමන

- සමාජ ප්‍රතිමාන ස්ථාපිතව පැවතීම සම්බන්ධයෙන් ආගමික නායකයින්ගේ බලපෑම ඉතා අවම මට්ටමකින් පවතී.
- සමාජ ප්‍රතිමාන ස්ථාපිතව පැවතීම සම්බන්ධයෙන් සමස්ත සමාජයේම බලපෑම ඉතා අධික ලෙස පවතී.
- කාන්තාවන් පොදු ස්ථානයන් වල වැඩියෙන් කතා නොකළ යුතුය සහ කාන්තාවන් කුමන දුකක් හෝ දරාගනිමින් තම පවුල් ජීවිතය ආරක්ෂා කරගත යුතුය යන සමාජ ප්‍රතිමාන ස්ථාපිතව පැවතීම සඳහා මව් වරුන්ගේ සැලකිය යුතු දායකත්වයක් පවතී.
- සමාජ ප්‍රතිමාන ස්ථාපිතව පැවතීම සඳහා පියවරුන්ගෙන් ලැබෙන දායකත්වයට වඩා මව්වරුන් විසින් ලබාදෙන දායකත්වය මදක් වැඩිය.

## 4.5 හඳුනාගත්, ස්ත්‍රීපුරුෂ සමාජභාවය අනුව වෙනස්කොට සලකනසුළු සමාජ සම්මත පැවතීම සඳහා මූලහේතු

ව්‍යාප්තිය සහ කාලයක සිට පැවතීම යන සාධක අනුව ප්‍රමුඛතා අනුපිළිවෙලට පෙළගස්වාගත් මුල් සමාජ සම්මත දහයට අදාළව හේතු වශයෙන් පර්යේෂණයට සහභාගිවූවන් ලබාදුන් දත්ත පහත වගුවේ දක්වා තිබේ. එම දත්ත ඇගැයුම් කර හේතු පහත දැක්වෙන පරිද්දෙන් ප්‍රමුඛතා අනුපිළිවෙලට සකසා තිබේ. දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රමාණාත්මක අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමවේදය භාවිතා කරන ලදී.

**4.16 වන වගුව**

| සමාජ ප්‍රතිමාන | විශේෂිත හේතු | පොදුවේ බලපාන බිය සහ දෘෂ්ටීන් | මූලහේතු(ව) |
|---|---|---|---|
| කාන්තාවන් ප්‍රසිද්ධියේ වැඩිපුර කථා නොකළ යුතුය | වැඩියෙන් කථාකරන කාන්තාවන් සමාජයේ විවේචනයට පාත්‍ර වේ. 'වාචාල', 'කථා පෙට්ටිය', 'කියවනවා' සහ 'පෙරළිකාරියක්' වැනි යෙදුම් සමාජ විවේචනවලදී භාවිතා වේ. | දෘෂ්ටිය වන්නේ ලජ්ජාබිය කාන්තාවන්ට අත්‍යාවශ්‍ය බවයි | දෙමළ සංස්කෘතිය තුළ කාන්තාවන් තුළ බිය, අහිංසකකම, ලැජ්ජාව සහ සංවේදීතාව යන ගුණාංග හතරම තිබිය යුතු බව විශ්වාස කරන අතර කාන්තාවන් මෙම ගුණාංග අනුගමනය කිරීමට බලාපොරොත්තු වේ.<br><br>සංස්කෘතියට සහ සම්ප්‍රදායට අනුව නිශ්ශබ්දව සිටීම කාන්තාවන්ගේ ප්‍රියජනක ගුණාංගයක් ලෙස සැලකේ<br><br>කාන්තාවන් නිහතමානීව හා නිහඬව සිටිය යුතු බව මුතුන් මිත්තන් ප්‍රකාශ කර ඇත |
| | ගැහැණු ළමුන් වැඩිපුර කථා නොකළ යුතු ය යන මවුපියන් පනවන සීමාකිරීම බොහෝවිට මව විසින් ලබා දෙන මාර්ගෝපදේශයකි. | දෘෂ්ටිය වන්නේ ගැහැනු ළමයින් වැඩිපුර කතා කළ හොත් පවුලේ ගෞරවය බිඳ වැටෙනු ඇතැයි යන්නය. | |
| | වැඩිපුර කථා කරන ගැහැණුන්ට හොඳ සැමියෙක් නොලැබේ/ විවාහ වන්නට නොලැබේ | දෘෂ්ටිය වන්නේ වැඩිපුර කථාකරන ගැහැණුන්ගේ හැසිරීම නරක බවකි. | කාන්තාවන් ප්‍රසිද්ධ ක්ෂේත්‍රයේ සක්‍රියවීම පිළිබඳව පිරිමින් අකමැති ය |
| | පිරිමින් කාන්තාවන්ට පොදු ස්ථානවල කතා කිරීමට ඉඩ නොදේ. පොදු ක්ෂේත්‍රය තුළ පිරිමින් වැඩි බලපෑමක් කරන බැවින් කාන්තාවන්ට තම අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් නොලැබේ | | |

| | | | |
|---|---|---|---|
| | ළමයින්ගේ මානසික සෞඛ්‍ය සහ අනාගත ජීවිතය, යුග දිවිය ගැන සිතිය යුතුය | ළමයින්ගේ නාමයෙන් ඕනෑම දුකක් වේදනාවක් විඳ දරාගැනීමේ ලක්ෂණය කාන්තාවන්ට තිබිය යුතුය යන අදහස | |
| | කාන්තාවන් එසේ වියයුතු යැයි සමාජය අපේක්ෂා කරයි. ඒ අපේක්ෂාව බිඳහෙළීම සමාජයේ විවේචන සහ සමාජයෙන් ප්‍රතික්ෂේප වීමට මගපාදයි. බොහෝවිට, තම සැමියාගෙන් වෙන් වූ කතුන් පිළිබඳ සඳහන් කිරීමට යොදගන්නේ 'වේලාවෙට්ටි' එනම් තමන්ගේ ජීවිතය අහිමිකරගත් තැනැත්තිය, සහ 'ආඩුකාලි' එනම් පෙරළිකාරිය යන වචන ය. | සමාජයෙන් ප්‍රතික්ෂේප වීමත් සමගින් සමාජයෙන් තමන්ට ලැබුණු ආරක්ෂාව අහිමි වේ යැයි බිය. තමන්ට ප්‍රශ්නයක් ඇතිවූ අවස්ථාවලදී සමාජයේ පුද්ගලයින් තමන්ට උදවු නොකරාවි යැයි බිය | සම්ප්‍රදාය සහ සංස්කෘතිය පදනම් කරගෙන කාන්තාවන් යම් ආකාරයකට ක්‍රියා කළ යුතුය<br><br>දුක් වේදනා ඉවසා සිටීම කාන්තාවන්ගේ අභිමානය බව සංස්කෘතික හා සාම්ප්‍රදායික කථාවලින් පැහැදිලි වේ.<br><br>සංස්කෘතික සම්මතවලට අනුව කාන්තාවන් පවුලේ ගැටලු ඉවසා සිටිය යුතුය. |
| | පවුල් ප්‍රශ්න පිටතට නොදිය යුතුය යන අදහස | පවුලේ ගැටළු පිට අය දැනගතහොත් විනාශ වන්නේ කාන්තාවන්ගේ ගෞරවය යන අදහස | |
| **කුමක් වුවත් කාන්තාවන් තමන්ගේ පවුල් ජීවිතය රැකගත යුතුය** | වෙනම ජීවත් වුවහොත් කාන්තාවන්ට ආර්ථික ගැටළුවලට මුහුණ දෙන්නට සිදුවේ. කාන්තාවන් ආර්ථික වශයෙන් ස්වාධීන නොවන බැවින් සෑමවිටකම ඔවුන්ට සැමියාගේ ආර්ථික සහය අවශ්‍ය වේ.<br><br>වෙනම ජීවත් වීමේදී තමන්ට සහ තම දරුවන්ට සැමියාගෙන් ආර්ථික සහය (නඩත්තු වියදම්) ලබාගැනීම සඳහා ඇති නීති ප්‍රතිපාදන අභියෝගාත්මකය. | කාන්තාවන්ගේ ආර්ථික ස්වාධීනත්වය අනවශ්‍ය ලෙස සැලකීම | කාන්තාවන් රැකියාවක් කළ යුතු නැතැයි සහ නිවසේ වැඩකටයුතු සිදුකිරීම ප්‍රමාණවත් යැයි යන සාම්ප්‍රදයික සම්මතය |
| | කාන්තාවක් වෙනම ජීවත් වීම ආරක්ෂාව පිළිබඳ ගැටළු ඇති කරයි. කාන්තාවට සහ ඇගේ දරුවන්ට සමාජයේ අනෙක් අයගෙන් ලිංගික හිරිහැරවලට මුහුණ දීමට සිදු විය හැකිය. | තම ස්වාමිපුරුෂයා සමඟ ජීවත් නොවන කාන්තාවන් ලිංගික ආශාවන්ට ගොදුරු විය හැකිය යන අදහස | පුරුෂයින් යනු කාන්තාවන්ගේ ආරක්ෂකයින් යැයි පිළිබිඹු කිරීමේ සාම්ප්‍රදය. කාන්තාවන් සෑම විටකම තමන්ගේ පියා, සහෝදරයා, ස්වාමි පුරුෂයා හා පුතා වැනි පිරිමියකුගේ භාරකාරීත්වය යටතේ සිටිය යුතුය යන සම්මතය. |

| | | | |
|---|---|---|---|
| **කය වෙහෙසා කළ යුතු වැඩෙහි නිරතවිය යුත්තේ පිරිමින් පමණි** | කාන්තාවන් ශාරීරිකව දුර්වල යැයි සැලකීම, සහ ගර්භණී සහ ආර්තව කාලයේ දී ඇයට බර වැඩ කිරීමට නොහැකිවීම/ දුෂ්කරවීම | ජෛවවිද්‍යාත්මක හේතු මත කාන්තාවන් දුර්වල හා පහසුවෙන් බිඳෙනසුළු ය යන අදහස | මෘදු ගතිය යනු කාන්තා ලක්ෂණයක් ය යන සාම්ප්‍රදය සහ සංස්කෘතිය |
| | සමාජයේ විවේචනවලට බියවීම. කය වෙහෙසා වැඩ කරන කාන්තාවන් බොහෝවිට 'පිරිමින් වාගේ' යනුවෙන් විවේචනයට ලක් වේ. | | |
| **ළමයින් රැකබලා ගැනීම ප්‍රධාන වශයෙන් ම කාන්තාවන්ගේ කාර්යයකි** | කාන්තාවන් විසින් රැකබලාගනු ලැබීම ළමයින්ගේ සුබසෙතට වඩාත්ම සුදුසු වේ. | ළමයින් රැකබලාගැනීමට අවශ්‍ය උපලක්ෂණ/ හැකියාව (මවුකිරි දීම, ඉවසීම,දරා සිටීම, කැපකිරීම) කාන්තාවන්ට ඇති බැවින් එම කාර්යය ප්‍රධාන වශයෙන් ම කාන්තා වන්ගේ කාර්යයක් ලෙස සලකනු ලැබේ | සංස්කෘතික හා සාම්ප්‍රදායික භාවිතයට අනුව, දරුවන් වැදීම (මාතෘත්වය ලබා ගැනීම) සහ ඔවුන් ඇති දැඩි කිරීම කාන්තාවන්ගේ අනන්‍යතාවය ලෙස සැලකේ (ස්ත්‍රීත්වය) |
| | ළමයින් රැකබලාගැනීම සඳහා කාලය ඇත්තේ කාන්තාවන්ට පමණි. කාන්තාවන් රැකියාවට නොයන විට, ඔවුන් අතේ වැඩි කාලයක් ඉතිරි වනු ඇත. මේ අනුව, ඔවුන්ට දරුවන් රැකබලා ගත හැකිය. | කාන්තාවන්ගේ ආර්ථික ස්වාධීනත්වය අනවශ්‍ය දෙයක් ලෙස සැලකීම. | කාන්තාවන් රැකියාවක් කළ යුතු නැතැයි සහ නිවසේ වැඩකටයුතු සිදුකිරීම ප්‍රමාණවත් යැයි යන සාම්ප්‍රදයික සම්මතය |
| | දරුවන්ගේ (විශේෂයෙන් ගැහැණු ළමයින්ගේ) ආරක්ෂාව සැලකිල්ලට ගෙන, කාන්තාවන් දරුවන් රැකබලා ගත යුතුය. | පිරිමින් පිළිබඳ ඇති සැකය. ගැහැණු ළමයින් ලිංගික අපයෝජනයට ලක් වේ යැයි බිය. මත්ද්‍රව්‍ය භාවිතය වැඩිවීම නිසාත් මේ බිය වැඩි වේ. | දරුවන් තම පියාගෙන් හෝ සමීපතම පිරිමි ඥාතීන්ගෙන් ලිංගික අතවරවලට ලක්වීමේ සමාජ ප්‍රචණ්ඩත්වය ඉහළ ගොස් තිබීම. |

| | | | |
|---|---|---|---|
| | සමාජ ව්‍යුහය අනුව, ආහාර පිසීම සහ ගෙදරදොරේ වැඩ කටයුතු කාන්තාවන් විසින් සිදුකළයුතු යැයි බලාපොරොත්තු වීම | 'පිරිමි වැඩට යන අතරේ කාන්තාවන් නිවසේ සිටී' යන අදහස මුල්බැසගෙන තිබීම | පුරුෂයින් ඉහළ තැනක ලා ගරුත්වයෙන් යුතුව සලකන අතර කාන්තාවන්ට දෙවන තැන ලබාදීම **(කිකිළිය හැඬලූවොත් ඉර නොපායයි ප්‍රස්තා පිරුළකි)**<br><br>කෑම පිසීම සහ ගෙදරදොර වැඩ කටයුතු පහත් කොට සැලකීම සහ මෙහෙකරුවන් කරන වැඩ වශයෙන් සැලකීම |
| | කාන්තාවන්ට හොඳින් ඉවුම්පිහුම් කළ හැකි වීම | කාන්තාවන්ගේ ආර්ථික ස්වාධීනත්වය අනවශ්‍ය දෙයක් ලෙස සැලකීම. | කාන්තාවන් විසින් ආහාර පිසීම සාම්ප්‍රදායික ව්‍යවහාරයක් වී තිබීම |
| **ආහාර පිසීම සහ ගෙදරදොරේ වැඩ කටයුතු ප්‍රධාන වශයෙන්ම කාන්තාවන්ගේ කාර්යයන් ය** | කාන්තාවන්ට ආහාර පිසීම සහ ගෙදර දොරේ වැඩ සඳහා කාලය තිබේ. රැකියාවට නොයන විට කාන්තාවන්ට වැඩි කාලයක් ඇති බැවින් ඔවුන්ට ආහාර පිසීමට හා ගෙදර දොරේ අනෙකුත් වැඩ කිරීමට හැකිය | කාන්තාවන්ගේ ආර්ථික ස්වාධීනත්වය අනවශ්‍ය දෙයක් ලෙස සැලකීම. | කාන්තාවන් රැකියාවක් කළ යුතු නැතැයි සහ නිවසේ වැඩකටයුතු සිදුකිරීම ප්‍රමාණවත් යැයි යන සාම්ප්‍රදායික සම්මතය **(වැඩ කිරීම පිරිමින්ගේ අනන්‍යතාවයයි ප්‍රස්තා පිරුළකි)** |
| | පොලිසියට යන කාන්තාවන් සමාජයේ විවේචනයට හා නින්දාවට ලක් වේ | කාන්තාවන් පොලිස් ස්ථානයට ගියොත් ඉන් ඔවුන්ගේ සමාජ ගෞරවයට හානි වේ ය යන අදහස.<br><br>පොලිස් ස්ථානයට යන්නේ සදචාරයක් නොමැති ගැහැණුන් ය යන අදහස. | පොලිසියට යන කාන්තාවන් සංස්කෘතික වශයෙන් පිළිගැනීමට ලක් නොකිරීම<br><br>පොලිසියට යන කාන්තාවන් හොඳ කාන්තාවන් නොවේ ය යන සම්ප්‍රදාය. |
| **කාන්තාවන් පොලිස් ස්ථානයට නොයා යුතුය** | කාන්තාවන් පොලිස් ස්ථානයට නොයා යුතුය යන්න නියම කරන මවුපියන්ගේ පාලනය/ මගපෙන්වීම | පවුලේ ගෞරවයට ඉන් හානියක් වේය යන අදහස<br><br>නිතර පොලිස් ස්ථානයට යන එන කාන්තාවකට හොඳ සැමියෙක් ලබාගැනීමට නොහැකි වේ | |
| | ආරක්ෂාව සම්බන්ධ ගැටළු | පොලිසිය අතින් කාන්තාවන් ලිංගික අතවරවලට ලක් වේය යන බිය. | යුද්ධය කාලයේ දී පොලීසිය විසින් නීති විරෝධී ලෙස අත් අඩංගුවට ගැනීම සහ ලිංගික වධහිංසාවට ලක් කිරීමෙන් ඇති වූ බලපෑම<br><br>පොලිස් නිලධාරීන් විසින් කාන්තාවන්, විශේෂයෙන්ම තනිවම ජීවත් වන/ආබාධිත කාන්තාවන් ලිංගික සූරාකෑමට ලක් කිරීමේ නැඹුරුව |

| | | | |
|---|---|---|---|
| කාන්තාවන් තම ස්වාමිපුරුෂයාට එරෙහිව පැමිණිලි නොකළ යුතුය | සමාජ ප්‍රතික්ෂේප කිරීම් සහ සමාජ විවේචනවලට මුහුණ දීමට සිදුවීමේ ඉඩකඩ | සමාජ ආරක්ෂාව අහිමි වේ යැයි බිය<br>පවුලේ ගරුත්වය | පුරුෂයා කුමක් කීවත් කළත් හොඳ කාන්තාවක් එය ඉවසා සිටින්නේ ය යන සංස්කෘතික වටිනාකම සහ සම්ප්‍රදායික ව්‍යවහාරය **(ගලක් වුවත් බට පඳුරක් වුවත් සැමියා සැමියා ම ය ප්‍රස්තා පිරුලක්)**<br><br>හොඳ බිරිඳක් යනු ස්වාමිපුරුෂයාට යටත් කාන්තාවක් ය යන සංස්කෘතික වටිනාකම සහ සම්ප්‍රදායික ව්‍යවහාරය **(සැමියා බිරිඳගේ දෙවියාය ප්‍රස්තා පිරුලකි)** |
| | පවුල / දෙමාපියන් විසින් පාලනය / මග පෙන්වීම | නැති වී යනු ඇතැයි බිය. ස්වාමි පුරුෂයාට විරුද්ධව පැමිණිලි කිරීම නරක පුරුද්දක් වශයෙන් සැලකීම | |
| | පවුලේ සමගිය විනාශ වේ. ස්වාමිපුරුෂයා සහ භාර්යාව අතර ස්ථිර වෙන්වීමක් නිර්මාණය වනු ඇත. | බිරිඳ විසින් තමන්ට එරෙහිව පොලිසියේ පැමිණිල්ලක් කිරීම ස්වාමිපුරුෂයින් විසින් මහා අපරාධයක් ලෙස සැලකීම.<br><br>හොඳ බිරිඳක් යනු තමන් කරන කියන ඕනෑම දෙයක් ඉවසන්නියක් යන පිරිමි ආකල්පය. | |
| | ස්වාමිපුරුෂයා හිරිහැරයක් හෝ ජීවිතයට තර්ජනයක් ඇති කරනු ඇතැයි යන බිය | | |
| ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තා කිරීමට පවුලෙන් කාන්තාවන්ට ඉඩ නොදීම | සමාජය විවේචනය කරනු ඇතැයි/ අපහාස කරනු ඇතැයි සහ ප්‍රතික්ෂේප කරනු ඇතැයි සිතීම | පවුලේ ගරුත්වය නැතිවීම | පවුලේ ගෞරවය රැඳී පවතින්නේ පවුලේ කාන්තාවන්ගේ නිර්මලත්වය මත ය යන සංස්කෘතික වටිනාකම ලිංගික අපයෝජනයට ලක් වූ කාන්තාවන් අපවිත්‍රය, හෝ ඔවුන් නිර්මල නැත හෝ කැළැල්වී ඇත යන සංකල්පයේ සංස්කෘතිකමය බලපෑම **(රාමායණයේ රාවණාගේ ග්‍රහණයෙන් මුදවාගත් තම බිරිඳ වන සීතාට අග්නි පරීක්ෂාවට මුහුණ දී තමන්ගේ පවිත්‍රබව ඔප්පු කරන මෙන් රාමා පවසයි)**<br><br>ලිංගික අපයෝජන යනු ශාරීරික හානි වශයෙන් පමණක් නොදැක ඒවා සදාචාරය සමගින් බද්ධ කරගැනීමේ සංස්කෘතික නැඹුරුව |
| | ඔවුන් විවාහක කතුන් නම්, විවාහයේ ප්‍රශ්න/ බේදීම් ඇති වේ යැයි බිය | ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ වින්දිත කාන්තාවක් භාර්යාව වශයෙන් භාරගැනීමට/ නඩත්තු කිරීමට පුරුෂයින් හෝ පවුලේ අය අකමැතිවීම | |
| | ඔවුන් අවිවාහක කතුන් නම්, විවාහයට බාධා වේ / හොඳ සැමියකු සොයාගැනීමට නොහැකි වේ යන බිය | | |

| | | | |
|---|---|---|---|
| **කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තා නොකළ යුතුය** | සමාජය විවේචනය කරනු ඇතැයි/ අපහාස කරනු ඇතැයි සහ ප්‍රතික්ෂේප කරනු ඇතැයි සිතීම | පවුලේ ගරුත්වය නැතිවීම යන බිය | පවුලේ ගෞරවය රැඳී පවතින්නේ පවුලේ කාන්තාවන්ගේ නිර්මලත්වය මත ය යන සංස්කෘතික වටිනාකම ලිංගික අපයෝජනයට ලක් වූ කාන්තාවන් අපවිත්‍රය, හෝ ඔවුන් නිර්මල නැත හෝ කැළැල්වී ඇත යන සංකල්පයේ සංස්කෘතිකමය බලපෑම **(රාමායණයේ රාවණාගේ ග්‍රහණයෙන් මුදවාගත් තම බිරිඳ වන සීතාට අග්නි පරීක්ෂාවට මුහුණ දී තමන්ගේ පවිත්‍රබව ඔප්පු කරන මෙන් රාමා පවසයි)**<br><br>ලිංගික අපයෝජන යනු ශාරීරික හානි වශයෙන් පමණක් නොදැක ඒවා සදාචාරය සමගින් බද්ධ කරගැනීමේ සංස්කෘතික නැඹුරුව |
| | ඔවුන් විවාහක කතුන් නම්, විවාහයේ ප්‍රශ්න/ බේදීම් ඇති වේ යැයි බිය | ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ වින්දිත කාන්තාවක් භාර්යාව වශයෙන් භාරගැනීමට/ නඩත්තු කිරීමට පුරුෂයින් හෝ පවුලේ අය අකමැතිවීම | |
| | ඔවුන් අවිවාහක කතුන් නම්, විවාහයට බාධා වේ / හොඳ සැමියකු සොයාගැනීමට නොහැකි වේ යන බිය | | |
| | තමන්ට යුක්තිය ලැබේ යැයි විශ්වාසයක් නොමැතිවීම | යුක්තියේ ප්‍රමාදයන් | අපරාධ යුක්ති පද්ධතියේ හිදැස් සහ අඩුපාඩු |
| | වින්දිතයින් තව තවත් වින්දිතභාවයට පත් කරවන නීතිමය කාර්යපටිපාටි | මෙවැනි සිදුවීම් සම්බන්ධයෙන් කටයුතු කරන නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදීතාවයක් නොමැතිව කටයුතු කිරීම | |
| ලිංගික ප්‍රචණ්ඩත්වයේ වින්දිතයින් වූ කාන්තාවන් අපවිත්‍රය | කන්‍යාභාවය අහිමිවීම.<br><br>සමාජය 'පිරිසිදුකම නැති වූ තැනැත්තිය' වශයෙන් ඇය හැඳින්වීම | තමන්ගේ ස්වාමිපුරුෂයා නොවන පිරිමියකු අතින් කාන්තාවකගේ කන්‍යාභාවය අහිමි වුවහොත් ඇය පිරිසිදුකම නැති වූ කාන්තාවක් වශයෙන් සලකයි | ලිංගික අපයෝජනයට ලක් වූ කාන්තාවන් අපවිත්‍රය, හෝ ඔවුන් නිර්මල නැත හෝ කැළැල්වී ඇත යන සංකල්පයේ සංස්කෘතිකමය බලපෑම **(රාමායණයේ රාවණාගේ ග්‍රහණයෙන් මුදවාගත් තම බිරිඳ වන සීතාට අග්නි පරීක්ෂාවට මුහුණ දී තමන්ගේ පවිත්‍රබව ඔප්පු කරන මෙන් රාමා පවසයි)**<br><br>ලිංගික අපයෝජන යනු ශාරීරික හානි වශයෙන් පමණක් නොදැක ඒවා සදාචාරය සමගින් බද්ධ කරගැනීමේ සංස්කෘතික නැඹුරුව |

### සොයාගත් ප්‍රධාන කරුණු

☞ සමාජයෙන් ප්‍රතික්ෂේප කිරීම සහ සමාජ විවේචනය සමාජ සම්මතයන් බහුතරයක ව්‍යාප්තිය සඳහා ප්‍රධාන හේතු වී තිබේ. මෙම සමාජ ප්‍රතික්ෂේප කිරීම්/සමාජ විවේචන වර්තමානයේ දී ද සමාජ මාධ්‍ය හරහා නිතර හුවමාරුවීම විශේෂත්වයකි. එපමණක් නොව, මෙම සමාජ සම්මතවල පැතිරීම සහ කාන්තාවන්ගේ විවාහ අපේක්ෂාවන් හෝ විවාහ ජීවිතය කෙරෙහි ඒවායේ බලපෑම අතර සමීප සම්බන්ධතාව පැහැදිලිව දැකගත හැකිය.

☞ පවුලේ අය විසින් පාලනය කිරීම සහ දෙමාපියන්ගේ මග පෙන්වීම ද මෙම සමාජ සම්මත බහුතරයක පැතිරීමට ප්‍රධාන හේතු වී තිබේ.

☞ සාධාරණීකරණය සඳහා ඉදිරිපත් කරන චිත්තවේගීය හේතු අතර, කාන්තාවන්ගේ ගුණාංග ප්‍රධාන තැනක් ගෙන ඇත. කාන්තාවන්ගේ ඉවසීම, ඔවුන්ගේ කරුණාව සහ දරා සිටීම වැනි ගුණාංග යම් යම් සමාජ සම්මත සාධාරණීකරණය කිරීමට යොදාගෙන ඇත. කෙසේ වෙතත්, කාන්තාවන්ට මෙම ඉවසීම සහ සංවේදීතාව යන ගුණාංග ඇති බව හෝ පිරිමින්ට මෙම ගුණාංග නොමැති බව හෝ ඒවා අඩු මට්ටමක පවතින බව කීමට ජීව විද්‍යාත්මක පදනමක් නොමැත. මේ සියලු ගුණාංග පීතෘමූලික සමාජය විසින් විවිධ අරමුණු සඳහා සමාජීය වශයෙන් ගොඩ නගන ලද ඒවා වේ.[71]

☞ 'විවාහ ජීවිතයට බාධා ඇති වේ ය' යන්න චිත්තවේගී තර්කයක් ලෙසත් නිශ්චිත හේතුවක් ලෙසත් භාවිත කරන කරුණකි. මෙම හේතුන් විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ නිශ්චිත සමාජ සම්මත වලින් බැහැරවීම විවාහ ජීවිතයට බාධාවක් හා තර්ජනයක් වන බවයි. 'කාන්තාවක් කෙසේ විය යුතුද' යන්න පිළිබඳ පිරිමින් දරන ආකල්ප සංස්කෘතික වටිනාකම් සහ සාම්ප්‍රදායික සිරිත් විරිත්වල ආධිපත්‍යයට නතු වී ඇති බව මෙයින් පැහැදිලිව පෙනේ. පිරිමින්ගේ මෙම ආකල්ප "විවාහයට බාධක" ලෙස කාන්තාවන්ට එරෙහි ස්ත්‍රීපුරුෂ සමාජභාවය අනුව වෙනස්කොට සලකන සුළු මෙම සමාජ සම්මත ප්‍රචලිතවීමට දායක වන බව පැහැදිලිය.

☞ 'කාන්තාවක් කෙසේ විය යුතුද' යන්න නියම කරන සංස්කෘතික වටිනාකම් සහ සාම්ප්‍රදායික සිරිත් විරිත් යම් යම් හේතු සහ චිත්තවේගීය සාධාරණීකරණ සඳහා බොහෝ විට මූලිකතම හේතුව වේ.

☞ අපරාධ යුක්ති අධිකරණ පද්ධතියේ ඇති හිඩැස් සහ අඩුපාඩු, රජයේ ආයතනික ව්‍යුහ හා පද්ධතිවල ඇති ගැටළු සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ රජයේ නිලධාරීන්ගේ සංවේදීතාවය ඇතැම් සමාජ සම්මතවල පැතිරීමට දායක වන මූලික සාධක ලෙස හඳුනාගෙන ඇත.

---

*71* Vithanage, 'Understanding the Nature and Scope of Patriarchy in Sri Lanka: How Does it Operate in the Institution of Marriage?' (2015) available at: https://repository.stcloudstate.edu/socresp_etds/3/ accessed 3 January 2021

## 4.6 හඳුනාගන්නා ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන කාන්තා අයිතිවාසිකම් හා නිදහස කෙරෙහි බලපෑම් එල්ල කරන ආකාරය තාර්කික විශ්ලේෂණය

ඉහත හඳුන්වාදෙන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ ප්‍රධාන සමාජ ප්‍රතිමාන වර්තමානයේ කාන්තාවන්ගේ සහ ගැහැනු දරුවන්ගේ ජීවිත කෙරෙහි බලපෑම් එල්ලකරන ආකාරය සහ ඒවා කාන්තාවන් සහ ගැහැනු දරුවන්ට ඔවුන්ගේ නිදහස සහ අයිතිවාසිකම් සාක්ෂාත් කරගැනීම හා ජීවිතයේ විවිධ ක්ෂේත්‍රයන්හි ඉදිරියට යාම සඳහා බාධා ඇතිකරන ආකාරය තාර්කිකව විශ්ලේෂණය කිරීම මෙම කොටසෙහි අරමුණ වේ. ඒ අනුව හඳුනාගන්නා ලද මෙම ප්‍රධාන සමාජ ප්‍රතිමාන විසින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා නිදහස කෙරෙහි ඇතිකරන බලපෑම සලකා බැලීම සඳහා ඒවා කොටස් දෙකකට වර්ගීකරණය කරනු ලැබේ.

1. කාන්තාවන්ගේ කාර්යභාරයන් පවුල් පරිසරයට පමණක් සීමා කරන්නාවූ සමාජ ප්‍රතිමාන
2. "චරිතවත් කාන්තාව" සහ "අදූෂිත/පතිවෘත කාන්තාව" යනාදී අදහස් පදනම් කරගනිමින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා නිදහස සීමා කරන්නාවූ සමාජ ප්‍රතිමාන.

මෙම ප්‍රධාන සමාජ ප්‍රතිමාන හැර, විශේෂයෙන් කාන්තාවන්ගේ වෘත්තීය නිදහස සහ ආගමික නිදහස සීමාකරන සමාජයේ ස්ථාපිත වෙනත් සමාජ ප්‍රතිමාන සහ ඒ මගින් ඇතිකෙරෙන බලපෑම් සම්බන්ධයෙන් ද සාකච්ඡා කර තිබේ.

3. කාන්තාවන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සීමාකරන භාවිතයන්/ සමාජ ප්‍රතිමාන
4. කාන්තාවන්ගේ ආගමික නිදහස සීමාකරන භාවිතයන්/සමාජ ප්‍රතිමාන

### 4.6.1 කාන්තාවන්ගේ කාර්යභාරයන් පවුල් පරිසරයට පමණක් සීමා කරන්නාවූ සමාජ ප්‍රතිමාන

**"වෙලාවකටමට හිතෙනවා මගේ මුළු ජීවිතයම කුස්සියටම සීමා වුණා කියලා. මගේ මහත්තයා ගෙදර වැඩවලට මට ටිකක් උදව් කරලා තිබුන නම්, මට ගොඩක් දේවල් කරගන්න තිබුන කියල හිතෙනවා."** පර්යේෂණයට සහභාගි වූ කාන්තාවක්, කිලිනොච්චිය දිස්ත්‍රික්කය

හඳුනාගන්නා ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන අතරින් පහත සඳහන් ප්‍රතිමාන කාන්තාවන්ගේ කාර්යභාරයන් පවුල් පරිසරයට පමණක් සීමා කරන්නා වූ ඒවා බවට පත්ව තිබේ.

- දරුවන් රැක බලාගැනීම මූලිකව කාන්තාවන්ගේ කාර්යභාරයකි.
- ඉවුම්පිහුම්, ගේදොර වැඩ කටයුතු මූලිකවම කාන්තාවන්ගේ කාර්යභාරයන් වේ.

එහි ප්‍රතිපලයක් වශයෙන් අපට ඔවුන්ගේ නිදහස සහ අයිතීන් උල්ලංඝනය වී ඇති ආකාරය පහත දක්වා ඇති ආකාරයට නිරීක්ෂණය කල හැකි වේ.

## ➤ කාන්තාවන්ගේ ආර්ථික ස්වාධීනත්වය ප්‍රතික්ෂේප කිරීම

**'මගේ දරුවා හදාගන්න ඕන නිසා මම මගේ රස්සාවෙන් ඉල්ලා අස්වුණා. ඊට පස්සෙ හැමදේකටම මහත්තයා මත යැපෙන්න සිදුවුණා. මගේ පවුලට කුමන හෝ දෙයක් කරන්න ඕන කියලා කැමැත්තක් තිබුණත් මහත්තයගෙන් අහන්න පොඩි පැකිලීමක් තිබෙනවා. මේක ඉතාමත්ම වේදනාකාරී තත්වයක්'.**

පර්යේෂණයට සහභාගීවූ කාන්තාවක් මන්නාරම දිස්ත්‍රික්කය විවාහයෙන් අනතුරුව පවුල් වගකීම් සහ දරුවන් රැකබලා ගැනීමේ අවශ්‍යතාව මත රැකියාවෙන් ඉල්ලා අස්වූ බොහෝ කාන්තාවන් විසින් ආර්ථිකමය වශයෙන් තමන් දැඩි අසීරුතාවකට පත්වී සිටින බව ප්‍රකාශ කරන ලදී. කාන්තාවන්ගේ ආර්ථික ස්වාධීනත් වය ඔවුන්ගේ සෙසු සියලු අයිතිවාසිකම් ළඟාකර ගැනීම සඳහා මූලික වන්නේය. උදාහරණයක් ලෙස, ආර්ථික වශයෙන් ශක්තිමත් නොවීම හේතුවෙන් බොහෝ කාන්තාවන් තමන්ට එරෙහිව සිදුවන විවිධ අකටයුතුවලට එරෙහිව නඩු පැවරීමෙන් වැළකී සිටින බව පර්යේෂණ පෙන්වා දෙයි.[72] මෙලෙස නඩු පැවරීම සඳහා මූල්‍ය හැකියාවක් නොමැති පීඩාවට පත් කාන්තාවන් හට ආධාර සැපයීම සඳහා වන බලය නීති ආධාර කොමිෂන් සභාවට තිබුණද එම සේවාවන් එකී අවශ්‍යතා සහිත සියලු කාන්තාවන්ට ලබා ගැනීමට හැකි වන්නේ නැත.

**'ඔහු මට පහර දෙන අවස්ථාවලදී මම පොලිසි යන්නෙ නෑ. එයාව පොලිසියෙන් අත්අඩංගුවට ගත්තොත් මටයි මගේ දරුවන්ටයි කන්න බොන්න දෙන්නෙ කවුද?'** පර්යේෂණයට සහභාගී වූ කාන්තාවක්, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් කාන්තාවන් සඳහා වන කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාව.[73]

එසේම, ආර්ථික ස්වාධීනත්වයක් නොමැතිව ස්වාමිපුරුෂයා මත/නිවැසියන් මත යැපෙමින් ජීවත්වන කාන්තාවෝ, ස්වාමිපුරුෂයන් අපයෝජනය කළ ද එය ඉවසා ජීවත් විය යුතු තත්ත්වයකට පත්වෙති. කාන්තාවන් ආර්ථික වශයෙන් ස්වාධීන නොවන විටක ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සිදුවීම් ඇතිවීමේ ප්‍රවනතා වැඩි වශයෙන් පවතින බව ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් කාන්තාවන් සඳහා වන කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාවට සහභාගීවූ කාන්තාවෝ ප්‍රකාශ කළහ. එසේම, කාන්තාවන් සඳහා ආර්ථික ස්වාධීනත්වය ප්‍රතික්ෂේප කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 ව්‍යවස්ථාව[74] මගින් තහවුරු කර ඇති වෘත්තීය අයිතිවාසිකම් ඇතුළු ඔවුන් සඳහා වන අධ්‍යාපන අයිතිවාසිකම් (උසස් අධ්‍යාපනය හෝ වෘත්තීය අධ්‍යාපනය) සහ ඔවුන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කිරීම සඳහා වන අයිතිය ද ප්‍රතික්ෂේප කෙරේ.

## ➤ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සඳහා මූලබීජ වපුරයි

**'දේශපාලනයේ නිරත කාන්තාවන්ගේ හැසිරීම සම්බන්ධයෙන් සෑම විටම නිෂේධාත්මක විවේචන ඉදිරිපත් කෙරෙනවා'** පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරියක් පුහුණුකරුවන් සඳහා වන වැඩමුළුව.[75]

දරුවන් රැක බලාගැනීම සහ ඉහුම් පිහුම්/ගේදොර වැඩකටයුතු කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාරය වේ යන සමාජ ප්‍රතිමානය, කාන්තාවන් පවුල් පරිසරයට සීමාවූවන් සහ කාන්තාවන් පවුල නැමැති වෘත්තයෙන් පිටතට නොපැමිණිය යුතුය නැතහොත් පවුල නැමැති සීමාවෙන් බැහැර වී පොදු ක්ෂේත්‍රයේ කටයුතු කරන කාන්තාවන් හොඳ කාන්තාවන් නොවේය යන වැරදි මතවාද සමාජය තුළ බිහිකිරීමට මූල බීජ වපුරයි. කාන්තාවන් පවුල නැමැති සීමාව තුළ පමණක් ක්‍රියාත්මක වීමට හිමිකම් ඇති තැනැත්තියන් වශයෙන් සැලකෙන බැවින් ඔවුන් කොටුකර ඇති පවුල නැමැති වෘත්තයෙන් බැහැරවී පොදු ක්ෂේත්‍රය තුළට පැමිණීම පිළිනොගන්නා දෙයක් බවටත් එලෙස කටයුතු කරන කාන්තාවන් ප්‍රචණ්ඩත්වයට ලක්කිරීම සදාචාරාත්මක ලෙසත් පිළිගැනේ.[76] පොදු ක්ෂේත්‍රය තුළ කටයුතු කරන කාන්තාවන්ට එරෙහිව සිදුකරනු ලබන ප්‍රචණ්ඩ ක්‍රියා, ඔවුන්ගේ කැමැත්ත සහ හෘද සාක්ෂිය අනුව කටයුතු කිරීමේ කාන්තාවන්ගේ නිදහස සහ අයිතිවාසිකම කෙරෙහි මැදිහත්වීමක් වන අතර උනන්දුව සහ කැමැත්ත තිබුණද ඔවුන් විසින් ඔවුන්ව නිවෙස් තුළට සීමා කරගැනීමේ තත්ත්වයක් ද නිර්මාණය කරයි.

---

*72* Women Action Network, 'Women's Access to Justice in the North and East in Sri Lanka' CEDAW Shadow Report, (August 2016) <https://tbinternet. ohchr.org/Treaties/CEDAW/Shared%20Documents/LKA/INT_CEDAW_NGO_LKA_25964_E.pdf> accessed 21 November 2020.

*73* 2021.03.23 වන දින මන්නාරමේ පිහිටා ඇති කාන්තා සංවර්ධන සම්මේලන ශාලාවේදී පවත්වන ලදී.

*74* 14(1)(උ) ව්‍යවස්ථාව සෑම පුරවැසියෙකුටම එකලාව හෝ අන් අය හා සමග යම් නිත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියුක්ත වීමේ නිදහසට හිමිකම් ඇත්තේය.

*75* 2021.03.17 වන දින යාපනයේ සර්වෝදය ශාලාවේ පවත්වන ලදී.

*76* OXFAM, 'Smashing Spatial Patriachy: Shifting social norms driving sexual and gender based violence on public transport in Sri Lanka' (OXFAM) available at: https://policy-practice.oxfam.org/resources/smashing-spatial-patriarchy-shifting-gender-based-norms-driving-sexual-and-gend-620845/ accessed 02 January 2021

ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා වර්ධනය වෙමින් පවතින තත්ත්වයක දී ප්‍රචණ්ඩත්වයට මූල බීජ වැපිරිය හැකි මෙවැනි සමාජ ප්‍රතිමාන පිළිබඳව ගැඹුරින් සලකා බැලීමත් ඒවා සමාජයෙන් අතු ගා දැමීමට පියවර ගැනීමත් අත්‍යවශ්‍ය වේ.

### කාන්තාවන්ගේ හැකියාවන්ට සහ දැනුමට වැට බැඳීම

*'වැඩියෙන් ඉගෙන ගත්තොත් මනමාලයෙක් හොයා ගන්න බැරි වෙයි කියා දෙමව්පියන් නිතරම කියනවා. මම විවාහ වෙලා දරුවන් හදාගෙන ජීවත් වෙන්න ඕනෙ කියන එකයි එයාලගෙ එකම බලාපොරොත්තුව. මගේ හැකියාවන්, ඉලක්ක ගැන ඔවුන්ට තැකීමක් නෑ.'* පර්යේෂණයට සහභාගී වූ කාන්තාවක්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන පිළිබඳව තරුණ පිරිස් සමග කරන ලද මාර්ගගත සාකච්ඡාව.[77]

දෙමාපියන් හා පවුලේ සාමාජිකයන් විසින් ගැහැණු දරුවන් පිළිපැදිය යුතු රීතීන් හා සමාජ සම්මතයන් උගන්වනු ලබන්නේ ඔවුන් වැඩිවියට පත්වීමටත් පළමුවෙන්ය. පවුලේ සාමාජිකයන්ට සැලකිය යුතු ආකාරය, ගෙවල් දොරවල් පිරිසිදු කරන ආකාරය, ආහාර රසවත්ව පිසින ආකාරය සහ දරුවන් බලාගන්නා ආකාරය බොහෝ ගැහැණු දරුවන් හට පවුල් මට්ටමෙන් උගන්වනු ලබයි. විවාහ වීම සහ දරුවන් ලැබීම ස්ත්‍රීත්වය පරිපූර්ණ වීමට අත්‍යවශ්‍ය බව ඇතැම් පවුල් ගැහැණු දරුවන්ට උගන්වනු ලබන්නේ ඔවුන් ඉතා කුඩා අවදියේදීය. පවුල, පාසල සහ පූජනීය ස්ථාන ඇතුළත් සමාජ ආයතන ගෘහස්ථ ක්ෂේත්‍රයට පමණක් සීමා වූ කාන්තාවන්ගේ භූමිකාව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාකාරකම් සහ දේශනා කිරීම ද සිදු කරයි. මෙම කරුණුවල එකතුව ගැහැණු දරුවන්ගේ සිතුම් පැතුම් සහ ඉලක්ක සීමා කරයි.

### කාන්තාවන්ගේ සෞඛ්‍යය පිරිහීම

*"වැඩට යන පිරිමින්ට වැඩ කරන්න තියෙන්නේ පැය අටක් විතරයි. නමුත් ගෙදර ඉන්න කාන්තාවන්ට හැම වෙලාවෙම වැඩ. අපිට විවේකයක් ඇත්තේම නෑ."* පර්යේෂණය සඳහා සහභාගි වූ කාන්තාවක් ස්වාමි පුරුෂයාගේ සහ භාර්යාවගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි කාර්යභාරය පිළිබඳ මාර්ගගත සාකච්ඡාව.[78]

බොහෝ දුරට, ස්වාමිපුරුෂයන් රැකියාව සඳහා යන පවුල්වල ගේදොර කටයුතු, ඉවුම් පිහුම් කටයුතු සහ දරුවන් රැක බලාගැනීම යන සියල්ලක්ම භාර්යාව සිදුකළ යුතු බවට අපේක්ෂා කෙරේ. ස්වාමි පුරුෂයාගේ කාර්යභාරය පවුල වෙනුවෙන් ආදායම් ඉපයීමට පමණක් සීමා කෙරේ. ඒ හේතුවෙන් නිවසේ සෙසු සියලු කටයුතු කාන්තාවන් විසින් සිදු කළ යුතු බවට අපේක්ෂා කෙරේ. මෙය බොහෝ අවස්ථාවලදී කාන්තාවන්ගේ විවේකය අඩු කොට ඔවුන්ගේ ශරීර සෞඛ්‍ය පිරිහී රෝගාතුර වීමට මග පාදයි. එය නිරෝගී ජීවිතයක් සඳහා වන කාන්තාවන්ගේ අයිතිය ළඟා කරගැනීමට ඔවුන්ට බාධා ඇති කරයි.

මේ සියල්ලට අතිරේකව, කාන්තාවන්ගේ කාර්යභාරය පවුල් පරිසරයට සීමා කිරීම තුළින් පොදු කටයුතුවල නිරත වීමට ඔවුන්ට ඇති අයිතිය[79] ඇතුළුව රැස්වීමේ අයිතිය සහ සමාගමය සඳහා ඔවුන්ට ඇති අයිතිය උල්ලංඝනය වේ. එසේම, මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) ව්‍යවස්ථාව[80] මගින් තහවුරු කර ඇති සර්ව සාධාරණත්වයේ අයිතිය උල්ලංඝනය කරයි.

---

77 2021.06.02 වන දින Zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලද මාර්ගගත සාකච්ඡාව

78 2021.07.03 වන දින Zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලද මාර්ගගත සාකච්ඡාව

79 මෙම මූලික අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (ආ) සහ (ඇ)අනු ව්‍යවස්ථා මගින් සහතික කොට තිබේ.

80 කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේය.

## 4.6.2 "චරිතවත් කාන්තාව" සහ "පතිවෘත කාන්තාව" යන මතයන් පදනම් කරගනිමින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ නිදහස සීමාකරන්නා වූ සමාජ ප්‍රතිමාන

"'කාන්තාවක් නම් ඇය කටයුතු කළ යුත්තේ මෙහෙමයි'යනුවෙන් දක්වන යම් යම් සමාජ ප්‍රතිමාන පවතිනවා. එම ප්‍රතිමාන අපේ අයිතිවාසිකම් උදුරා ගත්තත් අපි එම ප්‍රතිමාන උල්ලංඝනය නොකළ යුතුයි. අපි යම් හෙයකින් එම ප්‍රතිමාන ඇතුළත් යමක් උල්ලංඝනය කළහොත් මේ සමාජය අපිව පිළිගන්නේ නැහැ." පර්යේෂණය සඳහා සහභාගීවූ කාන්තාවක් කාන්තාවන් පසුබෑමට ලක් කරන්නේ කුමක්ද? යන ශීර්ෂය යටතේ පවත්වන ලද මාර්ගගත සාකච්ඡාව.[81]

හඳුනාගන්නා ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන අතරින් පහත සඳහන් දෑ 'චරිතවත් කාන්තාවක්', 'පතිවෘත කාන්තාවක්' යන මත පදනම් කරගනිමින් කාන්තා අයිතිවාසිකම් සහ නිදහස සීමා කරන්නාවූ සමාජ ප්‍රතිමාන වශයෙන් සලකනු ලැබේ.

- **භාර්යාවන් සෑම අවස්ථාවකදීම තම වෛවාහක/ පවුල් ජීවිතය රැකගත යුතුය**
- **කාන්තාවන්/ ගැහැනු දරුවන් පොදු ස්ථානවල වැඩියෙන් කතා නොකළ යුතුය**
- **කාන්තාවන්/ ගැහැනු දරුවන් පොලිස් ස්ථානයන්ට නොයා යුතුය**
- **කාන්තාවන් තම ස්වාමිපුරුෂයාට එරෙහිව පැමිණිලි නොකළ යුතුය**
- **ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක්වූ කාන්තාවන් පතිවත අහිමි වූවන් ය**
- **කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීමට පැකිලීම**
- **කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් විසින් වැළැක්වීම**

ප්‍රායෝගිකව පවතින මෙම සමාජ සම්මතයන් විසින් උල්ලංඝනය කරන ලද කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ නිදහස පහත පරිදි වර්ග කළ හැක:

### ➤ යුක්තිය සඳහා ප්‍රවේශවීමේ නිදහස

"මාව අපයෝජනය කළ පුද්ගලයන්ට දඬුවම් ලබාදීම සඳහා මම නඩු පැවරුවා. නමුත් මගේ පවුලේ උදවිය එම නඩුව ඉල්ලා අස්කර ගන්නා ලෙස මට බල කළා. එම නඩුව නිසා පවුලේ නම්බුව විනාශ වෙනවා කියලා මට බැන්නා. ඒ නිසා මම නඩුව ඉල්ලා අස්කර ගත්තා." පර්යේෂණයට සහභාගී වූ කාන්තාවක් ලිංගික ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත්වූවන් සමග පවත්වන ලද කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාව.

කාන්තාවන්/ගැහැනු දරුවන් පොලිස් ස්ථානයන්ට නොයා යුතුය, ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි නොකළ යුතුය සහ එලෙස ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව පැමිණිලි කිරීම ඔවුන්ගේ පවුල් විසින් වැළැක්විය යුතුය යනාදී සමාජ ප්‍රතිමාන/ භාවිතාවන් යුක්තිය සඳහා ප්‍රවේශවීමේ කාන්තා නිදහස කෙරෙහි බොහෝ දුරට බලපායි. ස්ත්‍රී දූෂණය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය නැතහොත් අපයෝජනය හේතුවෙන් පීඩාවට පත් බොහෝ කාන්තාවන් සහ ගැහැනු දරුවන් මෙවැනි සමාජ ප්‍රතිමානයන්ට පටහැනිව ඒවා උල්ලංඝනය කරමින් කටයුතු කිරීම හේතුවෙන් එහි ප්‍රතිවිපාක ලෙස මුහුණදීමට සිදුවන සමාජ කැළල, කොන්කිරීම් සහ සමාජීය වශයෙන් එල්ලවන විවේචනයන්ට බියවී යුක්තිය වෙත ප්‍රවේශ වීමට පැකිළෙති.

"සියලුදෙනාටම යුක්තිය වෙත ප්‍රවේශවීමට හැකි විය යුතුය" යන්න නීතියේ ආධිපත්‍යය සහ ප්‍රජාතන්ත්‍රවාදී සිද්ධාන්තයන්ගේ මූලිකාංගය කි. ඒ අනුව කාන්තාවන්ට සහ ගැහැනු දරුවන්ට යුක්තිය වෙත ප්‍රවේශවීමට බාධා ඇතිකරන මෙවැනි ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සහ භාවිතාවන් රටේ නීතියේ ආධිපත්‍යය සහ ප්‍රජාතන්ත්‍රවාදය අභියෝගයට ලක් කරයි.

81 2021.02.04 වන දින Zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලද මාර්ගගත සාකච්ඡාව

## ➤ වධ හිංසාවලින් මිදීම සඳහා වන නිදහස

**"මගේ මහත්තයා මට පහර දීලා මගේ ඇස් ඉදිමිලා. ඔලුවත් ඉදිමිලා. මම අම්මලාගේ ගෙදර යනවා. ගැහැනියක් උනාම ඉවසන්න ඕන කියලා අම්මලා කියල තියෙනවා. පොලිසියට ගිය වෙලාවේදී මේවා ස්වාමිපුරුෂයන් සහ භාර්යාවන් අතරේ සිදුවන සාමාන්‍ය දේවල් කියලා එතන හිටපු කාන්තා පොලිස් නිලධාරිනියක් කිව්වා."** පර්යේෂණයට සහභාගි වූ කාන්තාවක් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් පීඩාවට පත්වූවන් සඳහා වන කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාව.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 11 වන ව්‍යවස්ථාව, 'කිසිම තැනැත්තකු වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය' යනුවෙන් දක්වා ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයෙහි සඳහන් කර ඇති අයිතිවාසිකම් විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් මගින් උල්ලංඝනය කෙරෙන අවස්ථාවක පමණක් ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මූලික අයිතිවාසිකම් පිළිබඳ පෙත්සමක් ඉදිරිපත් කර සහන ලබාගත හැකිය.[82] මෙම අයිතිවාසිකම් විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් මගින් හෝ උල්ලංඝනය නොවී වෙනත් පාර්ශවයක් විසින් (උදාහරණ වශයෙන් පවුලක සාමාජිකයන් විසින්) උල්ලංඝනය කෙරෙන අවස්ථාවකදී එය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් වශයෙන් නොසැලකෙන අතර එහි ස්වභාවය අනුව එය ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හෝ අපරාධමය වරදක් ලෙස සැලකෙනු ඇත. නමුත් පවුලක ස්වාමි පුරුෂයා භාර්යාවට පහර දීමේදී හෝ වාචිකව අපයෝජනයට ලක් කිරීමේදී එය බොහෝදුරට ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වශයෙන් සලකනු ලැබේ. ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ නීතිය[83] 2005 වසරේදී පනවනු ලැබ දැනට බලාත්මකව පැවතිය ද එහි කාර්යක්ෂමතාව ප්‍රශ්නාර්ථයක්[84] බවට පත්ව තිබේ. මෙහිදී මතුවන තවත් ගැටලුවක් වනුයේ පවුල් පරිසරය තුළ ස්වාමි පුරුෂයා විසින් වධ හිංසාවට ලක්කරනු ලබන කාන්තාව තමන් සඳහා වන යුක්ති සහගත තීන්දුවක් ලබා ගැනීමේදී ව්‍යූහාත්මක වශයෙන් පවතින බාධාවන් වේ.

පළමුව, ස්වාමිපුරුෂයාට එරෙහිව පැමිණිලි කරනු ලබන කාන්තාවන් සමාජය විසින් කොන්කරනු ලබන නැතහොත් විවේචනය කරනු ලබන ප්‍රවනතාවක් උතුරු පළාතේ දක්නට ලැබෙන බව පර්යේෂණයට සහභාගීවූවන්ගෙන් 66.54% පිරිසක් සඳහන් කළහ. එම සමාජ විරෝධතා පසෙකලා කිසියම් කාන්තාවක් ස්වාමිපුරුෂයාට එරෙහිව පැමිණිලි කිරීම සඳහා පොලිස් ස්ථානයකට ගිය විට රාජකාරියේ නිරත පොලිස් නිලධාරීන් "භාර්යාවන් ඕනෑම අවස්ථාවක තම වෛවාහක/පවුල් ජීවිතය ආරක්ෂා කරගත යුතුය" වැනි ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන ගෙනහැර දක්වමින් පීඩාවට පත්වූ කාන්තාව සමතයට පත්කිරීමට නැතහොත් පැමිණිලි කිරීමෙන් වලක්වාලීමට උත්සාහ කරති.[85] මේ අයුරින් සමාජය තුළ සහ සමාජ ආයතනයන්හි ගැඹුරින් මුල්බැස ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සහ භාවිතාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් කාන්තාවන් පවුල් පරිසරය තුළ තමන්ට එරෙහිව සිදුවන වධ හිංසා සහ අපයෝජන විඳදරා සිටිය යුතු තත්ත්වයකට පත්ව සිටිති.

## ➤ සිතීමේ සහ හෘද සාක්ෂියේ නිදහස

**'කාන්තාවක් ලෙස ඉපදීම නිසා සාධාරණ යැයි හැඟෙන දෙයක් කරන්නට ගියත් බොහෝ විරෝධතාවන්ට මුහුණ දීමට අපට සිදුවී තිබෙනවා.'** පර්යේෂණයට සහභාගී වූ කාන්තාවක් කාන්තාවන් පසුබෑමට ලක්කරනු ලබන්නේ කුමක්ද? යන මාතෘකාව යටතේ සිදුකරන ලද මාර්ගගත සාකච්ඡාව.

තමන්ට සිදුවන අසාධාරණයන්ට එරෙහිව යුක්තිය ඉටුකරගත නොහැකි පරිදි කාන්තාවන් පාලනය කිරීම නැතහොත් වෛවාහක බැඳීම ආරක්ෂා කිරීම සඳහා ඕනෑම හිංසනයක් විඳදරා ගනිමින් ජීවත් විය යුතු බවට කාන්තාවන් පෙළඹවීම ඔවුන්ගේ සිතීමේ සහ හෘද සාක්ෂිය අනුව කටයුතු කිරීමේ නිදහස[86] අභියෝගයට ලක් කරයි.

---

**82** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 සහ 26 ව්‍යවස්ථා

**83** 2015 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත

**84** CPA, 'Legal Reform to Combat Sexual and Gender Based violence- Part 1' (CPA, November 2020) available at: https://www.cpalanka.org/wp-content/uploads/2020/11/Law-Reform-to-combat-SGBV-PART-1-General-Centre-for-Policy-Alternatives.pdf accessed 20 August 2021

**85** ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත්වූවන් සමග පවත්වන ලද කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාව

**86** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන ව්‍යවස්ථාවබ

## ➤ සංචරණයට ඇති

**'ඒ කෘෘර සිද්ධියෙන් පස්සේ එළියට යෑම හැකිතාක් දුරට මම වලක්වා ගන්නවා. අනිත් මිනිස්සුන්ගේ දෝෂ දර්ශන බැල්ම, විවේචනවලට මට මුහුණ දෙන්න බෑ.'** පරීක්ෂණයට සහභාගි වූ කාන්තාවක් ලිංගික ප්‍රචණ්ඩත්වය හේතුවෙන් පීඩාවට පත්වූවන් සමග පවත්වන ලද කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාව.[87]

ස්ත්‍රී දූෂණය හේතුවෙන් පීඩාවට පත් වූ කාන්තාවන්ට එරෙහිව එල්ල කරනු ලබන සමාජ කැළල ඔවුන්ගේ නිදහස් සංචරණයට බාධා ඇතිකොට ඔවුන් පටු රාමුවකට සීමාකරයි. කිසියම් කාන්තාවකගේ හෝ ඇයගේ පවුලේ ගරුත්වය ඇයගේ ශරීරය මත නැතහොත් ශාරීරික ආරක්ෂාව මත රැඳී පවතින බවට වන සංස්කෘතික සාරධර්මය ස්ත්‍රී දූෂණයෙන් පීඩාවට පත්වන කාන්තාවන් කෙරෙහි එල්ලවන සමාජ කැළලට හේතු වී තිබේ. මෙම සමාජ කැළලට මුහුණ දිය නොහැකි බොහෝ කාන්තාවන් සියදිවි නසා ගැනීම සඳහා තැත් කර ඇති බවට කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා සඳහා සහභාගි වූ කාන්තාවන් ප්‍රකාශ කර තිබුණි.[88] පතිවත, ගරුත්වය සහ කාන්තාව යනාදී පද එකිනෙකින් වෙන් කිරීමට නොහැකි පරිදි එකට බද්ධ වී ඇති ආකාරය මෙම පර්යේෂණයෙහි ග්‍රන්ථ ලිපි විමසුමෙහි ගෙනහැර දක්වන ලදී.

කාන්තාවන් රාත්‍රී කාලයේ තනිව ගමන් බිමන්වල නොයෙදිය යුතු බවට වූ සමාජ ප්‍රතිමානයක් සමාජයෙහි ස්ථාපිත වී පවතින බව පර්යේෂණයට සහභාගී වූ පිරිස අතුරින් 65.23% ක් මෙම පර්යේෂණයේදී ප්‍රකාශ කළහ. පශ්චාත් යුද සමයේ හමුදාකරණයට ලක්ව ඇති පරිසරය සහ මත්ද්‍රව්‍ය භාවිතයේ වර්ධනය යනාදී ආරක්ෂාව පිළිබඳව පවතින හේතු මත කාන්තාවන් රාත්‍රී කාලයේදී තනිව ගමන් බිමන්වල නොයෙදිය යුතු බවට වූ සමාජ ප්‍රතිමානයක් ගොඩනැගී පවතින බව පර්යේෂණයට සහභාගීවූවන්ගෙන් එක් පිරිසක් සඳහන් කළ ද 'වේලාව, කාන්තාවන්ගේ හැසිරීම නැතහොත් චරිතවත් බව' යනාදිය අතර පවතින බවට කාලාන්තරයක සිට ප්‍රකාශ වෙන සම්බන්ධතාව ද මෙම සමාජ ප්‍රතිමානය ස්ථාපිත වී පැවතීමට ප්‍රධාන හේතුවක් වේ. දිනපතා අවේලාවේ නිවසට පැමිණෙන කාන්තාවකගේ/ගැහැනු දරුවකුගේ ආරක්ෂාව සම්බන්ධයෙන් පවුලේ සාමාජිකයන් උනන්දුවක් දැක්වුව ද සෙසු පිරිස් එම දරුවා නිවසට පැමිණෙන වෙලාව පදනම් කරගනිමින් එම දරුවාගේ හැසිරීම විවේචනය කිරීම බොහෝ ස්ථානවල දැකිය හැකි බව පර්යේෂණයට සහභාගීවූවන් පෙන්වා දී තිබුණි.

## ➤ භාෂණයේ නිදහස

**"ගෙදර වැදගත් තීන්දු තීරණ ගන්නා අවස්ථාවලදී අපේ අදහස් දැක්වීමට උත්සාහ කරන විට 'කිකිළිය කෙකර ගෑවාට එළිය වැටෙන්නේ නැහැ කියා කියනවා. පොදු ස්ථානයන් හි කාන්තාවන් කතා කිරීම මෙම සමාජය බොහෝ දුරට පිළිගන්නෙ නැහැ. ඔවුන්ට කටකාර ගැහැණිය යන ලේබලය ගසනවා. කටකාර ගැහැණිය යන පදය සඳහා පුරුෂ ලිංග පදය කුමක්ද කියා මම බොහෝ අවස්ථාවල කල්පනා කරලා තිබෙනවා."** පර්යේෂණයට සහභාගී වූ කාන්තාවක් පුහුණුකරුවන් සඳහා වන වැඩමුළුව.[89]

කාන්තාවන් පොදු ස්ථානයන්හි වැඩියෙන් කතා නොකළ යුතුය යන සමාජ ප්‍රතිමානය ස්ථාපිත වී තිබෙන බවට පර්යේෂණයට සහභාගී වූ පිරිස අතුරින් 75.56% ක පිරිසක් ප්‍රතිචාර දක්වමින් සඳහන් කර තිබුණි. කෙසේ නමුත් කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා සහ දත්ත පිරික්සීමේ සාකච්ඡාවලදී මෙම සමාජ ප්‍රතිමානය මේ වන විට දුබල වෙමින් පවතින බව සහභාගිවූවන් පැවසූහ. ඊට උදාහරණ වශයෙන්, මේ වන විට දේශපාලන රැස්වීම්, සමෘද්ධි රැස්වීම් සහ වෙනත් විවිධ ආකාරයේ රැස්වීම් වල කාන්තාවන් බහුල වශයෙන් අදහස් දක්වන බවට ප්‍රකාශ කර තිබුණි. භාෂණයේ නිදහස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(අ) ව්‍යවස්ථාව මගින් සහතික කරන ලද මූලික අයිතිවාසිකමක් වන අතර කාන්තාවන් ඇතුළු සියලු පුරවැසියන් මෙම අයිතිවාසිකම භුක්ති විඳීමට හිමිකම් ලබති. කාන්තාවන්ගේ භාෂණ නිදහසට බාධා ඇති කිරීමේදී සමාජයේ ප්‍රගමනය ද වැළැක්වෙන බව අපි ඉතා පැහැදිලිව මෙහිදී වටහාගත යුතුය.

---

**87** 2021.03.23 දින මන්නාරමේ පිහිටා තිබෙන කාන්තා සංවර්ධන සම්මේලන ශාලාවේදී පවත්වන ලදී.

**88** ලිංගික ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට ලක් වූවන් සඳහා වන කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාව, 2021.03.23 වන දින මන්නාරමේ පිහිටා තිබෙන කාන්තා සංවර්ධන සම්මේලන ශාලාවේදී පවත්වන ලදී.

**89** 2021.03.18 වන දින යාපනයේ පිහිටි සර්වෝදය ශාලාවේදී පවත්වන ලදී.

### 4.6.3 කාන්තාවන්ගේ වෘත්තිය අයිතිවාසිකම් සීමාකරන භාවිතාවන්/සමාජ ප්‍රතිමාන

පර්යේෂණයට සහභාගිවූවන් විසින් තම ප්‍රජාවන් තුළ ස්ථාපිත වී ඇති බවට හඳුන්වා දී ඇති සමාජ ප්‍රතිමාන/භාවිතාවන් අතරින් පහත සඳහන් ඒවා කාන්තාවන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සහ වෘත්තියක නිරතවීමේ නිදහස සීමාකරන ඒවා බවට පත්ව තිබේ. ඒ අතරින් පළමුවැන්න ස්ථාපිත වී තිබීමේ ප්‍රමාණය අනුව ලැයිස්තුගත කොට ඇති සමාජ ප්‍රතිමාන ලැයිස්තුවෙහි පළමු සමාජ ප්‍රතිමාන 10 තුළටද අනෙකුත් තුන පළමු සමාජ ප්‍රතිමාන විස්ස තුළටද ඇතුළත් වේ.

- ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ සඳහා පුරුෂයන් පමණක් යෙදවිය යුතුය.(මෙම සමාජ ප්‍රතිමානය ස්ථාපිතව පවතින බව පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 76.8% ක පිරිසක් ප්‍රකාශ කර තිබේ.)
- කාන්තාවන්/ගැහැනු දරුවන් රැකියාවේදී රාත්‍රී සේවා මුර භාර නොගත යුතුය (මෙම සමාජ ප්‍රතිමානය ස්ථාපිතව පවතින බව පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 63.5%ක පිරිසක් ප්‍රකාශ කර තිබේ.)
- කාන්තා ගෘහමූලික පවුල් හැර සෙසු පවුල්වල ප්‍රධාන ආදායම් මාර්ගය පුරුෂයන් විය යුතුය. (මෙම සමාජ ප්‍රතිමානය ස්ථාපිතව පවතින බව පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 62.7.%ක පිරිසක් ප්‍රකාශ කර තිබේ.)
- කාන්තාවන්/ගැහැනු දරුවන් පුරුෂයන් නිරත වන එම වැඩ කටයුතුවලම නිරත වුවද සමාන වැටුප් ලැබීමට හිමිකම් නොලබයි (මෙම සමාජ ප්‍රතිමානය ස්ථාපිතව පවතින බව පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 61.4.% ක පිරිසක් ප්‍රකාශ කර තිබේ.)

මෙම සමාජ ප්‍රතිමාන විසින් පහත සඳහන් කර ඇති කාන්තාවන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සහ නිදහස විශේෂයෙන් සීමා කර තිබේ.

#### ➤ අභිමත රැකියාවක නිරතවීමේ අයිතිය

**"මගේ ස්වාමිපුරුෂයා ශරීරික දුබලතාවකින් යුත් අයෙකු වේ. එබැවින්, ඔහු අසනීප වන අවස්ථාවලදී මම ඔහුගේ ත්‍රීරෝද රථය පදවනවා. නමුත් ත්‍රිරෝද රථය පදවාගෙන යාමේදී සමාජයේ සිටින පිරිස් මා දෙස බලන්නේ විවේචනාත්මක ආකාරයෙන්".** පර්යේෂණයට සහභාගී වූ කාන්තාවක් ශාරීරික දුබලතාවයකින් යුත් පුද්ගලයින් සමග පවත්වන ලද කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාව.[90]

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තමන්ට අභිමත රැකියාවක නිරත වීමේ අයිතිවාසිකම පුරවැසියන් වෙත තහවුරු කරයි.[91] කෙසේ නමුත්, ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ කටයුතු වල පුරුෂයන් පමණක් යෙදවිය යුතුය යන සමාජ ප්‍රතිමානය එලෙස ශාරීරික ශ්‍රමය අධිකව යෙදිය යුතු රැකියාවන්හි කාන්තාවන් නිරතවීම වළක්වාලනු ලබයි. මෙම ප්‍රතිමානය ස්ථාපිතව පැවතීම සඳහා හේතු වශයෙන් පර්යේෂණයට සහභාගීවූවන් විසින් පුරුෂයන් වැඩි ශරීර ශක්තියකින් යුක්ත පිරිස් බවත් කාන්තාවන් හට දුෂ්කර වැඩ කටයුතුවල නිරත විය නොහැකි බවත් දක්වා තිබේ. කෙසේ නමුත්, උතුරු පළාතේ තත්ත්වය අනුව දැනට ශාරීරික ශ්‍රමය අධිකව යෙදිය යුතු කටයුතුවල ද කාන්තාවෝ නිරතවෙති. මෙවැනි වැඩ කටයුතුවල නිරත වන කාන්තාවන් සම්බන්ධයෙන් සමාජය දක්වන විවේචනාත්මක වූ දෘෂ්ටිය එවැනි රැකියාවල අඛණ්ඩව ඔවුන් විසින් නිරත වීමට බාධා ඇතිකරයි.

**90** 2021.03.21 වන දින කිලිනොච්චිය කනකපුරම් ග්‍රාමීය සංවර්ධන සභා ශාලාවේදී පවත්වන ලදී
**91** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) (උ)

ඡායාරූපය 4.1

**ඒ. සෙල්වනායගී පල්මුනෙ**
**මන්නාරම**

"මම ප්‍රමාණයෙන් විශාල, සාමාන්‍යයෙන් පුරුෂයන් පමණක් පදින යතුරුපැදියක් මිලට අරගෙන පදිනවා. මෙය දුටු පොලිස් ප්‍රවාහන අංශයේ නිලධාරියෙකු 'මේක පිරිමි පදින බයිසිකලයක් ඔයා පදින්න එපා' කියමින් අවවාද කළා. සමාජයේ සිටින උදවියද මම පිරිමින්ගේ වාහනයක් පදවන බවට විවේචනය කළා. මම ප්‍රවාහන අංශයේ ඉහළ නිලධාරියා හමුවී එම යතුරුපැදිය පැදවීමට අවසර ලබා ගත්තා."



ඡායාරූපය 4.2

**එස්. පුවනේශ්වරි පූනගරි**
**වව්නියාව**

"මම ආදායමක් සොයාගැනීමට ලොකු ට්‍රැක්ටර් රථයක් පදවනවා. ගස් නැගලා පොල් කඩනවා. කොහොම වුණත් සමාජයේ සිටින බොහෝ අය මේවා පිරිමින් කරන රස්සා බව කියමින් මාව විවේචනය කරනවා. ඒකෙන් මට පොඩි වේදනාවක් දැනුනත් මම මගේ ආදායම වෙනුවෙන් මේවා දිගටම කරගෙන යනවා."



කාන්තාවන්/ ගැහැනු දරුවන් රැකියාවල නිරතවීමේදී රාත්‍රී රැකියා මුර බාර නොගත යුතුය යන සමාජ ප්‍රතිමානය මගින් ද කාන්තාවන් විසින් තම අභිමත රැකියාව තෝරාගනු ලැබීම වළක්වාලයි. මේ සඳහා වන ප්‍රධාන හේතු අතරින් එකක් ලෙස ආරක්ෂාව දක්වනු ලැබුවද වෙලාව සහ කාන්තාවගේ හැසිරීම සම්බන්ධ කර බලන්නා සාම්ප්‍රදායික චාරිත්‍ර වාරිත්‍ර සහ පුරුදු පුහුණු මෙම සමාජ ප්‍රතිමානය බොහෝ දුරට ස්ථාපිතව පැවතීමට හේතු පාදක වී ඇත.

කාන්තා ගෘහමූලික පවුල් හැර සෙසු පවුල්වල පුරුෂයන් ප්‍රධාන ආදායම් උපයන්නා විය යුතුය යන අපේක්ෂාව නැතහොත් සමාජ චාරිත්‍රය 'රස්සාව පුරුෂ ලක්ෂණයක් වේ' යන පැරණි ප්‍රතිමානය මත පදනම් වූවකි. එය පුරුෂයන් ආදායම් ඉපයිය යුතුමය යන අනිවාර්ය තත්ත්වය පුරුෂයන් මත පටවනු ලබයි. එසේම, දරුවන් රැක බලාගැනීම හෝ සේවා ස්ථාන මාරුවීම් වැනි කුමන හෝ හේතුවක් මත ස්වාමි පුරුෂයා සහ භාර්යාව යන දෙදෙනාගෙන් කෙනෙකුට පමණක් රැකියාව කිරීමට සිදුවේ යන තත්ත්වය මතුවන සෑම අවස්ථාවකදීම භාර්යාවන් සිය රැකියාව අත්හැරීමට මෙම භාවිතය මගින් බලපෑම් කෙරේ. මෙයද වෘත්තියක නිරත වීමට ඔවුන් සතු අයිතිවාසිකම් සීමාකරනු ලබයි.

### ➤ සමාන වැටුප් ලැබීමට ඇති අයිතිය

**"පිරිමින් කරන ඒ වැඩ ටිකම අපිත් කරනවා. නමුත් අපට ලබා දෙන්නේ අඩු වැටුපක්. මොකක්ද මේකෙ තියෙන සාධාරණය?"** පර්යේෂණයට සහභාගීවූ කාන්තාවක් - මුලතිව් දිස්ත්‍රික්කය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) ව්‍යවස්ථාව මගින් කිසිම පුරවැසියෙකු ස්ත්‍රී පුරුෂ භේදය මත වෙනස්කමකට භාජනය නොකළ යුතු බව දක්වයි. කෙසේ නමුත්, කෘෂිකාර්මික කටයුතුවල නිරත වන පුරුෂයන් සහ කාන්තාවන් ඒකාකාර කටයුතු සිදුකරනු ලැබුවද පුරුෂයන්ට වඩා අඩු වැටුපක් කාන්තාවන්ට ලබාදෙනු ලැබෙයි. මෙම ප්‍රවනතාව කිලිනොච්චිය සහ මුලතිව් යන දිස්ත්‍රික්කයන්හි බහුල වශයෙන් දැකිය හැකි බව පර්යේෂණයට සහභාගීවූවන් ප්‍රකාශ කර තිබුණි. කාන්තාවන් පුරුෂයන්ට වඩා දුබලයන්ය යන ඒකාකෘතික චින්තනය මෙම වැටුප් විෂමතාවට මූලික හේතුව වී තිබේ. එසේම, රැකියා කිරීමට සුදුසු වන්නේ පුරුෂයන් පමණක් ය යන ප්‍රතිමානයත් කාන්තාවන්ගේ කාර්යභාරය පවුල රැක බලාගැනීමයි යන ප්‍රතිමානයත් මෙකී වැටුප් විෂමතාවට මූලික හේතු බවට පත්ව ඇත.

## 4.6.4 කාන්තාවන්ගේ ආගමික නිදහස සීමාකරන භාවිතාවන්/සමාජ ප්‍රතිමාන

### හින්දු ආගමික පදනමින්

- කාන්තාවන්/ ගැහැනු දරුවන් ඔසප් කාලවලදී දේවාලයට නොයා යුතුය

**"ඔසප් වීම නිසා මට ගිය අවුරුද්දේ පැවැති දේවාල වාර්ෂික උත්සවයට යන්න බැරි වුණා. ඒ ගැන මට හරි දුකයි. ඔසප් වීම ස්වාභාවික සංසිද්ධියක් නම් මට ඇයි දේවාලයට යන්න බැරි?"** පර්යේෂණයට සහභාගි වූ කාන්තාවක් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීම පිළිබඳව තරුණ පිරිස් සමඟ පවත්වන ලද මාර්ගගත සාකච්ඡාව.[92]

මෙම සමාජ ප්‍රතිමානය/භාවිතාව 86%කට වඩා හින්දු ලබ්ධිකයින් විසින් අනුගමනය කෙරෙන බව පර්යේෂණයට සහභාගීවූවන් ප්‍රකාශ කළහ. පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 65.1%ක පිරිසක් මෙය ආගමික විශ්වාසයක් හා චාරිත්‍රයක් වශයෙන් සලකන අතර 34.8% පිරිසක් මෙය සංස්කෘතික පුරුදු පුහුණුවක් ලෙස හෝ මිත්‍යා විශ්වාසයක් වශයෙන් සලකති. මේ සම්බන්ධයෙන් සඳහන් කිරීමේදී,

හින්දු ආගමික නායකයකු සහ වඩ්ඩුකෝට්ටේ වීර භද්‍රකාලී දේවාලයේ ප්‍රධාන පූජක සහ සංගාරත්තු සින්නම්මා විද්‍යාලයේ විදුහල්පති වූ සිව ශ්‍රී සිවලෝගනාද කුරුක්කල්තුමා පහත පරිදි ප්‍රකාශ කර තිබේ.

**"ඔසප් වීම සිදුවන කාලයේදී කාන්තාවන් විවේක ගැනීම සඳහා යොමු කිරීම වෙනුවෙන් මෙම ප්‍රතිමානය ස්ථාපිත වී ඇත. ඔසප් වීම කිල්ලක් වන බව සෞඛ්‍යය හා සම්බන්ධ වන කරුණක්. මෙය ස්ත්‍රී පුරුෂ සමාජ භාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ කරුණක් නොවේ."**

92 2021.06.02 වන දින Zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලද මාර්ගගත සාකච්ඡාව

ඔසප් වීම සිදුවන කාලයේදී කාන්තාවන්/ ගැහැනු ළමුන් දේවාලයට නොයා යුතුය යන කරුණ ආගමික ග්‍රන්ථයන්හි සඳහන් වන ආගමික රීතියකි යන අදහසද ආගමික නායකයන් විසින් ඉදිරිපත් කර තිබේ.[93] මෙම පර්යේෂණයේ අරමුණ වනුයේ, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සම්බන්ධයෙන් ගවේෂණය කිරීම වන අතර සමාජ ප්‍රතිමාන සහ ආගමික මූලධර්ම අතර පවතින වෙනස ලිපි ග්‍රන්ථ විමසුමෙහි පෙන්වා දී තිබේ. ඒ අනුවල මෙම සම්ප්‍රදාය හුදෙක් සංස්කෘතිය සහ සභ්‍යත්වය මත පදනම් වූ ප්‍රතිමානයක් ද නැතහොත් ආගමික රීතියක් ද යන සැකය මුළුමනින්ම දුරුකොට නැත යන්න සැබෑ සත්‍යය වේ. කෙසේ නමුත් මෙම චාරිත්‍රය ආගමික වත් පිළිවෙත් සිදුකිරීම සඳහා වන කාන්තාවන්ගේ නිදහස සීමාකරන බවට කිසිදු සැකයක් නොමැත. ඉන්දියාවේ බොහෝ ප්‍රදේශවල ඔසප් වීම ස්වාභාවික සංසිද්ධියක් වශයෙන් සලකා ඔසප් කාලය තුළ ඔවුන්ට දේවාලයට ඇතුළුවීමට අවසර ලබාදෙන බොහෝ දේවාල දක්නට ලැබේ. උදාහරණ වශයෙන්,

- ❖ **මේල්මරුත්තුවර් අම්මන් දේවාලය** චෙන්නායි නගරයේ සිට තිරුච්චි ප්‍රධාන මාර්ගයේ කිලෝමීටර් 92ක දුරින් පිහිටා ඇත. කාන්තාවන් දේවාලයේ දෙවියන් වහන්සේ වැඩ සිටින ප්‍රධාන ගර්භය තුළට පිවිසීම හෝ ඔසප් කාලය තුළ දේවාලයට යාම හෝ තහනම් කර නොමැත.

- ❖ **කෝයම්බත්තූර් මහා ලිංග බෛරවි** දේවාලය කාන්තාවන් දෙවියන් වහන්සේ වැඩ සිටින මූල ගර්භයට ගොස් ආගමික වතාවත් සිදුකිරීම හෝ ඔසප් කාලයේදී දේවාලයට පැමිණීම තහනම් කර නොමැත.

- කාන්තාවන්/ ගැහැනු දරුවන් මංගල වාද්‍ය උපකරණ වාදනය නොකළ යුතුය.

**"කාන්තාවන් මංගල වාද්‍ය උපකරණ වාදනයකිරීමේ භාවිතය ඉතා අවම වශයෙන් පවතී"** පර්යේෂණයට සහභාගී වූ පුද්ගලයෙක් පුහුණුකරුවන් සඳහා වන වැඩමුළුව

මෙම සමාජ ප්‍රතිමානය මෙම ප්‍රජාවන්හි ස්ථාපිත වී ඇති බව පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 64%ක ප්‍රමාණයක් ප්‍රකාශ කළහ. කෙසේ නමුත්, පර්යේෂණයට සහභාගී වූ 82.7%ක පිරිසක් කාන්තාවන් මංගල වාද්‍ය උපකරණ වාදනය කළ හැකි බවට වන මතය දැරූහ. මේ සම්බන්ධයෙන්,

යාපනය දිස්ත්‍රික් සමස්ත ලංකා ශෛව ආගමික පූජකයින්ගේ සභාවට අයත් කිරුබානන්ද කුරුක්කල් තුමා පහත පරිදි සඳහන් කළේය.

"කාන්තාවන් මංගල වාද්‍ය උපකරණ වාදනය කළ හැකියි. යාපනය දිස්ත්‍රික්කයෙහි කල්ලියංකාඩු ප්‍රදේශයේ මංගල වාද්‍ය උපකරණ වාදනය කරන බොහෝ කාන්තාවන් ඉන්නවා."

- **කාන්තාවන්/ ගැහැනු දරුවන් දේවාලයන්හි කුරුක්කල් තනතුර නොදැරිය යුතුය**

**"පූජකත්වය නැතහොත් පූජක තනතුර පුරුෂයන්ට අයත් බව ශිව ආගමහි ප්‍රකාශ වී ඇත"කිරුබානන්ද කුරුක්කල් තුමා**

මෙය ආගමික රීතියක් වශයෙන් පවතින බව හින්දු ආගමික නායකවරු විසින් පෙන්වා දෙන ලදී. පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 52.4% ක පිරිසක් මෙය ආගමික රීතියක් වශයෙන් පිළිගන්නා අතර 47.5% ක පිරිසක් මෙම ප්‍රතිමානය කාන්තාවන්ගේ ආගමික නිදහස උදුරාගන්නා පදනම මත එය පිළිගැනීම ප්‍රතික්ෂේප කර තිබේ. මෙම භාවිතය සමාජ ප්‍රතිමානයක් වශයෙන් පැවතිය ද ආගමික රීතියක් වශයෙන් පැවතිය ද එය ආගමික වන්දනාව සම්බන්ධයෙන් කාන්තාවන්ගේ ආගමික අයිතිවාසිකම උදුරා ගන්නා බව සැබෑවකි.

---

*93* හින්දු ආගමික නායකයින් සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව

### ක්‍රිස්තියානි/ කතෝලික ආගමික පදනමින්

- කන්‍යා සොයුරියන් දේව මෙහෙයන් නොපැවැත්විය යුතුය

"පූජකත්වය නැතහොත් පූජක තනතුර පුරුෂයන්ට හිමි බව බයිබලයේ සඳහන් වේ" දොන් බොස්කෝවින් සිගේෂිය සොයුරිය අගතා

මෙය ආගමික රීතියක් වශයෙන් පවතින බව ආගමික නායකවරුන් විසින් පෙන්වා දෙන ලදී. කෙසේ නමුත්, පර්යේෂණයට සහභාගීවූවන්ගෙන් 72.8%ක පිරිසක් මෙය පිළිනොගන්නා අතර කන්‍යා සොයුරියන්ට දේව මෙහෙයන් පැවැත්වීමට අයිතියක් තිබිය යුතු බවට අවධාරණය කළහ. එසේම කන්‍යා සොයුරියන් දේව මෙහෙයන් නොපවත්වන භාවිතාව තම ප්‍රජාවන්හි පවතින බව 60.8% පිරිසක් ප්‍රකාශ කළහ. මෙම භාවිතාව ආගමික වන්දනාවන් සිදුකිරීම සඳහා වන කාන්තාවන්ගේ අයිතිය සීමා කර තිබේ.

- කන්‍යා සොයුරියන් බෞතීස්ම සිදුකිරීම නොකළ යුතුය

කතෝලික සහ ක්‍රිස්තියානි ආගමික නායකයින් අතුරින් කිහිපදෙනෙක් කාන්තාවන් බෞතීස්ම කිරීම සඳහා කිසිදු බාධාවක් නොමැති බව සඳහන් කරන ලද අතර තවත් සමහරු සඳහන් කරනු ලැබූයේ හදිසි අවස්ථාවන්හිදි පමණක් කාන්තාවන් විසින් බෞතීස්ම කළහැකි බවය.

කන්‍යා සොයුරියන් බෞතීස්ම නොකරන භාවිතාව තම ප්‍රජාවන්හි පවතින බව පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 61.6% දෙනකු ප්‍රකාශ කළහ. එසේම 42.5% පිරිසක් මෙය ආගමික රීතියක් වශයෙන් පිළිගන්නා අතර පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 57.4% ක පිරිසක් මෙම ප්‍රතිමානය කාන්තාවන්ගේ ආගමික නිදහස උදුරාගන්නා බැවින් එය පිළිගැනීම ප්‍රතික්ෂේප කළහ.

### ඉස්ලාම් ආගමික පදනමින්

- කාන්තාවන්/ ගැහැනු දරුවන් ඔසප් කාලවලදී ආගමික වන්දනාවේ නිරත නොවිය යුතුය

"මෙය ආගමික රීතියකි" ඉස්ලාම් ආගමික නායකයෙක්

ඉස්ලාම් ආගමික නායකවරු මෙය ආගමික රීතියක් වශයෙන් අවධාරණය කරන අතර පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 67.2% පිරිසක් මෙය තම ප්‍රජාවන් තුළ ස්ථාපිතව පවතින බව ප්‍රකාශ කළහ. එසේම, 60.7% පිරිසක් ආගමික රීතියක් වශයෙන් පිළිගන්නා අතරේ 39.2%ක පිරිසක් මෙම සමාජ ප්‍රතිමානය කාන්තාවන්ගේ ආගමික නිදහස උදුරාගන්නා පදනම මත එය පිළිගැනීම ප්‍රතික්ෂේප කොට ඇත.

### බෞද්ධ ආගමික පදනමින්,

- කාන්තාවන් ඔසප් කාලවලදී බෞද්ධ විහාරස්ථාන වලට නොයා යුතුය

පර්යේෂණයට සහභාගී වූ බෞද්ධ ආගමට අයත් සියලුම පුද්ගලයින් වව්නියාව දිස්ත්‍රික්කයට අයත්වූවන් වූහ. මෙම පළාතේ පවතින සෙසු දිස්ත්‍රික්කවල ජීවත්වන බෞද්ධාගමිකයන් සංඛ්‍යාව ඉතා අවම වේ. පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 69.6%ක පිරිසක් මෙම සමාජ ප්‍රතිමානය තම සමාජය තුළ ස්ථාපිතව පවතින බවට ප්‍රකාශ කළහ. එසේම 47.1%ක පිරිසක් තම පෞද්ගලික මතය අනුව මෙම ප්‍රතිමානය ආගමික රීතීන්ට යටත්ව පිළිගන්නා බව ප්‍රකාශ කළ අතර 52.8ක පිරිසක් මෙම ප්‍රතිමානය තමන් පිළිනොග න්නා බවට ප්‍රකාශ කළහ.

- බෞද්ධ විහාරස්ථාන වෙත යන කාන්තාවන් බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ දෙපා ස්පර්ශ නොකළ යුතුය

  පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 58.2%ක පිරිසක් මෙම සමාජ ප්‍රතිමානය තම සමාජය තුළ ස්ථාපිතව පවතින බවට ප්‍රකාශ කළහ. එසේම 64.2%ක පිරිසක් තම පෞද්ගලික මතය අනුව මෙම ප්‍රතිමානය පිළිගන්නා බවට ප්‍රකාශ කළ අතර 35.7%ක පිරිසක් මෙම ප්‍රතිමානය තමන් පිළිනොගන්නා බවට ප්‍රකාශ කර තිබුණි. මෙය පිළිගන්නා බවට පිළිතුරු සපයා තිබූ බහුතරය මෙය ආගමික විශ්වාසයක් බැවින් එය පිළිගන්නා බව ප්‍රකාශ කර තිබුණි.

- බෞද්ධ විහාරස්ථානයන්හි ඇතැම් ස්ථානවලට (ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩසිටින ඉහල මාලය, පූජනීය ධාතුන් වහන්සේලා තැන්පත් කර ඇති ස්ථාන වලට) පිවිසීමට කාන්තාවන්ට අවසර නොලැබේ

  පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 61.1%ක පිරිසක් මෙම සමාජය ප්‍රතිමානය තම සමාජයෙහි ස්ථාපිතව පවතින බවට ප්‍රකාශ කර තිබුණි. එසේම 60.8%ක පිරිසක් තමන්ගේ පෞද්ගලික මතය අනුව මෙම ප්‍රතිමානය පිළිගන්නා බව සඳහන් කර තිබුණු අතර 39.1%ක පිරිසක් මෙම සමාජ ප්‍රතිමානය තමන් පිළිනොගන්නා බව ප්‍රකාශ කර තිබුණි. මෙය පිළිගන්නා බවට ප්‍රකාශ කර තිබූ බහුතරය ආගමික විශ්වාසයක් බැවින් එය පිළිගන්නා බව ප්‍රකාශ කර තිබුණි.

- කාන්තාවන් බෞද්ධ විහාරස්ථාන වෙත යාමේදී තම ශරීරය මුලින්ම වැසෙන පරිදි ඇඳුම් පැළඳිය යුතුය

  පර්යේෂණයට සහභාගී වූ පිරිසෙන් 88.8%ක පිරිසක් මෙම සමාජ ප්‍රතිමානය තම සමාජයෙහි ස්ථාපිතව පවතින බව ප්‍රකාශ කර තිබුණි. එසේම, 73.9%ක පිරිසක් මෙම ප්‍රතිමානය පිළිගන්නා බවට ප්‍රකාශ කර තිබුණු අතර 26%ක පිරිසක් මෙම ප්‍රතිමානය තමන් පිළිනොගන්නා බව ප්‍රකාශ කර තිබුණි. මෙය පිළිගන්නා බවට ප්‍රකාශ කර තිබූ පුද්ගලයින්ගේ බහුතරය එය තමන්ගේ විනය සහ සංස්කෘතිය යන පදනමින් පිළිගන්නා බව ප්‍රකාශ කර තිබුණි.

  මෙම සියලු භාවිතාවන්, ඒවා සමාජ ප්‍රතිමාන වුවද නැතහොත් ආගමික මූලධර්ම වුවද නැතහොත් විශ්වාසයන් වුවද, ඒවා කාන්තාවන්ගේ ආගමික වන්දනා අයිතිය සහ නිදහස සැලකිය යුතු අයුරින් සීමා කරයි.

# 5 වන පරිච්ඡේදය

## 5 පර්යේෂණ නිගමන කොටස 2

### 5.1 ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ ජාතික කතිකාවන් සහ ඒවා කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා නිදහස කෙරෙහි ඇති කරන බලපෑම

#### 5.1.1 හැඳින්වීම

"දෛනික සාකච්ඡාවලදී ඉදිරිපත්වන ජාතික කතිකාවන් බලවත් බවට සැළකේ යනුවෙන් Somers සඳහන් කර තිබේ".[94] ජාතික කතිකාවන් ප්‍රතිපත්ති සම්පාදනය, නීති පැනවීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමේදී බලපෑම් ඇති කළ හැකියාවෙන් යුක්ත වේ.[95] මෙම පර්යේෂණයේ අරමුණ වෙනුවෙන් ජාතික කතිකාවන් යන්නට පෙළපොත් සහ පුවත්පත් ඇතුළුව ජාතික මට්ටමින් නිකුත් කරන හෝ ප්‍රසිද්ධියට පත් කරන ලේඛන සහ ජාතික තලයේ සිදුවන සාකච්ඡා සහ සංවාද වලදී ඉදිරිපත් වන අදහස් වැනි සියලු දේ ඇතුළත් වේ.

කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම සඳහාවන සම්මුතිය කිසිදු වෙන්කිරීමකින් තොරව අපරානුමතකොට තිබීම මගින් ශ්‍රී ලංකා රජය ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව සහතික කිරීම සඳහා එහි කැපවීම සහ බැඳීම අවධාරණය කර තිබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව තහවුරු කිරීම සඳහා වරින් වර පාලන බලයට පැමිණි රජයයන් උත්සාහ කර තිබේ.[96] කෙසේ නමුත් ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව තවමත් ප්‍රශ්නාර්ථයක් වශයෙන් පවතින බව මෙම පර්යේෂණයේ 1 වන පරිච්ඡේදයෙහි පැහැදිලිව සාකච්ඡා කර තිබේ. ඒ සඳහා හේතු ගණනාවක් පැවතිය ද ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සහ ජාතික මට්ටමේ ප්‍රකාශ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි අසමානතාව කෙරෙහි සැලකිය යුතු දායකත්වයක් ලබාදෙයි. ඒවා අතරින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන උතුරු පළාතේ ස්ථාපිත වී ඇති ප්‍රමාණය, ඒවාහි ප්‍රබලත්වය සහ ඒවා කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා නිදහස කෙරෙහි ඇතිකරනු ලබන බලපෑම සම්බන්ධයෙන් පෙර පරිච්ඡේදයේදී පුළුල් ලෙස සාකච්ඡා කර තිබේ. මෙම පරිච්ඡේදය මගින් ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ ජාතික ප්‍රකාශයන්හි ස්ථාවරය සහ ඒවා කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා නිදහස කෙරෙහි බලපෑම් ඇති කරන ආකාරය සම්බන්ධයෙන් සාකච්ඡා කෙරේ.

ඒ අනුව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ ජාතික කතිකාවන් සම්බන්ධයෙන් සලකා බැලීමේදී ශ්‍රී ලංකාවේ නිකුත් වන භාෂා ත්‍රිත්වයට අදාළ පුවත්පත්, පාසැල් පෙළ පොත්, රූපවාහිනී දැන්වීම් සහ සමාජ මාධ්‍ය පළකිරීම් යනාදිය සැලකිල්ලට ගෙන තිබේ. ආගම් සහ භාෂාවන් පදනම් කරගත් පුරාණ සාහිත්‍යයන් පවා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳී වෙනස් කොට සැලකීමේ ජාතික කතිකාවන් නතු කරගෙන තිබුණ ද මෙකල ඒවායෙහි භාවිතය අවම වශයෙන් දක්නට ලැබෙන බැවින් ඒවා කෙරෙහි අඩු අවධානයක් යොමු කරන ලදී. එසේම, මෙකී ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ ජාතික කතිකාවන් කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා නිදහස කෙරෙහි ඇති කරනු ලබන බලපෑම පදනම් කරගනිමින් ඒවා කොටස් දෙකක් යටතේ සාකච්ඡා කර තිබේ.

---

*94* Somers, M. 'The narrative construction of identity: A relational and network approach', (Theory and Society, 1994) p. 614

*95* Mariola, A. 'The power of narratives: Explaining inaction on gender mainstreaming in Uganda's climate change policy', (Development Policy R view, 2000) p. 555- 574

*96* පළාත් පාලන ආයතනයන්හි කාන්තා නියෝජනය සඳහා ආසන වෙන් කිරීම ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳිප්‍රචණ්ඩත්වය තුරන් කිරීම සඳහා වන ජාතික වැඩසටහන, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත යනාදිය ඉදිරිපත් කළ හැකි උත්සාහයන් වෙයි.

## 5.1.2 'දරුවන් රැක බලාගැනීම කාන්තාවන්ට අදාළ දෙයකි' යන්න අවධාරණය කරන ජාතික කතිකාවන්

දරුවන් රැකබලා ගැනීම මූලිකව කාන්තාවන්ගේ කාර්යභාරයක් බවට වන සමාජ ප්‍රතිමානය උතුරු පළාතේ ස්ථාපිතව පවතින ප්‍රබල සහ ඉතා වැදගත් සමාජ ප්‍රතිමානයක් වශයෙන් පෙර පරිච්ඡේදයේදී හඳුනා ගන්නා ලදී. දරුවන් බිහිකිරීමේ සහ මව්කිරි දීමේ හැකියාව කාන්තාවන්ට ස්වාභාවිකව උරුම වූවකි. මෙම ස්වාභාවික තත්ත්වය පදනම් කරගනිමින් දරුවන් රැක බලාගැනීම කාන්තාවන්ට පමණක් හිමි දෙයක් බවට මිථ්‍යාවක් ගොඩනඟමින් එය සමාජයෙහි මුල් බැස ගැනීමට ඉඩ සලසා ඇත. මෙම මිථ්‍යාව තුරන් කිරීම සඳහා උත්සාහ කරන සෑම අවස්ථාවකදීම 'මාතෘත්වය කාන්තාවට හිමි දෙයකි', කාන්තාවක් පරිපූර්ණ වන්නේ මාතෘත්වය තුළිනි, යන මතයන් ඉදිරිපත් කරමින් එම උත්සාහයන් ව්‍යර්ථ කරනු ලැබේ. දරුවන් රැකබලා ගත යුත්තේ කාන්තාවන් විසින්ම බවට වූ අනිවාර්ය නියමයක් සමාජයෙහි ගොඩනඟා තිබේ. එසේම මෙම නියමය පවුල, පාසල සහ ආගමික සිද්ධස්ථාන වැනි සමාජ සංස්ථාවන් තුළ විවිධ ක්‍රම යොදාගනිමින් නැවත නැවතත් අවධාරණය කෙරේ. මව සහ පියා යන දෙපාර්ශවයටම දරුවන් රැක බලාගැනීම සඳහා වූ සදාචාරාත්මක හා නෛතික බැඳීමක් ඇත. කෙසේ නමුත් මෙම වගකීම කාන්තාව මත පමණක් පැටවීම ඇතැම් අවස්ථාවලදී ඇයගේ අයිතිවාසිකම් සහ නිදහස සීමාකරයි. මේ සම්බන්ධයෙන් පෙර පරිච්ඡේදයේදී විශ්ලේෂණයකර තිබේ. මෙම පරිච්ඡේදයේදී ජාතික කතිකාවන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ මෙම ප්‍රතිමානය අවධාරණය කරන්නේ නැතහොත් ශක්තිමත් කරන්නේ කෙසේද යන්න පිළිබඳව සලකා බලමු.

ප්‍රථමයෙන්, පාසැල් පෙළපොත් කෙරෙහි අවධානය යොමු කරන්නේ නම්, දරුවන් රැක බලාගැනීම සම්බන්ධයෙන් පාසල් පෙළ පොත්වල කරුණු අන්තර්ගත කර තිබෙන එක් එක් පාඩමෙහි කිසියම් කාන්තාවක් /ගැහැනු දරුවෙක් (මව හෝ අක්කා) දරුවන් රැකබලා ගන්නා දර්ශන බොහෝදුරට ඇතුළත් කර තිබෙන බව දැකිය හැකිය.

මීළඟට, පුවත්පත්හි පළ වන පුවත් සහ ලිපි සලකා බැලීමේදී දරුවන් රැකබලාගැනීම පිළිබඳ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් ලිවීමේදී දරුවන් රැකබලාගන්නා ප්‍රධාන පුද්ගලයන් වශයෙන් කාන්තාවන් ගෙනහැර දක්වනු ලැබේ. එසේම, කාන්තාවන්ගේ දියුණුව නැතහොත් ඔවුන් සවිබල ගැන්වීම සම්බන්ධයෙන් ලිවීමේදී ඔවුන් ස්ත්‍රී ලිංගිකයන් වශයෙන් සලකන ප්‍රවණතාවට වඩා ඔවුන් 'මව්වරුන්' යන දෘෂ්ටිකෝණය පදනම් කරගනිමින් ලිවීමේ ප්‍රවණතාවක් බොහෝ දුරට දැකිය හැක. ඒ පිළිබඳ උදාහරණයක් ලෙස, කාන්තාවන්ගේ දේශපාලන නියෝජනය සම්බන්ධයෙන් ලියැවෙන බොහෝ ලිපිවල කාන්තාවන් බහුතරයක් දේශපාලනයේ නියෝජනය වීමේදී දරුවන් රැක බලාගැනීමේ පහසුකම් දියුණු කරගත හැකි බවටත් දරුවන් සඳහා වන පෝෂණය සහතික කරගත හැකි බවටත් දක්වන කරුණු ප්‍රධාන වශයෙන් ඉස්මතුකොට දක්වනු ලැබේ.[97] කාන්තාවන්ගේ දේශපාලන නියෝජනය විවිධ ප්‍රතිලාභ අත්කර දිය හැකි තත්ත්වයකි. එය හුදෙක් දරුවන්ගේ යහපත සහ දරුවන් රැක බලාගැනීම පිළිබඳ කරුණුවලට පමණක් සීමාකිරීම යන්න ජාතික ආරක්ෂාව, ජාතික ආර්ථිකය, සාමය, ජාතික නිෂ්පාදනය වැනි වෙනත් වැදගත් කරුණු සම්බන්ධයෙන් දායකත්වය ලබාදීමට කාන්තා දේශපාලන නියෝජිතවරියන් නුසුදුසුය අදහස ව්‍යංගාර්ථයෙන් ප්‍රකාශ කරයි.

## 5.1.3 ඉවුම් පිහුම් සහ ගේදොර වැඩ කටයුතු කාන්තාවන්ට අදාළ බව අවධාරණය කරන ජාතික කතිකාවන්

ඉවුම් පිහුම් සහ ගේදොර වැඩකටයුතු මූලිකව කාන්තාවන්ගේ කාර්යභාරයන් වේ යන්න ප්‍රධාන සමාජ ප්‍රතිමානයක් බව මීට පෙර පරිච්ඡේදයෙහි හඳුනාගන්නා ලදී. එසේම, එම සමාජ ප්‍රතිමානය පුරුෂයන්ට වඩා කාන්තාවන් බහුල වශයෙන් පිළිගන්නා බව පර්යේෂණයේ නිගමනයකි. ගැහැනු දරුවන් කුඩා කල පටන් ගේදොර වැඩකටයුතු සිදු කිරීම කාන්තාවන්ගේ වගකීමක් බව මව්වරුන් විසින් ගැහැනු දරුවන්ට උගන්වනු ලබන බව කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාවන්ට සහභාගීවූවන් විසින් පෙන්වා දී තිබුණි. පවුල නැමැති සමාජ සංස්ථාවට පසු ළමුන්ගේ අන්තර් ක්‍රියාකාරීත්වය සිදුවන දෙවන සමාජ සංස්ථාව වන්නේ පාසලයි. ඒ අනුව, කිසියම් දරුවකු තම පස්වන වියේ සිට දහසය වන විය දක්වා පාසල සමග සම්බන්ධ වී කටයුතු කරයි. එබැවින්, පාසලේදී උගන්වනු ලබන කරුණු දරුවන් තුළ ඉතා ගැඹුරින් කාවදින අතර අවාසනාවන්ත ලෙස ශ්‍රී ලංකාවේ ඉවුම් පිහුම් සහ ගෙදර දොර වැඩ කටයුතු කාන්තාවන්ට පමණක් අදාළ බවටවන සමාජ ප්‍රතිමානය මතු පරම්පරා වෙත ඉතා ප්‍රබලව සහ අඛණ්ඩව සම්ප්‍රේෂණය කරන මාධ්‍යයක් බවට පාසැල් පෙළ පොත් පත්ව ඇත. පහත දක්වා ඇති ඡායාරූප ඒ සඳහා නිදසුන් කිහිපයකි.

---

*97* පාර්ලිමේන්තු මන්ත්‍රිනි කෝකිලා ගුණවර්ධන සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව. (Daily News, 01.08.2020) p. 14, available at:https://mcusercontent.com/b574ca75594e494e783c0ecc6/images/93338583-9695-4873-b032-7dc768107836.jpg accessed 02 August 2021

රූප සටහන 5.1




මූලාශ්‍රය: 1 ශ්‍රේණිය, ශෛව ධර්මය පෙළ පොත

රූප සටහන 5.2



මූලාශ්‍රය: 1 ශ්‍රේණිය, කතෝලික ධර්මය පෙළ පොත

රූප සටහන 5.3



මූලාශ්‍රය: 1 ශ්‍රේණිය, ඉස්ලාම් පෙළ පොත

රූප සටහන 5.4



මූලාශ්‍රය: 1 ශ්‍රේණිය, ශෛව ධර්මය පෙළ පොත

ඉවුම් පිහුම් කටයුතු සහ පිරිසිදු කිරීමේ කටයුතු පෙන්වා දෙනු ලබන සෑම අවස්ථාවකදීම ඒවා සිදු කරන පුද්ගලයා කාන්තාවක් (මව) හෝ ගැහැනු දරුවෙක් (දියණිය) ලෙස පෙන්නුම් කරයි. එකී කටයුතුවල පුරුෂයන් හෝ පිරිමි දරුවන් නිරතවන බව පෙන්නුම් කරනු ලබන රූප සටහන්වල පවා ජලය රැගෙන ඒම, මේස පුටු ඇදීම සහ කඩයට යාම වැනි වැඩකටයුතු පිරිමි දරුවන් විසින් සිදුකරන බවටත්, වළං සේදීම, නිවස අතුගෑම වැනි වැඩකටයුතු කාන්තාවන් සිදු කරන බවටත් පෙන්නුම් කරයි. මෙම ඡායාරූප සියල්ලක්ම ආගමික සාරධර්ම උගන්වනු ලබන ආගමික පෙළපොත්වල ඇතුළත් කර තිබීම විශේෂත්වයකි. මෙය ගැහැනු දරුවන්, කාන්තාවන් ඉවුම් පිහුම් නැතහොත් ගේදොර වැඩකටයුතු භාරව සිටීම ආගමික සාරධර්මයක් ලෙස අවබෝධ කරවීමට මග පාදයි.


බාලාංශ පංතිවල පමණක් නොව ද්විතීයික පංතිවලට අදාළ පෙළපොත් වල ද මෙවැනි ස්ත්‍රීපුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන අවධාරණය කරනු ලබන ඡායාරූප ඇතුළත් කර තිබේ.

රූප සටහන 5.5



මූලාශ්‍රය: 6 ශ්‍රේණිය, ප්‍රායෝගික තාක්ෂණය

රූප සටහන 5.6



මූලාශ්‍රය: 10 ශ්‍රේණිය, සෞඛ්‍යය

රූප සටහන 5.7



මූලාශ්‍රය: 7 ශ්‍රේණිය, සිංහල භාෂාව පෙළපොත

පාසැල් පෙළපොතේහි පමණක් නොව රූපවාහිනී නාලිකාවන්හි විකාශය කරනු ලබන වෙළඳ දැන්වීම් වලද ඉවුම් පිහුම් සහ ගේදොර වැඩකටයුතු පිළිබඳ වගකීම කාන්තාවන්ට පමණක් ඇති බව අවධාරණය කරන අයුරින් රූප රාමු නිර්මාණය කර තිබේ. සබන්, රෙදි සෝදන කුඩු ඇතුළු මහන මැෂිමේ සිට ඇඹරුම් යන්ත්‍රය දක්වා ඉවුම් පිහුම් සහ ගේදොර වැඩකටයුතු සඳහා අවශ්‍ය භාණ්ඩ පිළිබඳ වෙළඳ දැන්වීම්වල රඟපාන්නේ කාන්තාවන් ය. වාහන විකුණුම්, නිවාස මිලදීගැනීම්, ගොඩනැගිලි ද්‍රව්‍ය හා සම්බන්ධ වෙළඳ දැන්වීම්හි බොහෝ දුරට රඟපාන්නේ පිරිමින්ය.

රූප සටහන 5.8




මූලාශ්‍රය: අන්තර්ජාලය

රූප සටහන 5.9




මූලාශ්‍රය: අන්තර්ජාලය

රූප සටහන 5.10



මූලාශ්‍රය: අන්තර්ජාලය

එසේම, පුවත්පත් සහ යූටියුබ්හි ඉවුම්පිහුම් වට්ටෝරු නිකුත් කිරීමේදී ඒවා කාන්තාවන්ට අදාළ පිටුවල ප්‍රසිද්ධ කිරීම හෝ ඒ සඳහා කාන්තාවන්ට අදාළ ඉවුම් පිහුම් වට්ටෝරු යනුවෙන් සිරස්තල යෙදීම වැනි කරුණු ද ඉවුම් පිහුම් කාන්තාවන්ට අදාළ කටයුතු වන බව අවධාරණය කරයි.

**රූප සටහන 5.11**




මූලාශ්‍රය: අන්තර්ජාලය

**රූප සටහන 5.12**




මූලාශ්‍රය: අන්තර්ජාලය

## 5.1.4 කාන්තාවන් මෘදු බවට අවධාරණය කරන ජාතික කතිකාවන්

පාසැල් පෙළ පොත්හි බොහෝ ස්ථානයන්හි කාන්තාවන්ගේ සහ පුරුෂයන්ගේ ගති ලක්ෂණ සඳහන් කර තිබේ. බිය, අහිංසකභාවය, ලැජ්ජාව, සංවේදිතාවය කාන්තාවක් සතු වියයුතු ගුණාංග සතර බවට සිතෙහි ධාරණය කර ගන්නා ලෙසට පාසල් සිසුන් වෙත අවධාරණය කෙරේ.[98] මෙවැනි ප්‍රවණතා සමාජය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි අසමානතා දැඩිව මුල් බැස ගැනීමට මග පාදයි.

**රූප සටහන 5.14**


வருடப் பிறப்புக் கொண்டாட்டங்கள்

மன மகிழ்ச்சி தரும் மரபுவழி விளையாட்டுக்களில் ஈடுபடுதல், உறவினர்களின் இல்லங்களுக்குச் சென்று நலம் விசாரித்து மகிழ்தல், புதுக்கணக்குப் பதிதல், ஏர் மங்கலம், வித்தியாரம்பம் போன்றவை செய்தலும் புதுவருடத்துச் சிறப்பம்சங்களாகும். மக்கள் தமது வேலைகளைப் புத்தாண்டு பிறந்த பின் சுபநேரத்தில் ஆரம்பிப்பார்கள். அத்துடன் புதுப் பஞ்சாங்கம் பார்த்து அவ்வருடப் பலன்களை அறிந்து கொள்ளுதலும் மரபாகும்.

මෙම ඡායාරූපයෙහි ශාරීරික ශ්‍රමය අඩුවෙන් අවශ්‍ය ක්‍රීඩාවක්වන පොල් අතු විවීම සඳහා කාන්තාවන්ද ශාරීරික ශ්‍රමය වැඩියෙන් අවශ්‍ය ක්‍රීඩාවන්හි පුරුෂයින්ද නිරත වී සිටින අයුරු දැකගත හැකිය. ගැහැනු දරුවන් ද ක්‍රීඩා කටයුතුවල නිරත විය යුතු බවට දිරිගැන්විය යුතු පාසැල්වල උගන්වනු ලබන පෙළපොත්හි මෙවැනි ඡායාරූප ඇතුළත් කර තිබීම මගින් සමාජය තුළ ස්ථාපිත වී ඇති වෙනස් කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන තවදුරටත් බලගැන්වෙනු ඇත. ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සම්බන්ධයෙන් තරුණ පිරිස් සමග පවත්වනු ලැබූ මාර්ගගත සාකච්ඡාවේදී කාන්තාවන් ක්‍රීඩා කටයුතුවල නිරතවීම සම්බන්ධයෙන් දෙමව්පියන් කැමැත්තක් නොදක්වන බවට වූ අදහස ඉතා දැඩිව ඉදිරිපත් වී තිබුණි.[99]

---

**98** ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන පිළිබඳව තරුණ පිරිස් සමග 2021.06.02 දින Zoom ඔස්සේ පවත් වන ලද සාකච්ඡාව.

**99** 2021.06.02 දින Zoom ඔස්සේ පවත්වන ලද මාර්ගගත සාකච්ඡාව

### 5.1.5 'ආගමික සිරිත් විරිත් ආරක්ෂා කළ යුත්තේ කාන්තාවන්ය' යන්න අවධාරණය කරනු ලබන ජාතික කතිකාවන්

ආගමික සිරිත් විරිත් සහ ආගමික වතාවත් ආරක්ෂා කිරීමේ වගකීම කාන්තාවන් සතු බව නිරූපණය කෙරේ. සමාජය තුළ පුරුෂයෙක් යම් වරදක් සිදුකිරීමේදී එය තනි පුද්ගලයෙකු විසින් සිදුකරන ලද වරදක් බවට සලකෙන අතර කාන්තාවක් යම් වරදක් සිදුකරන විටක එය සංස්කෘතිකමය හානියක් සඳහාවන සලකුණක් වශයෙන් සලකනු ලැබේ.[100] සංස්කෘතිය යනු හුදෙක් කාන්තාවන් හා සම්බන්ධ කරුණක් වශයෙන් සැලකීමත්, සංස්කෘතිය මතු පරම්පරාව වෙත රැගෙන යන්නන් යන අනන්‍යතාව මෙම සමාජය විසින් කාන්තාවන්හට ලබාදී තිබීමත් මේ සඳහා හේතු වී තිබේ. තම ආගමික සිරිත් විරිත්, සංස්කෘතික භාවිතාවන් සහ සම්ප්‍රදායන් ආරක්ෂා කළ යුතු බවට කාන්තාවන්ට කුඩා කල සිට උගන්වනු ලැබේ. ඒ සඳහා පවුල, පාසල වැනි සමාජ සංස්ථා විශාල දායකත්වයක් ලබාදෙයි.

රූප සටහන 5.13



මූලාශ්‍රයః 10 ශ්‍රේණිය, ශෛව ධර්මය පෙළපොත

රූප සටහන 5.14




මූලාශ්‍රයః 8 ශ්‍රේණිය, ශෛව ධර්මය පෙළපොත

කාන්තාවන්ට එරෙහි සියලු ආකාර වෙනස්කම් පිටුදැකීමේ සම්මුතිය ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ පිටපත් සහ රූපසටහන් පෙළ පොත් වලින් ඉවත් කරන ලෙස අවධාරණය කරයි. ශ්‍රී ලංකාව 1981 වසරේදී මෙම සම්මුතිය කිසිදු වෙන් කිරීමකින් තොරව අපරානුමත කරනු ලැබුවද, මේ දක්වා පෙළපොත්වලින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ කොටස්, රූපසටහන් සහ පිටපත් ඉවත් කර නොමැත.[101]

## 5.2 යුද්ධයෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමාජ ප්‍රතිමානයන්ට අදාළ ප්‍රවනතාවෙහි ඇති වී තිබෙන වෙනස්කම්

### 5.2.1 හැඳින්වීම

මෙම පර්යේෂණය සිදුකරනු ලැබූ උතුරු පළාත 1983 වසරේ සිට 2009 වසර දක්වා වසර 30ක යුද්ධයකට මුහුණ දුන් පළාතකි. 2009 වසරේ අත්කරගත් හමුදා විජයග්‍රහණයත් සමග යුද්ධය අවසානයකට පැමිණිය ද යුද්ධයේ ප්‍රතිඵල තවමත් මෙම සමාජය තුළ ස්ථාපිතව පවතී. ලිංග භේදයකින් තොරව යුද්ධය සියලු දෙනාගේ ජීවිත කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කර තිබුණ ද, යුද්ධය හේතුවෙන් කාන්තාවන් මුහුණදුන් සහ මුහුණදෙමින් සිටින ගැටලු සුවිශේෂී සහ බරපතල වේ. යුද්ධයේදී කාන්තාවන්ට එරෙහිව ලිංගික ප්‍රචණ්ඩත්වය ප්‍රධාන ආයුධයක් වශයෙන් භාවිතා කරනු ලැබීම, පුරුෂයන් සැලකිය යුතු පිරිසක් ඝාතනය කරනු ලැබීම සහ අතුරුදහන් කරවනු

**100** 2021.03.19 දින යාපනයේ සර්වෝදය ශාලාවේ දී පවත්වනු ලැබූ දත්ත රැස්කරන්නන් සඳහා වූ වැඩමුළුව.
**101** කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් පිටුදැකීමේ සම්මුතිය, 10(ඇ) වගන්තිය

ලැබීම සහ අඛණ්ඩ හමුදා නිරීක්ෂණය වැනි දේ එවන් ගැටලුවලින් කිහිපයක් ලෙස පෙන්වා දිය හැකිය. විශාල වශයෙන් පිරිමින් මරා දැමීම සහ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම බොහෝ කාන්තා මූලික පවුල්වලට හේතු විය. ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් සියලු ප්‍රජාවන් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි අසමානතාව දැකගත හැකි අතර කාන්තාවන්ගේ නිදහස් ජීවිතය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ද එය එල්ල කරනවා මෙන්ම ඔවුන් පහසුවෙන් පීඩාවට පත්විය හැකි කණ්ඩායමක් බවටද පත් කරනු ලබයි. එවන් පසුබිමක් තුළ යුද්ධයේ ප්‍රතිවිපාක කාන්තාවන් තවදුරටත් පීඩාවට පත්කළ හැකි පුද්ගලයින් පිරිසක් බවට පත්කර තිබේ.

යුද්ධය කිසියම් සමාජයක සාමකාමී සමාජයීය, ආර්ථික සහ සංස්කෘතික ජීවිතය මුළුමනින්ම වෙනස් කරයි. යුද්ධයෙන් පසු සමාජයක් යළි ගොඩනැගීමේදී අවසන්වූ යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් වෙනස්කම් රාශියක් ඇති වනු ඇත. ඒවා ධනාත්මක මෙන්ම සෘණාත්මක වෙනස්කම් ද විය හැකිය. ඒ අනුව ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ ඇතිව තිබූ වසර 30 ක යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් "සමාජ ප්‍රතිමානන්හි ප්‍රවණතාවෙහි ඇති වී තිබෙන වෙනස්කම් හඳුනා ගැනීම මෙම කොටසෙහි අරමුණ වී තිබේ.

## 5.2.2 යුද සමයේදී සමාජ ප්‍රතිමායන්හි ඇතිවූ ප්‍රවණතාව

"දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය ක්‍රියාත්මක වූ කාලසීමාවේදී කාන්තාවන්ට එරෙහි වෙනස්කොට සැලකීම් දක්නට නොලැබුණි. කාන්තාවන් පුරුෂයන්ට සමානව සලකනු ලැබූහ. කුලභේද පදනමින් සිදුවන මර්දනයන් දක්නට නොලැබුණි. සියල්ලන් සමානය යන තත්ත්වය දක්නට ලැබුණි" හිටපු කාන්තා සටන්කාමීන් සමග පවත්වන ලද කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාවට සහභාගී වූ කාන්තාවක්.[102]

කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා වලට සහභාගිවූ සැලකිය යුතු සංඛ්‍යාවකින් සමන්විත හිටපු කාන්තා සටන්කාමීන්, කාන්තාවන්ට එරෙහි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන යුද කාලයේ දී ප්‍රායෝගිකව නොපැවති බව සඳහන් කළහ.[103] විශේෂයෙන්ම, යුද සටන්කාමීන් වශයෙන් කාන්තාවන්ද බඳවා ගනු ලැබීම තුළින් කාන්තාවන් මෘදු පුද්ගලයින්, බියවන ස්වභාවයකින් යුක්ත වූවන්, දුර්වල පුද්ගලයින් වැනි ගුණාංගයන් පදනම් කරගනිමින් කාන්තාවන් ඇගයීමට ලක්කිරීමේ සංස්කෘතිය මුළුමනින්ම තුරන් වී තිබුණි. කාන්තාවෝද පුරුෂයන්ට සමානව බර වාහන පැද වූහ, අවි පුහුණුව ලැබූහ, එසේම අවසන් යුද්ධයට ද සහභාගී වූහ.[104]

පුරාණයේ සිට කාන්තාවන් සංස්කෘතිය ආරක්ෂා කරන්නියන් වශයෙන් හා ගෘහණියන් වශයෙන් සලකනු ලැබූ දෙමළ ප්‍රජාව යුද කාලයේ දී ඔවුන් ආයුධ සන්නද්ධව යුද්ධයට සහභාගී වූ සටන්කාමීන් වශයෙන් පිළිගත්තේය. මෙම සමාජ වෙනස කෙටි කාලයක් තුළ සිදුවිය. මේ සම්බන්ධයෙන් යාපනය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය බහිරදී විසින් පහත පරිදි ප්‍රකාශ කර තිබේ.

"අසාමාන්‍ය වාතාවරණයකට මුහුණදීමට සිදුවීමේදී මිනිසුන් දිවි බේරාගනිමින් ජීවත්වීමේ යාන්ත්‍රණයන් අනුගමනය කරනවා ඇත."

යුද්ධයක් සිදුවූ අසාමාන්‍ය වාතාවරණයකදී අවශ්‍යතාව පදනම් කරගනිමින් කාන්තාවන් සටන්කාමීන් වශයෙන් බඳවාගනු ලැබූහ. ඉන් අනතුරුව කාන්තාවන් නිවසට සීමා කරන නැතහොත් ඔවුන්ගේ කාර්යක්ෂමතාවය හීන කරන සමාජ ප්‍රතිමාන සමාජ භාවිතයෙන් තුරන් විය. යුද කාලසීමාවේ දී මහජනතාව ලිංග භේදයෙන් තොරව සියලු සටන්කාමීන් වෙත නිසි ගෞරවය ලබාදුන් අතර ඔවුන් මහ විරුවන් වශයෙන් පැසසුමට ද ලක් කළහ.[105] කාන්තා සටන්කාමීන් ඇතුළු සියලු සටන්කාමීන් සඳහා මහජනතාව ආහාර සැපයූහ. මිශ්‍ර විවාහ සහ දෙවන විවාහය යනාදිය විවේචනවලින් තොරව අනුමත කළහ.[106] ඒ අනුව යුද්ධය දියත් වූ කාලයේදී දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය සමාජ වෙනසක් සඳහා වූ නියෝජිතයන් වශයෙන් ක්‍රියාත්මක වූහ.[107]

***102*** 2021.03.21 වන දින කිලිනොච්චිය කනකපුරම්හි පිහිටා ඇති ග්‍රාමීය සංවර්ධන සංගම් ශාලාවේදී පවත්වන ලදී.
***103*** 2021.03.21 වන දින කිලිනොච්චිය කනකපුරම්හි පිහිටා ඇති ග්‍රාමීය සංවර්ධන සංගම් ශාලාවේදී පවත්වන ලදී.
***104*** වෙට්ට්‍රිච් සෙල්වි, "ඊළාම් සටනේ අවසන් දින කිහිපය" (මලර් මුහම්, 2012)
***105*** වෙට්ට්‍රිච් සෙල්වි, "සටන්කාමියකු ගේ පෙම්වතිය" (මලර් මුහම්, 2012)
***106*** හිටපු කාන්තා සටන්කාමීන් සමග පවත්වනු ලැබූ සාකච්ඡාව. 2021.03.20 වන දින යාපනයේ සර්වෝදය ශාලාවේදී පවත්වන ලදී.
***107*** ආචාර්ය බහිරදී සමග පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව. 2021.02.07 වන දින Zoom ඔස්සේ පවත්වන ලදී.

## 5.2.3 පශ්චාත් යුද සමයේ සමාජ ප්‍රතිමානයන්හි ප්‍රවනතාවෙහි ඇති වී තිබෙන වෙනස

යුද්ධය පැවැති කාලසීමාවේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව සම්බන්ධයෙන් සාධනීය වෙනස්කම් රාශියක් සිදුව තිබුණද, ඒවා තත්කාලීන පිළිඹිබුවන් විය. අසාමාන්‍ය වාතාවරණයකදී ජීවිතය බේරාගෙන ජීවත්වීමේ උපක්‍රමයක් වශයෙන් සමාජය ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව අනුමත කරමින් කාන්තාවන් සඳහා ද සම අයිතිවාසිකම් ලබාදී තිබුණි. පශ්චාත් යුද සමයේදී සමාජය සාමාන්‍ය වාතාවරණයකට පත්වීමේදී සමාජයේ මුල්කාලීනව ස්ථාපිතව තිබූ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන යළි බලවත්වීමට පටන් ගැනුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් හිටපු කාන්තා සටන්කාමීන්ට ලබාදී තිබූ පිළිගැනීමේ ප්‍රමාණය, නැතහොත් ගෞරවය අඩුකොට ඔවුන් විවේචනය කිරීමේ ප්‍රවණතාවයක් ඇතිවිය.[108]

මෙය අපට සංජානනීය මනෝවිද්‍යාව (Cognitive Psychology) පිළිබඳ මතවාදය ඔස්සේ විග්‍රහ කළ හැකිය. මිනිස් මොළයේ දෘඩ කොටසේ තැන්පත්වන කරුණු / මතකයන් / සිතුවිලි වෙනස්කිරීම ඉතාමත්ම අපහසුය යන්න එම මතවාදය වේ. ඒ අනුව අසාමාන්‍ය වාතාවරණයකින් පසු සාමාන්‍ය පරිසරයක් කරා පැමිණි ජනතාව තමන් කුඩා කල සිට අනුගමනය කරනු ලැබූ ප්‍රතිමාන සහ භාවිතාවන් නැවතත් අනුගමනය කිරීමට පටන් ගත්හ.[109]

පශ්චාත් යුද සමයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව කෙරෙහි ඇතිවූ තවත් බලපෑමක් වනුයේ යුද්ධයෙන් බොහෝ කාන්තාවන් / ගැහැනු දරුවන් ශාරීරික දුබලතා සහිත පිරිසක් බවට පත් කරනු ලැබීමයි." කාන්තාව" යන තම ලිංගික අනන්‍යතාව හේතුවෙන් වෙනස්කොට සැලකීම්වලට මුහුණදෙමින් සිටි කාන්තාවන් "දුබලතාව" නැමැති නව අනන්‍යතාව හේතුවෙන්ද බොහෝ වෙනස්කොට සැලකීම්වලට ලක්වෙමින් සිටිති. 'කාන්තාව' සහ'දුබලතාව' යන අනන්‍යතා ද්විත්වය ඡේදනය වීමේදී එහි ප්‍රතිඵලයක් වශයෙන් කාන්තාවන් පහසුවෙන් පීඩාවට පත්විය හැකි පිරිසක් බවට පත්වේ. ශාරීරික දුබලතාවෙන් යුත් කාන්තාවන් සම්බන්ධයෙන් සමාජමය වෙන්කිරීමක් නොමැති බවට එකී කාන්තා පිරිස් තහවුරු කර තිබුණද සෙසු කාන්තාවන් භුක්තිවිඳින සාමාන්‍ය අයිතිවාසිකම් සහ නිදහස තමන්ට භුක්ති විඳීමට නොහැකි බව ප්‍රකාශ කළහ.[110] උදාහරණ වශයෙන් පොදු ස්ථාන සහ ගොඩනැගිලි සඳහා ප්‍රවේශ පහසුකම් නොමැති වීම, රජයේ ගොඩනැගිලි තුළ විදුලි සෝපාන පහසුකම් නොමැති වීම වැනි මූලික ගැටලු තම අයිතිවාසිකම් සහ නිදහස අභියෝගයට ලක් කරන බව ප්‍රකාශ කළහ.[111]

ඇතැම් අවස්ථාවලදී යුද්ධයෙහි ප්‍රතිවිපාක විසින් ඇතැම් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමානයන්හි පැවැත්ම සඳහා පරිසරයක් නිර්මාණය කර තිබෙන බවට දැකිය හැකිය. විශේෂයෙන්ම කාන්තාවන් රාත්‍රී කාලයේ දී තනිව ගමන් බිමන් නොයා යුතුය සහ පොලිස් ස්ථාන වෙත නොයා යුතුය වැනි සමාජ ප්‍රතිමාන පෙන්වා දිය හැකිය. යුද්ධය පැවති කාලසීමාවේ දී සහ ඊට පසු කාලසීමාවේදී යුද හමුදාව සහ පොලීසිය විසින් උතුරු පළාතේ ජනතාව කෙරෙහි ඇති කර තිබූ අමිහිරි අත්දැකීම් සහ ඔවුන් සම්බන්ධයෙන් ස්ථාපිත වී ඇති බිය හේතුවෙන් මෙම සමාජ ප්‍රතිමාන අනුගමනය කෙරෙන බවට පර්යේෂණයට සහභාගී වූ පිරිස් සඳහන් කර තිබුණි.[112] උතුරු පළාතේ අඛණ්ඩව සිදුවන හමුදාකරණය විසින් ද ආරක්ෂාව පිළිබඳ උනන්දුවක් ඇති කර තිබේ. සංස්කෘතික පදනමෙන් ප්‍රකාශ කළ ද නැතහොත් ආරක්ෂාව පිළිබඳ උනන්දුවෙන් ප්‍රකාශකළ ද කාන්තාවන් රාත්‍රී කාලයේ දී තනිව ගමන් නොකළ යුතුය සහ පොලිස් ස්ථාන වෙත නොයා යුතුය වැනි ප්‍රතිමාන කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ නිදහස සීමා කරන බවට කිසිදු සැකයක් නොමැත.

---

**108** හිටපු කාන්තා සටන්කාමීන් සමග පවත්වනු ලැබූ සාකච්ඡාව. 2021.03.20 වන දින යාපනයේ සර්වෝදය ශාලාවේදී පවත්වන ලදී.

**109** ආචාර්ය බහිරදී සමග පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව. 2021.02.07 වන දින Zoom ඔස්සේ පවත්වන ලදී.

**110** ශාරීරික දුබලතා සහිත කාන්තාවන් සමග පවත්වන ලද සාකච්ඡාව. 2021.03.20 දින කිලිනොච්චිය කනකපුරම්හි පිහිටි ග්‍රාමීය සංවර්ධන සභා ශාලාවේදී පවත්වන ලදී.

**111** කිලිනොච්චි කනගරායන්කුලම් ආර්.ඩී.එස් ශාලාවේ ආබාධිත කාන්තාවන් සමග පවත්වන ලද සාකච්ඡාව

**112** දත්ත පිරික්සීමේ වැඩමුළුව, 2021.08.04 දින සහ 2021.08.05 දින 'දදප ඔස්සේ පවත්වන ලදී.

කෙසේ නමුත්, යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජය තුළ සමාජ ප්‍රතිමාන සම්බන්ධයෙන් යම් සාධනීය වෙනස්කම් ද ඇතිවී තිබේ. ඒවා අතුරින් ඉතා වැදගත් වෙනස්කමක් වනුයේ, කාන්තා ගෘහ මූලික පවුල් සඳහා ලැබී තිබෙන පිළිගැනීමයි. පුරුෂයන් පමණක් ගෘහ මූලිකයන් විය යුතුය, ප්‍රධාන ආදායම් උපයන්නා පුරුෂයන් විය යුතුය, කාන්තාවන් ශාරීරික ශ්‍රමය අධිකව අවශ්‍ය වන වැඩ කටයුතුවල නැතහොත් ව්‍යාපාරික කටයුතු වල නිරත නොවිය යුතුය වැනි සමාජ ප්‍රතිමාන කාන්තා ගෘහ මූලික පවුල් සම්බන්ධයෙන් ලිහිල් වී තිබීම නිරීක්ෂණය කළ හැකිය. ඊට හේතුව වන්නේ 2009 වසරේදී සිදුවූ අවසන් යුද්ධයේදී පුරුෂයන් ඝාතනයට ලක් වීමත් අතුරුදහන් වීමත්, 2009 වසරට පසු කාල සීමාවේ දී පවා පිරිමි පුද්ගලයින් අතුරුදන් වීමත්, සුදු වෑන් මගින් පැහැරගෙන යාමත් සිදු වූ බැවිනි. යුක්තියට පටහැනි මෙවන් ඝාතන සහ අතුරුදහන් කරවීම් බොහෝ කාන්තාවන්ට තම ස්වාමිපුරුෂයා අහිමිවීමට හේතුපාදක විය. එතෙක් ස්වාමිපුරුෂයාගේ ආදායම් මග විශ්වාස කරමින්, රැකවරණ ආර්ථිකය පමණක් ක්‍රියාත්මක කළ කාන්තාවන් ආදායම් ඉපයිය යුතු තත්ත්වයකට පත්විය. එය ඔවුන්ගේ ආර්ථික ස්වාධීනත්වය තහවුරු කළේය.

පවුලේ නායකත්වය සහ ආර්ථික ස්වාධීනත්වය මෙම කාන්තාවන් සඳහා බලයක් ලබා දෙන ලදී. මෙලෙස යුද්ධයෙන් පසු ඇති වූ වෙනස්කම් මගින් සමාජයේ පැවැති බල ගතිකත්වය තුළ සාධනීය වෙනසක් නිර්මාණය විය.

යුද්ධයෙන් පසු ඇතිවූ තවත් සාධනීය වෙනසක් වනුයේ ස්වාමිපුරුෂයා හා අහිමිවූ කාන්තාවන් අසුබ දසුනක් සේ සලකනු ලැබීම අවම වීමයි.

ස්වාමිපුරුෂයා අහිමිවූ කාන්තාවන් අසුබ දසුනක් සේ සැලකීමේ ප්‍රතිමානය අඩුව යාම පශ්චාත් යුද සමයේදී සිදු වූ ධනාත්මක පරිවර්තනයකි. පෙර පරිච්ඡේදයේ දී උතුරු පළාතේ ස්ථාපිතව පවතින සමාජ ප්‍රතිමාන ස්ථාපිත වී ඇති ප්‍රමාණය අනුව ශ්‍රේණිගත කිරීමේ දී ස්වාමිපුරුෂයා අහිමිවූ කාන්තාවන් අසුබ දසුනක් සේ සැලකීමේ ප්‍රතිමානය 20 වන ස්ථානයට පත්ව තිබුණි. යුද්ධයෙන් අනතුරුව පෙර නොවූ විරූ අයුරින් ස්වාමිපුරුෂයා අහිමි වූ කාන්තාවන්ගේ සංඛ්‍යාව වර්ධනය වීමත්, එකී දුක්ඛිත තත්වයේ වේදනාව බොහෝ පිරිසකට එක් අවස්ථාවකදී අවබෝධ කරගැනීමට හැකිව තිබීමත් මෙම සමාජ ප්‍රතිමානයේ පැවැත්ම ප්‍රශ්නාර්ථයක් බවට පත්කර ඇති බවට සඳහන් කළ හැකිය. කෙසේ නමුත්, ස්වාමිපුරුෂයා අහිමි වූ කාන්තාවන් සුභ කටයුතුවලින් ස්වයංව ඉවත් වීමේ ප්‍රවණතාවයක් බහුල වශයෙන් දැකගත හැකි විය. ස්වාමි පුරුෂයා අහිමි වූ කාන්තාවන් සමග පවත්වන ලද කේන්ද්‍රිය කණ්ඩායම් සාකච්ඡා සඳහා සහභාගී වූ බොහෝ කාන්තාවන් සුභ කටයුතුවලින් තමන් ස්වයංව ඉවත්වන බව ප්‍රකාශ කළහ.[113]

**"මගේ දුවට තාලිය (තැල්ල) බඳින ලද අවස්ථාවේ මම ශාලාවේ හිටියේ නැහැ. මගේ දුවගේ ජීවිතයට කිසිම කරදරයක් ඇති නොවන්නටයි මමම ඉවත් වී සිටියේ."** ස්වාමිපුරුෂයා අහිමිවූ කාන්තාවන් සමග පවත්වන ලද කේන්ද්‍රිය කණ්ඩායම් සාකච්ඡාවට[114] සහභාගීවූ කාන්තාවක්.

එසේම, පශ්චාත් යුද සමයේදී රාජ්‍ය නොවන සංවිධානයන්හි මැදිහත්වීම් සහ සේවාවන් උතුරු පළාත තුළ වර්ධනය වී තිබීම කාන්තාවන්ගේ හැකියාවන් සහ නායකත්ව ගුණාංගයන්හි සාධනීය වෙනස්කම් රාශියක් ඇති කර තිබේ. එසේම රාජ්‍ය නොවන සංවිධාන හරහා කාන්තාවන්ට ලබා දෙන ලද ස්වයං රැකියා ව්‍යාපෘති සහ වෘත්තීය පුහුණු යනාදිය ඔවුන්ගේ ආර්ථික ස්වාධීනත්වය තහවුරු කර තිබේ. රාජ්‍ය නොවන සංවිධාන විසින් ඇති කරන ලද මෙවැනි සාධනීය වෙනස්කම් කාන්තාවන්ට එරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳී වෙනස් කොට සැලකීමේ සමාජ ප්‍රතිමානයන්ට විරුද්ධව නැගී සිටීමට අවශ්‍යය ශක්තිය කාන්තාවන්ට ලබාදී තිබේ.

***113*** ස්වාමිපුරුෂයා අහිමිවූ කාන්තාවන් සමග පවත්වන ලද සාකච්ඡාව, 2021.03.21 දින කිලිනොච්චිය කනකපුරම්හි පිහිටි ග්‍රාමීය සංවර්ධන සංගම් ශාලාවේ දී පවත්වන ලදී.

***114*** ස්වාමිපුරුෂයා අහිමිවූ කාන්තාවන් සමග පවත්වන ලද සාකච්ඡාව, 2021.03.20 දින යාපනයේ පිහිටි සර්වෝදය ශාලාවේ දී පවත්වන ලදී.

### ප්‍රධාන නිගමන

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස්කොට සැලකීමේ සමාජ සම්මතයන් යුධ සමයේ දී සමාජයෙන් තුරන් විය. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඉහළ මට්ටමකින් පවත්වාගෙන යන ලදී. එල්.ටී.ටී.ඊ සන්නද්ධ අරගලයට කාන්තාවන් බඳවා ගැනීමේ අවශ්‍යතාවය මෙයට මූලික වූ සාධකය විය.

- මිනිසුන් බොහෝ විට අසාමාන්‍ය අවස්ථාවන්හී දී සමාජ සම්මතයන්ගෙන් බැහැර වේ. සමාජ සම්මතයන්ගෙන් බැහැර වීම පැවැත්ම තහවුරු කරගැනීමේ උපාය මාර්ගයක් ලෙස පිළිගෙන ඇත.

- යුද්ධය සහ එහි බලපෑම වැන්දඹුවන් සම්බන්ධ සමාජ සම්මතයන් යම් දුරකට සමාජයෙන් ඉවත් කර ඇත.

- සිවිල් යුද්ධයේ අතුරු ඵලයක් ලෙස කාන්තා මූලික පවුල් බිහිවීම ගෘහ මූලිකත්වය පිරිස විය යුතුය යන සමාජ සම්මතය ඉවත් කිරීමට හේතු වී ඇත.

- යුද්ධය විසින් ගෙන එන ලද තවත් ධනාත්මක වෙනසක් නම් සිවිල් සමාජ සංවිධානයන්හි මැදිහත් වීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස කාන්තාවන්ගේ ආර්ථිකය සවිබල ගැන්වීම සහ ධාරිතා ගොඩනැගීමයි. කාන්තාවන් සවිබල ගැන්වීම ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස් කොට සැලකීමේ සමාජ ප්‍රතිමානයන්ට විරුද්ධ වීමට ඔවුන්ට ඇති හැකියාව ශක්තිමත් කරයි. කෙසේවෙතත් යුද්ධය හේතුවෙන් උතුරු පළාතේ ආබාධිත සංඛ්‍යාව වැඩිවීම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයට තවත් අභියෝගයක් වී ඇත.

- ආබාධිතභාවය මත කාන්තාවන් වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමානයන් ප්‍රායෝගිකව නොපවතින නමුත් ආබාධිත කාන්තාවන් සඳහා නිසි පහසුකම් නොමැතිකම ඔවුන්ගේ අයිතිවාසිකම් හා නිදහස සීමා කරයි.

- යුද්ධයේ ප්‍රතිවිපාක සමාජ සම්මතයන් ඇතුළු සමාජ ව්‍යුහයේ විශාල වෙනස්කම් ඇති කර ඇත. එබැවින් පශ්චාත් යුධ සමාජය සාමය කරා ගමන් කරන අතර එහි ව්‍යුහය ප්‍රතිනිර්මාණය කිරීමට උත්සහ දරයි. මෙම කාල පරිච්ඡේදය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස් කිරීමට එරෙහිව ආරම්භ කරන ලද උපදේශනය සමාජ ව්‍යුහයන් ප්‍රතිනිර්මාණය කිරීමේ ක්‍රියාවලියට හිතකර බලපෑමක් ඇති කරනු ඇත.

# 6 වන පරිච්ඡේදය

## 6 නිගමනය සහ නිර්දේශ

### 6.1 නිගමනය

ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි අසමානතාව යනු දශක ගණනාවක සිට ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටින අභියෝගයකි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන පැවතීම ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි අසමානතාව සඳහා ප්‍රධාන සාධකයකි. සමාජ ප්‍රතිමානයන්හි ස්වභාවය හේතුවෙන් ඒවා නිරීක්ෂණය කිරීම සහ ඇගයීම සංකීර්ණ ක්‍රියාදාමයක් වේ. කෙසේ නමුත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව තහවුරු කිරීම සඳහා සමාජය තුළ ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන වෙනස් කිරීම අත්‍යවශ්‍ය වන්නේය. ඒ අනුව, වසර 30ක කාලයක් පුරා යුද ගිනි ඇවිලුණු උතුරු පළාතේ මෙම සමාජ ප්‍රතිමාන වෙනස් කළ යුතු වීමේ අවශ්‍යතාවය දැඩිව පවතී. යුද්ධය අවසන් වී වසර දහයක් ගෙවී ඇති තත්ත්වයක් තුළ ද මේ දක්වා සමාජය තුළ ස්ථාපිත වී පවතින යුද්ධයේ ප්‍රතිවිපාක සහ බලපෑම් කාන්තාවන්ගේ ජීවිතය කෙරෙහිත් ඔවුන්ගේ අයිතිවාසිකම් හා නිදහස කෙරෙහිත් විශාල බලපෑම් එල්ලකිරීම මීට හේතු වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ ප්‍රධාන සමාජ ප්‍රතිමාන හඳුනාගැනීම, ඒවා තක්සේරු කිරීම, එමගින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා නිදහස කෙරෙහි ඇති කෙරෙන බලපෑම අවබෝධ කරගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වී තිබුණි එසේම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ ජාතික ප්‍රකාශ හඳුනා ගැනීම සහ යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමානයන්හි ප්‍රවනතාවෙහි ඇති වූ වෙනස්කම් අවබෝධ කරගැනීම ද මෙම පර්යේෂණයේ අරමුණු විය.

පර්යේෂණය මගින් ඇතිකර ගන්නා ලද නිගමනයන් හි පදනමෙන් උතුරු පළාතේ ස්ථාපිතව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ ප්‍රධාන සමාජ ප්‍රතිමාන දහයක් හඳුනාගනු ලැබූ අතර ඒවා කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා නිදහස කෙරෙහි බලපානු ලබන ආකාරය තාර්කික වශයෙන් විශ්ලේෂණය කර තිබේ. එවන් ප්‍රධාන සමාජ ප්‍රතිමාන බොහෝ දුරට කාන්තාවන්ගේ කාර්යභාරය පවුල් පරිසරයට පමණක් සීමා කරන ඒවා ලෙසද"යහපත් කාන්තාව", සහ පතිව්‍රතතාව" යන මතවාදයන් සමග සම්බන්ධ වන අයුරින් ද පැවතුණි. එසේම ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීම දිරිගන්වන්නා වූ පාසල් පෙළ පොත්, වෙළඳ දැන්වීම් සහ පුවත් පත් නිර්මාණ වැනි ජාතික ප්‍රකාශ සම්බන්ධයෙන් මෙම පර්යේෂණයේදී සලකා බැලුණි. යුද සමයේ දී සහ පශ්චාත් යුද සමයේදී මෙකී සමාජ ප්‍රතිමානයන්හි ප්‍රවනතාව වෙනස් වී ඇති ආකාරය පිළිබඳව ද මෙම පර්යේෂණයේදී සාකච්ඡා කරන ලදී.

මෙම පර්යේෂණයේ ලිපි ග්‍රන්ථ විමසුම පිළිබඳ පරිච්ඡේදයෙහි අදාළ විෂය කරුණ සම්බන්ධයෙන් ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර පර්යේෂණ පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් අන්තර්ගත වී තිබේ. ශ්‍රී ලංකාවේ යුද්ධයක් පැවැති වාතාවරණයක් තුළ ස්ථාපිත වී පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සහභාගිත්ව පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ පුළුල් ලෙස ගවේෂණය කර ඇති පර්යේෂණයක් වශයෙන් මෙම පර්යේෂණය වැදගත් වේ. මෙම පර්යේෂණය ඔස්සේ සොයාගනු ලැබ ඇති දත්ත සහ ඒවා මත පදනම් වූ ප්‍රධාන නිගමන ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන වෙනස්කිරීම සඳහා වන කාර්යක්ෂම මැදිහත්වීම් සැලසුම් කර ගැනීම සඳහා උපකාරී වනු ඇත.

## 6.2 නිර්දේශ

ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන උතුරු පළාතය තුළ පවතින බවත්, එයින් කාන්තාවන් තම අයිතිවාසිකම් සහ නිදහස භුක්ති විඳීමට සෘණාත්මක ලෙස බලපාන බවත් පර්යේෂණ සොයාගැනීම් පැහැදිලිවම පෙන්නුම් කරයි. මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සමාජය තුළ මුල්බැස ඇති අතර, එය ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාවය ඇති කරගැනීමට විශාල අභියෝගයක් වේ. මෙම අභියෝගයට සාර්තකව මුහුණ දීමටත්, පිරිමින් සහ කාන්තාවන් අතර සමානාත්මතාවය සහතික කිරීමටත්, ප්‍රජා සාමාජිකයින් තුළ ජීවිතය කෙරෙහි ඇති සාම්ප්‍රදායික මතයන්හි වෙනසක් අවශ්‍ය වනු ඇත. පුද්ගලයිනගේ ආකල්ප වෙනස් කිරීමට හැකි වන්නේ මෙම සාම්ප්‍රදායික ලක්ෂණයන් ඉවත් කිරීම තුළින් පමණි. රීතීන් මගින් පාලනය කරනු ලබන ඔවුන්ගේ සමාජ ජීවිතය තුළ වෙනසක් ඇති වූ විට ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාවය සහතික වනු ඇත. කෙසේවෙතත්, එවැනි වෙනස්කම් ක්ෂණිකව සිදු නොවන්නේය. මෙම පරිවර්තනය ඇති කිරීමට නම්, දීර්ඝ කාලීන, මනාව සැලසුම් කරන ලද මැදිහත් වීම් අවශ්‍ය වේ. එවැනි මැදිහත්වීම් පහතින් සඳහන් කර ඇතඃ

### 6.2.1 නීති සංශෝධනය සඳහා වන නිර්දේශ

නීතිය සහ සමාජ ප්‍රතිමාන අතරේ සමීප සබඳතාවක් පවතින අතර ඒවා එකක් අනෙක කෙරෙහි බලපෑම් එල්ල කරයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන කෙරෙහි සහයෝගය දක්වන ආකාරයෙන් පවතින නීතීන් හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීම් නිර්මාණය කරන නීතින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමානයන්හි ප්‍රබලත්වය තවදුරටත් දැඩි කරයි. එබැවින් මෙවැනි නීතීන් සංශෝධනය කිරීම අත්‍යාවශ්‍ය වේ. එලෙස සංශෝධනය කළ යුතු නීතීන් කිහිපයක් පහත දක්වා ඇත.

- **දණ්ඩ නීති සංග්‍රහයේ පවතින ස්ත්‍රී දූෂණය පිළිබඳ විධිවිධාන සංශෝධනය කිරීම**
  - වෛවාහක ස්ත්‍රී දූෂණය අපරාධයක් ලෙස ඇතුළත් කිරීම
- **සාක්ෂි ආඥා පනතේ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳිවෙනස්කොට සැලකීමේ විධිවිධාන සංශෝධනය කිරීම**
  - සාක්ෂි ආඥා පනතේ 155(ඇ) වගන්තිය "ස්ත්‍රී දූෂණය කිරීමක් ගැන හෝ දූෂණය කිරීමට තැත් කිරීමක් ගැන මිනිසකුට විරුද්ධව නඩු පවරනු ලැබූ විට චෝදක තැනැත්තී සාමාන්‍යයෙන් අයහපත් චරිතයකින් යුක්ත යැයි පෙන්විය හැකිය" යනුවෙන් සඳහන් කරයි. මෙම වගන්තිය "ස්ත්‍රී දූෂණය" සම්බන්ධයෙන් ස්ථාපිතව පවතින සමාජ ප්‍රතිමානයන්හි පැවැත්මටත් ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් පවතින කැළල සඳහාත් මග පාදා ඇත. එබැවින්, එම වගන්තිය ඉවත් කළ යුතුය.
- **තේසවලමේ නීතියෙහි පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ විධිවිධාන ඉවත් කිරීම.**
  - තේසවලමෙයි නීතිය කාන්තාවන්ගේ දේපල අයිතිවාසිකම් සම්බන්ධයෙන් වෙනස්කොට සැලකීමේ විධිවිධාන වලින් සමන්විත වේ. එම විධිවිධාන කාන්තාවන්ට තම නිශ්චල දේපල විකිණීම සඳහා ස්වාමිපුරුෂයාගේ ලිඛිත අවසරය ලබාගත යුතු බවට අවශ්‍ය කරවයි. එකී විධිවිධාන කාන්තාවන්ගේ ආර්ථික ස්වාධීනත්වයට බාධාවක් වන අතර සමාජ ප්‍රතිමාන සමග ඉතා සමීපව සම්බන්ධ වී තිබේ.
- බලාත්මකව පවතින අනෙකුත් පුද්ගල නීතීන් සහ ප්‍රතිපත්තීන්හි පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ විධිවිධාන ඉවත් කිරීම/සංශෝධනය කිරීම
  - උදාහරණ වශයෙන් මුස්ලිම් විවාහ, දික්කසාද පනත සහ 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥාපනත.

- ස්ත්‍රී දූෂණය පිළිබඳ නඩු විභාගයට අදාල කාර්ය පටිපාටිය ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සංවේදී ලෙස වෙනස්කිරීම සඳහා ඒ සම්බන්ධයෙන් නව නීති සම්පාදනය කිරීම.

### 6.2.2 අධිකරණ ක්ෂේත්‍රයෙහි සිදු කළ යුතු සංශෝධන සඳහා වන නිර්දේශ

- කාන්තාවන්ට එරෙහි ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ නඩු විමසීමේදී පෞද්ගලික පැහැදිලිකිරීම් සඳහා අවසර ලබා දීම (සංවෘත අධිකරණ ශාලාවක නඩු විභාග කිරීම).

- කාන්තාවන්ට එරෙහි ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධ නඩු විමසීම සඳහා වෙන්වූ විශේෂ අධිකරණයක් පිහිටුවීම.

- කාන්තාවන්ට එරෙහි ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධ නඩු තීන්දුවල පීඩාවට පත්වූ අයගේ නම සහ සෙසු පෞද්ගලික විස්තර ඇතුළත් කිරීමෙන් වැළකීම.

### 6.2.3 රජයේ ක්‍රියාකාරීන් සඳහා වන නිර්දේශ

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි පිටපත්, රූප සටහන්, කතා සහ පූර්වාදර්ශ ඉවත් කිරීම සඳහා පළවන ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා පවතින සියලුම පෙළපොත් සමාලෝචනය කොට ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳී වෙනස්කොට සැලකීමේ අංග ඉවත්කිරීම. පෙළපොත් හි ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි සමානාත්මතාව සහතික කරන්නා වූ අංග ඇතුළත් කිරීම.

- පාසල් හි ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන දිරි ගැන්වීම වැළැක්වීම සඳහා ගුරුවරුන්, විදුහල්පතිවරුන් සහ සෙසු අධ්‍යාපන නිලධාරීන් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සහ ඒවායෙහි බලපෑම් පිළිබඳව විශේෂ පුහුණු පැවැත්වීම.

- කාන්තාවන් ආර්ථික වශයෙන් ස්වාධීනවීමේ වැදගත්කම සහ කාන්තාවන් සඳහා වන රැකියා අවස්ථාවන් පිළිබඳ කරුණු පාසල් පෙළ පොත් තුළට ඇතුළත් කිරීම.

- පාසල් තුළ කාන්තාවන්ගේ නායකත්ව ගුණාංග වර්ධනය කිරීම සඳහා නව සැලසුම් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම.

- ඉවුම් පිහුම්, ගේදොර වැඩ කටයුතු වැනි විෂය කරුණු අන්තර්ගත ප්‍රායෝගික තාක්ෂණ විෂය 6 ශ්‍රේණියෙන් පසුව සියලුම සිසුන් සඳහා අනිවාර්ය විෂයක් බවට පත් කිරීම.

- ශාරීරිකමය වශයෙන් සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්විය යුතු සහ එරෙහි විය යුතු ක්‍රියාවන් වේ යන අදහස පාසල් සිසුන්ට කාවැද්දීම සඳහා ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට එරෙහිව හඬනැගීම වෙනුවෙන් පාසල් සිසුන් පුහුණු කිරීම.

  - මෑතකාලීනව ශ්‍රී ලංකාවේ වැඩි අවධානයක් යොමු වූ හිෂාලිනිගේ මරණයෙන් අනතුරුව (2021 ජූලි මස 15 වන දින) ඇය ලිංගික අපයෝජනයට ලක් කිරීමට එරෙහිව දීප ව්‍යාප්ත වශයෙන් විරෝධතා ව්‍යාපාර දියත් කෙරුණි. කිසියම් පාසලක සිසුන් විසින් ද විරෝධතා ව්‍යාපාරයක් දියත් කෙරුණි. "පාසල් අවධියේ සිට ප්‍රචණ්ඩත්වයට එරෙහිව හඬනැගීම වෙනුවෙන් සිසුන් පුහුණු කිරීම සඳහා සිසුන්ගේ නායකත්වයෙන් විරෝධතා ව්‍යාපාරයක් පැවැත්වූ බව" එම පාසලේ විදුහල්පතිවරයා ප්‍රකාශ කළේය. එය ඉතා වැදගත් පූර්වාදර්ශයකි.

- සියලුම රජයේ නිලධාරීන් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන පිළිබඳ අවබෝධය ලබාදීම. රජයේ නිලධාරීන් සිය රාජකාරි කටයුතුවලදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව තහවුරු කරන බව අධීක්ෂණය කිරීම සඳහා යාන්ත්‍රණයක් ආයතන මට්ටමින් පිහිටුවීම.

- ❖ ජාතික ක්‍රියාකාරී සැලසුම් සම්පාදනය කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි අංග සැලකිල්ලට ගැනීම සහ සියලු කටයුතුවලදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව තහවුරු කිරීම.

## 6.2.4 සිවිල් සමාජ ක්‍රියාධරයන් සඳහා වන නිර්දේශ

- ❖ පවුල් සම්බන්ධතා තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව තහවුරු කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම. විශේෂයෙන්ම වයස අවුරුදු 30-50 දක්වා කාණ්ඩයට අයත් යුවල් සඳහා මෙම වැඩමුළු පැවැත්වීම.

- ❖ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන හේතුවෙන් කාන්තාවන් මුහුණ දෙන ගැටලු පිළිබඳව පුළුල් සාකච්ඡා, සම්මන්ත්‍රණ සහ උද්දේශනය සඳහා මූලාරම්භයන් සිදු කිරීම.

- ❖ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සහ ඒවා හි ප්‍රතිවිපාක සම්බන්ධයෙන් වීදි නාට්‍ය, චිත්‍රපට නිර්මාණය කිරීම සහ පොදු වේදිකාවන්හි ඒවා ප්‍රදර්ශනය කිරීම.

- ❖ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන හේතුවෙන් කාන්තාවන් මුහුණ දෙන ගැටලු පිළිබඳව වාර්තා කිරීම සඳහාත් ඒ පිළිබඳව අත්දැකීම් හුවමාරුකර ගැනීම සඳහාත් සමාජ මාධ්‍ය වේදිකාවන් භාවිතා කිරීම.

- ❖ කාන්තාවන්ගේ ආර්ථික ස්වාධීනත්වය සහතික කිරීම සඳහා ඔවුන් වෙනුවෙන් ව්‍යවසායන් සහ ස්වයං රැකියා අවස්ථා ඇති කිරීම.

- ❖ කෘෂිකාර්මික දිස්ත්‍රික්කයන්හි පුරුෂයන් සහ කාන්තාවන් ඒකාකාර රැකියාවන්හි නිරත වීමේදී ඔවුන් සඳහා සම වැටුප් ලබාදීම තහවුරු කිරීම සඳහා උද්දේශන කටයුතු දියත් කිරීම.

- ❖ සම වැටුප් සඳහා වන කාන්තාවන්ගේ අයිතිය ඇතුළුව කාන්තාවන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් දියත් කිරීම.

- ❖ පුරුෂයන් ඉවුම් පිහුම් කටයුතු සහ දරුවන් රැක බලාගැනීමේ කටයුතුවල නිරතවීම දිරිගන්වන්නාවූ නව උපාය මාර්ග හඳුනාගනිමින් ක්‍රියාත්මක කිරීම. උදාහරණ වශයෙන් පිරිමින් ආහාර පිසින අයුරු දැක්වෙන ඡායාරූප සමාජ මාධ්‍ය ඔස්සේ පළකිරීමේ සමාජ මාධ්‍ය ප්‍රචාරයක් දියත් කළ හැකිය.

**වැඩිදුර පර්යේෂණය සඳහා වන නිර්දේශ**

- ➢ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් ඉස්ලාම් ආගමික කාන්තාවන් සමග පවත්වන ලද සාකච්ඡාවේදී කාති අධිකරණයන්හි අනුගමනය කෙරෙන ක්‍රියා පිළිවෙත් හේතුවෙන් කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ නිදහස දැඩි ලෙස උල්ලංඝනය වන බවට ප්‍රකාශ විය. කාති අධිකරණ රජයේ ආයතන වශයෙන් ක්‍රියාත්මක වුවද එකී අධිකරණයන්හි විනිසුරුවන් වියහැක්කේ පුරුෂයන්ට පමණි. මෙවන් පසුබිමක් තුළ කාති විනිසුරුවරුන් පුරුෂ පාර්ශ්වයට පක්ෂපාතී වන බවට සාකච්ඡාවට සහභාගී වූ කාන්තාවන් ප්‍රකාශ කළහ. මේ සම්බන්ධයෙන් වන ස්ථාවරය දැනගැනීම සඳහා ප්‍රශ්නාවලියට විශේෂ ප්‍රශ්න ඇතුළත් කරනු ලැබුවද කාති අධිකරණයන්හි ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳිවෙනස්කොට සැලකීමේ ක්‍රියාපිළිවෙත් පවතින බවට පර්යේෂණයට සහභාගී වූ සුළු පිරිසක් පමණක් පිළිතුරු ලබා දී තිබුණි. කෙසේ නමුත්, පීඩාවට පත් කාන්තාවන් සහ සුදුසු නිලධාරීන් සමග වැඩිදුර සහ පුළුල් සාකච්ඡා පවත්වා ඒ තුළින් මෙහි සත්‍යතාවය තහවුරු කරගත යුතුය. මෙම පර්යේෂණයේ අරමුණ, බහුල වශයෙන් ස්ථාපිතව පවතින සමාජ ප්‍රතිමාන හඳුනාගැනීම වන බැවින් සහ කිසිදු විශේෂිත සමාජ ක්‍රියා පිළිවෙතක් සම්බන්ධයෙන් ගැඹුරින් ගවේෂණය කිරීම සඳහා ක්ෂේත්‍රයක් මෙම පර්යේෂණ ව්‍යුහය තුළ අඩංගු නොවන බැවින් එය සිදු කිරීම මෙම පර්යේෂණයේදී ප්‍රායෝගික නොවීය. කෙසේවෙතත්, මුස්ලිම් ප්‍රජාව තුළ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම සඳහා ප්‍රමුඛතාවය දීමට ඇති අවශ්‍යතාවය, වින්දිතයන් සමග කරන ලද සාකච්ඡාවලදී බෙදා ගන්නා ලද අදහස් තුළින් පිලිඹබු විය.

- මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික සහ ද්විතීක දත්ත එකතු කිරීමේදී සොයාගත් කාරණයක් වන්නේ වතුකරය තුළද ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන වැඩි වශයෙන් පවතින බවයි. මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන වතුකරයේ ස්ත්‍රී ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් සහ නිදහසට විශාල බලපෑමක් ඇත. මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන, අධ්‍යාපනය නොමැති වීම, දරිද්‍රතාවය, නිවාස නොමැති වීම, වැනි සාධක සමග ඒකාබද්ධ කල විට දරුණු ප්‍රතිඵල ඇති කල හැකිය. කෙසේ නමුත් මෙම පර්යේෂණයේ අරමුණ උතුරු පළාතේ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වෙනස් කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සොයා බැලීමට සීමා වූ බැවින් වතුකරයේ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වෙනස් කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සහ එයින් වතු කම්කරු කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ නිදහස සීමා වන ආකාරය පිළිබඳව ආමන්ත්‍රණය කිරීමට නොහැකි විය. නමුත් මෙම පර්යේෂණය මගින් එවැනි පර්යේෂණ සිදු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි.

1 ඇමුණුම

# ආචාරධර්ම මූලලේඛය

## ශ්‍රී ලංකාවේ උතුරේ අයිතිවාසිකම් සහ මූලික නිදහස ප්‍රවර්ධනය සඳහා සමාජ ප්‍රතිමාන පරිවර්තනයට ලක් කිරීම (TRANSFORM)

## හැඳින්වීම සහ භාවිතය

TRANSFORM ව්‍යාපෘතිය යටතේ සිදුකරන සහභාගීත්ව ආකෘතික පර්යේෂණයට(formative participatory research) මගපෙන්වීම යන විශේෂිත කාර්යය සඳහා ම මෙම අචාරධර්ම මූලලේඛය (ethical protocol) සකස් කර තිබේ. ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතාවය, මානව හිමිකම්, මූලික නිදහස සහ යුක්තිය ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම හරහා ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම් වැඩිදියුණු කිරීමට TRANSFORM ව්‍යාපෘතිය හරහා වෑයම් දරනු ලැබේ.

ස්ත්‍රීපුරුෂ සමාජභාවය මත පදනම්ව වෙනස්කොට සලකන වත්මන් සමාජ ප්‍රතිමාන සහ ජාතික ආඛ්‍යාන පිළිබඳව, සහ මූලික අයිතිවාසිකම් හා නිදහස සහ ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතාවය කරා ප්‍රවේශවීමේදී ඒවායින් කාන්තාව මත ඇතිකෙරෙන බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා යොදා ගන්නා ආකෘතික සහභාගීත්ව පර්යේෂණ කටයුත්තක් සඳහා මෙම ආචාරධර්ම මූලලේඛය විශේෂයෙන් සකසා තිබේ. අවශ්‍යකරන කටයුතු සංවිධානය සඳහා Chrysalis වෙතින් ලැබෙන සහය ද, යුරෝපීය සංගමයෙන් ලැබෙන මූල්‍ය ආධාර ද ඇතිව TRANSFORM ව්‍යාපෘතිය යටතේ, නීතිය හා සමාජ භාරය (LST) විසින් මෙම පර්යේෂණය සිදුකරනු ලැබේ.

මෙම ආචාරධර්ම මූලලේඛය මගින්, මූලික මූලධර්ම මත පදනම් වූ මාර්ගෝපදේශ සපයන අතර, LST සහ Chrysalis කාර්ය මණ්ඩලය, උපදේශකයින්, සම්පත් පුද්ගලයින්, සහ ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින් ඇතුළු මෙම පර්යේෂණයට සම්බන්ධ සියලු පාර්ශ්වයන් විසින් මෙම පර්යේෂණයේ සෑම අදියරකදීම ඒවා දැඩි ලෙස පිළිපැදිය යුතුය.

**නිර්වචන**

**අ) ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්**

ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින් යනු මෙම පර්යේෂණයේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි LST විසින් සූදානම් කරන ලද තෝරාගැනීමේ මෙවලම හරහා තෝරා ගන්නා ලද පුද්ගලයින්ට ය. ප්‍රජාවෙන් දත්ත එක්තු කිරීම සඳහා ඔවුන්ට ප්‍රමාණවත්වත් පුහුණුවක් ඇති බව සහතික කරනු වස් ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්ට දෙදින ශක්‍යතා සංවර්ධන පුහුණුවක් ලබා දෙනු ලැබේ.

**ආ) පර්යේෂණයට සහභාගි වන්නන්**

පර්යේෂණයට සහභාගීවන්නේ උතුරේ ජනතාව ය.මෙම පර්යේෂණයෙන් සොයාගන්නා කරුණු, එම සහභාගීවන්නන් විසින් ලබාදෙන දත්ත පදනම් කරගෙන ගොඩනගනු ඇත. ඒ අනුව, Chrysalis විසින් නිර්දේශ කෙරෙන ප්‍රජා සාමාජිකයින් 300ක් ද, ශාස්ත්‍රඥයින්, වෘත්තීයවේදීන්, ක්‍රියාකාරීන්, හිටපු කාන්තා සටන්කාමීන්, ගෘහමූලික කාන්තාවන්, ආබාධ සහිත කාන්තාවන්, ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට ලක්වූ කාන්තාවන්, සහ ආගමික නායකයින් වැනි, ප්‍රජාවේ විශේෂිත කාණ්ඩවලින් තෝරාගත් සාමාජිකයින් 250ක් ද ඊට ඇතුළත් වනු ඇත.

## මූලික මාර්ගෝපදේශ

### 1. පර්යේෂණයට සහ සහභාගී වන්නන් වෙත අවංකත්වය සහ ආරක්ෂාව සහ සහතික කිරීම

අ) ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/ පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින්පර්යේෂණයට සහභාගීවන්නන් සමගින් කටයුතු කිරීම ආරම්භ කරන මුල් අවස්ථාවේ දී ම තමන් කවුරුද, තමන් මෙම පර්යේෂණය සිදුකරන්නේ කුමන සංවිධාන සමග ද ( LST සහ Chrysalis) කියා හඳුන්වාදීය යුතු වේ.

ආ) සහභාගීවන්නන්ට මෙම පර්යේෂණයට සහභාගිවීමට හැකි, පහසු වේලාව කුමක්දැයි විමසිය යුතුය. පර්යේෂණයට සහභාගීවන්නා සමගින් එම වේලාව කලින්ම තහවුරු කරගෙන තිබීම වඩාත් සුදුසු ය.

ඇ) ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/ පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් විසින් පර්යේෂණයේ අරමුණු සහ දත්ත එකතු කිරීමේ මෙවලම සම්බන්ධයෙන් සහභාගීවන්නන්ට පැහැදිලි කර දීය යුතු ය. ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/ පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් විසින් විශේෂයෙන්ම මෙම පර්යේෂණ ක්‍රියාවලියේ රහස්‍යභාවය පිළිබඳව අවධාරණය කළයුතු වේ.

ඈ) ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/ පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් විසින් ගෞරවාන්විතව හා වගකීමෙන් යුතුව දත්ත එකතු කර ගත යුතු අතර සෑම විටම සංවේදීව ප්‍රතිචාර දැක්විය යුතුය. ඔවුන් මධ්‍යස්ථභාවය පිළිබඳ වෘත්තීය ප්‍රමිතියක් පවත්වා ගෙන යා යුතු අතර, නින්දා සහගත වදන් භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතු ය. සෑමවිටම විනිශ්චය නොකරන ප්‍රවේශයක් පවත්වා ගත යුතුය. අව්‍යාජ හා වෙනස් නොකරන ලද ප්‍රතිචාර ලබාගැනීමට පහසුකම් සැලසීම සඳහා, තමන්ගේ අදහස් දැක්වීම, තමන්ගේ අත්දැකීම් බෙදාගැනීම, විසඳුම් යෝජනා කිරීම වැනි, සහභාගීවන්නන්ට බලපෑම් කෙරෙන කිසිවක් සිදුකිරීමෙන් ඔවුන් වැළකී සිටිය යුතුය.

ඉ) ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/ පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් ප්‍රශ්නවලට පිළිතුරු දීමට / අදාළ දත්ත සැපයීමට ප්‍රමාණවත් කාලයක් සහභාගීවන්නන්ට ලැබෙන බව සහතිකකරගත යුතුය.

ඊ) සහභාගීවන්නන් විසින් ප්‍රශ්නවලට පිළිතුරු දීම ඔවුන් අවදානමක හෙළීමට හේතුවිය හැකි යැයි ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින් සිතන්නේ නම්, සහභාගීවන්නන් වෙත එම අවදානම පිළිබඳව පැහැදිලිව කියා සිටිය යුතු අතර, අවදානමක් තිබේ යැයි සිතීමට සාධාරණ හේතු හෝ හැඟීමක් ඇත්තේ නම් එම සහභාගීවන්නන් සම්මුඛ සාකච්ඡාවට ලක් කිරීමෙන් වැලකීමට ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින් කටයුතු කළයුතු වේ.

### 2. දැනුවත් වී කැමැත්ත ලබාදීම

අ) ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/ පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් පර්යේෂණයට සහභාගීවන්නන් සමගින් සම්බන්ධ වී සිටින්නේ දත්ත එකතු කරගැනීමටයි. එසේ කිරීමට ප්‍රථමයෙන් '2වැනි කැමැත්ත දීමේ ආකෘතිපත්‍රය' පර්යේෂණයට සහභාගීවන්නන් විසින් අත්සන් කර දෙන මෙන් ඔවුන් ඉල්ලා සිටිය යුතු වේ. පර්යේෂණයට සහභාගීවන්නන් මේ සඳහා සහභාගි වන්නේ ස්වේච්ඡාවෙන් සහ දැනුවත් වී කැමැත්ත ලබා දී බැව් ඔවුන් සහතික කරගත යුතු වේ.

ආ) දත්ත එක්රැස් කිරීමේ ක්‍රියාවලියට සහභාගී වීමට පර්යේෂණයට සහභාගීවන්නන්ට කවර හෝ ආකාරයකින් බල කිරීමෙන්, බලපෑම් කිරීමෙන් හෝ පොළඹවා ගැනීමෙන් ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/ පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් වැළකී සිටිය යුතුය.

ඇ) පර්යේෂණයට සහභාගීවන්නෙකුට අකුරු කියවීමට නොහැකි නම්, ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයා කැමැත්ත ලබාදීමේ පෝරමයේ අන්තර්ගතය කියවා පැහැදිලි කර පර්යේෂණයට සහභාගීවන්නාගේ අත්සන ලබා ගත යුතුය. පර්යේෂණයට සහභාගීවන්නෙකුට අත්සන් කිරීමට නොහැකි නම්, ඔහුට / ඇයට තමන්ගේ දකුණු අතේ මාපටැඟිල්ලෙන් ඇඟිලි සලකුණක් තැබිය හැකිය.

### 3. සත්‍ය බව සහතික කිරීම

අ) පර්යේෂණයට සහභාගීවන්නන් ඉල්ලා සිටියහොත්, ඔවුන්ට කියවා බැලීම සඳහා, ඔවුන්ට අවබෝධ කරගත හැකි භාෂාවකින් ලියැවුණ, දත්ත එකතු කිරීම සඳහා ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/ පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින්වෙත අවසරය ඇති බව තහවුරු කරන්නා වූ, LST සමගින් ඔවුන් ඇතිකරගත් ගිවිසුම ඉදිරිපත් කිරීමට ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/ පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් හට හැකිවිය යුතු වේ.

ආ) පර්යේෂණයට සහභාගීවන්නන් ඉල්ලා සිටියහොත්, ඔවුන්ට කියවා බැලීම සඳහා,පර්යේෂණ අරමුණු, පර්යේෂණ ක්‍රමවේදය සහ පර්යේෂණ ක්‍රියාවලිය ඇතුළත් සවිස්තරාත්මක පර්යේෂණ සැලැස්ම ඔවුන්ට අවබෝධ කරගත හැකි භාෂාවකින් ඉදිරිපත් කිරීමට ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/ පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් කටයුතු කළයුතුවේ.

### 4. නිර්ණාමිකත්වය සහ රහස්‍යභාවය

අ) දත්ත රැස් කිරීම සහ ගබඩා කිරීම ඇතුළු ව්‍යාපෘතියේ / පර්යේෂණයේ සමස්ථ කාලසීමාව මුළුල්ලේම සියලු පාර්ශවයන් විසින් සහභාගීවන්නන්ගේ පෞද්ගලිකත්වයට ඇති අයිතියට ගරු කළ යුතු සහ එය සහතික කළයුතුවේ.

ආ) එකතු කරන ලද දත්ත සෑම විටම මුළුමනින්ම රහස්‍ය ලෙස පවත්වා ගත යුතු ය. සහභාගීවන්නන්ට නිර්නාමිකව පර්යේෂණයට සහභාගිවිය හැකි අතර දත්ත එකතු කිරීමේ ආරම්භයේදීම එසේ නිර්නාමිකව සහභාගිවීමට අවස්ථාව ඇති බව ඔවුන්ට දැනුම් දීය යුතුය.

ඇ) ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයන් විසින් මෙම පර්යේෂණය අතරතුරදී සහ ඒ සඳහා එකතු කරන ලද දත්ත හෝ තොරතුරු කිසිදු වේලාවක කිසිදු පුද්ගලයෙකු හෝ සංවිධානයක් සමඟ බෙදා හදා ගැනීම / අනාවරණය කිරීම / බෙදා හැරීම නොකළ යුතුය.

ඇ) එකතු කරන ලද දත්ත හෝ තොරතුරු, ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයන් විසින් මෙම පර්යේෂණය / ව්‍යාපෘතිය හැර වෙනත් අරමුණු සඳහා භාවිතා නොකළ යුතු වේ.

### 5. ඉවත්වීම සඳහා ඇති අයිතිය

අ) කිසියම් හේතුවක් ඇතිව හෝ නැතිව, ඕනෑම වේලාවක මෙම පර්යේෂණයෙන් ඉවත්වීම සඳහා සහභාගීවන්නන්ට අයිතිය තිබේ. ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/ පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් විසින් පර්යේෂණයට සහභාගීවන්නන් සමගින් අන්තර්ක්‍රියා කරන මුල් අවස්ථාවේ දී ම, මෙම අයිතිවාසිකම පිළිබඳව පර්යේෂණයට සහභාගීවන්නන්වෙත දැනුම්දීය යුතු වේ.

ආ) යම් ප්‍රශ්නයකට පිළිතුරු නොදී සිටීමට සහභාගීවන්නන් වෙත සම්පූර්ණ අයිතිය ඇති බව ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/ පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් පිළිගතයුතු වන අතර කිසිදු ප්‍රශ්නයක් සඳහා පිළිතුරු දෙන මෙන් බල නොකළ යුතු ය.

ඇ) ඔවුන් සිටින පරිසරය ප්‍රශ්න සඳහා පිළිතුරු දීමට/ දත්ත ලබාදීමට ආරක්ෂිත සහ මිත්‍රශීලී වටපිටාවක් වන බව ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/ පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් විසින් සහතික කරගත යුතු ය.

## 6. බාල වයස්කරුවන්ගෙන් දත්ත එකතු කිරීම

ආ) වයස අවුරුදු 18ට අඩු ඕනෑම තැනැත්තකුගෙන් දත්ත එකතු කරන්නේ නම්, මව/පියා හෝ නීත්‍යානුකූල භාරකරු විසින් අත්සන් තබන ලද 3වැනි කැමැත්ත ලබාදීමේ ආකෘති පත්‍රයක් හරහා ඒ සඳහා අවසරය ලැබෙන බව ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/ පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් විසින් සහතික කරගත යුතු වේ.

ආ) වයස අවුරුදු 18ට අඩු ඕනෑම තැනැත්තකුගෙන් දත්ත එකතු කරන්නේ නම්, ඊට පෙර ඒ බව LST වෙත ලිඛිතව දැනුම්දීමට ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් කටයුතු කළයුතු වේ.

ඇ) ඉහත කී රීති කඩ කිරීමෙන් ඇතිවිය හැකි ප්‍රතිවිපාක කිසිවකට LST විසින් වගකීම භාර ගනු නොලැබේ.

## 7. සහභාගීවන්නන් සඳහා ප්‍රතිලාභ

අ) පර්යේෂණයේ සොයාගැනීම් මත පදනම්ව සකසන ඉන්ෆොග්‍රැෆික් රූපසටහන් පර්යේෂණයට සහභාගීවූවන් අතර බෙදා හැරීම තුළින් පර්යේෂණයේ සොයා ගැනීම් ඔවුන් වෙත සන්නිවේදනය කරනු ලැබේ. තවද, අවසාන පර්යේෂණ වාර්තාව උතුරු පළාතේ සියලුම මහජන පුස්තකාල වෙත යවනු ලැබේ.

ආ) මෙම පර්යේෂණය හරහා සොයාගන්නා කරුණු ජාතික මට්ටමේ සහ කලාපීය මට්ටමේ සම්මන්ත්‍රණ වලදී ඉදිරිපත් කරනු ඇති අතර විශේෂයෙන්ම කලාපීය මට්ටමේ සම්මන්ත්‍රණ වලට සහභාගිවීම සඳහා මෙම පර්යේෂණයට සහභාගීවූවන් වෙත ආරාධනා කරනු ඇත.

### 8. කෝවිඩ්-19 පූර්වාරක්ෂණ මාර්ගෝපදේශ

අ) මෙහි දක්වා ඇති මාර්ගෝපදේශ සමගින්, කෝවිඩ්-19 පැතිරීම වැලැක්වීම සඳහා රජයෙන් පනවා ඇති සියළුම නීති සහ රෙගුලාසි අනුගමනය කිරීමට ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් විසින් කටයුතු කළයුතු වේ.

ආ) පර්යේෂණයට සහභාගීවන්නන්/ LST සහ Chrysalis කාර්යමණ්ඩලය සහ අනෙක් අය සමගින් අන්තර්ක්‍රියා කරන සෑම අවස්ථාවකම ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් විසින් මුහුණු ආවරණයක් පැළඳ සිටිය යුතු වේ.

ඇ) දත්ත එකතු කිරීමේ ක්‍රියාවලිය ඇතුළුව සමස්ථ පර්යේෂණ ක්‍රියාවලිය මුළුල්ලේ ම, පර්යේෂණයට සහභාගීවන්නන්/ ප්‍රජාවේ වෙනත් සාමාජිකයින්/ වෙනත් පාර්ශව සමගින් සම්බන්ධ වන විට ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් නිතරම සබන් යොදා දෑත් සේදීමට/ සැනිටයිසර් භාවිතයට කටයුතු කළයුතු වේ.

ඈ) දත්ත එකතු කිරීමේ ක්‍රියාවලිය ඇතුළුව සමස්ථ පර්යේෂණ ක්‍රියාවලිය මුළුල්ලේ ම ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් අනෙක් අයත් තමනුත් අතරේ මීටරයක දුරස්ථභාවයක් පවත්වාගෙන යායුතු වේ.

ඉ) දත්ත එකතු කිරීමේ ක්‍රියාවලිය ඇතුළුව සමස්ථ පර්යේෂණ ක්‍රියාවලිය මුළුල්ලේ ම ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින්, තමන් සහ පර්යේෂණයට සහභාගීවන්නන්/ ප්‍රජාවේ අනෙක් සාමාජිකයන්/ වෙනත් පාර්ශවයන් අතරේ භෞතික සම්බන්ධතා මගහරවාගත යුතු ය.

ඊ) දත්ත එකතු කිරීමේ ක්‍රියාවලිය අතරතුර ප්‍රජාව (පර්යේෂණයට සහභාගීවන්නන්) විශාල සංඛ්‍යාවක් එකම ස්ථානයට රැස් නොවන බව ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් විසින් සහතික කරගත යුතු වේ.

ඩ) දත්ත එකතු කිරීමේ ක්‍රියාවලිය තුළ හැකි සෑම අවස්ථාවකම ළමයින් සමගින් සම්බන්ධ වීමෙන් වැලකීමට ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් විසින් කටයුතු කළයුතු ය.

ඪ) පර්යේෂණයට සහභාගීවන්නන්/ ප්‍රජාවේ අනෙක් සාමාජිකයන්/ වෙනත් පාර්ශවයන් උණ, වියළි කැස්ස, ඇඟපත වේදනා වැනි අසනීපයකින් පසුවන්නේ නම් දත්ත එකතුකිරීම ඇතුළුව මෙම පර්යේෂණයේ ක්‍රියාකාරකම් සඳහා ඔවුන් හමුවට යෑමෙන් වැලකීමට ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් විසින් කටයුතු කළයුතු ය.

එ) පර්යේෂණයේ කවර හෝ ක්‍රියාකාරකමක් සඳහා කවර හෝ වාතාවරණයක් යටතේ, හුදෙකලා කළ/ වසා දැමූ (isolated/lockdown) ප්‍රදේශයක් කරා යාම ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්ට/පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින්ට මුළුමනින් ම තහනම් ය. එවැනි හුදෙකලා කළ/ වසා දැමූ ප්‍රදේශයක කිසිදු පුද්ගලයකුට දත්ත එකතු කිරීමේ ක්‍රියාවලිය ඇතුළුව පර්යේෂණයේ කාර්යයක් සඳහා වෙනත් ස්ථානයකට පැමිණෙන/ රැස්වෙන මෙන් ආරාධනා කිරීමෙන් ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් වැලකිය යුතු වේ. මෙම වගන්තිය උල්ලංඝනය කිරීමෙන් ඇතිවන ප්‍රතිවිපාක කිසිවක් සඳහා LST හෝ Chrysalis වගකියනු නොලැබේ.

ඒ) පර්යේෂණයට සම්බන්ධ පර්යේෂණයට සහභාගීවන්නන්/ ප්‍රජාවේ අනෙක් සාමාජිකයන්/ වෙනත් පාර්ශවයන් සියළුදෙනා සෞඛ්‍ය අමාත්‍යාංශය/ මහජන සෞඛ්‍ය නිලධාරී/ රජයේ බලධාරීන් විසින් නිකුත් කර ඇති සියළුම සුරක්ෂිතතා පූර්වාරක්ෂණ විධි සහ සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරන බව සහතික කරගැනීමට ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්/පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් විසින් කටයුතු කළයුතු ය.

## 2 ඇමුණුම

## පර්යේෂණ සැලසුම

### විධායක සාරාංශය

1. පර්යේෂණයේ පසුබිම, ප්‍රශ්න ප්‍රකාශය, පර්යේෂණයේ අරමුණු, පර්යේෂණ ක්‍රමවේදය සහ පර්යේෂණය සම්බන්ධයෙන් වන අනෙකුත් විස්තර මෙම පර්යේෂණ සැලසුම හරහා ඉදිරිපත් කර ඇත.

2. යුරෝපීය සංගමයේ මූල්‍ය සහය ඇතිව සහ Chrysalis විසින් ලබාදෙන කටයුතු සංවිධානමය සහය ඇතිව මෙම පර්යේෂණය සිදු කරනු ලැබේ. පර්යේෂණය ක්‍රියාත්මක කරන්නේ නීතිය හා සමාජ භාරයයි (LST).

3. පර්යේෂණ ක්‍රමවේදය සහ දත්ත එකතුකිරීමේ මෙවලම් සංවර්ධනය කිරීම සඳහා LST පර්යේෂණ කණ්ඩායම ප්‍රජාවේ සාමාජිකයින් 51දෙනෙකු සමගින් එක්ව වැඩ කරනු ඇත. එම ප්‍රජා සාමාජිකයින් 51දෙනා මෙම පර්යේෂණයේ ක්ෂේත්‍ර ප්‍රජාමූලික පර්යේෂකයින් වශයෙන් කටයුතු කරනු ඇත.

4. මෙම පර්යේෂණ සැලසුමේ පළමු කොටසින් අප මෙම පර්යේෂණය සිදුකිරීමට අදහස් කර ගෙන සිටින පසුබිම සම්බන්ධයෙන් කෙටි විස්තරයක් ලබාදෙයි. ප්‍රශ්න ප්‍රකාශය, පර්යේෂණයේ අරමුණු සහ පර්යේෂණ ප්‍රශ්න හඳුන්වාදෙන්නේ මෙම කොටසෙනි.

5. පර්යේෂණ ක්‍රමවේදය සහ පර්යේෂණයේ සීමාවන් මෙම පර්යේෂණ සැලැස්මේ දෙවන කොටසෙහි විස්තර කර ඇත. දත්ත රැස් කිරීම සඳහා මිශ්‍ර ක්‍රම ප්‍රවේශයක් භාවිතා කරනු ඇත. මෙම පර්යේෂණය මුළුල්ලේම ලේඛනගත කිරීම, අදහස් විමසීමේ සාකච්ඡා, සම්මුඛ සාකච්ඡා, කේන්ද්‍රික කණ්ඩායම් සාකච්ඡා, ප්‍රශ්නාවලියක් ලබාදීම යන ක්‍රම අනුගමනය කිරීමට යෝජනා කෙරේ. මෙම පර්යේෂණයේ මූලික ක්‍රමවේදිය ප්‍රවේශය, ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතාවය මත පදනම් වනු ඇත.

6. පර්යේෂණයට සම්බන්ධ අවදානම් තක්සේරුවක් තුන්වන කොටසෙහි ඇතුළත් වේ. මෙම කොටස පර්යේෂණයට අදාළ සාමාන්‍ය බාධා, අදළ සන්දර්භය තුළ අපේක්ෂිත වෙනස්කම් සහ දත්ත රැස් කිරීමට අදාළ ගැටළු පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයයි.

7. මෙම පර්යේෂණ සැලැස්මේ හතරවන කොටසට පර්යේෂණයේ වැඩ සැලැස්ම සහ යෝජිත කාලරාමුව ඇතුළත් වේ. කෙසේනමුත්, මෙම පර්යේෂණය සිදු කිරීමේදී ඇතිවිය හැකි අවදානම් මත පදනම්ව, මෙහි දක්වා ඇති කාලරාමුව වෙනස් විය හැක.

# I කොටස

## 1.1 පසුබිම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උත්තරීතර නීතිය වන ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා සමානාත්මතාවය සහතික කරන අතර ලිංගිකත්වය මත පදනම් වූ වෙනස්කොට සැලකීම් එහි තහනම් කර ඇත. කෙසේවෙතත්, ඒ සම්බන්ධයෙන් වන යම් යම් ව්‍යතිරේක සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අවසර දෙන අතර, පුද්ගලික සහ චාරිත්‍රානුකූල නීති හරහා කාන්තාවන්ට වෙනස් කොට සැලකීමට අවසර දෙන අවස්ථාවන්හිදී, ඒවා බලපැවැත්වේ. මෙය, සිරිත් විරිත් සහ සම්මතයන් නීතියට වඩා වෙනස් වූවත් ඒවා බලපැවැත්වෙන පසුබිමක් නිර්මාණය කරයි.

ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 52.1% ක් කාන්තාවන් වන අතර ඉන් බොහෝ දෙනෙක් විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙති. කෙසේ වෙතත්, විශේෂයෙන්ම අධ්‍යාපනය, නීතිය, ව්‍යාපාර සහ දේශපාලනයේ සහ අනෙකුත් සෑම ක්ෂේත්‍රයකම ඉහළ පෙළේ රැකියාවල කාන්තාවන්ගේ දායකත්වය සහ සහභාගීත්වය ප්‍රමාණවත් නොවේ. විශේෂයෙන්ම කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය සැලකිය යුතු ලෙස අඩු ය. මන්ත්‍රීවරුන් 225ක් සිටින වත්මන් පාර්ලිමේන්තුවේ සිටින්නේ කාන්තාවන් 12 දෙනෙක් (5.3%) පමණි. නිදහසින් පසු ශ්‍රී ලංකා ඉතිහාසයේ මුල් කාලීනව කැබිනට් මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ තනතුරු දැරූ කාන්තා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් බොහෝමයක් සිටි බැවින් මෙය විශේෂයෙන් සිත් කරදරයට පත් කරයි. කාන්තා වෘත්තීය සමිති නායිකාවන් ගණනාවක් සිට ඇත. මේ සියල්ලටම වඩා ලෝකයේ පළමු අගමැතිනිය ශ්‍රී ලංකාවෙන් පත් වූවා ය. කාන්තා නියෝජනය වැඩි කිරීම සඳහා පළාත්පාලන ආයතනවල ආසනවලින් 25%ක කෝටාවක් කාන්තාවන්ට වෙන්කරනු ලැබීම ප්‍රශංසනීය වේ. එහෙත්, එම කෝටාව තවමත් අකාර්යක්ෂම මෙවලමක් ලෙස පවතී. 2020 දී Search for Common Ground විසින් සිදු කරන ලද මූලික අධ්‍යයනයකින් දැක්වෙන අන්දමට වෙනස් කොට සලකනසුළු සමාජ හා සංස්කෘතික සම්මත පැවතීම හේතුවෙන්, 25% කෝටාව යටතේ පළාත් පාලන ආයතනවලට තේරී පත් වූ කාන්තා සභිකයින්ට ඔවුන්ගේ වගකීම් ඉටු කිරීමට නොහැකි වී ඇත.[115]

"සභාවේ පිරිමි සභිකයෝ අපිට නිදහසේ අදහස් ප්‍රකාශ කරන්න දෙන්නේ නැහැ. එක්කෝ ඒ අය අපට හිරිහැර කරනවා, නැතිනම් හිනා වෙනවා" බදුල්ල පළාත්පාලන ආයතනයට ඡන්දයෙන් තෝරාපත් වූ කාන්තා සභිකයෙක්.[116]

2020 සඳහා වන ගෝලීය ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ වාර්තාවේ රටවල් 153ක් අතරින් ශ්‍රී ලංකාව 102 වැනි ස්ථානයට පත්ව ඇත. 2019 වසරේදී ශ්‍රී ලංකාව 100 වැනි ස්ථානයේ තිබුණි. ශ්‍රේණිගත කිරීම්වල පහත වැටීමෙන් පැහැදිලිව ම පෙන්නුම් කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ අනෙකුත් නීති හරහා කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ නිදහස සහතික කරනු ලැබුවත්, එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම ප්‍රශ්නකාරී බව ය. යුද්ධය අවසන් වී දශකයක් ගත වී ඇතත් වසර 30ක යුද්ධයේ ප්‍රතිවිපාක ජය ගැනීමට තවමත් වෙහෙසෙන උතුරේ, මෙම ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් වූ අසමානතාවය පැහැදිලිව දැකගත හැකිය. යුද්ධය නිසැකවම සමස්ත ප්‍රජාවටම බලපා ඇත, නමුත් යුද්ධයේ බලපෑම කාන්තාවන්ට විවිධ හා සුවිශේෂී ආකාරවලින් බලපා ඇත. යුද්ධය සමයේදී කාන්තාවන්ට ද අසාමාන්‍ය භූමිකාවන් ඉටු කිරීමට සිදු විය. මව්වරුන්ගේ පෙරමුණ වැනි සංවිධානවල සහ Jaipur Foot වැනි ව්‍යාපෘතිවල නායකත්ව තනතුරු දැරීමට මෙන්ම කාන්තාවන්ට තමන්ව සහ තමන්ගේ පවුල් රැකබලා ගැනීමට සිදු විය.

කෙසේ වෙතත්, පශ්චාත් යුධ සන්දර්භය තුළ, පොදු සහ දේශපාලන ජීවිතය තුළ කාන්තාවන්ගේ සක්‍රීය සහභාගීත්වය වැළැක්වීම සඳහා උතුරේ ගැඹුරට කාවැදී ඇති ව්‍යුහාත්මක බාධක ජවසම්පන්න ලෙස යළි ඉස්මතු විය.[117] කාන්තාවන්ට එරෙහි ව්‍යුහාත්මක බාධක ස්ථාපිත කරනු ලබන්නේ සංස්කෘතික හා ආගමික විශ්වාසයන් මත සමාජයේ ගොඩනැගුණු ස්ත්‍රීපුරුෂ සමාජභාවීය සදාචාරය මගිනි. රැකියා කිරීමට සහ විවිධ

***115*** යුරෝපීය සංගමයෙන් අරමුදල් ලැබූ Women in Learning and Leadership ව්‍යාපෘතිය සඳහා කළ පාදම් අධ්‍යයනය. අවසන් වරට ප්‍රවේශය: 2020 නොවැම්බර් 12 November 2020 at https://www.sfcg.org/wp-content/uploads/2020/09/SFCG_Baseline-Study_Final_Report.pdf

***116*** එම

***117*** එම

දේවල නියැළීමට කාන්තාවන් විසින් ගත යුතු සහ ගත යුතු නොවන මාර්ග මේ යැයි සමාජයේ වක්‍රාකාරයෙන් පිළිගත් යම් යම් අදහස් තිබේ. 2015 දී කාන්තා මාධ්‍යවේදීනියන් පිළිබඳ කරන ලද පර්යේෂණයකින් පෙනී යන්නේ කාන්තාවන් තම අදහස් ප්‍රකාශ කිරීම සඳහා බොහෝ සංස්කෘතික බාධක ජයගත යුතු බවත්, මෙම සංස්කෘතික සදාචාරයන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල සැලකිය යුතු ලෙස පැතිරී ඇති බවත්ය.[118] 2016 දී උතුරු හා නැගෙනහිර යුක්තිය සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය පිළිබඳ කරන ලද තවත් පර්යේෂණයකින් හෙළි වී ඇත්තේ සමාජ සම්මතයන් කාන්තාවන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් සහ යුක්තිය ලබා ගැනීමට බාධා කරන බවයි.[119] යුද්ධයේ දරුණු ප්‍රතිවිපාකවලින් පීඩාවට පත්වී, අහිමිවීම්වලින් පසු යථාතත්වයට පත්වීමට උත්සාහ කරන කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ නිදහස උතුරේ පවතින සමාජ සම්මතයන් විසින් සීමා කරමින් ඔවුන්ගේ හඬ යටපත් කරමින් සිටින්නේ යැයි පැවසීම අතිශයෝක්තියක් නොවේ. ස්ත්‍රීපුරුෂ සමාජ භාව සමානාත්මතාවයේ ඉලක්කය තත්වාකාරයෙන් සාක්ෂාත් කර ගැනීමට නම්, ශ්‍රී ලංකාවට දිගු ගමනක් ඇත.

## 1.2 ප්‍රශ්න ප්‍රකාශය

සමානාත්මතාවය සඳහා ඇති අයිතිය පිළිබඳ ව්‍යවස්ථාවෙන්ම ලබාදුන් සහතිකයක් තිබියදීත්, විවිධ සාධකවල ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සමාන අයිතිවාසිකම් බොහෝ අවස්ථාවලදී අභියෝගයට ලක් වේ. සමාජයීය මට්ටමින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ නිදහස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (16 වැනි වගන්තිය) සහ පවතින සමාජ සම්මතයන් මගින් සීමා කර ඇත. සමාජ සම්මත, යම් පුද්ගලයකුගේ ස්ත්‍රීපුරුෂ සමාජභාවය මත පදනම්ව ඒ පුද්ගලයාට පරමාදර්ශී භූමිකාව මෙය යැයි නිර්වචනය කරයි. කාන්තාවන්ගේ ආයතනගත ස්වභාවය හේතුවෙන් ඔවුන්ට සමාජ සම්මතයන්ගෙන් වඩාත් ගැඹුරු බලපෑමක් ඇති කෙරේ. සමාජ සම්මත උල්ලංඝණය කිරීම සමාජයේ බැහැර කිරීම් සහ සමාජ සම්බාධකවලට හේතු වන බැවින් ඒවා බන්ධන ස්වභාවයක් ගනියි. 30 වසරක සිවිල් යුද්ධය හේතුවෙන් ඇති වූ අඳුරු අතීතයෙන් තම ජීවිත යළි ගොඩ ගැනීමට වෙර දරන උතුරේ කාන්තාවන් සමාජ සම්මතයන් නිසා ඇති වූ වෙනස්කොට සැලකීම් අත්විඳිමින් සිටිති. මේවා ඔවුන්ගේ වර්ධනයට හා ප්‍රගතියට බාධාවකි. තනිකඩ මවකවීම, වැන්දඹුවක වීම හෝ ආබාධිත කාන්තාවක් වීම වැනි අනෙකුත් අවදානම් පාත්‍රතා හේතුවෙන් මෙම වෙනස්කොට සැලකීමේ සමාජ සම්මත තවත් නරක අතට හැරේ. යුද්ධය දැනට දශකයකට පෙර අවසන් වුවද මෙම ප්‍රදේශ මිලිටරිකරණය වී ඇති අතර තනිකඩ මවුවරුන්, වැන්දඹුවන් සහ ආබාධිත කාන්තාවන් බරපතල ආරක්ෂක ගැටළු වලට මුහුණ දී සිටිති. මේවා ඔවුන්ව වැඩියෙන් අවදානමට ලක් කරන අතර ඔවුන්ගේ අයිතිවාසිකම් සහ නිදහස සාක්ෂාත් කර ගැනීමෙන් වළක්වාලයි.තනිකඩ මවුවරුන්ට සහ වැන්දඹුවන්ට පොදු ප්‍රවාහනයේදී එල්ල විය හැකි ලිංගික සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය හේතුවෙන් සංචලනය, රැකියා සහ වෙනත් අවස්ථා සම්බන්ධයෙන් මෙම කාන්තාවන්ගේ ප්‍රගතිය සීමා වී ඇත. කාන්තාවන්ගේ භූමිකාව ගෘහාශ්‍රිත වැඩපොලවලට සහ දරුවන් බිහි කිරීමට සීමා කිරීමෙන්, මෙම සමාජ සම්මතයන් කාන්තාවන්ට ප්‍රබල බලපෑමක් ඇති කරයි.

සමාජ සම්මත පිළිබඳව සහ කාන්තාවන්ගේ මූලික අයිතිවාසිකම් හා නිදහසට ප්‍රවේශවීම කෙරෙහි ඒවායේ බලපෑම පිළිබඳව මෑතකාලීනව සිදුකළ පර්යේෂණ නොමැත බැවින්, මෙම පර්යේෂණයෙන් උත්සාහ කරන්නේ කාන්තාවන්ගේ මූලික අයිතිවාසිකම් සහ නිදහසට, විශේෂයෙන් ඔවුන්ගේ හෘද සාක්ෂියට, සිතීමට හා ආගමට, සහ ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතාවයට ඇති නිදහසට බාධා කරන වෙනස්කොට සලකනසුළු සමාජ සම්මත, ජාතික ආඛ්‍යාන සහ අදාළ වන ස්ත්‍රීපුරුෂ සමාජභාව බලපෑම් පරීක්ෂා කිරීමට ය.

***118*** International Federation of Journalists, “Country Report: Media and Gender in Sri Lanka” (March, 2015) අවසන් වරට ප්‍රවේශය:2020 නොවැම්බර් 12 November 2020 at https://samsn.ifj.org/wp-content/uploads/2015/03/SRI-LANKA.pdf

***119*** Women’s Action Network විසින් ඉදිරිපත් කළ CEDAW ඡායා වාර්තාවල ‘Women’s Access to Justice in the North and East’

### 1.3 පර්යේෂණ ප්‍රශ්න

1. සමාජයේ (උතුරු පළාතේ) පවතින, ස්ත්‍රීපුරුෂ සමාජභාවය අනුව වෙනස්කොට සලකන සමාජ සම්මත මොනවාද? ඒවායින් කාන්තාවන් මත ඇති කරන ස්ත්‍රීපුරුෂ සමාජභාවීය බලපෑම් මොනවාද? සහ, තමන්ගේ මූලික අයිතිවාසිකම් හා නිදහස කරා ප්‍රවේශවීමෙන් ඒවා කාන්තාවන් වලක්වන්නේ කෙසේද?

2. ගැටුමින් පසුව කාල පරිච්ඡේදය තුළ සමාජ සම්මත කුමන ආකාරයේ වෙනස්කම්වලට භාජනය වී තිබේද? එම සමාජ සම්මතවල බලපෑමෙන් මිදී තම පැවැත්ම තහවුරු කරගැනීම සඳහා කාන්තාවන් කුමන ආකාරයේ යන්ත්‍රණ යොදගෙන ඇත්ද?

3. ස්ත්‍රීපුරුෂ සමාජභාවය අනුව වෙනස්කොට සලකන ජාතික ආඛ්‍යාන කාන්තාවන්ට ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් හා නිදහස, විශේෂයෙන්ම හෘද සාක්ෂියේ, සිතීමේ හා ආගමික නිදහස සම්බන්ධයෙන් සහ ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතාවය සම්බන්ධයෙන් කෙසේ බලපා ඇත්ද?

### 1.4 පර්යේෂණ අරමුණු

1. සමාජයේ (උතුරු පළාතේ) පවතින සමාජ සම්මත, ඒවායින් කාන්තාවන් මත ඇති කෙරෙන ස්ත්‍රීපුරුෂ සමාජභාවීය බලපෑම, සහ එම බලපෑම් කාන්තාවන් ඔවුන්ගේ මූලික අයිති වාසිකම් හා නිදහස කරා ප්‍රවේශවීමෙන් වැලැක්වීමට බලපාන්නේ කෙසේද යන්න අවබෝධ කරගැනීම සඳහා

2. ගැටුම පැවති අතරතුර සහ ඉන් පසුව සමාජ සම්මත වෙනස් වී ඇති ආකාරය අවබෝධ කරගැනීම සඳහා සහ එම සමාජ සමමතවලින් ඇති කෙරෙන බලපෑම මැඩපැවැත්වීමට කාන්තාවන් යොදගත් ක්‍රමෝපාය හඳුනාගැනීම සඳහා


3. ස්ත්‍රීපුරුෂ සමාජභාවය අනුව වෙනස්කොට සලකනසුළු ජාතික ආඛ්‍යාන කාන්තාවන්ට ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස සාක්ෂාත් කරගැනීම සඳහා බලපාන ආකාරය අධ්‍යනය කිරීම සඳහා

## II කොටස

### 2.1 පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ මූලික ක්‍රමවේදිය ප්‍රවේශය ලෙස, සහභාගීත්ව ප්‍රවේශයක් අනුගමනය කර ඇත. මෙය හිටපු කාන්තා සටන්කාමීන් වැනි සමාජීය වශයෙන් බැහැර කරන ලද කණ්ඩායම් ඇතුළුව ප්‍රජා සාමාජිකයින්ගේ පූර්ණ සහ අර්ථවත් සහභාගීත්වය පර්යේෂණ ක්‍රියාවලියට ලබාගන්නා බව සහතික කිරීම සඳහා එසේ කර තිබේ. මෙම මූලික ක්‍රමවේදිය ප්‍රවේශය ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතා ක්‍රමවේදිය ප්‍රවේශයක් සමඟ බද්ධ වනු ඇත. ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දත්ත එකතු කරමින් දත්ත රැස් කිරීම සඳහා මිශ්‍රක්‍රම පර්යේෂණ ප්‍රවේශයක් භාවිතා කරනු ඇත.

### 2.2 දත්ත එකතුකිරීමේ ක්‍රමවේද



## දත්ත එකතුකිරීමේ මෙවලම

විශේෂයෙන්ම කාන්තාවන්ගේ මානව හිමිකම් සහ නිදහස කෙරෙහි බලපෑමක් ඇති කරන, සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවීය බලපෑමක් සහිත, ස්ත්‍රීපුරුෂ සමාජභාවය අනුව වෙනස්කොට සලකනසුළු ජාතික ආඛ්‍යාන නිරීක්ෂණය කිරීම සහ ලේඛනගත කිරීම සඳහා මාධ්‍ය අධීක්ෂණ මෙවලමක් සංවර්ධනය කරනු ලැබේ. භාෂා තුනෙන්ම (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි) මුද්‍රිත මාධ්‍ය නිරීක්ෂණය කළ යුතුය. අගෝස්තු 01 වැනිදා සිට ඔක්තෝබර් 31 වැනිදා දක්වා මාස තුනක කාලයක් පුවත්පත් නිරීක්ෂණය කිරීමට නියමිතය. මේ සඳහා එක් එක් භාෂාවෙන් රාජ්‍ය පුවත්පතක් සහ පෞද්ගලික පුවත්පතක් බැගින් තෝරාගෙන ඇත.

| භාෂාව | පෞද්ගලික පුවත්පත් | රාජ්‍ය පුවත්පත් |
|---|---|---|
| සිංහල | අරුණ | සිළුමිණ |
| දෙමළ | තිනකුරල් | තිනකරන් |
| ඉංග්‍රීසි | ද අයිලන්ඩ් | සන්ඩේ ඔබ්සර්වර් |

ප්‍රජා සාමාජිකයින්ගෙන් දත්ත රැස් කිරීම සඳහා දත්ත රැස් කිරීමේ මෙවලම් CARE හි SNAP රාමුව සැලකිල්ලට ගනිමින් සකස් කරනු ලැබේ. මෙලෙස එකතු කරන ලද දත්ත, කාන්තාවන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් සහ නිදහසට ප්‍රවේශ වීම වළක්වමින් උතුරේ බහුලව පවතින, ප්‍රධාන ස්ත්‍රීපුරුෂ සමාජභාවය අනුව වෙනස්කොට සලකනසුළු සමාජ සම්මත හඳුනා ගැනීම සඳහා CARE හි SNAP මෙවලම භාවිතයෙන් විශ්ලේෂණය කෙරේ. දත්ත රැස් කිරීමේ මෙවලම් ප්‍රජා සාමාජිකයින් සමඟ දිශානති වැඩසටහනේදී පූර්ව පරීක්ෂාවට ලක් කෙරෙන අතර ඔවුන්ගෙන් ලැබෙන අදහස් සහ යෝජනා මත පදනම්ව ඒවා තවදුරටත් වෙනස් කරනු ලැබේ.

## ප්‍රශ්නාවලි

පර්යේෂණ සඳහා දත්ත රැස් කිරීමට භාවිතා කළ යුතු දත්ත එකතු කිරීමේ මෙවලම (ප්‍රශ්නාවලිය) LST හි පර්යේෂණ කණ්ඩායම විසින් සකස් කරනු ලැබේ. ප්‍රශ්නාවලිය සකස් කිරීමේදී ප්‍රජා සාමාජිකයින්ගේ දායකත්වය විවිධ ක්‍රම මගින් සහතික කළ යුතුය. ප්‍රශ්නාවලිය සැලසුම් කිරීමේ පළමු පියවර ලෙස උතුරු පළාතේ බහුලව පවතින ස්ත්‍රීපුරුෂ සමාජභාවය අනුව වෙනස්කොට සලකනසුළු සමාජ සම්මත පිළිබඳ සාහිත්‍ය සමාලෝචනයක් සිදු කෙරේ. සාහිත්‍ය සමාලෝචනය මත පදනම්ව පර්යේෂණ කණ්ඩායම විසින් සමාජ සම්මත ගණනාවක් ලැයිස්තුගත කරනු ඇත. ඉන්පසුව, සමාජය තුළ එම සමාජ සම්මත කොතෙක් දුරට ප්‍රචලිත ද යන්න හඳුනා ගැනීමේ පළමු පියවර ලෙස, උතුරු පළාතේ තරුණ තරුණියන් සමඟ අනෞපචාරික සාකච්ඡාවක් පවත්වනු ලැබේ. උතුරු පළාතේ පවතින සමාජ සම්මත පිළිබඳ මූලික දැනුමක් මෙම සාකච්ඡාව පදනම් කරගෙන ගොඩනැගෙනු ඇත.

එම දැනුම මත පදනම්ව ප්‍රශ්නාවලියේ කෙටුම්පතක් සකස් කෙරේ. දත්ත එකතු කරන්නන් සඳහා දිශානති වැඩසටහන් පැවැත්වෙන අතරතුර මෙම කෙටුම්පත තවදුරටත් වෙනස් කරනු ඇත. දිශානති වැඩසටහන්වලදී, සෑම දිස්ත්‍රික්කයකම දත්ත එකතු කරන්නන්ගෙන් තම දිස්ත්‍රික්කයේ පවතින සමාජ සම්මතයන් හඳුනා ගන්නා මෙන් ඉල්ලා සිටිනු ඇත.

## සම්මුඛ සාකච්ඡා

ආගමික නායකයින්, වෘත්තිකයින්, ස්ත්‍රීවාදීන් සහ ශාස්ත්‍රඥයින් සම්මුඛ සාකච්ඡාවට ලක් කෙරෙනු ඇත.

### කේන්ද්‍රික කණ්ඩායම් සාකච්ඡා

පහත දැක්වෙන කේන්ද්‍රික කණ්ඩායම් සමගින් කේන්ද්‍රික කණ්ඩායම් සාකච්ඡා පැවැත්වෙනු ඇති අතර, උචිත පරිදි ඒ සඳහා සාකච්ඡා කරුණු සූදනම් කරගනු ඇත.

1. ලිංගික හා ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයෙන් සහ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවා ගත් අය
2. කාන්තා ගෘහමූලිකයින්
3. හිටපු කාන්තා සටන්කාමීන්
4. සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවන්/සංක්‍රාන්ති සමාජභාවී පුරුෂයින්/LGBTIQ
5. ආබාධ සහිත පුද්ගලයන්
6. සිවිල් සමාජ සංවිධාන නියෝජිතයන්
7. ලිංගික ශ්‍රමිකයන්
8. කාන්තා ක්‍රියාකාරීන්

### දත්ත එකතු කිරීමේදි සැලකිල්ලට ගතයුතු ආචාරධර්මීය කරුණු

මෙම පර්යේෂණ කටයුත්ත සඳහා ම LST විසින් විශේෂයෙන් සකස් කළ ආචාරධර්ම ප්‍රොටෝකෝලය දත්ත එකතුකිරීම සහ විශ්ලේෂණය ඇතුළුව පර්යේෂණයේ සෑම පියවරකදිම අනුගමනය කෙරෙනු ඇත.

### 2.3 දත්ත එකතු කිරීම

මෙම පර්යේෂණය සඳහා ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයන් ලෙස ප්‍රජා සාමාජිකයන් 51දෙනෙක් (කාන්තාවන් 35ක් සහ පිරිමින් 16ක්) තෝරා ගනු ලැබේ. ප්‍රජා සාමාජිකයින්ගේ දායකත්වය සහතික කිරීම, පර්යේෂණයේ විෂය කරුණු හා සම්බන්ධ සංස්කෘතික හා සාම්ප්‍රදායික වටිනාකම් සලකා බැලීම සහ ඵලදායී හා සුමට දත්ත රැස්කිරීම සහතික කිරීම අරමුණු කර ගනිමින් දත්ත එකතු කරන්නන් ලෙස ප්‍රජා සාමාජිකයින් තෝරා ගනු ලැබේ. ඔවුන්ගේ කාර්යයේ වැදගත්කම සැලකිල්ලට ගෙන, ඔවුන් 'ප්‍රජාමූලික ක්ෂේත්‍ර පර්යේෂකයන්' යන තනතුර යටතේ පර්යේෂණ සඳහා බඳවා ගනු ලැබේ.

Chrysalis විසින් තෝරා ගන්නා ලද ප්‍රතිලාභීන් 400ක් අතරින්, තෝරා ගැනීමේ මෙවලම භාවිතයෙන් මෙම ප්‍රජාපාදක ක්ෂේත්‍ර පර්යේෂකයන් 51දෙනා තෝරා ගනු ලැබේ. වාර්ගිකත්වය, ආගම, වයස සහ ප්‍රතිලාභීන්ගේ ප්‍රජාවට සම්බන්ධවීම සැලකිල්ලට ගනිමින් තෝරා ගැනීමේ මෙවලම සැලසුම් කෙරේ. තෝරාගත් ප්‍රජා පාදක ක්ෂේත්‍ර පර්යේෂකයන් 51දෙනා, දත්ත රැස් කිරීමේ මෙවලම් භාවිතා කරමින් ප්‍රතිලාභීන් 400න් සහ අවශ්‍ය අවස්ථාවල දී අනෙකුත් ප්‍රජා සාමාජිකයින්ගෙන් දත්ත රැස් කරනු ඇත.

### ප්‍රජාමූලික ක්ෂේත්‍ර පර්යේෂකයන් සඳහා වන දිශානති වැඩසටහන

ප්‍රජාමූලික ක්ෂේත්‍ර පර්යේෂකයන්ට පර්යේෂණ පිළිබඳ දළ විශ්ලේෂණයක් ලබා දීම සඳහා දිශානති වැඩසටහන් පවත්වනු ලැබේ. මාධ්‍ය ප්‍රචාරක කටයුතු සඳහා එවැනි පර්යේෂකයන් ඇතුළත්/ඇතුළු ඕනෑම ඡායාරූපයක්/වීඩියෝවක්/ශ්‍රව්‍යයක් භාවිත කිරීමට/ප්‍රකාශ කිරීමට ප්‍රජාමූලික ක්ෂේත්‍ර පර්යේෂකයන්ගේ කැමැත්ත ලබා ගැනීමට මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගැනේ. ඔවුන්ගේ කාර්යභාරයන් සහ වගකීම් වැඩසටහනේදී නිසි ලෙස පැහැදිලි කරනු ලැබේ. පවතින සමාජ සම්මතයන් පිළිබඳව ප්‍රජාමූලික ක්ෂේත්‍ර පර්යේෂකයින්ගෙන් ලබා ගන්නා දැනුම හා අවබෝධය ඇසුරින් දත්ත රැස් කිරීමේ මෙවලම තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා දිශානති වැඩසටහන අතරතුර කණ්ඩායම් ක්‍රියාකාරකම්/මණ්ඩල සාකච්ඡාවක් පැවැත්වීම මේ අවස්ථාවේදි සිදුකෙරෙන වැදගත්ම කාර්යයකි.

### ප්‍රජාමූලික ක්ෂේත්‍ර පර්යේෂකයින් සඳහා පවත්වන පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව

ප්‍රජාමූලික ක්ෂේත්‍ර පර්යේෂකයන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ දෙදින පුහුණුවක් පැවැත්වේ. COVID-19 වසංගත තත්ත්වය සහ සමාජ දුරස්ථභාවය පිළිබඳ නීති සැලකිල්ලට ගනිමින්, ප්‍රජාමූලික ක්ෂේත්‍ර පර්යේෂකයන් 51දෙනා පුහුණු කිරීම සඳහා කණ්ඩායම් දෙකක් ලෙස ගනිමින් මෙය පවත්වනු ඇත. එම පුහුණුවෙන් පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම අරමුණු කරයි:

1. ස්ත්‍රීපුරුෂ සමාජභාවය අනුව වෙනස්කොට සලකනසුළු සමාජ සම්මත හඳුනා ගැනීම සඳහා ප්‍රජාමූලික ක්ෂේත්‍ර පර්යේෂකයන්ට සහාය වීම;

2. මූලික අයිතිවාසිකම් සහ නිදහස පිළිබඳව අවබෝධ කර ගැනීම සඳහා ප්‍රජාමූලික ක්ෂේත්‍ර පර්යේෂකයන්ට සහාය වීම;

3. ප්‍රජාමූලික ක්ෂේත්‍ර පර්යේෂකයන්ට ස්ත්‍රීපුරුෂ සමාජභාවය අනුව වෙනස්කොට සලකනසුළු සමාජ සම්මත පිළිබඳ ඔවුන්ගේ ම පිළිගැනීම වෙනස් කිරීමට සහාය වීම;

4. ස්ත්‍රීපුරුෂ සමාජභාවය අනුව වෙනස්කොට සලකනසුළු සමාජ සම්මත කාන්තාවන්ගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස කෙරෙහි බලපාන ආකාරය අවබෝධ කර ගැනීමට ප්‍රජාව පදනම් කරගත් ක්ෂේත්‍ර පර්යේෂකයන්ට සහාය වීම;

5. දත්ත එකතු කිරීමේ ශිල්පීය ක්‍රම සහ ආචාර ධර්ම පිළිබඳ ප්‍රජාපාදක ක්ෂේත්‍ර පර්යේෂකයන් පුහුණු කිරීම.

### 2.4 දත්ත විශ්ලේෂණය

එකතු කරන ලද දත්ත, පර්යේෂණ කණ්ඩායමේ අධීක්ෂණය යටතේ සේවය කරන පුහුණු කණ්ඩායමක් විසින් ඇතුළත් කරනු ලැබේ. මෙසේ වාර්තා කරන ලද දත්ත, සමාජ විද්‍යාව සඳහා වන සංඛ්‍යාන පැකේජය (SPSS) භාවිතයෙන් අර්ථ නිරූපණය කෙරේ. ඉන්පසු, පර්යේෂණ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පර්යේෂණ කණ්ඩායම විසින් දත්ත විශ්ලේෂණය කරනු ලැබේ. දිස්ත්‍රික්කය, වයස, අධ්‍යාපන පසුබිම සහ ආගම වැනි සාධක අනුව දත්ත වෙන වෙනම ඇතුළත් කර ප්‍රස්ථාර සහ වගු ලෙස සකස් කෙරෙනු ඇත.

### 2.5 දත්ත වලංගුකරණය

දත්ත එක්රැස් කර, ඇතුළත් කර ප්‍රතිඵල හඳුනා ගත් පසු, ඒවා ප්‍රජාමූලික ක්ෂේත්‍ර පර්යේෂකයන් සමඟ සරල ආකාරයකින් බෙදා ගනු ඇත. මෙම සොයාගැනීම් පිළිබඳ ඔවුන්ගේ අදහස්, මත සහ විවේචන එහිදී විමසනු ලබන අතර, එකතු කරන ලද දත්ත මේ මත පදනම්ව තහවුරු කරගනු ඇත. ඇතැම් අවස්ථාවලදී, දත්ත පිටුපස ඇති හේතු ද ඉන් පැහැදිලි වනු ඇත.

### 2.1 පර්යේෂණ වාර්තාව ලිවීම

ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර හරහා රැස් කර ගන්නා දත්ත පදනම් කරගෙන අවසාන පර්යේෂණ වාර්තාව සකස් කෙරෙනු ඇත. මෙම පර්යේෂණය සඳහා පවත්වන සියලු අතථ්‍ය සාකච්ඡා, කේන්ද්‍රික කණ්ඩායම් සාකච්ඡා සහ සම්මුඛ පරීක්ෂණ තුළින් රැස් කර ගන්නා සියලුම දත්ත මෙම පර්යේෂණයට ඇතුළත් කෙරේ. පර්යේෂණයට සහභාගීවූවන්ගෙන් බහුතරය දෙමළ කතා කරන අය වන බැවින් සහ පර්යේෂණ ප්‍රදේශයේ වෙසෙන ජනතාවගෙන් බහුතරය දෙමළ කතා කරන බැවින් අවසාන පර්යේෂණ වාර්තාව දෙමළ භාෂාවෙන් ලියා පසුව සිංහල සහ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීමට නියමිතය.

## 2.7 පර්යේෂණයේ සීමාකිරීම්

ශ්‍රී ලංකාවේ උතුරේ භූගෝලීය ප්‍රදේශයට මෙම පර්යේෂණය සීමා වී ඇත. එබැවින්, ස්ත්‍රීපුරුෂ සමාජභාවය අනුව වෙනස්කොට සලකනසුළු සමාජ සම්මතයන් බහුලව පවතින මධ්‍යම පළාත වැනි ප්‍රදේශවල ද ඉදිරියේදී මෙවැනි පර්යේෂණ සිදු කළ යුතුය.තවද, සියලු මූලික අයිතිවාසිකම් සහ නිදහස කෙරෙහි අවධානය යොමු කිරීමට මෙම පර්යේෂණය හරහා අදහස් කර නොමැති අතර, තෝරාගත් අයිතිවාසිකම් සහ නිදහස කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරයි. එපමණක් නොව, විෂය කරුණුවල සංවේදී ස්වභාවය නිසා, පක්ෂග්‍රාහී ප්‍රතිචාර ලැබීමේ අවදානමක් ඇත. කෙසේනමුත්, මධ්‍යස්ථ සම්මුඛ පරීක්ෂකයින් ඇතුළත් කිරීම මෙම අවදානම අවම කර ගැනීමට උපකාරී වේ. මෙම පර්යේෂණයේ සොයාගැනීම් පශ්චාත් යුධ සන්දර්භයකින් උපුටා ගත් ඒවා වන අතර යුද්ධයේ ප්‍රතිවිපාක පිළිබිඹු විය හැකි බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

## III කොටස

### අවදනම් ඇගැයුම

පුහුණු වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් සුවිශේෂී අභියෝග එල්ල වන වසංගත තත්ත්වයක් රට තුළ පවතින පසුබිමක මෙම පර්යේෂණ සිදු කිරීමට අපේක්ෂා කෙරේ. තවද, COVID-19 සන්දර්භය තුළ සමාජ දුරස්ථභාවය සහ සංචලනය සීමා කිරීම පිළිබඳ නීති රීති හේතුවෙන් දත්ත රැස් කිරීම අභියෝගාත්මක වනු ඇත.

ප්‍රාථමික දත්ත රැස් කිරීම ප්‍රශ්නාවලි, කේන්ද්‍රික කණ්ඩායම් සාකච්ඡා සහ සම්මුඛ සාකච්ඡා හරහා සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ. පර්යේෂණයේ මෙම අදියරේ සාර්ථකත්වය රඳා පවතින්නේ ප්‍රජා මූලික ක්ෂේත්‍ර පර්යේෂකයන්ගේ කාර්යක්ෂමතාව සහ ඔවුන්ගේ දායකත්වයේ මට්ටම මතය. එහි ප්‍රමාණය හෝ මට්ටම කල්තියා තක්සේරු කළ නොහැකි අතර, එමනිසා ප්‍රාථමික දත්ත රැස් කිරීම හා සම්බන්ධ අවදානමක් ඇත. එපමණක් නොව, පර්යේෂණයේ මෙම අදියරේ සාර්ථකත්වය උතුරේ පවතින තත්වයන් මත ද රඳා පවතී.

### අවදනම් ඇගැයුමේ දළ විශ්ලේෂණය

| අංකය | ප්‍රධාන ගැටළුව | ඇගැයුම් කළ අවදනම් මට්ටම | පර්යේෂණයට බලපානු ඇතැයි අපේක්ෂිත ගැටළු | හානි අඩුකරගැනීමට යෝජනා |
|---|---|---|---|---|
| 1 | Covid-19 | ඉහළයි | ක්ෂේත්‍රයට (උතුරට) යෑමට නොහැකිවීම | පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ දත්ත එකතුකිරීම සඳහා Zoom වැනි නව තාක්ෂණික විකල්ප භාවිතා කිරීම පිළිබඳව සලකා බැලීම |
| 2 | සමාජ සම්මත සහ ආගමික තහනම් | ඉහළයි | ගතානුගතික කාන්තාවන් අපගේ පර්යේෂණයට සහභාගිවීමට ඒත්තු ගන්වාගැනීම දුෂ්කරවීම | පුහුණු වැඩසටහනේ දී ඒත්තු ගැන් වීම සම්බන්ධයෙන් සැසි පැවැත්වීම |
| 3 | පර්යේෂණය සිදුකෙරෙන ප්‍රදේශයේ හමුදාකරණය වූ සන්දර්භයක් පැවතීම | ඉහළයි | පර්යේෂණය බලධාරීන්ගේ සැකයට ලක්විය හැකිය | පර්යේෂණයේ අරමුණ පිළිබඳ හමුදාව දැනුවත් කිරීම හෝ ප්‍රශ්න කිරීමකට ලක් වුවහොත් එසේ දැනුවත් කිරීමට සූදානමින් පසුවීම |
| 4 | පර්යේෂණයට අවශ්‍ය දත්ත කලට වේලාවට ලබාගැනීම | ඉහළයි | ප්‍රජාමූලික ක්ෂේත්‍ර පර්යේෂකයින් එකතුකරගත් දත්ත ලැබීමට ප්‍රමාදවීම | එකතුකළ දත්ත කොටස් වශයෙන් එවීම පිළිබඳ සලකා බැලීම |

| | | | | |
|---|---|---|---|---|
| 5 | භාෂා බාධක | අඩුයි | දත්ත එකතු කිරීමට සහ පුහුණු පැවැත්වීමට භාවිතා කරන භාෂාව | ප්‍රදේශයේ භාවිතාවන භාෂාව මැනැවින් හුරුපුරුදු පුද්ගලයින්ගෙන් පර්යේෂණ කණ්ඩායම සමන්විත වීම |
| 6 | පර්යේෂණ කණ්ඩායම පරිපාලනය | අඩුයි | කණ්ඩායමේ සාමාජිකයින් අතරේ වෘත්තීමය සම්බන්ධතා පවත්වාගැනීමේ අභියෝග | කඩිනමින් එවැනි අභියෝග සුහදව සහ උපායශීලීව ආමන්ත්‍රණය කිරීම |
| 7 | පුහුණු වැඩසටහන් පැවැත්වීම | මධ්‍යමයි | දිස්ත්‍රික්ක පහක සිටින සහභාගිවන්නන් එකම ස්ථානයකට ඒකරාශී කරගැනීමේදී ප්‍රශ්න ඇතිවිය හැක | සහභාගිවන්නන් පදිංචි දිස්ත්‍රික්කය අනුව කණ්ඩායම් දෙකකට බෙදනු ලැබේ. උදාහරණයක් ලෙස මන්නාරම සහ වවුනියාවෙන් සහභාගිවන්නන් වවුනියාවටද කිලිනොච්චිය, යාපනය සහ මුලතිව් ප්‍රදේශවලින් සහභාගිවන්නන් කිලිනොච්චියටද එක්රැස් කරනු ඇත. |
| 8 | තොරතුරු හෙලිදරවු කිරීමට/ දත්ත ලබාදීමට බිය වීම | මධ්‍යමයි | අන් අය විසින් තමන්ව සමාජ දඬුවම්වලට ලක් කරනු ඇතැයි බිය හේතුවෙන් පර්යේෂණයට සහභාගිවන්නන් දත්ත ලබාදීමට මැලි විය හැකිය | රහස්‍යභාවය ආරක්ෂා කිරීම ඇතුළුව ආචාර ධර්ම මාර්ගෝපදේශවලට දැඩි ලෙස අනුකූලවීම සිදුකෙරෙන බව සහභාගිවන්නන්ට ලිඛිතව සහතික කෙරේ |

**IV කොටස**

**ක්‍රියාකාරකම් සැලසුම සහ ඊට වෙන්කල කාල රේඛාව**

| ක්‍රියාකාරකම | ඔක්තෝබර් | | | | නො වැම්බර් | | | | දෙසැම්බර් | | | | ජනවාරි | | | | පෙබරවාරි | | | | මාර්තු | | | | අප්‍රේල් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සාහිත්‍ය සමාලෝචනය | ■ | ■ | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| මාධ්‍ය අධීක්ෂණ මෙවලම සංවර්ධනය කිරීම | ■ | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| මාධ්‍ය අධීක්ෂණ මෙවලම සම්පූර්ණ කර අවසන් කිරීම | ■ | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| තෝරාගැනීමේ මෙවලමක් සහ මාර්ගෝපදේශයක් සකස් කිරීම | | | ■ | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| තෝරාගැනීමේ මෙවලම සහ මාර්ගෝපදේශය සම්පූර්ණ කර අවසන් කිරීම | | | | ■ | ■ | | | | | | | | | | | | | | | | | | | | | | | |
| ප්‍රතිලාභීන් 51දෙනෙක් තෝරාගැනීම | | | | | | ■ | ■ | ■ | | | | | | | | | | | | | | | | | | | | |
| ආරම්භක වාර්තාව/සවිස්තර පර්යේෂණ සැලසුම සකස් කිරීම | | | ■ | ■ | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| ආරම්භක වාර්තාව පිළිබඳ අදහස් දැක්වීම සහ සකසා අවසාන කිරීම | | | | | ■ | ■ | | | | | | | | | | | | | | | | | | | | | | |

| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාධ්‍ය අධීක්ෂණය කිරීම සහ අදාළ ද්විතියික දත්ත එකතු කිරීම | | | | | ■ | ■ | ■ | ■ | | | | | | | | | | | | | | | | | | | | |
| දත්ත එකතුකිරීමේ මෙවලම් සංවර්ධනය කිරීම | | | | | | | | | ■ | ■ | | | | | | | | | | | | | | | | | | |
| දත්ත එකතුකිරීමේ මෙවලම් සම්පූර්ණ කර අවසන් කිරීම | | | | | | | | | | | ■ | | | | | | | | | | | | | | | | | |
| ප්‍රතිලාභීන්ට පවත්වන පුහුණුක රුවන් පුහුණු කිරීමේ වැඩමුළු සඳහා සූදානම්වීම | | | | | | | | | | | | ■ | | | | | | | | | | | | | | | | |
| පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළු පැවැත්වීම | | | | | | | | | | | | | ■ | ■ | | | | | | | | | | | | | | |
| පුහුණුව ලැබූ ප්‍රජා-මූලික ක්ෂේත්‍ර පර්යේෂකයින් විසින් දත්ත එකතු කිරීම | | | | | | | | | | | | | | | ■ | ■ | | | | | | | | | | | | |
| FGD සහ සම්මුඛ සාකච්ඡා සඳහා සූදානම්වීම | | | | | | | | | | | | | | | ■ | | | | | | | | | | | | | |
| FGD සහ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම | | | | | | | | | | | | | | | | ■ | | | | | | | | | | | | |
| දත්ත ඇතුළුකිරිම, පරිවර්තනය සහ ලිඛිත පිටපත් සැකසීම | | | | | | | | | | | | | | | | | ■ | ■ | | | | | | | | | | |
| ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය | | | | | | | | | | | | | | | | | | | ■ | ■ | | | | | | | | |
| ගුණාත්මක දත්ත විශ්ලේෂණය සමාලෝචනය | | | | | | | | | | | | | | | | | | | | | ■ | ■ | | | | | | |
| පර්යේෂණ පත්‍රිකාව කෙටුම්පත් කිරීම | | | | | | | | | | | | | | | | | | | | | | | ■ | ■ | | | | |
| අන්තර්ගතය සමාලෝචනය කිරීම | | | | | | | | | | | | | | | | | | | | | | | | | ■ | | | |
| රූප සටහන් සකස් කිරීම | | | | | | | | | | | | | | | | | | | | | | | | | ■ | | | |
| පළමු කෙටුම්පත Chrysalis සමගින් බෙදගැනීම | | | | | | | | | | | | | | | | | | | | | | | | | ■ | | | |
| Chrysalis විසින් සමාලෝචනය | | | | | | | | | | | | | | | | | | | | | | | | | | ■ | | |
| පර්යේෂණ පත්‍රිකාව සම්පූර්ණ කර අවසන් කිරීම | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | ■ | |
| සැකැසුම | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | ■ |
| සමාලෝචනය (LST) | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | ■ |

## 3 ඇමුණුම

**පර්යේෂණයට සහභාගීවන්නන් පිළිබඳ මූලික තොරතුරු**

**1.** **දිස්ත්‍රික්කය:**

මන්නාරම ☐ වවුනියාව ☐ කිලිනොච්චිය ☐ මුලතිවු ☐ යාපනය ☐

**2.** **ස්ත්‍රීපුරුෂ සමාජභාවය:**

පිරිමි ☐ ගැහැණු ☐ සංක්‍රාන්ති ලිංගික පිරිමි ☐ සංක්‍රාන්ති ලිංගික ගැහැණු ☐ වෙනත්☐
පිළිතුරු සැපයීමෙන් වැළකෙමි ☐

**3.** **වයස (අවුරුදු):**

18 ට අඩු ☐

21-30 ☐

31-40 ☐

41-50 ☐

51-60 ☐

61 සහ එයට වැඩි ☐

**4.** **ආගම:**

හින්දු ☐

බෞද්ධ ☐

ක්‍රිස්තියානි ☐

ඉස්ලාම් ☐

ආගමික නොවන ☐

වෙනත් ................................................

**5.** **අධ්‍යාපනය:**

අකුරු කියවිය හැකි, එහෙත් විධිමත් අධ්‍යාපනයක් නොලැබූ ☐

අකුරු කියවිය නොහැකි ☐

5 ශ්‍රේණිය දක්වා ☐

6 - 9 ශ්‍රේණි දක්වා ☐

9 ශ්‍රේණිය සාමාන්‍ය පෙළ දක්වා ☐

උසස් පෙළ දක්වා ☐

අධ්‍යාපන විද්‍යා පීඨ ☐

ඩිප්ලෝමා ☐

උපාධිය ☐

පශ්චාත් උපාධි ☐

වෙනත් ☐

**1.** කරුණාකර ඔබගේ ප්‍රජාව තුළ පහත සඳහන් ක්‍රියාකාරකම්/පිළිවෙත්/ආකල්ප/සිදුවීම්/මතයන් කොපමණ මට්ටමකින් පවතිනවාදැයි සලකුණු කරන්න?

| අංකය | ප්‍රකාශය | බොහෝ සෙයින් එකඟයි | තරමක් දුරට එකඟයි | අඩුවෙන් එකඟයි | නොඑකඟයි | නොදනිමි |
|---|---|---|---|---|---|---|
| 1 | කාන්තාවන් / ගැහැණු ළමයින් ප්‍රසිද්ධියේ ඕනෑවට වඩා කතා නොකළ යුතුය | | | | | |
| 2 | සමෘද්ධි රැස්වීම වැනි පොදු සංසදවලදී කාන්තාවන් / ගැහැණු ළමයින් අදහස් ඉදිරිපත් නොකළ යුතුය | | | | | |
| 3 | කාන්තාවන් / ගැහැණු ළමයින් ප්‍රසිද්ධියේ සිනා නොවිය යුතුය | | | | | |
| 4 | භාර්යාවන් තම ස්වාමිපුරුෂයන් සමග වාද නොකළ යුතුයි | | | | | |
| 5 | කාන්තාවන් / ගැහැණු ළමයින් උපදේශන කටයුතුවල නිරත නොවිය යුතුය | | | | | |
| 6 | කාන්තාවන් / ගැහැණු ළමයින් මාධ්‍ය කටයුතුවල නිරත නොවිය යුතුය | | | | | |
| 7 | කාන්තාවන් / ගැහැණු ළමයින් දේශපාලන රැස්වීම්වලදී හෝ පළාත් පාලන ආයතනවල රැස්වීම් වැනි පාලන සංසදවලදී අදහස ප්‍රකාශ නොකළ යුතුය | | | | | |
| 8 | කාන්තාවන් / ගැහැණු ළමයින් පෞද්ගලික සමාගම්වල සේවය නොකළ යුතුය | | | | | |
| 9 | කාන්තාවන් / ගැහැණු ළමයින් තම සේවා ස්ථානවල රාත්‍රී සේවය නොකළ යුතුය | | | | | |
| 10 | කාන්තාවන් / ගැහැණු ළමයින් තමන්ගේ රැකියාව සඳහා පිට පළාත්වලට ගමන් කිරීම හෝ පිටපළාත්වල නැවතී සිටීම නොකළ යුතුය. | | | | | |
| 11 | ස්වයං රැකියාවල නිරතව සිටින කාන්තාවන් සමාජය විසින් විවේචනය කරනු ලැබේ | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 12 | කාන්තාවන් / ගැහැණු ළමයින් පිරිමින් හා සමානව එකම රැකියාව කළ ද ඔවුන්ට පිරිමින්ගේ වැටුපට සමාන වැටුපක් ලැබීමට හිමිකමක් නැත. | | | | | |
| 13 | වැඩි ශාරීරික වෙහෙසක් දැරීමට අවශ්‍ය වන රැකියාව සඳහා බඳවා ගනු ලැබිය යුත්තේ පිරිමින් පමණකි | | | | | |
| 14 | භාර්යාවන් තම ස්වාමිපුරුෂයින්ගේ තනතුරුවලට වඩා උසස් තනතුරු දැරිය යුතු නැත | | | | | |
| 15 | ඕනෑම කැපකිරීමක් සිදුකර තම විවාහය / පවුල් බැඳීම සුරක්ෂිතව පවත්වා ගැනීමට භාර්යාවන් උත්සාහ කළ යුතුය | | | | | |
| 16 | තම ස්වාමිපුරුෂයන් විසින් පහර දෙනු ලැබූ විට පවා භාර්යාවන් ඒ පිළිබඳ පැමිණිලි නොකළ යුතුය | | | | | |
| 17 | ස්වාමිපුරුෂයන් තම දෙවියන් හා සමාන බැවින් ස්වාමිපුරුෂයන් ඔවුන්ට බැණ වැදුන ද පහර දුන්න ද භාර්යාවන් නිහඬව සිටිය යුතුයි | | | | | |
| 18 | ප්‍රධාන වශයෙන් කාන්තාවන්ගේ කාර්යභාරය වන්නේ ආහාර පිසීම සහ නිවෙස් රැකබලා ගැනීමයි | | | | | |
| 19 | ළමයින්ට රැකවරණය සැලසීම ප්‍රධාන වශයෙන් ම කාන්තාවන්ගේ වගකීමකි | | | | | |
| 20 | ගෙදර දොරේ වැඩකටයුතු සඳහා තම භාර්යාවන්ට උදව් කරන පිරිමින්ව අසල්වැසියන් විසින් සමච්චලයට ලක් කරනු ඇත | | | | | |
| 21 | පිරිමින් දරුවන් රැකබලා ගත යුතු යැයි අපේක්ෂා නොකරනු ලැබේ | | | | | |
| 22 | පවුලේ ප්‍රධාන ආදායම් උපයන්නන් විය යුත්තේ සැමවිටම පිරිමින්ය (කාන්තා ගෘහ මූලික පවුල්වල හැර) | | | | | |
| 23 | ස්ත්‍රීත්වය සම්පූර්ණ වන්නේ කාන්තාවක් විවාහ වී දරුවෙකු බිහි කළ විට පමණි | | | | | |
| 24 | දරුවන් නොමැති කාන්තාවන් අශුභ නිමිත්තක් ලෙස සලකනු ලැබේ | | | | | |
| 25 | වැන්දඹු කාන්තාවන් අශුභ නිමිත්තක් ලෙස සලකනු ලැබේ | | | | | |
| 26 | කාන්තාවන් පොලිස් ස්ථානවලට ගියහොත් ඔවුන්ව විවේචනයට ලක් වේ | | | | | |
| 27 | කාන්තාවන් තම ස්වාමිපුරුෂයන්ට එරෙහිව පොලිස් ස්ථානවල පැමිණිලි කළහොත් ඔවුන්ව විවේචනයට ලක් වේ | | | | | |
| 28 | ලිංගික හිරිහැර පිළිබඳ පැමිණිලි කිරීමට කාන්තාවන් මැලි වේ | | | | | |
| 29 | ලිංගික හිරිහැර පිළිබඳ පැමිණිලි කිරීමට පවුලේ සාමාජිකයින් කාන්තාවන්ට ඉඩ නොදේ | | | | | |
| 30 | ස්ත්‍රී දූෂනවලට/ලිංගික හිරිහැරවලට ගොදුරු වූ කාන්තාවන් ඔවුන්ගේ කන්‍යාභාවය සහ පතිවෘත්තාව අහිමි කර ගත් කාන්තාවන් ලෙස සලකනු ලැබේ | | | | | |
| 31 | වැන්දඹු/දික්කසාද වූ කාන්තාවන් නැවත විවාහ වුව හොත් ඔවුන්ගේ කන්‍යාභාවය සහ පතිවෘත්තාව ප්‍රශ්න කෙරේ | | | | | |
| 32 | හිටපු සටන්කාරියන් පවුල් ජීවිතයට නුසුදුසු කාන්තාවන් ලෙස සලකනු ලැබේ | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 33 | කාන්තාවන් රාත්‍රියේ තනිවම ගමන් නොකළ යුතුය | | | | | |
| 34 | හොඳ කාන්තාවන්/පවුල් ජීවිත ගත කරන කාන්තාවන් රාජ්‍ය නොවන සංවිධානවල කටයුතුවලට සම්බන්ධ නොවිය යුතුය | | | | | |
| 35 | හොඳ කාන්තාවන්/පවුල් ජීවිත ගත කරන කාන්තාවන් දේශපාලනයට සම්බන්ධ නොවිය යුතුය | | | | | |
| **හින්දු භක්තිකයින් සඳහා පමණි** | | | | | | |
| 36 | ඔසප්වීම සිදුවන කාලය තුළ කාන්තාවන්/ගැහැණු ළමයින් කෝවිල් වලට නොයති | | | | | |
| 37 | කාන්තාවන්/ගැහැණු ළමයින් සාම්ප්‍රදායික මංගල වාද්‍ය වාදනය නොකරති | | | | | |
| 38 | කාන්තාවන්ට / ගැහැණු ළමයින්ට කෝවිල්වල පූජක වරියන් විය නොහැක | | | | | |
| **ඉස්ලාම් භක්තියින් සඳහා පමණි** | | | | | | |
| 39 | ඔසප්වීම සිදුවන කාලය තුළ කාන්තාවන්/ගැහැණු ළමයින් යාඥාවල නිරත නොවෙති | | | | | |
| 40 | ක්වාසි අධිකරණවලදී කාන්තාවන්ට තම අදහස් ප්‍රකාශ කිරීමට අවසර නැත | | | | | |
| 41 | තම ස්වාමිපුරුෂයන් කුමක් කළත් කාන්තාවන් එයට හැඩගැසිය යුතු බව ක්වාසි විනිසුරුවන් අවධාරණය කරති | | | | | |
| **කතෝලිකයින්/කිතුනුවන් සඳහා පමණි** | | | | | | |
| 42 | පූජකවරියන්ට දේව මෙහෙයන් සිදු කිරීමට අයිතියක් නැත | | | | | |
| 43 | පූජකවරියන් ප්‍රසිද්ධ සංසද වලදී කතා නොකළ යුතු යැයි අපේක්ෂා කෙරේ | | | | | |
| 44 | පූජකවරියන් විසින් දිව්‍ය සත්ප්‍රසාදය ලබා දීම සිදු නොකල යුතුය | | | | | |
| **බෞද්ධ භක්තිකයින් සඳහා පමණි** | | | | | | |
| 45 | විහාරස්ථාන වලදී පූජ්‍ය පක්ෂයේ පාද ස්පර්ශය කිරීම කාන්තාවන් විසින් සිදු නොකල යුතුය | | | | | |
| 46 | ඇතැම් බෞද්ධ සිද්ධස්ථානයන්හි ඇති ඇතැම් ස්ථාන වලට කාන්තාවන්ට ඇතුල් වීමට තහනම් වේ (ශ්‍රී මහ බෝධියේ උඩ මලුව, දලදා මාලිගාවේ දන්ත ධාතුව ඇති ස්ථානය) | | | | | |
| 47 | කාන්තාවන් බෞද්ධ ස්ථාන වලට යන විට ඇඟ ආ වරණ වන සේ යා යුතුය. | | | | | |
| 48 | කාන්තාවන් / ගැහැණු ළමයින් ඔසප්වීම සිදුවන කාලය තුළ පන්සල් වලට නොයති | | | | | |

2. පහත සඳහන් ප්‍රකාශයන්ට ඔබ එකඟ වන්නේදනැත හොත් එකඟ නොවන්නේ යන්න සහ ඔබේ එකඟත්වයට හෝ එකඟ නොවීමට හේතුව සඳහන් කරන්න. ඔබ එකඟ නොවන්නේ නම්, ඔබට එකඟ විය හැකි වන සුවිශේෂී තත්වය(න්)තිබේ නම් ඒ මොනවාද යන්න සඳහන් කරන්න.

| අංකය | ප්‍රකාශය | එකඟ වෙමි | එකඟ නොවෙමි | හේතුව (හේතු) | ඔබ එකඟ වන්නේ නම්, එයට පටහැනි විය හැකි විශේෂ තත්ත්වයන් මොනවාද(තිබේ නම්) |
|---|---|---|---|---|---|
| 1 | කාන්තාවන් / ගැහැණු ළමයින් ප්‍රසිද්ධි ස්ථානවල ඕනෑවට වඩා කතා නොකළ යුතුය | | | | |
| 2 | සමෘද්ධි රැස්වීම වැනි පොදු සංසදවලදී කාන්තාවන් / ගැහැණු ළමයින් අදහස් ඉදිරිපත් නොකළ යුතුය | | | | |
| 3 | කාන්තාවන් / ගැහැණු ළමයින් ප්‍රසිද්ධියේ සිනා නොවිය යුතුය | | | | |
| 4 | භාර්යාවන් තම ස්වාමිපුරුෂයන් සමග වාද නොකළ යුතුයි | | | | |
| 5 | කාන්තාවන් / ගැහැණු ළමයින් උප්පදේශන කටයුතුවල නිරත නොවිය යුතුය | | | | |
| 6 | කාන්තාවන් / ගැහැණු ළමයින් මාධ්‍ය කටයුතුවල නිරත නොවිය යුතුය | | | | |
| 7 | කාන්තාවන් / ගැහැණු ළමයින් දේශපාලන රැ ස්වීම්වලදී හෝ පළාත් පාලන ආයතනවල රැස්වීම් වැනි පාලන සංසදවලදී කථා නොකළ යුතුය | | | | |
| 8 | කාන්තාවන් / ගැහැණු ළමයින් පෞද්ගලික සමාගම්වල සේවය නොකළ යුතුය | | | | |
| 9 | කාන්තාවන් / ගැහැණු ළමයින් තම සේවා ස්ථානවල රාත්‍රී සේවය නොකළ යුතුය | | | | |
| 10 | කාන්තාවන් / ගැහැණු ළමයින් තමන්ගේ රැකියාව සඳහා පිට පළාත්වලට ගමන් කිරීම හෝ පිටපළාත් වල නැවතී සිටීම නොකළ යුතුය. | | | | |
| 11 | ස්වයං රැකියාවල නිරතව සිටින කාන්තාවන් සමාජය විසින් විවේචනය කරනු ලැබේ | | | | |
| 12 | කාන්තාවන් / ගැහැණු ළමයින් පිරිමින් හා සමානව එකම රැකියාව කළ ද ඔවුන්ට පිරිමින්ගේ වැටුපට සමාන වැටුපක් ලැබීමට හිමිකමක් නැත. | | | | |
| 13 | වැඩි ශාරීරික වෙහෙසක් දැරීමට අවශ්‍ය වන රැකියාව සඳහා බඳවා ගනු ලැබිය යුත්තේ පිරිමින් පමණකි | | | | |
| 14 | භාර්යාවන් තම ස්වාමිපුරුෂයින්ගේ තනතුරුවලට වඩා උසස් තනතුරු දැරිය යුතු නැත | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 15 | ඕනෑම කැපකිරීමක් සිදුකර තම විවාහය / පවුල් බැඳීම සුරක්ෂිතව පවත්වා ගැනීමට භාර්යාවන් උත්සාහ කළ යුතුය | | | | |
| 16 | තම ස්වාමිපුරුෂයන් විසින් පහර දෙනු ලැබූ විට පවා භාර්යාවන් ඒ පිළිබඳ පැමිණිලි නොකළ යුතුය | | | | |
| 17 | ස්වාමිපුරුෂයන් තම දෙවියන් හා සමාන බැවින් ස්වාමිපුරුෂයන් ඔවුන්ට බැණ වැදුන ද හෝ පහර දුන්න ද භාර්යාවන් නිහඬව සිටිය යුතුයි | | | | |
| 18 | ප්‍රධාන වශයෙන් කාන්තාවන්ගේ කාර්යභාරය වන්නේ ආහාර පිසීම සහ නිවෙස් රැකබලා ගැනීමයි | | | | |
| 19 | ළමයින්ට රැකවරණය සැලසීම ප්‍රධාන වශයෙන් ම කාන්තාවන්ගේ වගකීමකි | | | | |
| 20 | ගෙදර දොරේ වැඩකටයුතු සඳහා පිරිමින් තම භාර්යාවන්ට උදව් නොකළ යුතුය | | | | |
| 21 | පිරිමින් දරුවන් රැකබලා ගත යුතු යැයි අපේක්ෂා නොකරනු ලැබේ | | | | |
| 22 | පවුලේ ප්‍රධාන ආදායම් උපයන්නන් විය යුත්තේ සැමවිට ම පිරිමින්ය (කාන්තා ගෘහ මූලික පවුල්වල හැර) | | | | |
| 23 | ස්ත්‍රීත්වය සම්පූර්ණ වන්නේ කාන්තාවක් විවාහ වී දරුවෙකු බිහි කළ විට පමණි | | | | |
| 24 | දරුවන් නොමැති කාන්තාවන් අශුභ නිමිත්තක් ලෙස සලකනු ලැබේ | | | | |
| 25 | වැන්දඹු කාන්තාවන් අශුභ නිමිත්තක් ලෙස සලකනු ලැබේ | | | | |
| 26 | කාන්තාවන් පොලිස් ස්ථානවලට නොයා යුතුය | | | | |
| 27 | කාන්තාවන් තම ස්වාමිපුරුෂයන්ට එරෙහිව පොලිස් ස්ථානවල පැමිණිලි නොකළ යුතුය | | | | |
| 28 | කාන්තාවන් ලිංගික හිරිහැර පිළිබඳ පැමිණිලි නොකළ යුතුය | | | | |
| 29 | ලිංගික හිරිහැර පිළිබඳ පැමිණිලි කිරීමට පවුලේ සාමාජිකයින් කාන්තාවන්ට ඉඩ නොදිය යුතුය | | | | |
| 30 | ස්ත්‍රී දූෂනවලට/ලිංගික හිරිහැරවලට ගොදුරු වූ කාන්තාවන්ගේ නිර්මලත්වයක් නැත | | | | |
| 31 | වැන්දඹු/දික්කසාද වූ කාන්තාවන් නැවත විවාහ වුවහොත් ඔවුන්ගේ නිර්මලත්වය ප්‍රශ්න කෙරේ | | | | |
| 32 | හිටපු සටන්කාරියන් පවුල් ජීවිතයට නුසුදුසු කාන්තාවන් නොවේ | | | | |
| 33 | කාන්තාවන් රාත්‍රියේ තනිවම ගමන් නොකළ යුතුය | | | | |
| 34 | හොඳ කාන්තාවන්/පවුල් ජීවිත ගත කරන කාන්තාවන් රාජ්‍ය නොවන සංවිධානවල කටයුතු වලට සම්බන්ධ නොවිය යුතුය | | | | |
| 35 | හොඳ කාන්තාවන්/පවුල් ජීවිත ගත කරන කාන්තාවන් දේශපාලනයට සම්බන්ධ නොවිය යුතුය | | | | |
| 36 | කාන්තාවන් ගමේ/ප්‍රාදේශීය මට්ටමේ සංවිධාන/ව්‍යාපාරවල නායකත්ව තනතුරු නොදැරිය යුතුය | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **හින්දු භක්තිකයින් සඳහා පමණි** | | | | |
| 37 | ඔසප්වීම සිදුවන කාලය තුළ කාන්තාවන්/ගැහැණු ළමයින් කෝවිල් වලට නොයා යුතුය | | | | |
| 38 | කාන්තාවන්/ගැහැණු ළමයින් සාම්ප්‍රදායික මංගල වාද්‍ය වාදනය නොකළ යුතුය | | | | |
| 39 | කාන්තාවන්ට / ගැහැණු ළමයින්ට කෝවිල්වල පූජක වරියන් විය නොහැක | | | | |
| | **ඉස්ලාම් භක්තියින් සඳහා පමණි** | | | | |
| 40 | ඔසප්වීම සිදුවන කාලය තුළ කාන්තාවන්/ගැහැණු ළමයින් යාඥාවල නිරත නොවිය යුතුය | | | | |
| 41 | ක්වාසි අධිකරණවලදී කාන්තාවන්ට තම අදහස් ප්‍රකාශ කිරීමට අවසර නොතිබිය යුතුය | | | | |
| 42 | තම ස්වාමිපුරුෂයන් කුමක් කළත් කාන්තාවන් එයට හැඩගැසිය යුතු බව ක්වාසි විනිසුරුවන් අවධාරණය කළ යුතුය | | | | |
| | **කතෝලිකයින්/කිතුනුවන් සඳහා පමණි** | | | | |
| 43 | පූජකවරියන්ට දේව මෙහෙයන් සිදු කිරීමට අයිතියක් නැත | | | | |
| 44 | පූජකවරියන් ප්‍රසිද්ධ සංසද වලදී කතා නොකළ යුතු යැයි අපේක්ෂා කෙරේ | | | | |
| 45 | පූජකවරියන් විසින් දිව්‍ය සත්ප්‍රසාදය සිදු නොකරති | | | | |
| | **බෞද්ධ භක්තිකයින් සඳහා පමණි** | | | | |
| 46 | විහාරස්ථාන වලදී පූජ්‍ය පක්ෂයේ පාද ස්පර්ශය කිරීම කාන්තාවන් විසින් සිදු නොකරති. | | | | |
| 47 | ඇතැම් බෞද්ධ සිද්ධස්ථානයන්හි ඇති ඇතැම් ස්ථාන වලට කාන්තාවන්ට ඇතුල් වීම සුදුසු නොවේ. (ශ්‍රී මහ බෝධියේ උඩ මලුව, දලදා මාලිගාවේ දන්ත ධාතුව ඇති ස්ථානය) | | | | |
| 48 | කාන්තාවන් බෞද්ධ ස්ථාන වලට යන විට ඇඟ ආවරණ වන සේ යා යුතු යැයි අපේක්ෂා කෙරේ | | | | |
| 49 | කාන්තාවන් / ගැහැණු ළමයින් ඔසප්වීම සිදුවන කාලය තුළ පන්සල් වලට නොයති | | | | |

3. ඔබ පහත සඳහන් ප්‍රකාශ සමග එකඟ වන්නේද, එකඟ නොවන්නේද යන්න සඳහන් කරන්න.

| අංකය | ප්‍රකාශය | තදින්ම එකඟ වෙමි | තරමක් එකඟ වෙමි | තදින්ම විරුද්ධ වෙමි | තරමක් විරුද්ධ වෙමි | නොදනිමි |
|---|---|---|---|---|---|---|
| 1 | ඔබගේ සමාජයේ බොහෝ විට කාන්තාවන් / ගැහැණු ළමයින් ප්‍රසිද්ධියේ ඕනෑවට වඩා කතා නොකරති | | | | | |
| 2 | ඔබගේ සමාජයේ බොහෝ විට සමෘද්ධි රැස්වීම වැනි පොදු සංසදවලදී කාන්තාවන් / ගැහැණු ළමයින් අදහස් ඉදිරිපත් නොරති | | | | | |
| 3 | ඔබගේ සමාජයේ බොහෝ විට කාන්තාවන් / ගැහැණු ළමයින් ප්‍රසිද්ධියේ සිනා නොවෙති | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 4 | ඔබගේ සමාජයේ බොහෝ විට භාර්යාවන් තම ස්වාමිපුරුෂයන් සමග වාද නොකරති | | | | | |
| 5 | ඔබගේ සමාජයේ බොහෝ විට කාන්තාවන් / ගැහැණු ළමයින් උපදේශන කටයුතුවල නිරත නොවෙති | | | | | |
| 6 | ඔබගේ සමාජයේ බොහෝ විට කාන්තාවන් / ගැහැණු ළමයින් මාධ්‍ය කටයුතුවල නිරත නොවෙති | | | | | |
| 7 | ඔබගේ සමාජයේ කාන්තාවන් / ගැහැණු ළමයින් දේශපාලන රැස්වීම්වලදී හෝ පළාත් පාලන ආයතනවල රැස්වීම් වැනි පාලන සංසදවලදී කථා නොකරති | | | | | |
| 8 | ඔබගේ සමාජයේ බොහෝ විට කාන්තාවන් / ගැහැණු ළමයින් පෞද්ගලික සමාගම්වල සේවය නොකරති | | | | | |
| 9 | ඔබගේ සමාජයේ බොහෝ විට කාන්තාවන් / ගැහැණු ළමයින් තම සේවා ස්ථානවල රාත්‍රී සේවය නොකරති | | | | | |
| 10 | ඔබගේ සමාජයේ බොහෝ විට කාන්තාවන් / ගැහැණු ළමයින් තමන්ගේ රැකියාව සඳහා පිට පළාත්වලට ගමන් කිරීම හෝ පිටපළාත්වල නැවතී සිටීම නොකරති. | | | | | |
| 11 | ඔබගේ සමාජයේ බොහෝ විට ස්වයං රැකියාවල නිරතව සිටින කාන්තාවන් අන් අය විසින් විවේචනය කරනු ලැබේ | | | | | |
| 12 | ඔබගේ සමාජයේ බොහෝ විට කාන්තාවන් / ගැහැණු ළමයින් පිරිමින් හා සමානව එකම රැකියාව කළ ද ඔවුන්ට පිරිමින්ගේ වැටුපට සමාන වැටුපක් නොලැබේ | | | | | |
| 13 | ඔබගේ සමාජයේ වැඩි ශාරීරික වෙහෙසක් දැරීමට අවශ්‍ය වන රැකියාව සඳහා බඳවා ගනු ලබන්නේ පිරිමින් පමණකි | | | | | |
| 14 | ඔබගේ සමාජයේ එකම පවුලේ ස්වාමිපුරුෂයින් රැකියාවේ පහළ මට්ටමේ තනතුරු දරන විටබොහෝ විට භාර්යාවන් එයට වඩා උසස් තනතුරු දැරීම සිදු නොකරති | | | | | |
| 15 | ඔබගේ සමාජයේ බොහෝ විට ඕනෑම කැපකිරීමක් සිදුකර තම විවාහය / පවුල් බැඳීම සුරක්ෂිතව පවත්වා ගැනීමට භාර්යාවන් උත්සාහ කරති | | | | | |
| 16 | ඔබගේ සමාජයේ බොහෝ විට තම ස්වාමිපුරුෂයන් විසින් පහර දෙනු ලැබූ විට පවා භාර්යාවන් ඒ පිළිබඳ පැමිණිලි නොකරති | | | | | |
| 17 | ඔබගේ සමාජයේ බොහෝ විට ස්වාමිපුරුෂයන් භාර්යාවන්ගේ දෙවියන් හා සමාන ලෙස සලකන බැවින් ස්වාමිපුරුෂයන් භාර්යාවන්ට බැණ වැදුන ද, පහර දුන්න ද භාර්යාවන් නිහඬව සිටිති | | | | | |
| 18 | ඔබගේ සමාජයේ බොහෝ විට ආහාර පිසීමේ සහ නිවෙස් රැකබලා ගැනීමේ වගකීම ප්‍රධාන වශයෙන් ම කාන්තාවන්ට පැවරෙයි. | | | | | |
| 19 | ඔබගේ සමාජයේ බොහෝ විට ළමයින්ට රැකවරණය සැලසීමේ වගකීම ප්‍රධාන වශයෙන් ම කාන්තාවන්ට පැවරෙයි | | | | | |
| 20 | ඔබගේ සමාජයේ බොහෝ විට පිරිමින් ගෙදර දොරේ වැඩකටයුතුවල නිරත නොවෙති | | | | | |
| 21 | ඔබගේ සමාජයේ බොහෝ විට පිරිමින් දරුවන් රැකබලා ගැනීමේ කටයුතු ඉටු නොකරති | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 22 | ඔබගේ සමාජයේ බොහෝ විට පවුලේ ප්‍රධාන ආදායම් උපයන්නන් සැමවිට ම පිරිමින් වෙති (කාන්තා ගෘහ මූලික පවුල්වල හැර) | | | | | |
| 23 | ස්ත්‍රීත්වය සම්පූර්ණ වන්නේ කාන්තාවක් විවාහ වී දරුවෙකු බිහි කළ විට පමණක් යැයි ඔබගේ සමාජයේ අන් අය සිතති | | | | | |
| 24 | දරුවන් නොමැති කාන්තාවන් අශුභ නිමිත්තක් ලෙස ඔබගේ සමාජයේ අනෙක් අය සලකති | | | | | |
| 25 | වැන්දඹු කාන්තාවන් අශුභ නිමිත්තක් ලෙස ඔබගේ සමාජයේ අන් අය සලකති | | | | | |
| 26 | ඔබේ සමාජයේ කාන්තාවන් පොලිස් ස්ථානයට ගියහොත් අන් අය ඔවුන්ව විවේචනයට ලක් කරති | | | | | |
| 27 | ඔබේ සමාජයේ කාන්තාවන් තම ස්වාමිපුරුෂයන්ට එරෙහිව පොලිස් ස්ථානවල පැමිණිලි නොකරති | | | | | |
| 28 | ඔබේ සමාජයේ බොහෝ විට ලිංගික හිරිහැර පිළිබඳ පැමිණිලි කිරීමට කාන්තාවන් මැලි වෙති | | | | | |
| 29 | ඔබේ සමාජයේ බොහෝ විට ලිංගික හිරිහැර පිළිබඳ පැමිණිලි කිරීමට පවුලේ සාමාජිකයින් කාන්තාවන්ට ඉඩ නොදෙති | | | | | |
| 30 | ඔබේ සමාජයේ බොහෝ විට ස්ත්‍රී දූෂණවලට/ලිංගික හිරිහැරවලට ගොදුරු වූ කාන්තාවන් ඔවුන්ගේ කන්‍යාභාවය සහ පතිවෘත්තාව අහිමි කර ගත් කාන්තාවන් ලෙස අන් අය සලකති | | | | | |
| 31 | ඔබේ සමාජයේ බොහෝ විට වැන්දඹු/දික්කසාද වූ කාන්තාවන්ගේ කන්‍යාභාවය සහ පතිවෘත්තාව ප්‍රශ්න කෙරෙයි | | | | | |
| 32 | ඔබේ සමාජයේ බොහෝ විට, හිටපු සටන්කාරියන් පවුල් ජීවිතයට නුසුදුසු කාන්තාවන් ලෙස අන් අය විසින් සලකනු ලැබේ | | | | | |
| 33 | ඔබේ සමාජයේ බොහෝ විට කාන්තාවන් රාත්‍රියේ තනිවම ගමන් නොකරති | | | | | |
| 34 | ඔබේ සමාජයේ බොහෝ විට කාන්තාවන් රාජ්‍ය නොවන සංවිධානවල කටයුතුවලට සම්බන්ධ නොවෙති | | | | | |
| 35 | ඔබේ සමාජයේ බොහෝ විට කාන්තාවන් දේශපාලනයට සම්බන්ධ නොවෙති | | | | | |
| 36 | ඔබේ සමාජයේ බොහෝ විට කාන්තාවන්/ගැහැණු ළමයින් ගමේ/ප්‍රාදේශීය මට්ටමේ සංවිධාන/ව්‍යාපාරවල නායකත්ව තනතුරු නොදරති | | | | | |
| **හින්දු භක්තිකයින් සඳහා පමණි** | | | | | | |
| 37 | ඔබේ සමාජයේ බොහෝ විට ඔසප්වීම සිදුවන කාලය තුළ කාන්තාවන්/ගැහැණු ළමයින් කෝවිල් වලට නොයති | | | | | |
| 38 | ඔබේ සමාජයේ බොහෝ විට කාන්තාවන්/ගැහැණු ළමයින් සාම්ප්‍රදායික මංගල වාද්‍ය වාදනය නොකරති | | | | | |
| 39 | ඔබේ සමාජයේ බොහෝ විට කාන්තාවන් / ගැහැණු ළමයින් කෝවිල්වල පූජා සිදු නොකරති | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ඉස්ලාම් භක්තියින් සදහා පමණි** | | | | | | |
| 40 | ඔබේ සමාජයේ බොහෝ විට ඔසප්වීම සිදුවන කාලය තුළ කාන්තාවන්/ගැහැණු ළමයින් යාඥාවල නිරත නොවෙති | | | | | |
| 41 | ඔබේ සමාජයේ බොහෝ විට ක්වාසි අධිකරණවලදී කාන්තාවන්ට තම අදහස් ප්‍රකාශ කිරීමට අවසර නැත | | | | | |
| 42 | ඔබේ සමාජයේ බොහෝ විට තම ස්වාමිපුරුෂයන් කුමක් කළත් කාන්තාවන් එයට හැඩගැසිය යුතු බව ක්වාසි විනිසුරුවන් අවධාරණය කරති | | | | | |
| **කතෝලිකයින්/කිතුනුවන් සඳහා පමණි** | | | | | | |
| 43 | ඔබේ සමාජයේ බොහෝ විට පූජකවරියන්ට දේව මෙහෙයන් සිදු කිරීමට අයිතියක් නැත | | | | | |
| 44 | ඔබේ සමාජයේ බොහෝ විට පූජකවරියන් ප්‍රසිද්ධ සංසද වලදී කතා නොකළ යුතු යැයි අපේක්ෂා කෙරේ | | | | | |
| 45 | ඔබේ සමාජයේ බොහෝ විට පූජකවරියන්විසින් දිව්‍ය සත්ප්‍රසාදය සිදු නොකරති. | | | | | |
| **බෞද්ධ භක්තිකයින් සදහා පමණි** | | | | | | |
| 46 | ඔබේ සමාජයේ බොහෝ විට විහාරස්ථාන වලදී වන්දනාමාන කරන විට පූජ්‍ය පක්ෂයේ පාද ස්පර්ශය කිරීම කාන්තාවන් විසින් සිදු නොකරයි | | | | | |
| 47 | ඔබේ සමාජයේ බොහෝ විට ඇතැම් බෞද්ධ සිද්ධස්ථානයන්හි ඇති ඇතැම් ස්ථාන වලට කාන්තාවන්ට ඇතුල් වීම සිදු නොකරති (ශ්‍රී මහ බෝධියේ උඩ මලුව, දලදා මාලිගාවේ දන්ත ධාතුව ඇති ස්ථානය) | | | | | |
| 48 | ඔබේ සමාජයේ බොහෝ විට කාන්තාවන් බෞද්ධ ස්ථාන වලට යන විට ඇඟ ආවරණ වන සේ යා යුතුයැයි අපේක්ෂා කෙරේ. | | | | | |
| 49 | කාන්තාවන් / ගැහැණු ළමයින් ඔසප්වීම සිදුවන කාලය තුළ පන්සල් වලට නොයති | | | | | |

**4.** කාන්තාවන් සහ පිරිමින් විසින් කළ යුතු යැයි අනෙක් අය අපේක්ෂා කරන්නේකුමක්ද යන්න සඳහන් කරමින් පහත වගුව පුරවන්න. 'අනෙක් අය' යන්නෙන් අදහස් කරන්නේ කවුරුන්ද යන්න ද සඳහන් කරන්න.

| අංකය | ප්‍රකාශය | 'අන් අය' යන්නෙන් අදහස් කරන්නේ කවුරුන්ද යන්න සලකුණු කරන්න. ඔබට එකකට වඩා හෝ අදාළ නම් සියල්ල මලකුණු කළ හැකිය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඔව් | නැත | මව | පියා | පවුලේ වැඩිහිටි සාමාජිකාවන් | පවුලේ වැඩිහිටි සාමාජිකයින් | ආගමිකනායකයින් | අසල්වැසියන් | සමස්තයක් ලෙස සමාජය |
| 1 | කාන්තාවන් / ගැහැණු ළමයින් ප්‍රසිද්ධියේ ඕනෑවට වඩා කතා නොකළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 2 | සමෘද්ධි රැස්වීම වැනි පොදු සංසදවලදී කාන්තාවන් / ගැහැණු ළමයින් අදහස් ඉදිරිපත් නොකළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 3 | කාන්තාවන් / ගැහැණු ළමයින් ප්‍රසිද්ධියේ සිනා නොවිය යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 4 | භාර්යාවන් තම ස්වාමිපුරුෂයන් සමග වාද නොකළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 5 | කාන්තාවන් / ගැහැණු ළමයින් උපදේශන කටයුතුවල නිරත නොවිය යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 6 | කාන්තාවන් / ගැහැණු ළමයින් මාධ්‍ය කටයුතුවල නිරත නොවිය යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 7 | කාන්තාවන් / ගැහැණු ළමයින් දේශපාලන රැස්වීම්වලදී හෝ පළාත් පාලන ආයතනවල රැස්වීම් වැනි පාලන සංසදවලදී කථා නොකළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 8 | කාන්තාවන් / ගැහැණු ළමයින් පෞද්ගලික සමාගම්වල සේවය නොකළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 9 | කාන්තාවන් / ගැහැණු ළමයින් තම සේවා ස්ථානවල රාත්‍රී සේවය නොකළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 10 | කාන්තාවන් / ගැහැණු ළමයින් තමන්ගේ රැකියාව සඳහා පිට පළාත්වලට ගමන් කිරීම හෝ පිටපළාත්වල නැවතී සිටීම නොකළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 11 | කාන්තාවන්/ගැහැණු ළමයින් ස්වයං රැකියාවල නිරතව නොවිය යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 12 | කාන්තාවන් / ගැහැණු ළමයින් පිරිමින් හා සමානව එකම රැකියාව කළ ද ඔවුන්ට පිරිමින්ගේ වැටුපට සමාන වැටුපක් ලබා නොදිය යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 13 | වැඩි ශාරීරික වෙහෙසක් දැරීමට අවශ්‍ය වන රැකියාව සඳහා බඳවා ගනු ලැබිය යුතත්තේ පිරිමින් පමණක් යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 14 | භාර්යාවන් තම ස්වාමිපුරුෂයින්ගේ තනතුරුවලට වඩා උසස් තනතුරු දැරිය යුතු නැතැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 15 | ඕනෑම කැපකිරීමක් සිදුකර තම විවාහය / පවුල් බැඳීම සුරක්ෂිතව පවත්වා ගැනීමට භාර්යාවන් උත්සාහ කළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 16 | තම ස්වාමිපුරුෂයන් විසින් පහර දෙනු ලැබූ විට පවා භාර්යාවන් ඒ පිළිබඳ පැමිණිලි නොකළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 17 | ස්වාමිපුරුෂයන් තම දෙවියන් හා සමාන බැවින් ස්වාමිපුරුෂයන් ඔවුන්ට බැණ වැදුන ද පහර දුන්න ද භාර්යාවන් නිහඬව සිටිය යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 18 | කාන්තාවන්ගේ ආහාර පිසීමේ සහ නිවෙස් රැකබලා ගැනීමේ වගකීම භාර ගත යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 19 | කාන්තාවන් ළමයින්ට රැකවරණය සැලසීමේ වගකීම දැරිය යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 20 | පිරිමින් ගෙදර දොරේ වැඩකටයුතු නොකළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 21 | පිරිමින් දරුවන් රැකබලා ගැනීමේ කාර්යයන් නොකළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 22 | පිරිමින් සැමවිට ම පවුලේ ප්‍රධාන ආදායම් උපයන්නන් විය යුතු  යැයි අන් අය අපේක්ෂා කරති (කාන්තා ගෘහ මූලික පවුල්වල හැර) | | | | | | | | | |
| 23 | කාන්තාවන් නිසි වයසේදී විවාහ වී දරුවන් බිහි කළයුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 24 | දරුවන් නොමැති කාන්තාවන් අශුභ නිමිත්තක් ලෙස ඔබගේ සමාජයේ අනෙක් අය සලකති | | | | | | | | | |
| 25 | වැන්දඹු කාන්තාවන් අශුභ නිමිත්තක් ලෙස ඔබගේ සමාජයේ අන් අය සලකති | | | | | | | | | |
| 26 | කාන්තාවන් පොලිස් ස්ථානයට නොයා යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 27 | කාන්තාවන් තම ස්වාමිපුරුෂයන්ට එරෙහිව පොලිස් ස්ථානවල පැමිණිලි නොකළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 28 | කාන්තාවන් ලිංගික හිරිහැර පිළිබඳ පැමිණිලිනොකළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 29 | ලිංගික හිරිහැර පිළිබඳ පැමිණිලි කිරීමට පවුලේ සාමාජිකයින් කාන්තාවන්ට ඉඩ නොදිය යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 30 | ස්ත්‍රී දූෂණවලට/ලිංගික හිරිහැරවලට ගොදුරු වූ කාන්තාවන් ඔවුන්ගේ  කන්‍යාභාවය සහ පත්‍රිවෘත්තාව අහිමි කර ගත් කාන්තාවන් ලෙස අන් අය සලකති | | | | | | | | | |
| 31 | වැන්දඹු/දික්කසාද වූ කාන්තාවන්ගේ කන්‍යාභාවය සහ පත්‍රිවෘත්තාව අන් අය ප්‍රශ්න කෙරෙයි | | | | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 32 | හිටපු සටන්කාරියන් පවුල් ජීවිතයට නුසුදුසු කාන්තාවන් ලෙස අන් අය විසින් සලකනු ලැබේ | | | | | | | | | |
| 33 | කාන්තාවන්/ගැහැණු ළමයින් රාත්‍රියේ තනිවම ගමන් නොකළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 34 | කාන්තාවන්/ගැහැණු ළමයින් රාජ්‍ය නොවන සංවිධා නවල කටයුතුවලට සම්බන්ධ නොවිය යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 35 | කාන්තාවන්/ගැහැණු ළමයින් දේශපාලනයට සම්බන්ධ නොවිය යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 36 | කාන්තාවන්/ගැහැණු ළමයින් ගමේ/ප්‍රාදේශීය මට්ටමේ සංවිධාන/ව්‍යාපාරවල නායකත්ව තනතුරු නොදැරිය යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| | **හින්දු භක්තිකයින් සඳහා පමණි** | | | | | | | | | |
| 37 | ඔසප්වීම සිදුවන කාලය තුළ කාන්තාවන්/ගැහැණු ළමයින් කෝවිල් වලට නොයා යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 38 | කාන්තාවන්/ගැහැණු ළමයින් සාම්ප්‍රදායික මංගල වාද්‍ය වාදනය නොකළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 39 | කාන්තාවන් / ගැහැණු ළමයින් කෝවිල්වල පූජා සිදු නොකළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| | **ඉස්ලාම් භක්තියින් සඳහා පමණි** | | | | | | | | | |
| 40 | ඔසප්වීම සිදුවන කාලය තුළ කාන්තාවන්/ගැහැණු ළමයින් යාඥාවල නිරත නොවිය යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 41 | ක්වාසි අධිකරණවලදී කාන්තාවන් නිෂ්ශබ්දව සිටිය යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 42 | තම ස්වාමිපුරුෂයන් කුමක් කළත් කාන්තාවන් එයට හැඩගැසිය යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| | **කතෝලිකයින්/කිතුනුවන් සඳහා පමණි** | | | | | | | | | |
| 43 | පූජකවරියන්ට දේව මෙහෙයන් සිදු නොකළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 44 | පූජකවරියන් ප්‍රසිද්ධ සංසද වලදී කතා නොකළ යුතු යැයි යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 45 | පූජකවරියන් විසින් දිව්‍ය සත්ප්‍රසාදය සිදු නොකළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| | **බෞද්ධ භක්තිකයින් සඳහා පමණි** | | | | | | | | | |
| 46 | පූජ්‍ය පක්ෂයේ පාද ස්පර්ශය කිරීම කාන්තාවන් විසින් සිදු නොකළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති | | | | | | | | | |
| 47 | ඔබේ සමාජයේ බොහෝ විටඇතැම් බෞද්ධ සිද්ධ ස්ථානයන්හි ඇති ඇතැම් ස්ථාන වලට කාන්තාවන්ට ඇතුල් වීම සිදු නොකළ යුතු යැයි අන් අය අපේක්ෂා කරති (ශ්‍රී මහ බෝධියේ උඩ මලුව, දළදා මාලිගාවේ දන්ත ධාතුව ඇති ස්ථානය) | | | | | | | | | |
| 48 | ඔබේ සමාජයේ බොහෝ විටකාන්තාවන් බෞද්ධ ස්ථාන වලට යන විට ඇග ආවරණය වන සේ යා යුතුයැයි අන් අය අපේක්ෂා කෙරේ. | | | | | | | | | |
| 49 | කාන්තාවන් / ගැහැණු ළමයින් ඔසප්වීම සිදුවන කාලය තුළ පන්සල් වලට නොයා යුතු යැයි අන් අය අපේක්ෂා කරත | | | | | | | | | |

5. පහත සඳහන් අවස්ථාවලදී සමාජය කවර ආකාරයකින් ප්‍රතිචාර දක්වනු ඇත්දැයි සඳහන් කරන්න.

| අංකය | ක්‍රියාමාර්ගය | සමාජයේ ප්‍රතිචාරය වනු ඇත්තේ | | | | |
|---|---|---|---|---|---|---|
| | | සුභවාදී ප්‍රතිචාරයක් | අසුභවාදී ප්‍රතිචාරයක් | තත්වය වෙනස් කිරීමට මැදිහත් වෙයි | ප්‍රතිචාරයක් නොදක්වයි | නොදනිමි |
| 1 | කාන්තාවක් / ගැහැණු ළමයෙක් ප්‍රසිද්ධියේ ඕනෑවට වඩා කතා කළ හොත් | | | | | |
| 2 | සමෘද්ධි රැස්වීම වැනි පොදු සංසදවලදී කාන්තාවක් / ගැහැණු ළමයෙක් අදහස් ඉදිරිපත් කළ හොත් | | | | | |
| 3 | කාන්තාවක් / ගැහැණු ළමයෙක් ප්‍රසිද්ධියේ සිනාසුණ හොත් | | | | | |
| 4 | භාර්යාවක් තම ස්වාමිපුරුෂයා සමග වාද කළ හොත් | | | | | |
| 5 | කාන්තාවක් / ගැහැණු ළමයෙක් උද්දේශන කටයුතුවල නිරත වුවහොත් | | | | | |
| 6 | කාන්තාවක් / ගැහැණු ළමයෙක් මාධ්‍ය කටයුතුවල නිරත වුව හොත් | | | | | |
| 7 | කාන්තාවක් / ගැහැණු ළමයෙක් දේශපාලන රැස්වීම්වලදී හෝ පළාත් පාලන ආයතනවල රැස්වීම් වැනි පාලන සංසදවලදී කථා කළ හොත් | | | | | |
| 8 | කාන්තාවක් / ගැහැණු ළමයෙක් පෞද්ගලික සමාගම්වල සේවය කළ හොත් | | | | | |
| 9 | කාන්තාවක් / ගැහැණු ළමයෙක් තම සේවා ස්ථානවල රාත්‍රී සේවය කළ හොත් | | | | | |
| 10 | කාන්තාවක් / ගැහැණු ළමයෙක් තමන්ගේ රැකියාව සඳහා පිට පළාත්වලට ගමන් කිරීම හෝ පිටපළාත්වල නැවතී සිටීම කළ හොත් | | | | | |
| 11 | කාන්තාවක්/ගැහැණු ළමයෙක් ස්වයං රැකියාවල නිරත වුව හොත් | | | | | |
| 12 | ඕනෑම කැපකිරීමක් සිදුකර තම විවාහය / පවුල් බැඳීම සුරක්ෂිතව පවත්වා ගැනීමට භාර්යාවක් උත්සාහ නොකළ හොත් | | | | | |
| 13 | තම ස්වාමිපුරුෂයා විසින් පහර දෙනු ලැබූ විට භාර්යාවක් ඒ පිළිබඳ පැමිණිලි කළ හොත් | | | | | |
| 14 | ස්වාමිපුරුෂයා තමන්ට බැණ වදින විට හෝ පහර දෙන විට භාර්යාවක් නිහඬව නොසිටිය හොත් | | | | | |
| 15 | කාන්තාවක්ගේ ආහාර පිසීමේ සහ නිවෙස් රැකබලා ගැනීමේ වගකීම ඉටු නොකරන්නේ නම් | | | | | |
| 16 | කාන්තාවක්ළමයින්ට රැකවරණය සැලසීමේ වගකීම ඉටු නොක රන්නේ නම් | | | | | |
| 17 | පිරිමියෙක් ගෙදර දොරේ වැඩකටයුතු වලට තම බිරිඳට උපකාරකළ හොත් | | | | | |
| 18 | පිරිමියෙක් දරුවන් රැකබලා ගැනීමේ කාර්යයන් කළ හොත් | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 19 | පවුලේ ප්‍රධාන ආදායම් උපයන්නා කාන්තාවක් වුව හොත් (කාන්තා ගෘහ මූලික පවුල්වල හැර) | | | | | |
| 20 | විවාහක කාන්තාවකට දරුවන්නැති නම් | | | | | |
| 21 | කාන්තාවක්/ගැහැණු ළමයෙක් පොලිස් ස්ථානයට ගිය හොත් | | | | | |
| 22 | කාන්තාවක් තම ස්වාමිපුරුෂයාට එරෙහිව පොලිස් ස්ථානයේ පැමිණිලි කළ හොත් | | | | | |
| 23 | කාන්තාවක්/ගැහැණු ළමයෙක් ලිංගික හිරිහැර පිළිබඳ පැමිණිලිකළ හොත් | | | | | |
| 24 | ලිංගික හිරිහැර පිළිබඳ පැමිණිලි කිරීමට පවුලේ සාමාජිකයින් කාන්තාවක්ට ඉඩ ලබාදුන හොත් | | | | | |
| 25 | කාන්තාවක්/ගැහැණු ළමයෙක් රාත්‍රියේ තනිවම ගමන් කළ හොත් | | | | | |
| 26 | කාන්තාවක්/ගැහැණු ළමයෙක් රාජ්‍ය නොවන සංවිධානවල කටයුතුවලට සම්බන්ධ වුව හොත් | | | | | |
| 27 | කාන්තාවක්/ගැහැණු ළමයෙක් දේශපාලනයට සම්බන්ධ වුව හොත් | | | | | |
| 28 | කාන්තාවක්/ගැහැණු ළමයෙක් ලිංගික හිරිහැරයට ලක් වුව හොත් | | | | | |
| **හින්දු භක්තිකයින් සඳහා පමණි** | | | | | | |
| 29 | ඔසප්වීම සිදුවන කාලය තුළකාන්තාවක්/ගැහැණු ළමයෙක් කෝවිලට ගිය හොත් | | | | | |
| 30 | කාන්තාවක්/ගැහැණු ළමයෙක් සාම්ප්‍රදායික මංගල වාද්‍ය වාදනය කළ හොත් | | | | | |
| 31 | කාන්තාවක් / ගැහැණු ළමයෙක් කෝවිල්වල පූජා සිදු කළ හොත් | | | | | |
| **ඉස්ලාම් භක්තියින් සඳහා පමණි** | | | | | | |
| 32 | ඔසප්වීම සිදුවන කාලය තුළකාන්තාවක්/ගැහැණු ළමයෙක් යාඥාවල නිරත වුව හොත් | | | | | |
| 33 | ක්වාසි අධිකරණවලදී කාන්තාවකට අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ ලබාදුන හොත් | | | | | |
| **කතෝලිකයින්/කිතුනුවන් සඳහා පමණි** | | | | | | |
| 34 | පූජකවරියක් දේව මෙහෙයන් සිදු කළ හොත් | | | | | |
| 35 | පූජකවරියක් ප්‍රසිද්ධ සංසද වලදී කතා කළ හොත් | | | | | |
| 36 | පූජකවරියන් විසින් දිව්‍ය සත් ප්‍රසාදය සිදු කළ හොත් | | | | | |
| **බෞද්ධ භක්තිකයින් සඳහා පමණි** | | | | | | |
| 37 | පූජ්‍ය පක්ෂයේ පාද වන්දනාමාන කරන විට ස්පර්ශය කිරීම කාන්තාවන් විසින් සිදු කල හොත් | | | | | |
| 38 | ඇතැම් බෞද්ධ සිද්ධස්ථානයන්හි ඇති ඇතැම් ස්ථාන වලට කාන්තාවන්ට ඇතුල් වීම සිදු කල හොත් (ශ්‍රී මහ බෝධියේ උඩ මලුව, දළදා මාලිගාවේ දන්ත ධාතුව ඇති ස්ථානය) | | | | | |
| 39 | කාන්තාවන් බෞද්ධ ස්ථාන වලට යන විට ඇඟ ආවරණය වන සේ නොගියහොත් | | | | | |
| 40 | කාන්තාවන් / ගැහැණු ළමයින් ඔසප්වීම සිදුවන කාලය තුළ පන්සල් ට ගියහොත් | | | | | |

## 4 ඇමුණුම

| අංකය | නම | දිස්ත්‍රික්කය |
|---|---|---|
| 1 | ජෙගතීසන් තයාලිනී | යාපනය |
| 2 | නලිනා ප්‍රේම්ලාල් | යාපනය |
| 3 | සුතර්සිනී කේතීස්වරන් | යාපනය |
| 4 | සිවරාසා මරියරෝසරි | යාපනය |
| 5 | සතානන්තම් වේනුකා | යාපනය |
| 6 | ලලිතාරාණි රවීන්ද්‍රන් | යාපනය |
| 7 | දේවේන්ද්‍රන් කෝනේස්වරි | යාපනය |
| 8 | නිර්මලාදේවි මහේන්ද්‍රන් | යාපනය |
| 9 | ජෝන් අම්බිහාදේවි | යාපනය |
| 10 | ශ්‍රීරාමචන්ද්‍රන් මයුතරන් | යාපනය |
| 11 | බාලක්‍රිෂානන් කලයිවානි | යාපනය |
| 12 | ජෙයසිත්තිරා තයානන්දන් | කිලිනොච්චිය |
| 13 | ශ්‍රීකාන්තන් කලයිවානි | කිලිනොච්චිය |
| 14 | සෙල්වරානි තර්මලිංගම් | කිලිනොච්චිය |
| 15 | සුරේෂ්කුමාර් ඌෂානන්තිනී | කිලිනොච්චිය |
| 16 | අරුලානන්දන් වික්නේශ්වරි | කිලිනොච්චිය |
| 17 | පරමේෂ්වරන් දනලක්ෂ්මි | කිලිනොච්චිය |
| 18 | සිත්තම්පලම් අරුල්ප්‍රසාත් | කිලිනොච්චිය |
| 19 | වෛත්‍රිලිංගම් බාලසුරේෂ් | කිලිනොච්චිය |
| 20 | ප්‍රියා නඩේසන් | කිලිනොච්චිය |
| 21 | මුත්තු සිවමෝහන් | කිලිනොච්චිය |
| 22 | ඉමැකියුලාටා පුෂ්පානන්දන් | මුලතිවු |
| 23 | ජෙයකුමාර් සිවලෝගිනී | මුලතිවු |
| 24 | සුවන්තිනි සිවඥානරාජ් | මුලතිවු |
| 25 | සතාසිවම් සකීලා | මුලතිවු |
| 26 | වජිරමුත්තු ජෙයරූබන් | මුලතිවු |
| 27 | පරමනාදන් ජෙයරාජ් | මුලතිවු |
| 28 | සමන්තා සෙබනේසරණි | වවුනියාව |
| 29 | රාසික් තවුෆීකා | වවුනියාව |
| 30 | අංජලා කෝහිලකුමාර් | වවුනියාව |
| 31 | සතාසිවම් කමලාදේවි | වවුනියාව |
| 32 | කලයිරෝහන් පද්මෙනී | වවුනියාව |
| 33 | වරදරාසා ප්‍රදිපන් | වවුනියාව |
| 34 | බාස්කරන් කතීෂන් | වවුනියාව |
| 35 | මයිකල් ලූසියා | වවුනියාව |
| 36 | කාමරරාජ් කිරිදරන් | වවුනියාව |
| 37 | කනේෂ් නවනීදන් | වවුනියාව |
| 38 | තදජිනී පරංසෝති | වවුනියාව |

| | | |
|---|---|---|
| 39 | රාමලිංගම් සසිකරන් | වවුනියාව |
| 40 | එම්.එස්.එම්.සහ්රාන් | වවුනියාව |
| 41 | කුමාරවේලු රාජින්තිනි | වවුනියාව |
| 42 | එම්.එස්.එම්.සෆ්රාස් | වවුනියාව |
| 43 | ජේසුදාසන් ප්‍රිසිතා | මන්නාරම |
| 44 | කනගරාජ් සත්‍යප්‍රියා | මන්නාරම |
| 45 | ඈන්තනි සහායම් | මන්නාරම |
| 46 | පී.එම්. මුජිබර් රහමාන් | මන්නාරම |
| 47 | එස්.රූත් අත්පුතරාණි | මන්නාරම |
| 48 | ඩේවිඩ් නෙවනේසන් චන්ද්‍රිකා සූසායි | මන්නාරම |
| 49 | කමලනාදන් තරණි | මන්නාරම |
| 50 | අශෝක්කුමාර් ප්‍රශාන්තිනී | මන්නාරම |
| 51 | කොන්ක්ලව්ස් තයාලරාජන් | මන්නාරම |

## 5 ඇමුණුම

**දත්ත ඇතුළත් කළ අයගේ නම් ලැයිස්තුව**

1. සුවිර්තාන් තේවරාජා
2. අනුෂා ගයත්‍රි සෙල්වේන්ද්‍රන්
3. මදිවදනි කුරුචන්ද්‍රනාදන්
4. වෙනුජා නවරත්නරාජා
5. අක්ෂි තේවරාජා
6. ඇන්තනි රීටා
7. ෂෙලෝමි පුෂ්පරාජ්
8. වේලිනි පරමේෂ්වරන්

## 6 ඇමුණුම

| දිනය | වේලාව | සිදුවීම | ස්ථානය |
|---|---|---|---|
| 04/02/2021 | 03 PM-05 PM | "කාන්තාවන් පසුබට කරවන්නේ කුමකින්ද?" ස්ත්‍රීපුරුෂ සමාජභාවය මත වෙනස් කොට සලකනසුළු සමාජ සම්මත පිළිබඳ (virtual) සාකච්ඡාව | Zoom වේදිකාව හරහා |
| 08/02/2021 | 09 AM-03.30 PM | මූලික හඳුන්වාදීමේ වැඩසටහන | යාපනය |
| 09/02/2021 | 09 AM-03.30 PM | | සර්වෝදය නේයහම් නේවාසික සහ සම්පත් මධ්‍යස්ථානය, යාපනය. |
| 17/02/2021 | 09 AM-03.30 PM | | කිලිනොච්චිය සහ මුලතිව් (සමුපකාර ශාලාව, කිලිනොච්චිය) |
| | | | වවුනියාව සහ මන්නාරම (සමුපකාර ශාලාව, කිලිනොච්චිය) |
| 16/03/2021 | 09.45 AM – 05 PM | දත්ත එකතුකරන්නන් සඳහා පැවැත්වූ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව (1 කණ්ඩායම පළමු දිනය) | සර්වෝදය නේයහම් නේවාසික සහ සම්පත් මධ්‍යස්ථානය, යාපනය. |
| 17/03/2021 | 08 AM – 03.15 PM | දත්ත එකතුකරන්නන් සඳහා පැවැත්වූ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව (1 කණ්ඩායම දෙවන දිනය) | |
| 18/03/2021 | 09.45 AM – 05 PM | දත්ත එකතුකරන්නන් සඳහා පැවැත්වූ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව (2 කණ්ඩායම පළමු දිනය) | |
| 19/03/2021 | 08 AM – 03.15 PM | දත්ත එකතුකරන්නන් සඳහා පැවැත්වූ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව (2 කණ්ඩායම දෙවන දිනය) | |
| 20/03/2021 | 09 AM – 01 PM | කේන්ද්‍රික කණ්ඩායම් සාකච්ඡා සහ ප්‍රධාන තැනැත්තන්ගේ සම්මුඛ සාකච්ඡා යාපනය | සර්වෝදය නේයහම් නේවාසික සහ සම්පත් මධ්‍යස්ථානය, යාපනය. |
| 21/03/2021 | 09 AM – 01 PM | කේන්ද්‍රික කණ්ඩායම් සාකච්ඡා සහ ප්‍රධාන තැනැත්තන්ගේ සම්මුඛ සාකච්ඡා කිලිනොච්චිය සහ මුලතිව් | ආර්.ඩී.එස් ශාලාව, ආනන්දන් නගර්, කන්ගපුරම්, කිලිනොච්චිය |

| | | | |
|---|---|---|---|
| 22/03/2021 | 09 AM – 01 PM | කේන්ද්‍රික කණ්ඩායම් සාකච්ඡා සහ ප්‍රධාන තැනැත්තන්ගේ සම්මුඛ සාකච්ඡා  වවුනියාව | ළමා සංවර්ධන මුලපිරීම, ශාන්ත අන්තෝනි දේවස්ථානය, හොරොව්පතාන පාර, වවුනියාව. |
| 23/03/2021 | 09 AM – 01 PM | කේන්ද්‍රික කණ්ඩායම් සාකච්ඡා සහ ප්‍රධාන තැනැත්තන්ගේ සම්මුඛ සාකච්ඡා  මන්නාරම | කාන්තා සංවර්ධන සම්මේලනය, මන්නාරම. |
| 04/05/2021 | 11.30 AM - 4.30 PM | දත්ත එකතුකරන්නන් සඳහා පැවැත්වූ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව (3 කණ්ඩායම) | Zoom වේදිකාව හරහා |
| 16/05/2021 | 03 PM - 4.30 PM | ශ්‍රී ලංකාවේ  උතුරේ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට එරෙහි කාන්තා නායිකාවන්ගේ හඬ. | Zoom වේදිකාව හරහා |
| 02/06/2021 | 03 PM - 05 PM | ස්ත්‍රීපුරුෂ සමාජභාවය මත වෙනස්කොට සැලකීම පිළිබඳව කථා කරන තාරුණ්‍යය වෙබිනාර් සැසිය | Zoom වේදිකාව හරහා |
| 03/07/2021 | 06 PM - 7.30PM | ස්වාමිපුරුෂයා සහ භාර්යාව වශයෙන් නිවස තුළ පවතින භූමිකාවල ස්ත්‍රීපුරුෂ සමාජභාවී ස්වභාවය | Zoom වේදිකාව හරහා |
| 04/08/2021<br>05/08/2021 | 09 AM – 04 PM | දත්ත වලංගු කිරීමේ වැඩමුළුව | Zoom වේදිකාව හරහා |

## යොමුව

Abeykoon, D. (2020). Baseline Study for EU Funded Project-Women in Learning and Leadership. Colombo: Search for Common Ground .

Banu, A. (2016). Human Development, disparity and vulnerability: Women in South Asia, . New York: UNDP.

Birgitte, S. (1998). Women and post-conflict reconstruction: Issues and sources. Geneva: UNRISD.

Butt, A. P., & Sharanya, S. (2019). Smashing Spatial Patriarchy: Shifting social norms driving sexual andgender based violence on public transport in Sri Lanka. Sri Lanka: OXFAM.

Charlesworth, H. (1999). Feminist Methods in International Law. The American Journal of International Law, 379-394.

De Mel, N., Peiris, P., & Gomez, S. (2013). Broadening gender: Why masculinities matter. Colombo: Care International Sri Lanka.

Elackia. (2016). Women's Freedom is today. Chennai: Vidiyal Padhippagam.

Haniffa, F. (2008). Piety as Politics amongst Muslim Women in Contemporary Sri Lanka. Modern Asia Studies, 347-375.

Howland, C. W. (1999). Religious Fundamentalisms and the Human Rights of Women. New York: Palgrave Macmillan US.

Jacevic, M., & al, e. (2021). The ASEAN Regional Study on Women, Peace and Security. ASEAN.

Jayawardena, K. (2016). Emancipation and Subordination of Women in Sri Lanka. In K. Jayawardena, Feminism and Nationalism in the Third World (pp. 99-119). London: Verso.

Justino, P. (2012). Women Working for Recovery: The Impact of Female Employment on Family and Community Welfare after Conflict'. New York: UN Women.

Kumarage, A. (2019). Genderizing Life, Choice, and Rights: Asking the Woman Question in. Virginia Journal of Social Policy & the Law, 137-164.

Militzer, D. (2008). Disaster and Gender: The Indian Ocean Tsunami and Sri Lankan Women. Toronto Univeristy.

Patesch, P. (2017). Agency & Gender Norms in War Economics. In F. C. Ni Aolain, The Oxford Handbook of Gender & Conflict. Oxford University Press.

Periyar, E. (1942). Why has woman become a slave? Pollachi: Ethir Veliyeedu.

Pinto-Jayawardena, K., & Jayantha, D. A. (2010). Is Land Just for Men? Critiquing Discriminatory Laws, Regulations and Administrative Practices Relating to Land and Property Rights of Women in Sri Lanka. Colombo: Law and Society Trust.

Prof.Goonesekere, S. (2012). Harmful Traditional Practices in Three Countries of South Asia: Culture, Human Rights and Violence against women. Bangkok: Economic and Social Commission for Asia and the Pacific.

T.Herath, & all, e. (2018). The effect of a community-based health promotion intervention to change gender norms among women in a rural community in Sri Lanka. Sri Lanka: BMC.

UNDP. (2019). Human Development Report 2019: Beyond averages, beyond today: Inequalities in human development in the 21st century. New York: UNDP.

UNDP. (2020). Beyond income, beyond averages, beyond today: Inequalities in human development in the 21st century. New York: UNDP.

Vithanage, D. S. (2015). Understanding the Nature and Scope of Patriarchy in Sri Lanka: How Does it Operate in the Institution of Marriage? Sri Lanka.

WHO. (2014). Gender, Women and Health: What do we mean by “Sex” and “Gender”? Geneva: World Health Organisation.

WHO, & Nutrition, M. o. (2008). National report of violence and health in Sri Lanka.

Panchali, (1990, December- January) "war and women", p. 6.

Panchali, (1991, May-June). "What would you say Chastity is", p. 5.

මෙම සහභාගීත්ව පර්යේෂණය උතුරු පළාතේ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවී වෙනස් කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන වලින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ නිදහසට ඇති වන බලපෑම පිලිබඳ නව සාක්ෂි ඉදිරිපත් කරමින් ඒ පිලිබඳ දැනුම වැඩි දියුණු කිරීමට දායක වී ඇත. පර්යේෂණයේ සොයාගැනීම් උතුරු පළාතේ කාන්තාවන් මුහුණ දෙන අභියෝග පිළිබිඹු කරන අතර විවිධ සමාජීය ආයතන තුළ ගැබ් වී ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවී වෙනස්කොට සැලකීම් ඉස්මතු කරයි. යුද්ධයේ බලපෑම් හේතුවෙන් කාන්තාවන්ගේ සාම්ප්‍රදායික භූමිකාවන් පරිවර්තනය වී ඇති පශ්චාත් යුද සන්දර්භයක් තුළ මෙම පර්යේෂණය සිදු කර ඇති බැවින් මෙම පර්යේෂණය විශේෂයෙන් වැදගත් වේ.

පර්යේෂණයේ සෑම අදියරකදීම ප්‍රජා සාමාජිකයින්ගේ සහභාගීත්වය සහ දායකත්වය සහතික කිරීම නිසා මෙම පර්යේෂණය සුවිශේෂී වැදගත්කමක් හිමිකර ගනී. එමගින් එකතු කරන ලද දත්තවල වලංගුභාවය සහතික කරන අතර පර්යේෂණයේ සොයාගැනීම් වල වලංගු භාවය ද පොහොසත් කරමින් ප්‍රජා සාමාජිකයින්ට ඔවුන් දිනපතා මුහුණ දෙන සමාජ ප්‍රතිමාන ගැන වෙනස් ලෙස සිතීමට මාර්ගයක් ද විවර කර දෙයි.

ඕනෑම සමාජයක ප්‍රගමනය රඳා පවතින්නේ එම සමාජයේ කාන්තාවන්ගේ ප්‍රගමනය මතය. එබැවින්, සමාජයේ කවර හෝ සැබෑ ප්‍රගතියක් අත්කර ගැනීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවී වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමානයන්ට අභියෝග කිරීම තුළින් ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවය සහතික කිරීම ඉතා වැදගත් වේ. නිසි ලෙස ක්‍රියාත්මක කළහොත් ස්ත්‍රී පුරුෂ සමාජභාවී වෙනස් කොට සැලකීමේ සමාජ ප්‍රතිමානයන්හි පරිවර්තනයකට පහසුකම් සැලසිය හැකි නිශ්චිත නිර්දේශ මෙම පර්යේෂණ වාර්තාව මගින් යෝජනා කරයි. කෙසේ වෙතත්, සමාජ ප්‍රතිමානයන් පරිවර්තනය කිරීම එක රැයකින් සිදුවන ඉන්ද්‍රජාලික සිදුවීමක් නොවේ. ඒ වෙනුවට, ඒ සඳහා කාලාන්තරයක් තිස්සේ සිදුකරන වෙහෙසකර පරිශ්‍රමයන් අවශ්‍ය වේ. සමාජ සම්මතයන් පරිවර්තනය කිරීම සඳහා සෑම පුද්ගලයෙකුගේම ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවය සඳහා කැපවීම අත්‍යවශ්‍ය වන අතර විශේෂයෙන් වඩාත් ශක්තිමත් සහ වඩාත් ප්‍රචලිත සමාජ සම්මතයන් පවුල් මට්ටමින් මුලිනුපුටා දැමීම අවශ්‍ය ය.

හඳුනාගෙන ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවී වෙනස් කොට සැලකීමේ සමාජ ප්‍රතිමානයන් පරිවර්තනය කරන සාර්ථක ප්‍රජා මැදිහත්වීම් වර්ධනය කිරීමට මෙම පර්යේෂණයේ සොයාගැනීම් අර්ථාන්විතව දායක වනු ඇති බවට නම් සැකයක් නොමැත.

චතුරිකා සෙව්වන්දි
ව්‍යාපෘති සම්බන්ධීකාරක
ට්‍රාන්ස්ෆෝම් ව්‍යාපෘතිය
නීතිය සහ සමාජ භාරය